පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම
2023 - 2033

"සැඟවුණු සෞභාග්‍යයේ ද්වාරය"



නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම 2023 – 2033

“සැඟවුණු සෞභාග්‍යයේ ද්වාරය”

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය

පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම 2023-2033

©නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව -2023
සියලුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ . මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශය
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.uda.gov.lk
විද්‍යුත් තැපෑල - info@uda.gov.lk
දුරකථන අංක - +94112 873 637
ප්‍රකාශනය 2023

පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම (2023 – 2033), පළමු කොටස , දෙවන කොටස හා තුන්වන කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යනය , සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව , ශද්‍රුඅත (SWOT) විශ්ලේෂණය සහ සැලැස්ම යන කොටස් වලිනි . දෙවන කොටස සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධන නියමතා, කලාපිකරන නියමතා , යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා හා රක්ෂිත වලින් සමන්විත වේ. තුන්වන කොටස කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලි ඇමුණුම් වලින් සමන්විත වේ.

පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම (2023 - 2033) සකස් කර ඇත්තේ සබරගමුව පළාත් කාර්යාලය සැලසුම් අංශය විසිනි.

අධීක්ෂණය
නිමේෂ් හේරත් සභාපති , නාගරික සංවර්ධන අධිකාරිය. නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර අධ්‍යක්ෂ ජනරාල්, නා.සං.අ. වාස්තු විද්‍යාඥ මහින්ද විතානාරච්චි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී එම්.පී.රණතුංග නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් - කලාප 1), නා.සං .අ . නීතිඥ ඩී. එම් . කිරිවත්තුඩුව අධ්‍යක්ෂ (නීති) , නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න, අධ්‍යක්ෂ (උපායමාර්ගික සැලසුම්), නා.සං.අ. විසිනි.

සැලසුම් කණ්ඩායම

අධීක්ෂණ කටයුතු හා මෙහෙයවීම :
නගර නිර්මාණ ශිල්පී සුගත් ජේමසිරි අධ්‍යක්ෂ, සබරගමුව පළාත, නා.සං.අ. නගර නිර්මාණ ශිල්පී ඩී.පී.ආර්.කේ. ගුණතිලක නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.
සම්බන්ධීකරණය, සැලැස්ම සකස් කිරීම හා ලේඛනගත කිරීම : නගර නිර්මාණ ශිල්පී යූ.ජී.දුල්මිණි උදේශිකා සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.
සැලැස්ම සකස් කිරීම හා ලේඛනගත කිරීම සඳහා කණ්ඩායම් දායකත්වය ලබාදීම : නගර නිර්මාණ ශිල්පී එච්.එම්.පී.එච්. මැණිකේ සහකාර අධ්‍යක්ෂ (නගර සැලසුම්) සබරගමුව පළාත් කාර්යාලය, නා.සං. අධි, කේ.එම්.අයි.සමන් රූපසිංහ සබරගමුව පළාත් කාර්යාලය, නා.සං. අධි., කේ.ඒ.එස්.ගුණසේකර, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං. අධි., මහේෂ් ජිනදාස බලාත්මක සැලසුම් නිලධාරී සබරගමුව පළාත් කාර්යාලය, නා.සං. අධි, ඩබ්.එම්.ඩබ්. මැණිකේ සැලසුම් ශිල්පී, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං. අධි.

සහය කණ්ඩායම්
උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ. (අධීක්ෂණය, නියාමනය, සහ ගැසට් කිරීම)
පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ. (PORS සැලසුම සකස් කිරීම සහ රෙගුලාසි සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ. (භූගෝලීය තොරතුරු හා දත්ත සැපයීම සහ තාක්ෂණික සහය සැපයීම)

පරිවර්තන කටයුතු
ඉංග්‍රීසි පරිවර්තනය
කෞශානි අමරසිංහ මෙනෙවිය

දෙමළ පරිවර්තනය
ඒ.එම්.ඇන්ටන් සුදර්ශන් මහතා
පිටු සැකසුම් කටයුතු
සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.

ප්‍රණාමය

පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම 2023-2033 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ උපායමාර්ගික සැලසුම් අංශයේ මූලික අධීක්ෂණය යටතේ සිදු විය. “සැඟවුණු සෞභාග්‍යයේ ද්වාරය” දැක්ම තුළින් මෙම නගරයේ පවතින මැණික්, වැවිලි භෝග, සංචාරක ආකර්ෂණීය ස්ථාන යනාදී නගරය තුළ පවතින සම්පත් උපයෝගිතාවයකින් යුතුව භාවිතයට ගනිමින් නගර වැසියන්ගේ ජීවිත සමෘද්ධිමත් කරමින් නගරය සංවර්ධනය මෙම සැලැස්මේ අරමුණයි. පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම 2023-2033 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව සකස් කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන යටතේ පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම 2023-2033 සඳහා අනුමැතිය ලබාදීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස විෂයභාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමන්ටත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ගරු පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ටත්, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ටත්, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු සභාපති ලක්ෂ්මන් ප්‍රේමරත්න මහතා ඇතුළු මහජන නියෝජිතයන් සියලු දෙනාටත්, කහවත්ත ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු සභාපති ප්‍රියන්ත උපුල් හේවගේ මහතා ඇතුළු මහජන නියෝජිතයන් සියලු දෙනාටත් අධිකාරියේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිමු.

මෙම සැලැස්ම සාර්ථකව නිමා කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්.එස් . සත්‍යානන්ද මහතා වෙත අපගේ ස්තුතිය පුදකර සිටින්නෙමු. තවද, මෙම නගර සැලැස්ම සඳහා තොරතුරු හා අදහස් ලබාගැනීමේදී පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභාවන් ඇතුළු රාජ්‍ය ආයතන රැසක් තම සම්පත් දායකත්වය ලබාදුන් අතර එකී සියලුම රජයේ නිලධාරීන්ට අපගේ විශේෂ ස්තුතිය පුදකර සිටිමු.

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්ය හා මග පෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති නිමේෂ් හේරත් මහතාට, අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර මහතාට, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරලත් වාස්තු විද්‍යාඥ මහින්ද විතානාරච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - කලාප 1 නගර නිර්මාණ ශිල්පී එම්.පී.රණතුංග මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - කලාප 2 නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න මහතාට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එමෙන්ම උපායමාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ඊ.කළුපහන මහත්මියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ නගර නිර්මාණ ශිල්පී ජේ . පී. එස් . සෝමසේකර මහත්මිය හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත්, නීති අංශයේ කාර්ය නියුතු අධ්‍යක්ෂ දයානි කිරිවන්තුඩුව මහත්මියටත්, සියලු පළාත් අධ්‍යක්ෂක මහත්ම මහත්මීන්ට, අධ්‍යක්ෂ (සබරගමු පළාත) නගර නිර්මාණ ශිල්පී සුගත් පේමසිරි මහතාටත්, සබරගමු පළාත් හිටපු අධ්‍යක්ෂවරුන් වන නගර නිර්මාණ ශිල්පී අනුර මැදවල මහතා සහ නගර නිර්මාණ ශිල්පී තුෂානි ද අල්විස් මහත්මියට මෙන්ම රත්නපුර කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සියලුම සේවක මහත්ම මහත්මීන්ටත් අපගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන්, පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම (2023 – 2033) සකස් කිරීමේදී මූලික අදියර දත්ත රැස් කිරීමේ සිට ගැසට් පත්‍රයෙහි පළකිරීම දක්වා සියලු අදියරයන් වලදී ඍජුව සහ වක්‍රව සහයෝගය ලබාදුන් රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන, විවිධ සම්පත්දායකයින්, හා නාගරික මහජනතාව වෙත හදපිරි ප්‍රණාමය පළකර සිටින්නෙමු.

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන

"පැල්මඩුල්ල, කහවත්ත" නගර සංවර්ධනය යථාර්ථයක් කරා...

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා සඵලදායි ලෙස ඉටුකර ගැනීම පිණිස නිවැරදි දිශානතියක් කරා රාජ්‍යය යොමු කිරීම යටතේ නව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍යය.

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත් නගර 30 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සඳහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. "පැල්මඩුල්ල - කහවත්ත" නගර සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් 130 කට වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම්කර ඇත.

පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්ගෙන් සේවා ලබාගන්නා සහ එහි නේවාසික ජනතාව සඳහා වන අතර එය තවදුරටත් සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට මෙම සැලැස්ම මගින් හදුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තියවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලසුම (2023-2033) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
ගරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු සභාපතිතුමගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය හා නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ (II අ කොටස) 8 (1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලැසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව ප්‍රදේශයේ භෞතික , ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම 2023-2033 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනාගැනීම තුළින් ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම හා ඒ හරහා උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර තවදුරටත් සංවර්ධන සැලසුම තුළින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා නියාමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යයතා ඉටු කරනු වස් මෙම සැලැස්ම බලාත්මක කිරීම තුළින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම නියමිත කාලය තුළ සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද මෙම කර්තව්‍යය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

නිමේෂ් හේරත්
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

පූර්විකාව

පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි පවතින සංවර්ධන ප්‍රවණතා හේතුවෙන් ඉස්මතුවන අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මතු වී ඇත. ඒ අනුව නගරයේ පවතින ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික තත්ත්වය විශ්ලේෂණය කරමින් තිරසාර නගර නිර්මාණය කිරීමේ අරමුණ වෙත ලගාවීම ඉලක්කගතව පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. තවද පැල්මඩුල්ල, කහවත්ත නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශකත්වය මෙම සැලැස්ම හරහා ලබා දීමට අපේක්ෂිතය.

මෙම නගර සංවර්ධන සැලැස්ම 2023 – 2033, I, II සහ III ලෙස කොටස් තුනකින් සමන්විත වන අතර, I වන කොටස සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, ශ.දු.අ.ත. විශ්ලේෂණය හා සැලැස්ම යන පරිච්ඡේද වලින් සමන්විත වන අතර II වන කොටස සංවර්ධන කලාප හා කලාප නියමතා, කලාපීකරණ රෙගුලාසි, යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත යන පරිච්ඡේද වලින් සමන්විත වේ. III වන කොටස කලාපීකරණ මායිම් වලට අදාළ ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

පළමුවන කොටස - සැලැස්මේ 1 වන පරිච්ඡේදය සංවර්ධන සැලැස්මේ අර්ථය, එහි නෛතික සන්දර්භය, සැලැස්මේ පාර්ශ්වකරුවන්, විෂය පථය සහ සැලසුම් ක්‍රියාවලිය විස්තර කෙරේ. පිළිවෙලින් 2 වන සහ 3 වන පරිච්ඡේදයන් සැලසුම් ප්‍රදේශය, ප්‍රදේශයේ ඉතිහාසය, සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම සහ සැලැස්මේ අවශ්‍යතාවය විස්තරාත්මකව දක්වා ඇත. 4 වන පරිච්ඡේදයේ දැක්ම, අරමුණු සහ උපායමාර්ගික සැලසුම් වලින් සමන්විත වන අතර 5 වන පරිච්ඡේදයේ එක් එක් පරමාර්ථයන් සඳහා වන මූලික ශ.දු.අ.ත. විශ්ලේෂණය පිළිබඳ විස්තරාත්මක විස්තරයක් ඇතුළත් වේ. එමෙන්ම සැලැස්මේ 6 වන පරිච්ඡේදයේ සංකල්පීය සැලැස්ම සහ යෝජිත ඉඩම් පරිහරණ සංවර්ධන සැලැස්ම විස්තර කෙරේ. ඒ යටතේ සංවර්ධන සැලැස්මේ ප්‍රධාන උපායමාර්ග සැලසුම් වන භෞතික හා සාමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග, ආර්ථික සංවර්ධන උපායමාර්ග, තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග හා ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග ලෙස සවිස්තරව දක්වා ඇත.

දෙවන කොටස - 7 වන පරිච්ඡේදය මගින් සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා දක්වා ඇති අතර 8 වන පරිච්ඡේදයේ හඳුනාගත් කලාප සඳහා අදාළ කලපිකරන රෙගුලාසි 9 වන පරිච්ඡේදයේ යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත සීමාවන් ඇතුළත් වේ.

අවසාන වශයෙන්, මෙම අධිකාරියේ සහ ශ්‍රී ලංකා රජයේ අරමුණ වන්නේ 2023 – 2033 පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීමයි.

ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 පෙබරවාරි මස 16 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

"සුහුරුපාය",

සුභූතිපුර පාර,

බත්තරමුල්ල.

2023 05 **මස** 26 **වන දින.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2330/05 - 2023 මැයි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2023.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 පෙබරවාරි මස 16 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අප්‍රේල් මස 28 වන දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0005/1

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා

1A - PG 6315 — 46 (2023/05)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම 2023 අප්‍රේල් මස 28 වන දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මැයි මස 03 වන දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0005/2

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 අප්‍රේල් මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

නිමේෂ් හේරත්,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2023 මැයි මස 03 වන දින.

EOG 05 - 0005/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ප්‍රණාමය II

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන III

ගරු සභාපතිතුමගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය IV

පූර්විකාව V

ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය VII

ගැසට් නිවේදනය VIII

පටුන

I වන කොටස - දත්ත විශ්ලේෂණය සහ සැලැස්ම

පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම

1.1 හැඳින්වීම 02

1.2 සැලැස්මේ පාර්ශවකරුවන් 03

1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය 04

1.4 සැලසුම් ක්‍රියාවලිය 06

පරිච්ඡේදය 02 : මූලික අධ්‍යනය

2.1. අධ්‍යයන ප්‍රදේශය 10

2.2. සැලසුම් සීමාව නිර්ණය කිරීම 13

2.2.1. හැඳින්වීම 13

2.2.2. ක්‍රියාකාරී සීමාව 13

2.2.3. භූගෝලීය සීමාව 15

2.2.4. පරිපාලන සීමාව 17

2.2.5. සැලසුම් සීමාව 19

2.3 සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය 22

2.3.1. නගරයේ ඓතිහාසික පසුබිම 22

2.3.2. ජාතික හා කලාපීය ප්‍රතිපත්ති 26

2.3.3. පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්ට අදාළව පෙර සකස් කරන ලද සංවර්ධන සැලසුම් 28

2.3.4. සමාජීය, ආර්ථික, භෞතික හා පාරිසරික සන්දර්භය 29

පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව

3.1 හැඳින්වීම 38

3.2 හඳුනාගත් ගැටළු 38

3.3 හඳුනාගත් විභවතා 47

පරිච්ඡේදය 04 : සංවර්ධන සැලසුම් රාමුව
4.1. දැක්ම 66
4.2. දැක්මේ ප්‍රකාශනය 66
4.3. ඉලක්ක 67
4.4. අභිමතාර්ථ 67

පරිච්ඡේදය 05 : ශක්‍යතා , දුබලතා , අවස්ථා සහ තර්ජන පිළිබඳ විශ්ලේෂණය
5.1. සාරාංශගත ශ.දු.අ.ත. විශ්ලේෂණය 70
5.2. විස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය 73

පරිච්ඡේදය 06 : සැලැස්ම
6.1. හැඳින්වීම 102
6.2. සංකල්පිත සැලැස්ම 102
6.3. යෝජිත භූමි පරිහරණ සැලැස්ම 104
6.4. භෞතික හා සමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම 110
6.4.1. සමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම 110
6.4.1.1. නේවාසික පහසුකම් 110
6.4.1.2. සෞඛ්‍ය පහසුකම් 113
6.4.1.3. අධ්‍යාපන පහසුකම් 115
6.4.2. භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම 117
6.4.2.1. ප්‍රවාහන පහසුකම් 117
6.4.2.2. පානීය ජල සැපයුම 121
6.4.2.3. විදුලිය හා දත්ත රැහැන් සැපයුම 123
6.4.2.4. අපජල හා මළාප්‍රවාහන කළමනාකරණය 125
6.4.2.5. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය 126
6.5 ආර්ථික සංවර්ධන උපායමාර්ග 128
6.5.1. මැණික් කර්මාන්තය සංවර්ධනය කිරීමේ උපායමාර්ග 129
6.5.2. කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමේ උපායමාර්ග 132
6.5.3. සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ උපායමාර්ග 134
6.5.4. වෙළඳ හා වාණිජ සංවර්ධන උපායමාර්ග 137
6.6. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග 138
6.6.1. පරිසර සංරක්ෂණ සැලැස්ම 139
6.6.2. ආපදා අවධානම අවම කිරීමේ සැලස්ම 140
6.6.3. පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම 142

6.6.4. භූ දර්ශන කළමනාකරණ සැලැස්ම 147
6.7. සංස්කෘතික සහ ඓතිහාසික උරුමයන් පිළිබඳ උපායමාර්ග 149
6.7.1. පුරා විද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන 149
6.7.2. සංස්කෘතික උත්සව හා අනන්‍යතාවයන් 154
6.8. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග 159
6.8.1. හැඳින්වීම 159
6.8.2. ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම 159
6.8.3. ව්‍යාපෘති පිළිබඳ විස්තර 163

II වන කොටස - භෞතික සංවර්ධන උපායමාර්ග සහ නියමතා

පරිච්ඡේදය 07 : සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා
7.1 හැඳින්වීම 184
7.2. කලාපීකරණ සැලැස්ම (2023-2033) 185
7.3. සංවර්ධන කලාප සහ කලාප සංගුණකය 186
7.4. සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපිකරණ නියමතා 186

පරිච්ඡේදය 08 : කලාපිකරණ නියමතා
8.1 කලාපිකරණ නියමතා 196
8.1.1. සංරක්ෂණ කලාපය සඳහා අනුමත භාවිතයන් 205
8.1.2. කෘෂිකාර්මික කලාපය I සඳහා අනුමත භාවිතයන් 205
8.1.3. කෘෂිකාර්මික කලාපය I සඳහා අනුමත මාර්ගෝපදේශ 206
8.2. උපලේඛණ 208
උපලේඛණය I – “අ” ආකෘතිය -අවසරලත් ගෙබිම් අනුපාතයන්
උපලේඛණය II – “ආ” ආකෘතිය - මීටර් 3 සහ 4.5 සඳහා මහල් ප්‍රමාණයන්
උපලේඛණය III – “ඉ” ආකෘතිය - විවෘත අවකාශයන්
උපලේඛණය IV – “ඊ” ආකෘතිය - සංවර්ධන කලාප සඳහා අවසරලත් භාවිතයන් හා අවම බිම් ප්‍රමාණයන්

පරිච්ඡේදය 09 : යෝජිත මාර්ග පළල , ගොඩනැගිලි සීමා සහ රක්ෂිත
9.1. ගොඩනැගිලි සීමා සහ යෝජිත මාර්ග පළල
9.1.1. ප්‍රධාන මාර්ග 226

9.1.2. අනෙකුත් මාර්ග 226
9.2. ජල මුලාශ්‍ර ආශ්‍රිත රක්ෂිත සීමාවන් 229
9.3. කැණීම් සඳහා රක්ෂිත අවශ්‍යතා 230

රූප සටහන් ලැයිස්තුව 231
සිතියම් ලැයිස්තුව 234
වගු ලැයිස්තුව 234

III වන කොටස - ඇමුණුම්
ඇමුණුම 01 : සිතියම් 238
ඇමුණුම 02 : ප්‍රස්ථාර 243
ඇමුණුම 03 : පාර්ශවකරුවන්ගේ අදහස් ආශ්‍රිත පරිසණක වචන විශ්ලේෂණය 244
ඇමුණුම 04 : ව්‍යාපෘති පෙළගැස්ම 249
ඇමුණුම 05 : කලාප මායිම් 251
කෙටි යෙදුම් 360
පරිශීලිත මුලාශ්‍ර 360

I වන කොටස

දත්ත විශ්ලේෂණය සහ සැලැස්ම

පළමුවන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

1.1 හැඳින්වීම

හැඳින්වීම

නාගරික සංවර්ධන අධිකාරියේ විෂය පථය තුළට ඇතුළත් ප්‍රධානතම කාර්යභාරයක් වන නාගරික සංවර්ධන ප්‍රදේශ හඳුනාගැනීම, එම ප්‍රදේශ නාගරික බල ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කිරීම හා එවැනි ප්‍රකාශිත බල ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් පිළියෙළ කර ක්‍රියාවට නැංවීම යන ක්‍රියාදාමයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම නගර දෙකක් වන කහවත්ත හා පැල්මඩුල්ල නගර ඇතුළත් සමස්ථ නාගරික බලප්‍රදේශය සඳහා මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වන වගන්තිය යටතේ වර්ෂ 2008 පෙබරවාරි මස 08 වන දින අංක 1535/14 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාස 5 කින් හා ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් තුනකින් මෙන්ම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම් 04 කින් සමන්විත භූමි ප්‍රදේශය කහවත්ත නාගරික බල ප්‍රදේශය ලෙස (ව.කි.9.15) වර්ෂ 2013 මැයි මස 09 වන දින අංක 1809/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාස 17 කින් සමන්විත භූමි ප්‍රදේශය (ව.කි.25.7) පැල්මඩුල්ල නාගරික බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

කහවත්ත හා පැල්මඩුල්ල නගරයන්හි පවතින ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික පසුබිම පිළිබඳ පුළුල් අධ්‍යයනයන් සිදුකිරීම තුළින් ඒ ආශ්‍රිතව පවතින විභවතා හා ගැටලු හඳුනාගෙන ඇත. ඒ අනුව හඳුනාගත් විභවතා ඵලදායීව භාවිතා කරමින් පවතින ගැටළු නිරාකරණය කර තිරසර නගර ලෙස සංවර්ධනය කිරීම සඳහා කලාපීය මට්ටමේ සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

ඒ අනුව අපේක්ෂිත භෞතික හා සාමාජීය සංවර්ධනය තුළින් නගරයේ හා අවට ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සැලසුම් කර ඇත. නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් වර්ෂ 2023 – 2033 යන කාලය සඳහා සැලසුම් සහගත නගරයක් වශයෙන් කහවත්ත හා පැල්මඩුල්ල නගරයන්හි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක විය යුතු මාර්ගෝපදේශයක් වශයෙන් මෙම සංවර්ධන සැලැස්ම, 1982 අංක 4 දරණ, නාගරික සංවර්ධන අධිකාරියේ සංශෝධිත පනතේ 8 II (අ) මඟින් පවරා ඇති බලතල වලට අනුගතව පිළියෙළ

කර ඇත. මෙහි මුලික අධ්‍යයනයන් වර්ෂ 2019 සැප්තැම්බර් මස සිට ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත.

මෙම සංවර්ධන සැලැස්මේ සැලසුම් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී විධිමත්ව සියලු දත්ත ඒකරාශී කිරීම, විශ්ලේෂණය කිරීම මෙන්ම නාගරික ජනතාව ඇතුළු සියලු පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන ඇත. එම සියලු විශ්ලේෂණයන් අනුව නිර්මාණය කරන ලද දැක්මකට අනුව පිළියෙළ කරන ලද සංවර්ධන සැලැස්මේ සියලු සංවර්ධන යෝජනා සංක්ෂිප්තව හා විස්තරාත්මකව මෙම වාර්තාව තුළ අන්තර්ගත කර ඇත.

1.2 සැලැස්මේ පාර්ශවකරුවන්

සැලැස්මේ පාර්ශවකරුවන්

පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේ කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට සහයෝගය දැක්වූ නගරයේ පරිපාලන කටයුතු වලට මැදිහත්ව ක්‍රියා කරන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන, විවිධ අංශ නියෝජනය කරන සංවිධාන, ව්‍යාපෘති ආයතන හා ප්‍රජා සංවිධාන ඇතුළු සියලු ප්‍රජා නියෝජනයන්හි සහභාගිත්වය හා අදහස් යෝජනා සංවර්ධන සැලැස්ම සඳහා මහඟු පිටුවහලක් විය.

ප්‍රධාන උපදේශන ආයතන (Main Stakeholders)

- කහවත්ත ප්‍රාදේශීය සභාව
- පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
- ගොඩකවෙල ප්‍රාදේශීය සභාව
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පැල්මඩුල්ල/ කහවත්ත/ගොඩකවෙල
- ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව
- මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - රත්නපුර
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - රත්නපුර
- මාර්ග සංවර්ධන අධිකාරිය -රත්නපුර
- ලංකා විදුලිබල මණ්ඩලය - රත්නපුර
- ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - පැල්මඩුල්ල/ කහවත්ත
- ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිය - රත්නපුර
- ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය - රත්නපුර
- සබරගමුව මාර්ගස්ථ හා මගී ප්‍රවාහන අධිකාරිය

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

අනෙකුත් උපදේශන ආයතන (Main consultancy agencies)

- පැල්මඩුල්ල/කහවත්ත පොලිස් ස්ථාන
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය - පැල්මඩුල්ල/කහවත්ත
- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - පැල්මඩුල්ල/කහවත්ත
- විධායක ඉංජිනේරු කාර්යාලය- පැල්මඩුල්ල/කහවත්ත
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර
- කර්මාන්ත අමාත්‍යාංශය - සබරගමුව පළාත් සභාව
- මධ්‍යම පරිසර අධිකාරිය - රත්නපුර
- නිවාස සංවර්ධන අධිකාරිය - රත්නපුර
- පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය - සබරගමුව පළාත් සභාව
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - රත්නපුර
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව . රත්නපුර
- පුරා විද්‍යා දෙපාර්තමේන්තුව - රත්නපුර
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කිරිමේ දෙපාර්තමේන්තුව- සබරගමුව පළාත් සභාව
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය - රත්නපුර

අනෙකුත් පාර්ශවකරුවන් (Stakeholder Groups)

- පැල්මඩුල්ල/කහවත්ත වෙළඳ සංගම්
- පැල්මඩුල්ල/කහවත්ත ගොවිජන සංවිධාන

සංවර්ධන සැලැස්මේ විෂය පථය

1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පැල්මඩුල්ල හා කහවත්ත නගර, මෙම කලාපයේ පළමුපෙළ නගරය වන රත්නපුර හා දෙවනපෙළ නගරය වන ඇඹිලිපිටිය නගරය අතර අන්තර් සබඳතා වර්ධනයට පහසුවන මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපිතව ඇත. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ සකස් කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලැස්මට (2050) ට අනුව හඳුනාගත් අධි සංවේදී මධ්‍යම පාරිසරික කලාපය තුළ පැල්මඩුල්ල හා කහවත්ත නගර පිහිටා ඇත.

එසේම රටේ අපනයන ආර්ථිකයේ, කර්මාන්ත අංශයේ අපනයන ආදායම ලබාදෙන මැණික් කර්මාන්තය සඳහා ප්‍රධාන දායකත්වයක් පැල්මඩුල්ල හා කහවත්ත නගර තුළින් ලබාදේ. තවද ජාතික ප්‍රතිපත්ති අනුව සකස් කර ඇති ජාතික භෞතික සැලස්ම

තුළ පතල් හා ඛණිජ කැණීම් කර්මාන්තය මූලික කරගත් ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් හඳුනාගෙන පැවතීම සම්පත් උපයෝගිතාවයකින් යුතුව යොදාගැනීමට නව අවස්ථාවකි. රටේ ඉදිරි සංවර්ධනයන් සඳහා ජාතික වශයෙන් හඳුනාගෙන ඇති යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අතර යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය, දුම්රිය මාර්ගය හා ෆයිබර් ඔප්ටික් ජාලය පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යය හරහා ව්‍යාප්තව ඇත. මෙහිදී එවැනි සංවර්ධනයන්හි ප්‍රතිලාභ උපරිමත්ව යොදවමින් මෙම ප්‍රදේශයේ පවතින පාරිසරික සංවේදීතාවය ආරක්ෂා කරමින් කලාපීය මට්ටමේ සංවර්ධනයක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී ජාතික හා පළාත් මටටමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකරනු ලබයි. එකි සංවර්ධන ප්‍රතිපත්ති වල සිදුකරනු ලබන වෙනස්කම් මෙන්ම ජාතික මට්ටමේ අවධානයක් ලබාදිය යුතු විවිධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා, ස්ථාවර ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකිරීම තුළින් සංවර්ධන සැලසුම් නැවත යාවත්කාලින කිරීමට සිදු වී ඇත. තවද කලාපීය මට්ටමේ සංවර්ධනයන්, එක් එක් විෂය පථයන් යටතේ විවිධ ආයතන හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර එකී ආයතන මගින් ලබාගන්නා දත්ත හා අනෙක් තොරතුරු වල නිරවද්‍යභාවය පිළිබඳ ගැටළු මතු වී ඇති අතර, එවැනි අවස්ථාවන්හිදී විවිධ ක්‍රමවේදයන් ඔස්සේ නැවත දත්ත හා තොරතුරු ඒකරාශී කිරීමට සිදුව ඇත. මේ ආකාරයට ජාතික, පළාත් මෙන්ම කලාපීය වශයෙන් ඒ ඒ අදාළ අංශ හා නිරන්තරයෙන් සම්බන්ධ වීමට සිදුවන අතර සංවර්ධන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතු අතර මෙවැනි ගැටළු සංවර්ධන සැලසුම් සකස්කිරීමේදී මතුවූ බාධක වශයෙන් හඳුනාගෙන ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුළින් පැල්මඩුල්ල හා කහවත්ත නාගරික බල ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ආවරණය කර ඇති අතර, සමස්ථ සැලැස්ම තුළින් වර්ෂ 2033 වනවිට කලාපීය සම්පත් ඵලදායිව භාවිතා කරමින් ආර්ථිකමය වශයෙන් ස්ථාවර, පරිසර හිතකාමී වටපිටාවක් සහිත භෞතිකව සංවර්ධිත වූ සෞඛ්‍යමත් හා යහගුණැති සමාජ වටපිටාවක් සහිත සුන්දර නගරයක් ඇතිකිරීම අපේක්ෂා කෙරේ.

01 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මේ පසුබිම

සැලසුම් ක්‍රියාවලිය

1.4 සැලසුම් ක්‍රියාවලිය

පැල්මඩුල්ල හා කහවත්ත නගර සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම ආරම්භයේ සිට අවසානය දක්වා පියවරයන් කිහිපයක් යටතේ සැලසුම් කර ඇත. එම සැලසුම් ක්‍රියාවලිය සංක්ෂිතව පහතින් දක්වා ඇත.

1. මූලික අධ්‍යයනය (Background Studies)

මෙම නගර සංවර්ධන සැලැස්මේ මූලික අදියර ලෙස සංවර්ධනය කිරීමට යෝජිත ප්‍රදේශය පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කරන ලදී. ඒ අනුව නාගරික බල ප්‍රදේශයේ ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික ආදී සියලු පැතිකඩයන් මෙන්ම ප්‍රාථමික හා ද්විතියික දත්ත අධ්‍යයනය තුළින් සමස්ථ ප්‍රදේශය පිළිබඳ විශ්ලේෂණය කර ඇත.

ප්‍රාථමික හා ද්විතියික දත්ත අධ්‍යයනයට අමතරව මෙම ප්‍රදේශයට අදාළ වන ජාතික හා භෞතික සැලැස්ම, සබරගමුව කලාපීය ව්‍යුහ සැලැස්ම, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන විසින් පිළියෙළ කරන ලද සැලසුම් අධ්‍යයනය කිරීම තුළින් ප්‍රදේශයට අදාළ සංවර්ධන කාර්යයන් පිළිබඳ කරුණු අධ්‍යයනයන් සිදුකර ඇත.

2. විෂය පථය (Scoping)

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමට පවතින අවශ්‍යතාවය, ක්‍රියාත්මක කිරීමේ අරමුණු හා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මතුවූ අභියෝග පිළිබඳ කරුණු සංවර්ධන සැලැස්මේ විෂයපථය තුළට ඇතුළත් කර ඇත.

3. ගැටළු හා විභවතා හඳුනාගැනීම (Problems and Potentials)

ඉහත සඳහන් පියවරයන් මඟින් රැස්කරගත් සියලු ප්‍රාථමික හා ද්විතියික දත්ත විශ්ලේෂණය තුළින්, මෙම ප්‍රදේශයට අදාළ නව සංවර්ධන විභවතා හා ගැටළු හඳුනාගැනීම සිදුකර ඇත. එමෙන්ම නගරය පිළිබඳ මූලික අධ්‍යයනය තුළින් හඳුනාගත් ගැටළු විභවතා වලට අමතරව නාගරික පරිපාලන ආයතන,මෙන්ම විවිධ පර්ෂද කණ්ඩායම් සමඟ සිදුකරනු ලබන සාකච්ඡා වැඩසටහන් මඟින් ඔවුන්ගේ අත්දැකීම් හා පළපුරුද්ද ආශ්‍රිත කරුණු සාකච්ඡා කිරීම හරහා නගර සංවර්ධනයට පවතින අවශ්‍යතාවය හඳුනාගැනිම ද මෙම සංවර්ධන සැලැස්මේ එක් සුවිශේෂී අංගයක් විය. මෙහිදී සියලු පර්ෂද කණ්ඩායම් තුළින් ලබාගත් අදහස්, යෝජනා NVIVO මෘදුකාංගය තුළින් විශ්ලේෂණය කරමින් ඊට අදාළ වාර්තාව සකස් කරනු ලැබේ.

මතුපිටින් ගැටළු ලෙස කැපී පෙනෙන්නා වූ නගරයේ පවතින සියලුම ගැටළු බිම් මට්ටමින් සලකා බැලීමේදී සංවර්ධන සැලැස්ම තුළින්ම විසඳුම් සෙවිය යුතුද යන්න පිළිබඳව මෙහිදී අධ්‍යයනය කර ඇත. එහිදී හඳුනාගත් ගැටළු එකින් එක ගෙන බැලීමේදී අනෙකුත් ගැටළු අතරින් විශේෂ වීම (Significant), ඒවායේ සන්ධර්භය (context), අනෙක් ගැටළු හා සැසඳු විට එහි බලපෑමේ ප්‍රමාණාත්මකභාවය(magnitude) පිළිබඳ කරුණු විශ්ලේෂණය තුළින් ගැටළු පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත.

4. දැක්ම, අභිමතාර්ථ හා අරමුණු සැකසීම (Vision, Goals & Objectives)

මෙම නගරයන්හි සංවර්ධනය ක්‍රියාත්මක කිරීමට පවතින මූලික ගැටළු හා සංවර්ධන විභවතා අධ්‍යයනය තුළින් නගරයේ සංවර්ධන ගමන්මග වෙත ලඟාවීමේ මූලික අඩිතාලම වශයෙන්, වර්ෂ 2033 වන විට පැල්මඩුල්ල හා කහවත්ත නගර සංවර්ධනය විය යුතු ආකාරයට අදාළ "දැක්මක්"(Vision), අරමුණු (Goals) හා පරමාර්ථ(Objectives) ගොඩනගාගෙන ඇත.

5. සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය(Detail Analysis)

සංවර්ධන සැලැස්මේ දැක්ම, අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කිරීමට පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් සිදුකිරීම සඳහා ප්‍රධාන අභිමතාර්ථ තුනට `ශ.දු.අ.ත. විශ්ලේෂණයන්(SWOT Analysis), වෙන් වෙන් වශයෙන් සිදුකර ඇත.

6. සැලසුම් උපායමාර්ග සැකසීම (Strategies Formulation)

සංවර්ධන සැලැස්මේ අරමුණු ඉටුකරගැනීම සඳහා උපාය මාර්ග(Strategies) ඇතුළත් කර ඇත. මෙහිදී භූමිය හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග, සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග, ආර්ථික සංවර්ධන උපායමාර්ග හා තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග මෙන්ම සංස්කෘතික ආගමික හා උරුම කළමනාකරණ උපායමාර්ග වශයෙන් ප්‍රධාන උපාය මාර්ග 5ක් යටතේ සංවර්ධන සැලසුම් උපායන් සකස්කර ඇත. තවද අවකාශීය සංවර්ධන උපායමාර්ග යටතේ කලාපීයකරණය ද ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග යටතේ සංවර්ධන ව්‍යාපෘති අන්තර්ගත කර ඇත.

7. ව්‍යාපෘති හඳුනාගැනීම හා එම ව්‍යාපෘති සඳහා සුදුසු ප්‍රදේශ හඳුනාගැනීම (Identification, Establishment, Evaluation and Testing)

සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති හඳුනාගැනීම, ඒ සඳහා අවශ්‍ය ශාක්‍යතා අධ්‍යයනයන් සිදුකරමින් ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශ්වයන් හඳුනාගැනීම හා ස්ථාන පරීක්ෂාවන් සිදුකිරීම.

8. කලාපිකරණය හා රෙගුලාසි සැකසීම (Zoning and Regulations)

සැලසුම් ප්‍රදේශයේ කලාපීයකරණය සිදුකිරීම සඳහා පාරිසරික සංවේදීතා අධ්‍යයනය (Sensitivity Analysis), ජීවත්වීමට සුදුසු ප්‍රදේශ අධ්‍යයනය (Livability Analysis), හා සංවර්ධන ප්‍රවණතා(Development Pressure) අධ්‍යයනයන් හා ඝණත්වය මත පදනම්ව සංවර්ධන කලාප හඳුනාගැනීම හා ඒ ඒ කලාප සඳහා අදාළ නියමතා සැකසීම සිදුකර ඇත.

9. ලේඛනගත කිරීම, මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීම (Documentation and Public Consultations)

සංවර්ධන සැලැස්මේ මුලික අධ්‍යයනයේ සිට කලාපීයකරණය හා නියමතා සැකසීම දක්වා සියලු පියවරයන්ට අදාළ සංවර්ධන කාර්යයන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ප්‍රධාන භාෂා තුනට පරිවර්ථනය කරනු ලැබේ. ලේඛනගත කිරීමෙන් පසු සංවර්ධන සැලැස්ම පළාත් පාලන ආයතනවල අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත්කර මහජන අදහස් විමසීම සඳහා දින 60ක කාලයක් මහජන පුස්තකාල තුළ තබනු ලැබේ. තවද මෙම සැලසුම් ප්‍රදේශයට අදාළ ආයතන හා සංවිධාන නියෝජනය කරමින් සහභාගී වූ පර්ෂද කණ්ඩායම් වෙත දෙවන වරටත් කැදවමින් කෙටුම්පත් සංවර්ධන සැලැස්ම නැවත ඉදිරිපත්කර ඔවුන්ගේද එකගතාවයන් මත සංශෝධනයන් ඇත්නම් ඒවාද නැවත ඇතුළත් කරනු ලබයි.

10. සංශෝධනය හා ප්‍රකාශයට පත් කිරීම (Amendments & Publishing)

පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගැනීමෙන් හා මහජන ප්‍රදර්ශනයෙන් අනතුරුව සංශෝධනයන් ඇත්නම් එම සංශෝධනයන්ද ඇතුළත් කර නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රධාන සැලසුම් කමිටුවේ අනුමැතිය සහිත සංවර්ධන සැලැස්ම විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය හා අත්සන සහිතව අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

පරිච්ඡේදය 02

මූලික අධ්‍යයනය

02 වන පරිච්ඡේදය

මූලික අධ්‍යයනය

2.1 අධ්‍යයන ප්‍රදේශය

අධ්‍යයන ප්‍රදේශය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටියාවූ පැල්මඩුල්ල - කහවත්ත නගර, කොළඹ - මඩකලපුව (A 4) මාර්ගය හා පැල්මඩුල්ල - නෝනගම (A18) මාර්ගය සම්බන්ධ වන මංසන්ධි ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් ස්ථාපිතව ඇත. පැල්මඩුල්ල නගරය උතුරු අක්ෂාංශ 6°38'4.15"N හා නැගෙනහිර දේශාංශ 80°31'47.83"E අතර ද කහවත්ත නගරය උතුරු අක්ෂාංශ 6°34'57.18"N හා නැගෙනහිර දේශාංශ 80°34'27.83"E අතර ද පිහිටා ඇත. පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම නගර මධ්‍යය ප්‍රදේශ ඇතුළත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හා කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් මෙන්ම ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් තුනක කොටස්වලින් සමන්විත වර්ග කිලෝමීටර් 35 ක ප්‍රදේශයට බලාත්මක වුවද, මෙම සැලැස්ම සකස් කිරීමේදී අධ්‍යයන ප්‍රදේශය ලෙස පැල්මඩුල්ල, කහවත්ත, ගොඩකවෙල, ඕපනායක හා නිවිතිගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් වර්ග කිලෝමීටර් 231 ක පමණ වපසරියක් අධ්‍යයන ප්‍රදේශය ලෙස යොදාගෙන ඇත.

භූමි භාවිතයන්

මෙම සංවර්ධන සැලැස්මේ අධ්‍යයන ප්‍රදේශයට අදාළ භූමි භාවිතය (සිතියම් අංක 2.1) පිළිබඳ අධ්‍යයනයට අනුව වැඩිම භූමි භාවිත ප්‍රතිශතයක් රබර් හා තේ වගාව සඳහා යොදාගෙන ඇත. එමෙන්ම නේවාසික හා තේ වගාව සඳහා ද වැඩි භූමි භාවිතයක් පෙන්නුම් කර ඇත. ඒ අනුව දැනට පවතින භූමි පරිහරණ රටාව තුළින් මෙම ප්‍රදේශය කෘෂිකාර්මික කටයුතු සඳහා වැඩි ප්‍රවණතාවයක් දක්වන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

වගු අංක **2.1 :** භූමි භාවිතයන්

භූමි භාවිතය	හෙක්ටයාර්	ප්‍රතිශතය
වාණිජ	28.58	0.10
නේවාසික	**4312.46**	**18.60**
අධ්‍යාපන	36.28	0.20
ආගමික	9.65	0.00
සෞඛ්‍යය	3.704	0.00
කර්මාන්ත	39.75	0.20
ආයතනික	2.10	0.00
මාර්ග	951.50	4.10
කුඹුරු	1241.70	5.40
රබර්	**4756.80**	**20.50**
තේ	**3430.20**	**14.80**
පාෂාණ	84.60	0.40
පොල්	20.69	0.10
හේන්	**4853.90**	**20.90**
අනෙකුත් වගාවන්	275.30	1.20
තෙත්බිම්	12.80	0.10
ලදු කැලෑ	266.0	1.10
වනාන්තර	2543.5	11.00
තෘණ බිම්	101.4	0.40
ජල මූලාශ්‍ර	220.9	1.00
එකතුව	**23191.8**	**100**

මූලාශ්‍රය : සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අධි. – 2020

ඉහත සඳහන් භූමි භාවිතයන්ට අනුව අධ්‍යයන ප්‍රදේශය තුළ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 23191.8 ක් වේ. ඉන් 77%ක් සංවර්ධනයට ගතහැකි භූමි වන අතර 27% ක් සංවර්ධනයට ගත නොහැකි භූමි භාවිතයන් වේ. මෙහිදී සංවර්ධනයට ගත නොහැකි භූමි ලෙස මාර්ග, කුඹුරු, පාෂාණ, තෙත්බිම්, ලදු කැලෑ, වනාන්තර හා ජල මූලාශ්‍ර ඇතුළත් කර ඇත.

සිතියම් අංක 2.1 : අධ්‍යයන ප්‍රදේශයේ භූමි භාවිතයන්



2.2. සැලසුම් සීමාව නිර්ණය කිරීම

2.2.1. හැඳින්වීම

පැල්මඩුල්ල - කහවත්ත නගරයන්හි සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීමේ දී ප්‍රධාන වශයෙන් නගරයේ භූගෝලීය පිහිටීම (Geographical Boundary), ක්‍රියාකාරිත්වමය පිහිටීම (Functional Boundary), හා පරිපාලනමය සීමාවන් (Administrative Boundary) අධ්‍යයනය කරමින් සැලසුම් සීමාව නිර්ණය කර ඇත.

2.2.2. ක්‍රියාකාරි සීමාව

රත්නපුර නගරය හා ඇඹිලිපිටිය නගරය අතර පිහිටි පැල්මඩුල්ල හා කහවත්ත නගර දෙක ඒකාබද්ධ නගර සංවර්ධන සැලැස්මක් තුළට ඇතුළත් කිරීම සඳහා මෙම නගර දෙක අතර පවතින ක්‍රියාකාරිත්වමය පිහිටීම් සීමාව (Functional boundary) පිළිබඳ විශේෂ අවධානයක් යොමු කර ඇත. පරිපාලන සීමාවන්ට අනුව පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන්වන්නේ වේ ගඟ සීමාවෙනි.

පරිපාලන සීමාවන් එසේ වෙන්වුවද කහවත්ත නගරයේ ක්‍රියාකාරිත්වමය සීමාව ආරම්භ වනුයේ පැල්මඩුල්ල නගරයේ පරිපාලන සීමාව තුළය. එනම් කහවත්ත නගරයේ ඔරලෝසු කණුව හා පැරණි දුම්රිය නැවතුම්පොළ (වර්තමානයේ බස් නැවතුම්පොළ) පිහිටා ඇත්තේ පැල්මඩුල්ල නගරයේ පරිපාලන සීමාව තුළය. නගරයේ පවතින මෙම ක්‍රියාකාරිත්වමය පිහිටීම් හේතුවෙන් නාගරික අවශ්‍යතා සපුරා ගැනීමට පැමිණෙන පුද්ගලයන්ගෙන් බොහොමයක් පැල්මඩුල්ල නගරයේ පරිපාලන සීමාවට පැමිණීම හඳුනාගත හැකිය. නාගරික සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය තුළින් ද ඉස්මතු වන ලක්ෂණයක් වන්නේ පැල්මඩුල්ල නගරයේ සංවර්ධනය කහවත්ත නගරය දෙසට ව්‍යාප්ත වන බවයි (සිතියම් අංක 2.2).

සිතියම් අංක 2.2: සංවර්ධන ප්‍රවණතා අධ්‍යයනය



2.2.3. භූගෝලීය සීමාව

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පැල්මඩුල්ල නගරය උතුරු අක්ෂාංශ 6°37'32.50"අතරද, නැගෙනහිර දේශාංශ 80°32'19.45"අතරද පිහිටා ඇති අතර කහවත්ත නගරය උතුරු අක්ෂාංශ 6°34'50.28" අතරද, නැගෙනහිර දේශාංශ 80°34'25.13" අතර වන පරිදි පිහිටා ඇත. මෙම ප්‍රදේශයේ භූ විෂමතාවය පිළිබඳව සැලකීමේදී මුහුදු මට්ටමේ සිට උස මීටර් 480 – 3500 ත් අතර පරාසයක විහිදී ඇති අතර මෙම නගර කඳු වලින් වටවූ නිම්න ප්‍රදේශයක පිහිටා ඇත (සිතියම් අංක 2.3).

කිරිබත්ගල කඳුවැටිය හා කුට්ටපිටිය කඳුවැටිය අතර පිහිටි මෙම ප්‍රදේශය බේසම් ද්‍රෝණියක හැඩය ගෙන ඇත. නිම්න භූමියක පිහිටියත් භූ විෂමතාවය අනුව තැනින් තැන විවිධ උස මට්ටමින් යුතු කුඩා කඳු ගැට, මෙම ප්‍රදේශය තුළ දැකගත හැකිවේ. එමෙන්ම ප්‍රදේශයේ ස්වභාවික ජලවහන රටාව දෙනවක ගඟ හා වේ ගංගාව මෙන්ම ස්වභාවික ඇළ, දොළ මූලික කරගනිමින් නිර්මාණය වී ඇත.

එසේම ප්‍රදේශයෙන් ලැබෙන භූමි සම්පත් අතර "චානොකයිට්ස්" නැමැති පාෂාණ විශේෂය හේතුවෙන් මැණික් ඉල්ලම් සුලභ වීමත් වෙනත් පාෂාණ විශේෂයන් වූ පෙල්ස්පා, කැල්සයිට්, විවිධ මැටි වර්ග හා වැලි සහිත භූමියකින් මෙම ප්‍රදේශය සමන්විත වේ. (මූලාශ්‍රය: සබරගමුව වංශ කතාව, 2 වෙළුම) මෙවැනි භූ විෂමතා ලක්ෂණ වලින් සමන්විත මෙම ප්‍රදේශයේ පවතින දේශගුණික හා භූගෝලීය සාධක මත ගං වතුර, නාය යෑම් වැනි ස්වභාවික ආපදාවන්ගේ බලපෑම් සහිත ප්‍රදේශයකි.

සිතියම් අංක 2.3: භූගෝලීය පිහිටීම



2.2.4. පරිපාලන සීමාව

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කහවත්ත හා පැල්මඩුල්ල නාගරික බල ප්‍රදේශය, පැල්මඩුල්ල, කහවත්ත හා ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත්ව පිහිටා ඇත. මෙම නාගරික බල ප්‍රදේශය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව, කහවත්ත ප්‍රාදේශීය සභාව හා ගොඩකවෙල ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන තුන යටතට අයත් පාලන බල ප්‍රදේශ තුළ පිහිටා ඇත. මෙම පළාත් පාලන බලප්‍රදේශයන්ට අයත් කහවත්ත හා පැල්මඩුල්ල නාගරික බල ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමේදී නාගරික ක්‍රියාකාරකම් ව්‍යාප්තිය, භූගෝලීය පිහිටීම් හා නාගරික සංවර්ධන ප්‍රවණතාවයන් පිළිබඳ අවධානය යොමු කර ඇත.

එමෙන්ම මෙම ප්‍රදේශ සඳහා සිදුකරන ලද සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය, පාරිසරික සංවේදිතා විශ්ලේෂණය, කලාපීය සබඳතා විශ්ලේෂණ තුළින් අනාගත නාගරික සංවර්ධන ප්‍රවණතා හඳුනාගෙන ඇත.

වගු අංක 2.2: පරිපාලන සීමාවන් (පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය)

නාගරික බල ප්‍රදේශය	පළාත් පාලන ආයතනය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ආවරණිත ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය	සම්පූර්ණ භූමි ප්‍රමාණය
කහවත්ත නාගරික බල ප්‍රදේශය	කහවත්ත ප්‍රාදේශීය සභාව, ගොඩකවෙල ප්‍රාදේශීය සභාව, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව	කහවත්ත ගොඩකවෙල පැල්මඩුල්ල	12	ව. කි. 9.1
පැල්මඩුල්ල නාගරික බල ප්‍රදේශය	පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව	පැල්මඩුල්ල	17	ව.කි. 25.7

සිතියම් අංක 2.4 : පරිපාලන සීමාවන් (පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය)



2.2.5. සැලසුම් සීමාව

පැල්මඩුල්ල නගරයේ සංවර්ධන ප්‍රවණතාවයන් අධ්‍යයනයේදී, විශේෂිත ලක්ෂණයක් ලෙස නාගරික සංවර්ධන ප්‍ර පැල්මඩුල්ල නගරයේ සිට කහවත්ත නගරය දෙසට ව්‍යාප්තවීමක් හඳුනාගෙන ඇත. කඳු වලින් වට වූ නිම්නයක පිහිටි මෙම නගර දෙකේ භූගෝලීය පිහිටීම අනුව ද මෙම නගර ඒකාබද්ධ කර සැලසුම් කිරීම වඩා යෝග්‍ය බවට හඳුනාගෙන ඇත. මේ අනුව ඉහත සඳහන් ක්‍රියාකාරිත්වමය කලාප, භූගොලීය ලක්ෂණ හා පරිපාලන සීමාවන් පිළිබඳ අධ්‍යයනයන් තුළින් හඳුනාගත් ලක්ෂණ අනුව පැල්මඩුල්ල හා කහවත්ත නගර ඒකාබද්ධ කර සැලසුම් සීමාව හඳුනාගෙන ඇත මෙම නාගරික සැලසුම් ප්‍රදේශය වර්ග කිලෝමීටර් 35කින් සමන්විත වන අතර ග්‍රාම නිලධාරි වසම් 24 කට අයත් වේ. මෙම ග්‍රාම නිලධාරි වසම් අතරින් වසම් දහයක සම්පූර්ණයෙන්ම නාගරික සැලසුම් ප්‍රදේශයට අයත්ව පවතින අතර, අනෙකුත් වසම්වලින් කොටසක් බැගින් ඇතුළත් වී ඇත.

වගු අංක 2.3: භූමි භාවිතයන් (පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය)

ග්‍රාම නිළධාරි වසම	නාගරික සැලසුම් ප්‍රදේශයට අයත් වන භූමි ප්‍රතිශතය
දොඹගස්වින්න	53%
සන්නස්ගම	63%
ගොඩගම	50%
දෙනවක පාතකඩ	100%
ගනේගම	63%
රිල්හේන	100%
පැල්මඩුල්ල නගරය	100%
පහල බෝපිටිය	100%
පැල්මඩුල්ලගම	100%
ඉහළ බෝපිටිය	100%
දෙනවක උඩකඩ	39%
බොරාල	70%
පනාවැන්න	100%
කපුහේන්තොට	100%
පොරෝනුව	100%
කට්ටන්ගේ	29%
නුගවෙල නැගෙනහිර	100%
නුගවෙල බටහිර	100%
යායින්න	15%
බුංගිරිය	30%
වැල්ලදූර	76%
දිඹුල්වල	20%
හපුරුදෙනිය	27%
කොටකෙතන	51%

මූලාශ්‍රය : සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අධි.

සිතියම් අංක 2.5: පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය



පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය

0 0.3 0.6 1.2 1.8 2.4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
පෙබරවාරි 2022

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම (2022 - 2032)

සැකසුම : සැලසුම් අංශය
සබරගමුව පළාත් කාර්යාලය

2.3 සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය

2.3.1. නගරයේ ඓතිහාසික පසුබිම

පුරාණ කාලයේ වෙළදාම් කටයුතු සඳහා බදුල්ල හා ඇඹිලිපිටිය නගරය වෙත ගමන් කළ වෙළෙඳුන් පැල්මඩුල්ල නගරය හරහා ගමන්කර ඇත. එහිදී ගමන් විඩාව මගහරවා ගෙන විවේක ගැනීම සඳහා තාවකාලික පැල්පත් ඉදිකර ඇත. මෙලෙස මඩුල්ලක් ආකාරයට පැල්පත් රාශියක් ඉදිකර පැවති බැවින් “පැල්මඩුල්ල” යනුවෙන් ව්‍යවහාර වූ අතර ඒ අනුව “පැල්මඩුල්ල” යන නම පැල්මඩුල්ල නගරයට ලැබී ඇත.

පැල්මඩුල්ල නගරය ආශ්‍රිතවම පිහිටා ඇති කහවත්ත නගරයේ ඉතිහාසය ද ලක්දිව පාලනය කළ දෙවන රාජසිංහ රජ සමය දක්වා දිව යයි (ක්.ව.16.17 සියවස). එවකට කහවත්ත ප්‍රදේශය රජයේ නින්දගමක් වශයෙන් පාලනය වී ඇති බවත්, පොතුවිල් දිසාව පාලනය කළ වික්‍රමසිංහ නැමැති නරපතියෙකු රජුගේ අණ පරිදි කොළඹ කොටුවේ යුද්ධයට යැවූ බවත්, ඔහු විසින් එම සටනේදී කළ වික්‍රමයන් හේතුවෙන් ගම්වරයක් වශයෙන් මෙම ප්‍රදේශය තෑගි කළ බවත් සඳහන් වේ. එම නින්දගම අතීතයේ දි මහ සමන් දේවාලය සඳහා අවශ්‍ය කහ ලබාගත් ප්‍රදේශයක්ව පැවති බැවින් පසු කාලීනව එය කහඳුන් වත්ත “කහවත්ත” ලෙස ව්‍යවහාර වන්නට වූ බවත් ජනප්‍රවාදයේ සඳහන් වේ.

අනුරාධපුර යුගය (ක්‍රි.පූ.377 - ක්‍රි.ව.1017)

අනුරාධපුර යුගය වනවිට ශ්‍රී ලංකාව රුහුණු, මායා, පිහිටි යනුවෙන් කොටස් තුනකට බෙදා පාලනය වූ අතර පැල්මඩුල්ල හා කහවත්ත නගර මායා කොටසට අයත් විය. එවකට සතුරු ආක්‍රමණ වලින් ආරක්ෂා වීම සඳහා සැඟවී සිටීමට මෙම ප්‍රදේශය භාවිතා කර ඇත. අනුරාධපුර යුගය තුළ මෙම ප්‍රදේශයේ ජනාවාස ආරම්භ වී නොතිබුන අතර කෘෂිකාර්මික කටයුතු සඳහාද යොදාගෙන නැත. නමුත් මැණික් කැණීම් කටයුතු සඳහා ප්‍රචලිතව පැවති අතර එම සියලු සම්පත් රජු යටතේ පාලනය වි ඇත.

පොළොන්නරු යුගය (ක්‍රි.ව.1056- ක්‍රි.ව.1232)

පරාක්‍රමබාහු රජු පොළොන්නරුව රාජධානියේ රාජ්‍ය පාලනය කරන සමයේ රටේ රාජ්‍යත්වය සංකේත කරනු ලබන ශ්‍රී දළදා වහන්සේගේ හා පාත්‍ර ධාතුන් වහන්සේගේ

භාරකාරත්වය සුගලා දේවිය සතු විය. රටේ රාජ්‍යත්වය තහවුරු කරගැනීම සඳහා ශ්‍රී දළදා වහන්සේගේ හා පාත්‍ර ධාතූන් වහන්සේගේ භාරකාරත්වය පරාක්‍රමබාහු රජු වෙත ලබාගැනීමට අවශ්‍ය වූ බැවින් ඒ සඳහා සුගලා දේවිය හා සටන් වැදීමට රජු තීරණය කර ඇත. එවකට රණකාමී දේවියක් වූ සුගලා දේවිය පැල්මඩුල්ල ප්‍රදේශයේ තම සේනාව හා සමග සැඟව සිට ඇත. (මූලාශ්‍රය: සබරගමු වංශකතාව, වෙළුම i, පිටු 266,268 සබරගමු වංශකතාව, වෙළුම ii, පිටු 627)

එකල පැල්මඩුල්ල නගරයේ දෙනවක ප්‍රදේශය "දෝන වක්කා" ලෙස හඳුන්වා තිබුණි. එමෙන්ම සබරගමුව වංශ කතාවට (ii වෙළුම) අනුව රජරට හා රුහුණුරට අතර යුද පිටියක් ලෙස මෙම ප්‍රදේශය භාවිතයට ගෙන ඇති බවද සඳහන්ව ඇත (මූලාශ්‍රය: සබරගමු වංශකතාව, වෙළුම ii, Pages 458)

පොළොන්නරු යුගය වනවිටද මෙම ප්‍රදේශය කැලෑවෙන් ආවරණය වී පැවති අතර ජනාවාස වී නොතිබුණි. පොළොන්නරු රාජධානි සමයෙන් පසු දඹදෙණිය, යාපහුව, කුරුණෑගල හා ගම්පොළ යුගය තුළ මෙම ප්‍රදේශය පිළිබඳ විශේෂ සඳහනක් සටහන් වී නොමැත.

කෝට්ටේ රාජධානිය (ක්‍රි.ව. 1412 -ක්‍රි.ව.1597)

කෝට්ටේ යුගයේ ගනේගම පිහිටි අරමන්පොල රජමහා විහාරය 4 වන පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකරන ලදැයි සැලකේ. මෙම විහාරය අසළින් දෙනවක ගඟ ගලා යන අතර මෙම විහාරස්ථානය ඉදිවීමත් සමග ඒ ආශ්‍රිතව ජනාවාස ආරම්භ වී ඇත. එම ජනාවාසවල ජීවත් වූ ජනතාව කුඹුරු හා හේන්වගාවන් සිදුකරමින් තම ජීවනෝපාය ගෙනගොස් ඇත.

සීතාවක යුගය (ක්‍රි.ව. 1521 - ක්‍රි.ව.1593)

සිතාවක යුගයේ මෙම ප්‍රදේශය මායාදුන්න කුමරු යටතේ පාලනය විය. ඔහුගේ රාජධානිය පැල්මඩුල්ලට ආසන්න බටුගෙදර ප්‍රදේශයේ අවුරුදු තුනක් පවත්වාගෙන ගොස් ඇත. මායාදුන්න රජුගේ මරණින් පසු ඔහුගේ පුත් රාජසිංහ රජු දන්ත ධාතූන් වහන්සේ සමන් දේවාලයේ තැම්පත් කර ඇත. එකල පැල්මඩුල්ල ඇතුළු ගම්මාන හතක් දන්තධාතූන් වහන්සේ වැඳ නමස්කාරයට එහි පැමිණ ඇත. (මූලාශ්‍රය: සබරගමු වංශකතාව, වෙළුම i, පිටු 294)

නුවර යුගය (ක්‍රි.ව. 1590 - ක්‍රි.ව. 1815)

සීතාවක රාජධානියේ බිඳ වැටීමත් සමග සබරගමුව පළාත මහනුවර රාජධානිය හා විදේශ ආක්‍රමණිකයින් යටතේ පාලනය විය. නුවර යුගය තුළ සබරගමුව පළාත පස්වන මහා දිසාව ලෙස හඳුන්වා ඇත. එයට ප්‍රධාන කෝරල හතක් ඇතුළත් වූ අතර පැල්මඩුල්ල නවදුන් කෝරලයට ඇතුළත් විය. (මූලාශ්‍රය: රත්නපුර උරුමය (ඓතිහාසික රත්නපුර) පිටුව 57)

යටත්විජිත පාලන සමය

පෘතුග්‍රීසි පාලන සමය (ක්‍රි.ව. 1505 – 1658)

ක්‍රි. ව. 1505 දි පෘතුග්‍රීසීන් ලංකාවට පැමිණීමත් සමග ලංකාවේ පරිපාලන කටයුතු ද වෙනස් විය. මේ අනුව සබරගමුව පළාත නුවර යුගය තුළ ප්‍රධාන කෝරල 7 කට බෙදා වෙන්කර තිබු අතර ඉන් කොලොන්න කෝරලය හා කඩවතු කෝරලය ඉවත් කර හේවාවසම් කෝරලය, දෙහිගම්පොල කෝරලය, පනවල් කෝරලය හා අටළුගම කෝරලය එකතු කර ඇත. මේ කාලය තුළ පැල්මඩුල්ල සබරගමුව දිසාවට අයත් විය.

19 වන සියවස වනවිට ශ්‍රී ලංකාව මුහුදුබඩ ප්‍රදේශ හා උඩරට පරිපාලන ප්‍රදේශ ලෙස ප්‍රධාන පරිපාලන ප්‍රදේශ දෙකකට බෙදන ලදී. ඒ අනුව සබරගමුව පළාත උඩරට පරිපාලන ප්‍රදේශයට අයත් විය. (මූලාශ්‍රය: රත්නපුර උරුමය (ඓතිහාසික රත්නපුර) පිටුව 58)

බ්‍රිතාන්‍ය පාලන සමය (ක්‍රි.ව. 1796 -1948)

වර්ෂ 1887 රත්නපුර නගරය දේශීය සභාවක් බවට පත් වූ අතර ප්‍රධාන කෝරල 7 කට බෙදා පාලනය කර ඇති අතර එවකට පැල්මඩුල්ල නවදුන් කෝරලය ලෙස හඳුන්වා ඇත. බ්‍රිතාන්‍ය පාලන සමයේ වර්ෂ 1892 දී හින්ග්ලි ආයතනය විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ තේ වගාව ආරම්භ කර ඇත. එම තේ වතුවල වැඩ කිරීම සඳහා දකුණු ඉන්දියාවෙන් දෙමළ ජනතාව ගෙන්වා පදිංචි කර ඇත. දැනටත් දැකගත හැකි රිල්හේන වතුයාය එකළ ආරම්භ කරන ලද වතුයායක් වන අතර එම වතු ආශ්‍රිතව රෝහල්, පාසල්, හින්දු කෝවිල් හා ලයින් කාමර බ්‍රිතාන්‍යන් විසින් ඉදිකර ඇත. (මූලාශ්‍රය: රත්නපුර උරුමය (ඓතිහාසික රත්නපුර) පිටු 56 – 59)

පැල්මඩුල්ල නගරයට සමීපව පිහිටා ඇති සුදර්ශන ධර්ම ශාලාව සමන් දේවාලයේ බස්නායක නිළමේ වශයෙන් සිටි ඉද්දමල්ගොඩ නිළමේතුමා විසින් වර්ෂ 1867 – 1868 කාලය තුළ ඉදිකර ඇත. 19 වන සියවසේ මුල් භාගයේ ඉද්දමල්ගොඩ

බස්නායක නිළමේ විසින් ඉදිකරන ලද ලන්දේසි හා බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ශිලිපිය ලක්ෂණ සහිත ඉද්දමල්ගොඩ වලව්ව අදටත් දැකගත හැකිය.

වර්ෂ 1905 -1908 අතර කාලය තුළ බ්‍රිතාන්‍යයන් විසින් පැල්මඩුල්ල හා කහවත්ත නගරයේ රබර් වගා කර ඇත. පැල්මඩුල්ල මධ්‍ය විද්‍යාලය වර්ෂ 1829දි ගනේගම ගොදගහවත්ත බෞද්ධ මිශ්‍ර පාසලක් ලෙස ආරම්භ කර ඇත. වර්ෂ 1946 දි සි.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා විසින් මෙම පාසල පැල්මඩුල්ල මධ්‍ය විද්‍යාලය බවට පත්කර ඇත.

මෙම නගරයේ මාර්ග යටිතල පහසුකම් වර්ෂ 1832 ආරම්භ කර ඇත. එනම් රත්නපුර බදුල්ල මාර්ගය පැල්මඩුල්ල නගරය හරහා ඉදිකර ඇත. වර්ෂ 1851 – 1870 අතර කාල සීමාව තුළ ප්‍රධාන මාර්ගය හා සම්බන්ධව ආරම්භ වන බොහෝ අතුරු මාර්ග ප්‍රමාණයක් ඉදිකර ඇති අතර ඒවා බොරලු පාරවල් ලෙස ඉදිකර ඇත. (මුලාශ්‍රය :Formation of the Pelmadulla, හර්ෂනී සිල්වා, 2015)

මෙම කාලය තුළ මැණික් ගැරීම, මැණික් කැපීම හා මැණික් ව්‍යාපාර කටයුතුද සිදු කර ඇත. සැලකිය යුතු පිරිසක් වතු වගාවේ නියැලුණු අතර බොහෝ දෙනෙක් කුඩා තේ වතු ආරම්භ කර ඇත. බ්‍රිතාන්‍ය පරිපාලන කාල සීමාවට පෙර සාමාන්‍ය ජන ජිවිතයක් ගතකල ජනතාව ස්වයංපෝෂිත ආර්ථිකයකින් වාණිජ ආර්ථිකයට මාරු වී ඇත.

මෙසේ ක්‍රමයෙන් විකාශනය වෙමින් ඉංග්‍රීසි අධිරාජ්‍යයට යටත්ව පැවති මෙම ප්‍රදේශයේ තේ හා රබර් වගාව ව්‍යාප්ත වූ අතර ඒ හේතුවෙන් දුම්රිය මාර්ගයක් මෙන්ම දුම්රිය නැවතුම්පලවල් ද ස්ථාපනය වි ඇත.

නිදහසින් පසු

නිදහසින් පසු මෙම ප්‍රදේශයේ පරිපාලන කටයුතු වල සුවිශේෂී වෙනස්කම් සිදු වී ඇත. වර්ෂ 1959 දී පැල්මඩුල්ල ඡන්ද බල ප්‍රදේශයක් බවට පත්ව ඇත. (Reference: Sabaragamu Wanshakathawa volume iii, page 1229)

වර්ෂ 1960 දි පැල්මඩුල්ල ගම් සභාව ආරම්භ විය. වර්ෂ 1977 දී ගම් සභාව, සංවර්ධන සභාව බවට පත්වූ අතර, වර්ෂ 1987 දි පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව බවට පත්විය.

කහවත්ත නගරයේ පරිපාලනය වර්ෂ 1963 සිට සුළු නගර සභාවක් යටතේද, වර්ෂ 1987 සිට සංවර්ධන සභාවක් යටතේ ද, වර්ෂ 1988 සිට ප්‍රාදේශීය සභාවක් යටතේද, පාලනය විය.

2.3.2. ජාතික හා කලාපීය ප්‍රතිපත්ති

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නාගරික ධූරාවලියට අනුව සිව්වෙනි ස්ථානය හිමිකරගෙන පවතින පැල්මඩුල්ල හා කහවත්ත නගර, රත්නපුර ප්‍රධාන නගරය හා දෙවනපෙළ නගරයක් වන ඇඹිලිපිටිය නගරයට මැදිව, කොළඹ - මඩකලපුව (A 4) හා පැල්මඩුල්ල - නෝනගම (A 18) මාර්ග කේන්ද්‍රකර ගනිමින් ස්ථාපිතව ඇත.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2050 සඳහා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම තුළින් ආර්ථික සංවර්ධන කොරිඩෝ හතරක් නම්කර ඇති අතර, එහි දක්ෂිණ ආර්ථික සංවර්ධන කොරිඩෝවට අයත් ඇඹිලිපිටිය නගරය හා රත්නපුර ආර්ථික සංවර්ධන ප්‍රදේශය අතර පිහිටි පැල්මඩුල්ල හා කහවත්ත නගරය මධ්‍යම පාරිසරික සංවේදී කලාපයට ඇතුළත් කර ඇත (රූපය අංක.2.1).

තවද ජාතික භෞතික සැලස්ම තුළ ආර්ථික සංවර්ධන ප්‍රදේශ ව්‍යාප්තියට අදාළව, පතල් හා ඛනිජ කැණීම් කර්මාන්තය මූලික කරගත් ආර්ථික සංවර්ධන ප්‍රදේශ සඳහා මෙම සැලසුම් ප්‍රදේශය අයත් වේ. දුම්රිය මාර්ගය හා ෆයිබර් ඔප්ටික් ජාලය පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යය හරහා ව්‍යාප්තව කිරීමට හඳුනාගෙන ඇත. එවැනි ජාතික මට්ටමේ සංවර්ධනයන්හි ප්‍රතිලාභ විධිමත්ව යොදවමින් මෙම ප්‍රදේශයේ පවතින පාරිසරික සංවේදීභාවය ආරක්ෂා කරමින් ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා කලාපීය මට්ටමේ සංවර්ධනයක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

රූප සටහන අංක 2.1: ජාතික භෞතික සැලැස්ම 2050

Figure 5.1 : The Proposed Spatial Structure - 2050



මූලාශ්‍රය: ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

තවදුරටත් මෙම කලාපය සඳහා විශේෂිත ප්‍රතිලාභ අත්වන විශේෂිත ව්‍යාපෘතියක් ලෙස යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය හඳුනාගත හැකිය. පැල්මඩුල්ල පනාවැන්න ප්‍රදේශයේ සඳහා අන්තර් හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත වීමට යෝජිතය. එම අන්තර් හුවමාරුවේ සිට පැල්මඩුල්ල නගරය දක්වා දුර කිලෝ මීටර් 3.5 ක් ද කහවත්ත නගරය දක්වා දුර කිලෝමීටර් 2.6 ක් ද වේ.

පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම සඳහා පාදක කරගනු ලැබූ අධ්‍යයන ප්‍රදේශය තුළ පවතින භෞතික, ආර්ථික, පාරිසරික හා සාමාජීය පැතිකඩයන් වෙත අවධානය යොමුකරමින් අධ්‍යයන ප්‍රදේශය පිළිබඳ තත්ත්ව විශ්ලේෂණයක් සිදුකර ඇත. අධ්‍යයන ප්‍රදේශයේ සාමාජීය පැතිකඩ පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකිරීම තුළින් කලාපයේ ජනගහනය, අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් යනාදී සාමාජීය යටිතල පහසුකම් මෙන්ම එකී ක්ෂේත්‍රයන් තුළ පවතින ප්‍රවර්ධනයන් හඳුනාගෙන ඇත.

2.3.3. පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්ට අදාළව පෙර සකස් කරන ලද සංවර්ධන සැලසුම්

පැල්මඩුල්ල හා කහවත්ත නගර සබරගමුව පළාතේ පවතින සිව්වන පෙළ නගර වශයෙන් කඩිනමින් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන පැවතුන ද මේවන තෙක් මෙම නගර සඳහා සංවර්ධන සැලසුම් සකස් කර නොමැත. විවිධ අවස්ථාවන් වලදී සංවර්ධන සැලසුම් සකස් කිරීමට ගත් උත්සාහයන් විවිධ හේතු මත අසාර්ථක වී ඇත.

2.3.4. සාමාජීය, ආර්ථික, භෞතික හා පාරිසරික සන්දර්භය

ජනගහනය

රූප සටහන අංක 2.2: ජනගහනය



මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව-2019

ජනගහනය පිළිබඳ අධ්‍යයනයේදී විවිධ කාණ්ඩ යටතේ ජනගහන වර්ගීකරණය, ජනඝණත්වය, හා ජනගහන වර්ධන වේගය පිළිබඳ අධ්‍යයනය කර තත්ත්ව විශ්ලේෂණයක් සිදුකර ඇත. පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සමස්ථ ජනගහනය 142,899 (2019) කි. එම ජනගහනයෙන් 30% ක ජනගහනයක් පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය තුළ ජීවත් වේ. මෙම ප්‍රදේශයේ සාමාන්‍ය ජනගහන වර්ධන වේගය 1.5% කි.

නාගරික සැලසුම් ප්‍රදේශයේ වැඩිම ජනගහනයක් එනම් 64% ක ප්‍රතිශතයක් ග්‍රාමීය ජනගහනය වේ. වතු ජනගහනය 19% ක් වන අතර නාගරික ජනගහනය 17% කි. මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ ජනවාර්ගික පදනම අනුව වැඩිම ප්‍රතිශතයක් වශයෙන් 87% ක සිංහල ජනගහනයක් වාර්තා වන අතර ආගම අනුව 86.9% ක බෞද්ධ ජනගහනයක් වාර්තා වේ. වයස් කාණ්ඩ අනුව ජනගහන ව්‍යාප්තිය තුළ 44.5% ක වැඩිම අගය අවුරුදු 20-50 ත් අතර වයස් කාණ්ඩය යටතේ වාර්තා වේ. 32% ක ජනගහනයක් අවුරුදු 0-20 ත් අතර වයස් කාණ්ඩය යටතේද අඩුම ප්‍රතිශතය

වන 23.5% ක ජනගහනය අවරුදු 50 ට වැඩි වයස් කාණ්ඩය යටතේ ද වාර්තා වී ඇත.

මෙම ජනගහන දත්තයන්ට අනුව වැඩ කරන වයසේ ජනගහනය වශයෙන් සැලකිල්ලට ගතහැකි වයස අවුරුදු 20-50ත් අතර 44.5%ක් තරම් වැඩි ප්‍රතිශතයක් අධ්‍යයන ප්‍රදේශ තුළ ජීවත්වීම සංවර්ධන කාර්යයයන් සඳහා දායකත්වය ලබාගත හැකි වඩා වැදගත් ප්‍රබලතාවයක් වශයෙන් හඳුනාගෙන ඇත. (ඇමුණුම් ප්‍රස්ථාර අංක. 2.1).

පැල්මඩුල්ල හා කහවත්ත නගර අවට ව්‍යාප්තව පවතින කුඩා නගර මධ්‍යස්ථාන වන පනාවැන්න, කෙටෛතැන්න, වටාපොත, ඇන්දාන, වෙරළුගහමුල, රිදීවිට, මාදම්පේ හා අම්බලන්වත්ත ප්‍රදේශවල නගරවාසීන් තම ආර්ථික, සෞඛ්‍ය හා පරිපාලන සේවා සඳහා පැල්මඩුල්ල හා කහවත්ත නගරයට පැමිණේ. නගරාශ්‍රිත ජනතාවට අමතරව රත්නපුර, බේරුවල ආදී විවිධ පළාත් වල මැණික් ව්‍යාපාරිකයින් මැණික් මිලදී ගැනීම සඳහා පැල්මඩුල්ල නගරයට පැමිණේ. මේ අනුව, දෛනිකව 65,000ක් පමණ සංසරණ ජනගහනයක් මෙම නගර වෙත පැමිණීම හඳුනාගෙන ඇත.

නිවාස

රූප සටහන අංක 2.3: නේවාසික ව්‍යාප්තිය -2020



මූලාශ්‍රය: ග්‍රාම නිලධාරි දත්ත , සැලසුම් ප්‍රදේශය -2020

නේවාසික ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනයේදී, හඳුනාගත හැකි පොදු ලක්ෂණය වන්නේ ප්‍රධාන මාර්ග ආශ්‍රිතව නේවාසික ඝනත්වය වැඩිව පැවතීමයි. මෙම ප්‍රදේශයේ පවතින භූගෝලීය පිහිටීමද ඊට හේතු වී ඇත. මෙම සැලසුම් ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාව 11,025 ක් වන අතර, නේවාසික ඝණත්වය වර්ග කිලෝමීටර් එකකට නේවාසික ඒකක 300කි (ඇමුණුම් සිතියම් අංක 1.2). මෙම නගරයන්හි පවතින නිවාස වල ස්වභාවය රූප සටහන් අංක 2.3 හි දක්වා ඇත. ඒ අනුව මෙම ප්‍රදේශයේ ස්ථිර නිවාස ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගන්නා අතර නිවාස අහිමි අගය සීමිත ගණනකි.

අධ්‍යාපන

මෙම ප්‍රදේශයේ අධ්‍යාපනික යටිතල පහසුකම් සැලකීමේදී පාසල් පහසුකම් වලට අමතරව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන, උපකාරක පන්ති හා රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හඳුනාගත හැකිවේ. මෙම සැලසුම් ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට පවතින සාමාජීය යටිතල පහසුකම් ව්‍යාප්තිය පිළිබඳ විශේෂ අවධානයක් මෙම සංවර්ධන සැලසුම් කාර්යය ආරම්භයේදී සිදුකරනු ලැබූ අතර එහිදී සාමාජීය යටිතල පහසුකම් වශයෙන් වැදගත්වන පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි අධ්‍යාපන අවශ්‍යතා සපුරාගැනීමට මූලික වන පාසල් පහසුකම් පිළිබඳ තොරතුරු පහතින් දක්වා ඇත.

වගු අංක 2.4 : පාසල් ව්‍යාප්තිය (පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය)

ප්‍රදේශය	ජාතික පාසල්		පළාත් සභා පාසල්				එකතුව
	1 AB පාසල්	1 C පාසල්	1 AB පාසල්	1 C පාසල්	2 වන ශ්‍රේණිය පාසල්	3 වන ශ්‍රේණිය පාසල්	
සැලසුම් ප්‍රදේශය	1		3	4	11	13	32

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ -2020 (පැල්මඩුල්ල, කහවත්ත, ගොඩකවෙල ප්‍රා.ලේ.කො.)

රූප සටහන අංක 2.4 : අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය -2020



මූලාශ්‍රය: ග්‍රාම නිලධාරි දත්ත , සැලසුම් ප්‍රදේශය -2020

පසුගිය වසර තුළ මෙම කලාපයේ අධ්‍යාපනික මට්ටම පිළිබඳ අධ්‍යයනයේදී හඳුනාගත හැකි ලක්ෂණය වන්නේ අ.පො.ස. සාමාන්‍ය පෙළ අධ්‍යාපන මට්ටමින් පසු උසස් අධ්‍යාපනය සඳහා යොමු වන ප්‍රමාණය අඩු මට්ටමක පැවතීමය. එමෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ අනෙක් අධ්‍යාපන කලාප හා සංසන්දනයේදී රත්නපුර හා ඇඹිලිපිටිය අධ්‍යාපන කලාප හැරුණුවිට වැඩි සිසු ජනගහනයක් අධ්‍යාපන කලාපය තුළින් වාර්තා වේ.

සෞඛ්‍ය

කලාපයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ දත්ත විශ්ලේෂණය තුළින් දැනට පවතින සෞඛ්‍ය පහසුකම් පිළිබඳ හඳුනාගත හැකි වන අතර එහිදී බෝවන හා බෝනොවන රෝග සම්බන්ධයෙන් විශේෂ බලපෑමක් පසුගිය වසර කිහිපය තුළින් වාර්තා වී නොමැත. කහවත්ත මූලික රෝහල, පැල්මඩුල්ල දිසා රෝහල, ඇන්දාන ප්‍රාදේශීය රෝහල හා ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථාන හා පෞද්ගලික වෛද්‍ය ආයතන තුළින් සෞඛ්‍ය සේවා සැපයීම සිදු වන අතර රජයේ රෝහල් නාගරික සැලසුම් ප්‍රදේශය තුළ පිහිටා තිබීම විශේෂ කරුණකි.

ආර්ථිකය

මැණික් හා කෘෂිකාර්මික ආර්ථික රටාවක් මූලික කරගනිමින් ස්ථාපනය වී ඇති මෙම නගරයන්හි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපායන් ලෙස මැණික්, තේ හා රබර් කර්මාන්ත ආශ්‍රිත රැකියාවන් හඳුනාගත හැකිවේ. මිට අමතරව අධ්‍යයන ප්‍රදේශයේ

ආර්ථික තත්ත්වය අධ්‍යයනය තුළින් නගරයේ ආර්ථික පදනම හා ශ්‍රම බලකාය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදුකර ඇත. අධ්‍යයන ප්‍රදේශයේ සමස්ථ ශ්‍රම බලකාය 55% ක් වශයෙන් ද ඉන් 81.3 ක ශ්‍රම බලකායක් ආර්ථිකමය වශයෙන් සක්‍රිය දායකත්වයක් සපයන බවට වාර්තා වේ. මේ අනුව ආර්ථිකමය වශයෙන් අක්‍රිය ශ්‍රම බලකාය 18.7% කි. එමෙන්ම සේවා නියුක්ති අගය 93.7 % ක් හා සේවා වියුක්තිය 6.3 %ක් වශයෙන් වාර්තා වේ (ජන සංඛ්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012). ඒ අනුව සේවා නියුක්තියට සාපේක්ෂව සේවා වියුක්ති අගය ඉතා අඩු අගයක් ගැනීම නගරයේ ආර්ථික වර්ධනයට හේතුවන ප්‍රබලතාවයක් වශයෙන් හඳුනාගෙන ඇත.

රූප සටහන අංක 2.5: රැකියා නියුක්තිය -2020



මූලාශ්‍රය: ග්‍රාම නිලධාරි දත්ත , සැලසුම් ප්‍රදේශය -2020

ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායම සඳහා දායකත්වය සපයන කර්මාන්ත අංශයේ 2.6 %ක අපනයන දායකත්වයක් ලබාදෙන්නේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තුළිනි. (මහ බැංකු වාර්තාව, 2018) ශ්‍රී ලංකාව තුළ රුවන්පුර ලෙස හැඳින්වෙන රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පැල්මඩුල්ල නගරයට මැණික් කර්මාන්තය හා බැඳුණු අතීතයක් පවතින අතර, ඉතා දුර්ලභ ගනයේ වටිනා මැණික් මෙම ප්‍රදේශය තුළින් සොයාගෙන ඇත. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් රත්නපුර දිස්ත්‍රික්කය

තුළ වසරකට මැණික් පතල් බලපත්‍ර 3500ක් පමණ නිකුත් කරනු ලබයි. ඉන් බලපත්‍ර 600 කට ආසන්න ප්‍රමාණයක් පැල්මඩුල්ල හා කහවත්ත නගරය ආශ්‍රිතව නිකුත් කෙරේ. බලපත්‍රලාභී පතල් කර්මාන්ත වලට අමතරව වසරකට අනවසර පතල් වැටලීම් 120ක 130ක ප්‍රමාණයක් සිදුවේ. මේ අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ අනෙකුත් නගර වලට සාපේක්ෂව වැඩි ප්‍රතිශතයක පතල් කැණීම් සංඛ්‍යාවක් මෙම ප්‍රදේශයෙන් වාර්තා වේ.

රූප සටහන අංක 2.6 : අපනයන සංයුතිය



මූලාශ්‍රය: මහා බැංකු වාර්තාව 2019

පතල් කර්මාන්තයට අමතරව මෙම ප්‍රදේශය තුළ වී වගාව, තේ හා රබර් වගාවන්, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම සංවර්ධන සැලසුම් ප්‍රදේශයේ බෝග වගාවන් හා සියලු කෘෂිකාර්මික ක්‍රියාවන් සඳහා යොදාගෙන ඇති භූමි ප්‍රමාණයෙන් අධික භූමි ප්‍රදේශයක් එනම් 39% ක ප්‍රතිශතයක් යොදාගෙන ඇත්තේ රබර් කර්මාන්තය සඳහාය. ඊට අමතරව වී ගොවිතැන සඳහා 30% ක ප්‍රතිශතයක් ද තේ සඳහා 15% ක භූමි ප්‍රමාණයක් තේ වගාව සඳහා ද ඉතිරි භූමි ප්‍රමාණය වන 6% මිශ්‍ර බෝග වගාවන් සඳහාද යොදාගනු ලැබේ (ඇමුණුම ප්‍රස්ථාර අංක 02).

මැණික් පතල් හා කෘෂිකර්මික ක්ෂේත්‍රයට අමතරව කර්මාන්ත ක්ෂේත්‍රය තුළින්ද කලාපීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දායකත්වයක් සපයනු ලබයි. අධ්‍යයන ප්‍රදේශය තුළ විශාල පරිමාණයේ කර්මාන්ත 4 ක්, මධ්‍යම පරිමාණයේ කර්මාන්ත 10 ක්, කුඩා පරිමාණයේ කර්මාන්ත 403 ක්, සාම්ප්‍රදායික කර්මාන්ත 13 ක් හා ස්වයං රැකියා 501 ඇතුළු කර්මාන්ත 934 ක් ස්ථාපිත වී ඇත.

එමෙන්ම අධ්‍යයන ප්‍රදේශය තුළ පවතින භෞතික සම්පත් අධ්‍යයනය තුළින් යටිතල පහසුකම්වල ව්‍යාප්තිය හා අනාගත ඉල්ලුමට සරිලන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය වියයුතු ආකාරය පිළිබඳ හඳුනාගෙන ඇත. ඒ අනුව පැල්මඩුල්ල කහවත්ත නාගරික අධ්‍යයන ප්‍රදේශයේ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සැලකීමේදී මහාමාර්ග, ජලය, විදුලිය, ප්‍රවාහනය ආදී අංශ කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත.

මහ මාර්ග

පැල්මඩුල්ල-කහවත්ත නගර තුළ ප්‍රධාන මාර්ග ජාලය කොළඹ - මඩකලපුව (A 4), පැල්මඩුල්ල - නෝනගම (A18) යන ප්‍රධාන මාර්ගයන් එක්ව සැකසී ඇත. නගරය තුළ ව්‍යාප්තව පවතින මාර්ග ජාලය තුළින් බලන්ගොඩ හා ඇඹිලිපිටිය ප්‍රදේශ වෙත පහසුවෙන් සම්බන්ධ විය හැක. පැල්මඩුල්ල නගරයේ සිට රත්නපුර ප්‍රධාන නගරයට දුර කිලෝමීටර් 22 ක් ද, පැල්මඩුල්ල සිට බලංගොඩට දුර කිලෝමීටර් 24 කි. එසේම කහවත්තේ සිට ඇඹිලිපිටිය නගරයට දුර කිලෝමීටර් 55 කි.

නගරයේ බොහෝ ස්ථාන වල ප්‍රධාන මාර්ග දෙපස රේඛීය සංවර්ධනයක් (ඇමුණුම් සිතියම් අංක 1.04) දක්නට ලැබෙන අතර නගර මධ්‍යයේ පවතින ප්‍රධාන මාර්ග පද්ධතිය හා නගර අභ්‍යන්තරයේ පවතින අතුරු මාර්ග පද්ධතිය ගුණාත්මක භාවයෙන් ඉතා අඩු තත්ත්වයක පවතින බවට හඳුනාගෙන ඇත.

ප්‍රවාහනය

පැල්මඩුල්ල ප්‍රධාන බස්නැවතුම්පොළ නගර මධ්‍යයේ පිහිටා ඇති අතර කහවත්ත නගරයේ පැරණි දුම්රිය නැවතුම් ස්ථානය බස් නැවතුම්පොළ ලෙස භාවිතා කරනු ලැබේ. මෙම බස්නැවතුම් ස්ථාන විධිමත් තත්ත්වයේ නොපවතින අතර නිසි අයුරින් නැවත ස්ථාපනය කළයුතු වේ. පැල්මඩුල්ල හා කහවත්ත නගරයේ සිට දුර සේවා ගමන්වාර බස්රථ ආරම්භ නොවන අතර කොළඹ, රත්නපුර, ඇඹිලිපිටිය, බදුල්ල නගර සඳහා ගමන් ගන්නා බස්රථ මෙම ප්‍රදේශය හරහා ගමන් ගනී. රත්නපුර නගරයේ සිට ආරම්භ වන බස්රථ පැල්මඩුල්ල හා කහවත්ත නගර හරහා ගමන් කරනු ලැබේ. පැල්මඩුල්ල නගර ආශ්‍රිතව දිනකට බස්රථ ගමන්වාර 57 ක් ක්‍රියාත්මක වන අතර කහවත්ත රත්නපුර බස්රථ ගමන්වාර 92 ක් ක්‍රියාත්මක වේ.

විදුලිය

මෙම නගරයේ විදුලි අවශ්‍යතාවය සපුරාලීම සඳහා මුළු නගරයම ආවරණය වන පරිදි ට්‍රාන්ස්ෆෝමර් ස්ථානගතකර රැහැන් ගත කර ඇත. තවද වර්ෂ 2050 සඳහා

යෝජිත ජාතික භෞතික සැලැස්ම තුළ ඇතුළත් කිලෝ වෝට් 220ක අධි බලැති රුහැන් ජලය පැල්මඩුල්ල - නෝනගම මාර්ගයට සමාන්තරව ව්‍යාප්තව ඇත. මේ අනුව නගරයේ ඉදිරි විදුලි අවශ්‍යතා සපයා ගැනීමට අවස්තාවක් කර ගත හැකිවේ.

පානීය ජලය

මෙම ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාව 50% ක් සපුරාලනුයේ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා ප්‍රජා ජල ව්‍යාපෘතිය මඟිනි. ඊට අමතරව ළිං හා වෙනත් ජල මූලාශ්‍ර තුලින්ද පානීය ජල අවශ්‍යතාවය සපුරා ගනු ලබන අතර පානීය ජලය සැපයීමේ ප්‍රධානතම ජල මූලාශ්‍රය ලෙස කහවත්ත නගරය හරහා ගලා යන වේ ගඟ භාවිතා කරනු ලබයි. පතල් කැණීම් බහුල ප්‍රදේශයක් වශයෙන් භූගත ජලයේ ගුණාත්මකභාවයේ ගැටළු පවතින අතර බොහොමයක් ප්‍රදේශ සඳහා පානීය ජලය නොමැතිවීම ගැටලුවක් බවට පත්ව ඇත.

ඝන අපද්‍රව්‍ය හා අප ජලය

නගරය තුළ කසළ කළමනාකරණය පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රාදේශීය සභා විසින් වෙන් වෙන්ව සිදුකරමින් පවතින අතර පැල්මඩුල්ල නගරයෙන් දිනකට ඝන අපද්‍රව්‍ය ටොන් 7 ක් හා කහවත්ත නගරයෙන් ඝන අපද්‍රව්‍ය ටොන් 2 ක් එකතු වේ. දැනට සනීපාරක්ෂක බිම් පිරවුම සිදුකෙරෙන අතර විධිමත් ආකාරයකට කසළ කළමනාකරණය සිදු කළ යුතු වේ. නගරය තුළ මළ ප්‍රවාහය හා අප ජල බැහැර වීම සඳහා විධිමත් නල හා කාණු පද්ධතියක් ස්ථාපිත වී නොමැත.

පාරිසරික හා විනෝදාස්වාද පහසුකම්

මෙම අධ්‍යයන ප්‍රදේශයේ පවත්නා පාරිසරික තත්ත්වයන් සැලකීමේදී හඳුනාගත හැකි ප්‍රධානතම ලක්ෂණය වනුයේ කඳු වලින් වටවූ, උස බිම් සහිත නිම්න භූමියකින් සමන්විත පාරසරික සංවේදී ප්‍රදේශයක් වීමය.

ඉඩම් වටිනාකම්

පැල්මඩුල්ල- කහවත්ත නගරයේ අධ්‍යයන ප්‍රදේශයේ වර්තමාන ඉඩම් වටිනාකම තීරණය වීමේදී නගරයේ භෞතික පිහිටීම හා අපරව්‍යුහ පහසුකම් ව්‍යාප්තිය හා වර්තමාන භූමි භාවිතය පාදක වී ඇත. ඒ අනුව නගර මධ්‍යයේ පිහිටි වාණිජ භාවිත පවතින ඉල්ලුම වැඩි ඉඩමක පර්චසයක මිළ රුපියල් 2500,000-1,000,000 අතර මිලක පවතී. නගර මධ්‍යය ප්‍රදේශයෙන් මදක් ඈතට ප්‍රධාන මාර්ග දෙපස ඉඩම් වටිනාකම පර්චසයක මිළ රුපියල් 100,000 – 200,000 ක් අතර පවතින අතර ග්‍රාමීය ප්‍රදේශ වන්නට ඉඩම් වටිනාකම අඩුවී ඇත. (ඇමුණුම් සිතියම් අංක 1.5)

පරිච්ඡේදය 03

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව

3.1 හැඳින්වීම

හැඳින්වීම

සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය තුළදී සංවර්ධන ප්‍රදේශය තුළ හඳුනාගත් විභවතාවන් ඵලදායිව භාවිතා කරමින් හඳුනාගත් ගැටළු සඳහා විසඳුම් ලබාදෙමින් පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. මෙම සැලසුම් ප්‍රදේශයට අදාළ ගැටළු හා විභවතාවයන්, පාර්ශවකරුවන්ගේ රැස්වීම් හා සාකච්ඡා තුළින් හඳුනාගෙන ඇත. සැලසුම් කණ්ඩායම විසින් කරන ලද අධ්‍යනයන් තුළින් හඳුනාගත් සියලු ගැටළු, ඒ ඒ අතරින් විශේ වීම, ඒවායේ සන්ධර්භය හා එකිනෙක ගැටලු ගෙන සංසන්දනය කලවිට බලපෑමේ පවතින ස්වභාවය අනුව මූලික ගැටලු කිහිපයක් හඳුනාගෙන ඇත.

ඒ අනුව එකිනෙකට යාබදව පිහිටි පැල්මඩුල්ල හා කහවත්ත ද්විත්ව නගර ඒකාබද්ධව සංවර්ධනය කිරීම සඳහා මෙම ප්‍රදේශයට සුවිශේෂිව පවතින සංවර්ධන විභවතා වැඩිදියුණු කරමින් හා සංවර්ධනයට බාධාවන ගැටලු වලට විසඳුම් ලබාදීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම කඩිනම් අවශ්‍යතාවයක් විය.

හඳුනාගත් ගැටළු

3.2. හඳුනාගත් ගැටලු

පැල්මඩුල්ල, කහවත්ත නගර සංවර්ධනය පුළුල් කිරීමට පවතින විභවතා වලට අමතරව මෙම ප්‍රදේශයට ආවේණික සංවර්ධනයට බාධාවන ප්‍රධාන ගැටලු කිහිපයක්ද හඳුනාගෙන ඇත.

1. මැණික් කර්මාන්තයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අපොහසත් වීම
2. කහවත්ත නගරය පැල්මඩුල්ල පරිපාලන සීමාව තුළ පිහිටීම
3. භූගෝලිය පිහිටීම නගරයේ සංවර්ධනය පුළුල් කිරීමට බාධාවක් වීම

3.2.1. මැණික් කර්මාන්තයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට අපොහසත් වීම

ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකයට විශේෂ දායකත්වයක් සපයනු ලබන මැණික් කර්මාන්තය අතීතයේ සිටම මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වී ඇත. භූගෝලීය පිහිටීම අනුව මැණික් නිෂ්පාදනයට හේතුවන පාංශු ස්ථර වල පිහිටීම මැණික් සුලභව හමුවීමට හේතු වී ඇත .

මැණික් යනු ඉතා ඉහළ වෙළඳපොළ මූල්‍ය අගයක් පවතින සම්පතක් වුවද මෙම ප්‍රදේශය තවමත් මැණික් සම්පතේ උපරිම ප්‍රතිලාභ අත්කර ගැනීමට සමත් වී නැත. මේ සඳහා බලපා ඇති ප්‍රධාන හේතු කිහිපයක් හඳුනාගෙන ඇත.

- මැණික් සඳහා අගය එක්කිරීම නිසි පරිදි ක්‍රියාත්මක නොවීම
- අනවසර පතල් ප්‍රමාණය වැඩි වීම
- අදායම් බෙදීයාමේ විෂමතාවය
- අවිනිශ්චිත කර්මාන්තයක් වීම
- මැණික්ගල් සැකසුම් ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම

පතලකින් හමුවන මැණික් ගලට නිසි වටිනාකම ලබාගැනීම සඳහා එම මැණික් ගල ඔප මට්ටම් කළ යුතුය. මේ අනුව මැණික් ගලක නිසි වටිනාකම ලබාගැනීම සඳහා සැකසුම් ක්‍රියාවලියකට ලක්කළ යුතු වේ.

රූපය අංක 3.01 : මැණික් වෙළඳාම - පැල්මඩුල්ල නගරය

මූලාශ්‍රය : https://rb.gy/whcxcr, නා.සං.අධි. 2020

මැණික් පතල් කැණීමෙන් හමුවන රළු මැණික් කැපීමට හා ඔප දැමීමටත් ඉන්පසු විද්‍යාගාර මට්ටමේ පරීක්ෂණ සිදු කර ස්වර්ණාභරණ භාවිතයන් සඳහා වෙළඳපොළට නිකුත් කිරීමත් සිදු කරනු ලැබේ. මෙම ප්‍රදේශයේ පතල් කැණීම් කටයුතු බහුලව සිදුවුවත් මැණික් සඳහා නියම වෙළඳපොල අගය ලබාගැනීම සඳහා සිදුකරන මැණික් ගල් සැකසුම් කටයුතු සිදුවන්නේ ඉතා අවම වශයෙනි. මෙම තත්ත්වය හේතුවෙන් අතරමැදියන් බොහෝ පිරිසක් මැණික් කර්මාන්තයේ ප්‍රතිලාභ භුක්ති විදීම හඳුනාගත හැකිවේ.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන මැණික් නගරය ලෙස හැඳින්වෙන රත්නපුර නගරයෙන් පිටත පිහිටි නගර ද මැණික් සම්පතේ උපරිම ප්‍රතිලාභ භුක්ති විදිනු ලැබේ. රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් කැපීම සඳහා නිකුත් කළ බලපත්‍ර ප්‍රමාණය අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. එමගින් තහවුරු වන්නේ මැණික් සඳහා අගය

එක්කිරීමේ කටයුතු තවදුරටත් මෙම ප්‍රදේශයෙන් ක්‍රියාත්මක වීම අඩුවීම හා පරිබාහිර ප්‍රදේශ ඒ සඳහා වැඩිවීමේ ප්‍රවණතාවයයි.

රූපය අංක 3.02 : 2015 -2019 කාලසීමාව තුල නිකුත් කරන ලද මැණික් ගල් කැපීම් බලපත්‍ර ප්‍රමාණය (රත්නපුර දිස්ත්‍රික්කය)



මූලාශ්‍රය : මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

එමෙන්ම මැණික් වෙළදාම ද අඩුවීමේ ප්‍රවණතාවයකින් වර්ධනය වීමක් දැකගත හැකිවේ. නමුත් මැණික් වෙන්දේසියේ වර්ධන ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි.

රූපය අංක 3.03 : 2015 -2019 කාලසීමාව තුල නිකුත් කරන ලද මැණික් වෙළඳ බලපත්‍ර ප්‍රමාණය (රත්නපුර දිස්ත්‍රික්කය)



මූලාශ්‍රය : මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

රූපය අංක 3.04: 2015 – 2019 කාලසීමාව තුල නිකුත් කරන ලද මැණික් වෙන්දේසි බලපත්‍ර ප්‍රමාණය (රත්නපුර දිස්ත්‍රික්කය)



මූලාශ්‍රය : මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

හවස 3ත් 5ත් අතර කාලසීමාව තුළදී පැල්මඩුල්ල ප්‍රධාන බස්නැවතුම්පොල අසළ සිදුවන අතර වෙනත් ප්‍රදේශ වලින් පැමිණෙන වෙළෙන්දන් හා තැරැව්කරුවන් විසින් රළු මැණික් ගල් මිළදී ගැනීම සිදුකරනු ලැබේ. ඒ අනුව මෙම ප්‍රදේශයේ හමුවන මැණික් වල ප්‍රතිලාභ බොහොමයක් පිටත ප්‍රදේශ වලට ගලායාම තහවුරු කරගත හැකිවේ.

අනවසර පතල් ප්‍රමාණය වැඩි වීම

පසුගිය වසර පහක කාලය තුළ අනවසර පතල් කැණීම්, වැඩි වේගයකින් වර්ධනය වී ඇත. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වැටලීම් වලින් තහවුරු කරගත් දත්ත වලට අමතරව වැටලීම් වලට හසු නොවූ අනවසර පතල් ද බහුතර සංඛාවක් පැවතිය හැකිවේ.

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන මැණික් පතල් කැණීම් සිදුකරනු ලබන නගර අතරින් සැලසුම් ප්‍රදේශය අනවසර පතල් කැණීම් අතරින් තුන්වන ස්ථානයේ පසුවේ. මෙලෙස අනවසර පතල් කැණීම් මගින් මෙම ප්‍රදේශයට ප්‍රතිලාභ නොලැබීම මෙන්ම පාරිසරික බලපෑම් බොහොමයක් සිදුවේ. මැණික් පතල් කැණීමෙන් පසු අදාළ පතල නිසිපරිදි වසා නොදැමීම හා දෝනා පතල් හේතුවෙන් නිවාස, මාර්ග ආදී ස්ථාන ගිලාබැසයාමේ ආපදාවන්ට ගොදුරුවිම ද සිදු වේ. පාරිසරික විපත් වලට අමතරව ඩෙංගු, මැලේරියාව වැනි වසංගත රෝගද ව්‍යාප්ත වීමට ඉඩ පැවතිය හැක.

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් වාර්ෂිකව ලබාදෙන මැණික් පතල් බලපත්‍ර ප්‍රමාණයේ ඉතා වැඩි වේගයකින් අඩුවීමේ ප්‍රවණතාවයක් තුළින් තවදුරටත් මෙම ප්‍රදේශයේ අනවසර පතල් වැඩිවීම ගම්‍ය කරගැනීමට හැකිවේ. අනවසර පතල් සංඛාව වැඩිවීමට හේතු ලෙස මෙම කර්මාන්තයේ පවතින අවිනිශ්චිතතාවය සමඟ බලපත්‍ර ලබා ගැනීමේදී දැරීමට සිදුවන පිරිවැය ඉහළ යාම හා බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලියේ පවතින සංකීර්ණතාවය හේතු වී ඇත.

අදායම් බෙදීයාමේ විෂමතාවය

මැණික් පතල් කර්මාන්ත ක්‍රියාවලියේ පවතින අපහසුම කාර්යය සිදුකරනු ලබන්නේ පතල් කරුවන් විසිනි. මතුපිට පොළොවෙන් යටට අඩි 35, 40 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගැඹුරු වූ පතල්ද ඒවා හරහා ගමන් කරන දෝන පතල් පවතින අතර එම පතල් කැණීම් වල නිරතවන පතල්කරුවන් තම රැකියාවේ නියැලෙන්නේ ජීවිත අවධානමක් සමඟිනි. නමුත් ඔවුන්ට අදායම වශයෙන් ලැබෙන්නේ මැණික් ගලක වටිනාකමින් ඉතා සුළු ප්‍රතිශතයකි.

කෙසේ නමුදු මෙම ප්‍රදේශයේ මැණික් කර්මාන්තයේ නියැලී සිටින පිරිසට අමතරව පිටතින් පැමිණෙන බොහෝ අතරමැදියන් සංඛාවක් කිසිම මහන්සියකින් තොරව ආදායම් උපයනු ලැබේ. රළු මැණික් ගලේ සිට ඔප දමන ලද මැණික් ගල දක්වා විවිධ අවස්ථාවන්හිදී මැණික් සැපයුම් ජාලය තුළ අතරමැදියන් සම්බන්ධ වන ආකාරය පහත දැක්වෙන 3.05 රූප සටහන තුළින් මනාව පැහැදිලි කරගත හැකිවේ.

රූපය අංක 3.05 : මැණික් සැපයුම් ජාලය



මූලාශ්‍රය: මැණික් පතල් සමීක්ෂණ දත්ත, නා.සං.අධි.

අවිනිශ්චිත කර්මාන්තයක් වීම

මැණික් කර්මාන්තය යනු විශ්වාසය මත ගොඩනැගී පවතින කර්මාන්තයකි. එසේම මැණික් පවතින ප්‍රදේශ හඳුනාගැනීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ ක්‍රම භාවිතා නොකරනු ලබන අතර සාමාන්‍ය ජන සමාජයේ ක්‍රියාත්මක වන විශ්වාස හා ඇදහිලි මත ක්‍රියාත්මක වේ. එසේම භූමිය අභ්‍යන්තර ස්කෑන් කිරීම සඳහා විශාල මුදලක් වැයවන බැවින් ක්‍රියාත්මක කිරීම සිදු නොවේ.

මැණික් වෙළඳාම සඳහා විශ්වාසය මෙන්ම මනා පළපුරුද්ද ද අවශ්‍ය වේ. මැණික් කැණීම් කටයුතු සාම්ප්‍රදායික ක්‍රමවේදය ඔස්සේ ක්‍රියාත්මක වන අතර වාර්ෂිකව ක්‍රියාත්මක කල නොහැකි කාර්යයකි. මෙම ප්‍රදේශයේ බොහොමයක් මැණික් ඉල්ලම් නොහොත් මැණික් නිධි කුඹුරු ඉඩම් වල පවතින අතර ගංවතුර පවතින කාලයන්හි පතල්කරුවන්ට තම රැකියා අහිමි වේ. එලෙසම සිංහල හින්දු අලුත් අවුරුද්ද වැනි උත්සව සමය තුළ ද මැණික් වෙළඳාම් සිදුනොවේ. මෙවන් තත්ත්වයක පතල්කරුවන්ට තම රැකියාව සම්බන්ධයෙන් පවතින්නේ අවිනිශ්චිතතාවයකි.

මේ ආකාරයට මැණික් පතල් කර්මාන්තය ආශ්‍රිත ගැටලු රාශියක් පැවතීම මැණික් කර්මාන්තය ආශ්‍රිත කටයුතු ප්‍රවර්ධනයට බාධාවකි. ඒ අනුව එම ගැටලු ද

හඳුනාගනිමින් මැණික් පතල් කර්මාන්තය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සලසමින් මෙම ප්‍රදේශයේ සංවර්ධන කටයුතු පුළුල් කළ යුතුවේ.

3.2.2. කහවත්ත නගරය පැල්මඩුල්ල පරිපාලන සීමාව තුළ පිහිටීම

පැල්මඩුල්ල හා කහවත්ත නගර එකිනෙක යාබදව පිහිටි නගර දෙකක් මෙන්ම භූගෝලීය හා පාරිසරික ලක්ෂණද බොහොමයකින් එක සමාන වේ.පරිපාලනමය වශයෙන් පැල්මඩුල්ල හා කහවත්ත නගර වෙන්වන භෞතික සීමාව ලෙස සැලකෙන්නේ වේ ගඟයි. නමුත් කහවත්ත නගරයේ ක්‍රියාකාරිමය සීමාව ආරම්භ වන්නේ පැල්මඩුල්ල නගරයේ පරිපාලන සීමාව තුළිනි.

රූපය අංක 3.06 : කහවත්ත නගරයේ ක්‍රියාකාරිත්වමය සීමාව



මූලාශ්‍රය: නා.සං.අධි.

රූපය අංක 3.07 : කහවත්ත දුම්රිය ස්ථානය හා ඔරලෝසු කණුව

මූලාශ්‍රය: නා.සං.අධි. 2020

කහවත්ත දුම්රිය ස්ථානය හා කහවත්ත නගරයේ ඔරලෝසු කණුව පැල්මඩුල්ල පරිපාලන සීමාව තුළ පිහිටා ඇත. දැනට කැලණිවැලි දුම්රිය මාර්ගය ක්‍රියාත්මක නොවන නිසාවෙන් මෙම දුම්රිය ස්ථානය කහවත්ත ප්‍රධාන බස්නැවතුම ලෙස භාවිතා කෙරේ. ඒ අනුව ඒ ආශ්‍රිතව විශාල ජන සංඛ්‍යාවක් නිරන්තරයෙන් සංසරණය සිදු කරන බැවින් වෙළඳසැල්, බැංකු වැනි වාණිජ සේවාවන් ද ඒ ආශ්‍රිතව ස්ථාපනය වී ඇත.

නමුත් මෙම ප්‍රතිලාභ සියල්ල අත්වන්නේ පැල්මඩුල්ල නගරයට වන අතර එනිසා කහවත්ත නගරයේ සංවර්ධනය පුළුල් කිරීමට බාධාවක් වී ඇත. වේ ගඟ සීමාව පසුකර ඇරඹෙන කහවත්ත පරිපාලන නගර සිමාව තුළ කහවත්ත මූලික රෝහල, රාජ්‍ය ආයතන හා වෙළඳසැල් ආදිය ස්ථාපනය වී ඇති නමුත් එම සේවාවන් ව්‍යාප්ත කිරීමට නගර මධ්‍යයේ පවතින ඉඩකඩ සීමිතය. නගරයක ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය නගර මධ්‍යය ප්‍රදේශයේ පිහිටා ඇති අතර ඉන් අත්වන ප්‍රතිලාභ බොහොමයකි. කහවත්ත නගරයේ නාගරික වෙළඳ මධ්‍යස්ථානය නොහොත් නගර මධ්‍ය ප්‍රදේශය ආරම්භ වන්නේ මෙම ප්‍රදේශයෙනි. ඒ අනුව මේ ප්‍රදේශය ආශ්‍රිතව වාණිජ හා ,අනෙකුත් සේවා බොහොමයක් ස්ථාපනය වී ඇත. කහවත්ත නමින් හැඳින්වුවත් පැල්මඩුල්ල පළාත් පාලන බල ප්‍රදේශයට අයත් මෙම ප්‍රදේශයේ පවතින සියලු වාණිජ ගොඩනැගිලි වල වරිපනම් ගාස්තු එක්රැස් කරගැනීම හා අනෙකුත් සංවර්ධනයන් ක්‍රියාත්මක කරනු ලබන්නේ පැල්මඩුල්ල පළාත් පාලන ආයතනය මගිනි.

තවද මෙම පැල්මඩුල්ල හා කහවත්ත නගරයට අතරමැදි ප්‍රදේශයේ පිහිටි පාසල සඳහා ද මෙම නගර දෙකේම සිසුවන් පාසලට ඇතුළත්වන අතර පාසලේ සිසුන් ප්‍රමාණයට ඉඩ පහසුකම්ද ප්‍රමාණවත්ව නැත.

මෙම තතත්වය තුළ කහවත්ත නගරයේ පවතින භූගෝලිය පිහිටීමත් සමඟ තවදුරටත් පවතින ඉඩකඩ නගර ව්‍යාප්තියට ප්‍රමාණවත් නොවන අතර දැනට භාවිතයට නොගන්නා කහවත්ත දුම්රිය ස්ථානය ආශ්‍රිත ගොඩනැගිලි හා ඉඩම් ඵලදායීව යොදවමින් කහවත්ත නගර සංවර්ධනයට යොදාගැනීමට නොහැකි වී ඇත.

3.2.3. භූගෝලිය පිහිටීම නගරයේ සංවර්ධනය පුළුල් කිරීමට බාධාවක් වීම

පැල්මඩුල්ල හා කහවත්ත නගර දෙකම භූගෝලීය වශයෙන් කඳු සහිත ලක්ෂණ පෙන්නුම් කරනු ලබන නගර දෙකකි. කිරිබත්ගල හා කුට්ටපිටිය කඳු මුදුන් මෙම නගර වටකරන් පවතින විශාල කඳු පන්ති දෙකක් වන අතර ඊට අමතරව කුඩා කඳු ගැට කිහිපයක්ද තැනින් තැන දැකගත හැකිවේ. නගරයේ පවතින මෙම භූගෝලිය පිහිටීම නිසාවෙන් රේඛීය සංවර්ධනයක් මෙම නගරයේ දැකගත හැකිවේ.

මෙම ප්‍රදේශයේ පවතින පාංශු ස්ථර වල පිහිටීම අනුව මැණික් ඛණිජය බොහෝ ප්‍රදේශ වල දැකගත හැකි වේ. එකී පිහිටීම විවිධාකාර වන බැවින් මැණික් ලබාගැනීම සඳහා සිදුකරනු ලබන පතල්ද ඊට අනුරූපව විවිධ වේ. ගොඩ පතල් ,ගැඹුරු පතල්, දෝන පතල්, යනාදී පතල් මෙන්ම අදින පතල් හෙවත් ගඟේ මැණික් කැණීමද දැකගත හැකිය. යම් අතරින් ගැඹුරු පතල් හා දෝන පතල් සිදු කිරීමෙන් පසු එම පතල් නිසි අයුරින් වසා නොදැමීම හේතුවෙන් එවැනි පතල් සිදුකරන ප්‍රදේශවල පාංශු ස්ථරය අස්ථාවර වී ගිලාබැසීම් ආදිය සිදුවේ. මේ අනුව විවධ සංවර්ධන කාර්යයන් සඳහා දැරීමට සිදුවන ඉදිකිරීම් පිරිවැය ද වැඩිවේ.

රූපය අංක 3.08 : නගරයේ භූගෝලීය පිහිටීම



මූලාශ්‍රය: නා.සං.අධි.

මෙම නගරවල පවතින භූගෝලීය ලක්ෂණ හේතුවෙන් රේඛීය සංවර්ධනයක් දැකගත හැකි අතර එමගින් රථවාහන තදබයක්ද පැල්මඩුල්ල ප්‍රදේශයේ දැකගත හැකිවේ.

3.3. හඳුනාගත් විභවතා

මැණික් පතල් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ තේ, රබර්, වී මූලික කරගත් කෘෂිකාර්මික අනන්‍යතාවයක් පවතින මෙම ප්‍රදේශයේ සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගත් ප්‍රධාන සංවර්ධන විභවතා පහකි.

- යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය පැල්මඩුල්ල නගරය දක්වා ක්‍රියාත්මක වීම
- යෝජිත කැළණිවැලි දුම්රිය මාර්ගය කහවත්ත නගරය හරහා ක්‍රියාත්මක වීම
- මෙම සැලසුම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ මැණික් ත්‍රිකෝණය තුළ පිහිටා තිබීම
- පැල්මඩුල්ල හා කහවත්ත නගර රත්නපුර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදනයට 18% කින් දායක වීම
- පැල්මඩුල්ල හා කහවත්ත නගර රත්නපුර දිස්ත්‍රික්කයේ රබර් නිෂ්පාදනයට 12% කින් දායක වීම
- මෙම ප්‍රදේශයේ පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන

3.3.1. ඉදිවෙමින් පවතින රුවන්පුර අධිවේගී මාර්ගය පැල්මඩුල්ල නගරය දක්වා ක්‍රියාත්මක වීම

රුවන්පුර අධිවේගී මාර්ගය කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා ක්‍රියාත්මක කිරීමට යෝජිතය. පැල්මඩුල්ල පනාවැන්න ප්‍රදේශයේ ඉදිවීමට යෝජිත අන්තර් හුවමාරුව හරහා මෙම ප්‍රදේශයේ ජනතාවට රුවන්පුර අධිවේගී මාර්ගයට පහසුවෙන් ගමන් කල හැකිවේ. මෙම අන්තර් හුවමාරුව නගර දෙකටම මැදිව පිහිටා ඇති අතර, නගර දෙකටම ඇත්තේ කිලෝමීටර් 4 කටත් අඩු සුළු දුර ප්‍රමාණයකි.

අතීතයේ කැලණිවැලි දුම්රිය මාර්ගය මෙම නගර හරහා ක්‍රියාත්මක වූ අතර මේ වන විට එකම ප්‍රවාහන මාධ්‍ය ලෙස ක්‍රියාත්මක වනුයේ බස්රථ සේවාව පමණි. රේඛිය සංවර්ධනයක් සහිත මෙම නගරයේ රථවාහන තදබදයද ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇති අතර ඒ සඳහා මෙන්ම මැණික් හා අනෙකුත් කෘෂි බෝග නිෂ්පාදන ආශ්‍රිත නාගරික ආර්ථික කටයුතු සංවර්ධනය සඳහා මෙම අධිවේගී මාර්ගය යොදාගත හැකිවේ.

3.3.2. යෝජිත කැළණිවැලි දුම්රිය මාර්ගය කහවත්ත නගරය හරහා ක්‍රියාත්මක වීම

වර්ෂ 2050 සඳහා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම තුළ කැළණිවැලි දුම්රිය මාර්ගය යෝජිත සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. අතීතයේ දී මේ ප්‍රදේශය හරහා ක්‍රියාත්මක වූ දුම්රිය සේවාව හරහා මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා පහසුකම් සැලසී ඇත. මේ අනුව නගරයේ ආර්ථික කටයුතු පහසුවෙන් හා විධිමත්ව කරගැනීමට මෙන්ම මගී ප්‍රවාහනයට ද පහසුවක් සලසාගැනීමේ හැකියාව සැලසේ.

3.3.3. මෙම සැලසුම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ මැණික් ත්‍රිකෝණය තුළ පිහිටි නගරයක් වීම

අතීතයේ රත්නද්වීපය ලෙස හැඳින්වූ ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රධාන මැණික් නගරය වන රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින උපනගර ලෙස මෙම සැලසුම් ප්‍රදේශය හඳුනාගත හැකිවේ රාජධානි යුගයේ සිට මැණික් කැණීම් කටයුතු .සඳහා සුප්‍රසිද්ධියක්

හිමිකරගෙන පවතින පැල්මඩුල්ල හා කහවත්ත නගර ශ්‍රී ලංකාවේ මැණික් ත්‍රිකෝණයට අයත් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන කර්මාන්තයක් වශයෙන් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය හඳුනාගත හැකි අතර එමගින් දළ ජාතික ආදායමට 2.3% ක දායකත්වයක් සපයනු ලබයි.

භූගෝලීය පිහිටීම අනුව මැණික් නිෂ්පාදනයට බලපාන පාංශු ස්ථර වල පිහිටීම නිසා තවමත් මැණික් සම්පත් සුලභ වූ ප්‍රදේශයකි. පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි මැණික් කැණීම් බහුලව සිදුවන අතර පැල්මඩුල්ල නගරයේ කොළඹ -මඩකලපුව ප්‍රධාන මාර්ගය දෙපස ද මැණික් පතල් බහුලව දැක ගත හැකිවේ.

රූපය අංක 3.09 : පැල්මඩුල්ල නගරයේ පවතින පතල්

මූලාශ්‍රය: නා.සං.අධි. 2021

රූපය අංක 3.10 :ශ්‍රී ලංකා මැණික් ත්‍රිකෝණය



මූලාශ්‍රය: සබරගමුව වංශ කතාව

මෙම ප්‍රදේශයේ බොහොමයක් ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මැණික් පතල් කර්මාන්තය වේ. රැකියා වර්ගීකරණයට අනුවද 48% ක් වන බහුතරය ප්‍රාථමික රැකියා කාණ්ඩයට අයත් වේ. ඒ අනුව මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් ප්‍රාථමික රැකියාවක් ලෙස මැණික් පතල් වල සේවයේ නිරතවීම දැකගත හැකිවේ. ස්ථිර වශයෙන් පතල් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන්ට අමතරව විවිධ

ජීවනෝපායන් තුළින් ජීවත්වන ජනතාවද අමතර ආදායමක් ලෙස පතල් කර්මාන්ත ආශ්‍රිත කටයුතු වල නිරත වේ.

සාම්ප්‍රදායික පතල් කර්මාන්තය දීර්ඝකාලීනව පවත්වාගනිමින් මැණික් නිෂ්පාදනය වැඩිදියුණු කර, රටේ ජාතික ආදායම වර්ධනය කිරීමට මෙම සේවක පිරිස වටිනා සම්පතකි.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2050 සඳහා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම තුළින් ද මෙම සැලසුම් ප්‍රදේශය මැණික් කැණීම් ආශ්‍රිත කර්මාන්ත මුලික කරගත් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා හඳුනාගෙන ඇත.

රූපය අංක 3.11: ශ්‍රී ලංකා මැණික් ත්‍රිකෝණය



මූලාශ්‍රය: ජාතික භෞතික සැලැස්ම 2050, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

මැණික් පාෂාණ වල පිහිටීම අනුව ශ්‍රී ලංකාවේ මැණික් පතල් කර්මාන්තය ප්‍රදේශ කිහිපයකට සීමා වුවද ප්‍රධාන මැණික් වෙළඳ මධ්‍යස්ථාන රත්නපුර, කොළඹ, බේරුවල හා ගිංතොට යන නගර තුළ ව්‍යාප්ත වී ඇත .මැණික් නගරය ලෙස සුප්‍රසිද්ධ රත්නපුර නගරය ජාතික මැණික් මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමට යෝජිතව

පවතින අතර ඊට යාබදව පිහිටි පැල්මඩුල්ල නගරයටද එහි ප්‍රතිලාභ අත්කර ගැනීමට හැකිවේ.

3.3.3. පැල්මඩුල්ල හා කහවත්ත නගර රත්නපුර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදනයට 18%කින් දායක වීම

රූපය අංක 3.12 :ශ්‍රී ලංකාවේ තේ වගාව ව්‍යාප්තිය



මූලාශ්‍රය: වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය-2020

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව

ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ආර්ථික බෝගයක් ලෙස තේ වගාව හඳුනාගත හැකිවේ. භූගෝලීය හා දේශගුණික ලක්ෂණ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් තේ වගාව සිදුකරනු ලබන දිස්ත්‍රික්ක 14 කි. එම දිස්ත්‍රික්ක අතරින් තේ වගා කිරීම තුළින් ලංකාවෙන්ම දෙවන ස්ථානය හිමිකරගෙන පවතින්නේ රත්නපුර නගරයයි.

තේ වගාවට උචිත සරු භූමියක් හා දේශගුණික ලක්ෂණ පවතින බැවින් රත්නපුර දිස්ත්‍රික්කයේ බොහොමයක් ප්‍රදේශ තේ කර්මාන්තය සඳහා යොමු වී ඇත. පැල්මඩුල්ල හා කහවත්ත නගර තුළ තේ වගාව ආරම්භ කර ඇත්තේ යටත් විජිත අධිරාජ්‍ය යුගයේ සිටය. මෙම ප්‍රදේශයේ විශාල පරිමාණයේ මෙන්ම කුඩා පරිමාණයේ තේ වගාකරුවන් දැකගත හැකි අතර රත්නපුර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදනයට18% කින් දායක වේ.

2007 වර්ෂයේ සිට 2018 වසර දක්වා කාල පරාසය තුළ ලංකාවේ තේ නිෂ්පාදනයේ වර්ධන අනුපාතය ඉහළ යන ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය.

ලොවපුරා තේ නිෂ්පාදනය සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර අපනයන මට්ටමේ ගුණාත්මකභාවයෙන් යුතු නිෂ්පාදනය සඳහා දායක වෙමින් නාගරික ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකයද ශක්තිමත් කළහැකි වේ.

3.3.4. පැල්මඩුල්ල හා කහවත්ත නගර රත්නපුර දිස්ත්‍රික්කයේ රබර් නිෂ්පාදනයට 12% කින් දායක වීම

රූපය අංක 3.13 : ශ්‍රී ලංකාවේ රබර් වගාව ව්‍යාප්තිය



මූලාශ්‍රය: වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය-2020

ප්‍රධාන ආර්ථික බෝගයක් ලෙස සැලකෙන රබර් වගාවේ ආරම්භය සිදුව ඇත්තේ ද යටත් විජිත පාලන සමයේ සිටය. ලංකාවේ රබර් වගාකරනු ලබන ප්‍රධාන නගර 18ක් හඳුනාගත හැකිය. එම සියලු දිස්ත්‍රික්ක අතරින් රබර් වගාකිරීම තුළින් රත්න්පුර දිස්ත්‍රික්කය 3 වන ස්ථානයේ පවතී.

2007 වර්ෂයේ සිට 2018 වසර යන කාල පරාසය තුළ ලංකාව පුරාම රබර් නිෂ්පාදනය අඩුවෙමින් යන ප්‍රවණතාවක් පැවතියත් රබර් අපනයනය එකම අගයක පැවතීම හඳුනාගත හැකිය.

පැල්මඩුල්ල හා කහවත්ත නගරයේ ප්‍රධාන ආර්ථික බෝගයක් ලෙස රබර් වගාව සිදුකරනු ලබන අතර දිස්ත්‍රික්කයේ රබර් නිෂ්පාදනයට 12%කින් දායක වේ. විවිධ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදන මුලද්‍රව්‍යයක් ලෙස යොදාගන්නා රබර් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. ඉල්ලුමට සැපයුම ලාබාදෙමින් නගරයේ ආර්ථිකය වැඩිදියුණු කරගැනීමට හැකිවේ.

3.3.5. මෙම ප්‍රදේශයේ ආවේනිකත්වය සමඟ පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන

සංචාරක ආකර්ෂණය සඳහා ප්‍රමුඛ ස්ථානයක් හිමිකරගෙන පවතින සබරගමුව පළාත තුළ ප්‍රධාන සංචාරක කලාප 7 කි. මෙම සැලසුම් ප්‍රදේශය මිණිපුර සංචාරක කලාපයට ඇතුළත් වේ. සංචාරක ආකර්ෂණීය ස්ථාන අතරින් ස්වභා සෞන්දර්යාත්මක අගය ඉහළ නංවන දියඇලි සඳහා හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතරින් වැඩිම දියඇලි සංඛාවක් පිහිටා ඇත්තේ රත්නපුර දිස්ත්‍රික්කයේය.

රූපය අංක 3.14 : කිරිදි ඇල්ල

මූලාශ්‍රය: shorturl.at/gsBG9

රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පැල්මඩුල්ල නගරයේ ද ආකර්ෂණීය දියඇළි කිහිපයක්ම පිහිටා ඇත. පැල්මඩුල්ල නගරය හරහා ගලා යන දෙනවක ගංගාව ආරම්භ වන්නේ ආකර්ෂණීය දිය ඇල්ලක් වන කිරිඳි ඇල්ලේ සිටය. සිත් ඇද ගන්නා සුළු කිරිඳි ඇල්ලට ඉහළ සංචාරක ආකර්ශනයක් හිමිව ඇත. කිරිඳි ඇල්ල ගලා හැලෙන ප්‍රදේශය සුන්දරතත්වයෙන් ඉතා ඉහළ අතර මෙම දිය ඇල්ලේ ජල පෝෂකය මුලික කරගනිමින් නිර්මාණය වූ කුඩා දියඇලි ද බොහොමයකි .එසේම පැල්මඩුල්ල නගරයේ ජනතාවගේ ප්‍රධාන පානීය ජල සැපයුම් මුලාශ්‍රය ලෙසද මෙම දිය ඇල්ල භාවිතා කෙරේ.

පැල්මඩුල්ල නගරය හරහා කොළඹ - මඩකලපුව ප්‍රධාන මාර්ගය ඔස්සේ ගමන් කරන විට වෙල්යාය වට කරගත් අපුර්ව වූ කිරිබත්ගල කන්ද හා ඒ ඔස්සේ ඇද හැලෙන පුළුන් ඇල්ල ද දැකගත හැකිය.

ආකර්ශනයෙන් ඉතා ඉහළ කිරිබත්ගල කන්ද හරහා ඇද හැලෙන කුඩා දියඇලි එම ප්‍රදේශයේ පවතින ආකර්ෂණය තවදුරටත් ඉහළ නැංවීමට හේතුවී ඇත. පුළුන් ඇල්ල, ලිහිණියන් කෙලින ඇල්ල, හත්බිලි ඇල්ල යනාදී වශයෙන් බොහොමයක් නාමයෙන් ප්‍රසිද්ධ නොවූ ආකර්ෂණීය දියඇලි ගණනාවක් කිරිබත්ගල කඳු මුදුනේ හීන් ඔයේ සිට ඇද හැලේ. මිට අමතරව මරක්කල ඇල්ල, කුඩා ඇල්ල, දොඩම්පේ ඇල්ල තවත් මේ ප්‍රදේශයේ සැඟව පවතින සංචාරක ආකර්ෂණීය දියඇලි වේ.

රූපය අංක 3.15 : කිරිබත්ගල කන්ද

රූපය අංක 3.16 : පුළුන් ඇල්ල

මූලාශ්‍රය : අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

රූපය අංක 3.17 : කුඩා ඇල්ල

රූපය අංක 3.18 : මරක්කල ඇල්ල

රූපය අංක 3.19 : දොමෝදර ඇල්ල

රූපය අංක 3.20 : ලිහිනියන්කිලින ඇල්ල

රූපය අංක 3.21 : හත්බිලි ඇල්ල

මූලාශ්‍රය: https://rb.gy/cqu8zw

භූගෝලීය පිහිටීම අනුව කඳු සහ නිම්න භූමි සහිත පිහිටීම, මෙම ප්‍රදේශයේ සුන්දරත්වය වැඩි කිරීමට හේතු වී ඇත. පැල්මඩුල්ල නගරය හරහා ප්‍රධාන මාර්ගය ඔස්සේ ගමන් කිරීමේදී දැක ගැනීමට හැකිවන මැණික් පතල් සංචාරක කර්මාන්තය සඳහා නව අත්දැකීමකි.

පාරිසරික ආකර්ෂණීය ස්ථාන මෙන්ම ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වශයයන් වැදගත්වන ස්ථාන බොහොමයක්ද මෙම ප්‍රදේශයේ හඳුනාගැනීමට හැකිවේ.

පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරය

පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරය කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස ඉදිකරන ලද පුරාණ විහාරස්ථානයකි. පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරයේ ඉදිකර පවතින ටැම්පිට විහාරය අවුරුදු 400 කට වඩා පැරණි ගල්කුලුණු 16 ක් යොදා ඉදිකරන ලද්දකි. මකර තොරණ, නුවර යුගයට අයත් සිතුවම්ද මෙම පන්සල තුළ දැකබලා ගැනීමට හැකිවේ.

රූපය අංක 3.22 : ටැම්පිට විහාරය

රූපය අංක 3.23 : පැල්මඩුල්ල විහාරයේ ඇති පැරණි සිතුවමක්

මූලාශ්‍රය: https://amazinglanka.com/wp/pelmadulla-rajamaha-vihara/

රූපය අංක 3.24 : ගනේගම අරමන්පොළ රජමහා විහාරය

මූලාශ්‍රය : නා.සං.අධි.

රූපය අංක 3.25 : ගනේගම අරමන්පොළ රජමහා විහාරය

මූලාශ්‍රය : නා.සං.අධි.

දෙනවක විහාරය, ගනේගම පන්සල යනාදී නම්වලින් ද හඳුන්වන මෙම විහාරස්ථානය හතරවන පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකරන ලදැයි සැලකේ. අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධියේ දෙතිස් බෝධීන් වහන්සේ අතරින් රෝපණය කරන ලද බෝධීන් වහන්සේ නමක් මෙම විහාරස්ථානයේ රෝපණය කර ඇත. පැල්මඩුල්ල ගනේගම කොළඹ- මඩකලපුව ප්‍රධාන මාර්ගය ආසන්නයේ පිහිටා ඇති මෙම විහාරස්ථානය ඓතිහාසික හා ආගමික වටිනාකම් පවතින විහාරස්ථානයක් මෙන්ම ඉතා ආකර්ෂණීය ස්ථානයක පිහිටා ඇත.

ගල්පොත්තාවල රජමහා විහාරය

බෞද්ධ ජනතාවගේ මුදුන්මල්කඩක් ලෙස සැලකෙන ශ්‍රී පාදස්ථානයේ කරඬුව හා දේවාභරණ තැම්පත් කර ඇත්තේ ගල්පොත්තාවල රජමහා විහාරය නොහොත් ශ්‍රීපාද රජමහා විහාරයේ සමන්දේව මන්දිරයේය. සෑම වසරකම දෙසැම්බර් මස උඳුවප් පොහෝ දින මෙම විහාරස්ථානයේ සිට මාර්ග කිහිපයක් ඔස්සේ පෙරහැර ආකාරයෙන් කරඬුව හා දේවාභරණ ශ්‍රී පාද මළුව වෙත වඩම්මනු ලැබේ. පැල්මඩුල්ල නගරයේ පවතින පුරාණ වැදගත්කමක් පවතින බෞද්ධ වෙහෙර විහාරස්ථාන මෙන්ම සංස්කෘතික අංග මෙම ප්‍රදේශයේ අනන්‍යතාවය ඉස්මතු කරමින් මෙම ප්‍රදේශයේ සංවර්ධනය පුළුල් කිරීමට අවස්ථාව සැලසේ.

රූපය අංක 3.26 : ගල්පොත්තාවල රජමහා විහාරය



රූපය අංක 3.27 : සුදර්ශනී ධර්ම ශාලාව

මූලාශ්‍රය: National Trust – Sri Lanka Quarterly Tours – Saturday, 25th February 2012.February 2012

සුදර්ශනී ධර්මශාලාව වර්ෂ 1867 - 1868 කාල පර්ඡේදය තුළ ඉද්දමල්ගොඩ නිළමේතුමා විසින් මෙම ධර්මශාලාව ඉදිකර ඇත. නුවර යුගයේ හා යුරෝපා ගෘහනිර්මාණ ශිල්පීය ක්‍රම අනුව මෙම ධර්මශාලාව ඉදිකර ඇත.

ඉද්දමල්ගොඩ වලව්ව

සමන්දේවාලයේ ප්‍රධාන බස්නායක නිළමේතුමා ලෙස කටයුතු කරන ලද ඉද්දමල්ගොඩ නිළමේතුමාට අයත් මෙම වලව්ව 19 වන සියවසේ මුල් භාගයේ ඉදිකරන ලදැයි සැලකේ. පැරණි වලව් සම්ප්‍රදාය හා ඒ ආශ්‍රිත ගෘහ නිර්මාණ ශිල්පය දැකබලා ගැනීමට මෙවැනි නිර්මාණ ඉතා වටිනා සම්පතකි.

රූපය අංක 3.28 : ඉද්දමල්ගොඩ වලව්ව

මූලාශ්‍රය : අන්තර්ජාලයෙනි

කහවත්ත දුම්රිය ස්ථානය

යටත්විජිත පාලන සමයේ ප්‍රධාන බෝග වගාවන් කිහිපයක් හඳුන්වා දුන් අතර එම බෝග ප්‍රවාහනය සඳහා අදාළ ප්‍රදේශ ආවරණය කරමින් බ්‍රිතාන්‍යයන් විසින් දුම්රිය මාර්ග ඉදිකර දුම්රිය මාර්ග ඉදිකර ඇත. ඒ අනුව 1912 වසරේ ඉදිකරන ලද කැලණිවැලි දුම්රිය මාර්ගය ඕපනායක දක්වා ක්‍රියාත්මක වී ඇති අතර කහවත්ත දුම්රිය නැවතුම් ස්ථානය තවමත් දැකබලා ගත හැකිවේ.

රූපය අංක 3.29 : කහවත්ත දුම්රිය ස්ථානය

මූලාශ්‍රය : අන්තර්ජාලයෙනි

මේ අනුව පැල්මඩුල්ල හා කහවත්ත නගර සංවර්ධනය සිදුකිරීම සඳහා නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය කරුණු කිහිපයක් ඔස්සේ ගොනුකර දැක්විය හැකි වේ.

03 වන පරිච්ඡේදය

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව

- පැල්මඩුල්ල හා කහවත්ත නගර සඳහා මේවන තෙක් ගැසට් මගින් ප්‍රකාශිත සංවර්ධන සැලැස්මක් සකස්කර නොතිබීම
- මැණික් ත්‍රිකෝණයේ පිහිටි ප්‍රදේශයක් වශයෙන් මැණික් කර්මාන්තය පදනම්කරගනිමින් නාගරික සංවර්ධනය වැඩි දියුණු කරගත හැකිවුවද මේ එසේ සිදු කිරීමට අසමත් වීම
- දිස්ත්‍රික්කයේ රබර් හා තේ වගාවට සැලකිය යුතු දායකත්වයක් සැපයීම
- මෙම ප්‍රදේශයේ පවතින භූගෝලීය පිහිටීම නගරයේ සංවර්ධනය පුළුල් කිරීමට බාධාවක් වීම
- සංචාරක ආකර්ශනිය ස්ථාන බොහොමයක් පැවතුනත් එම සම්පත් සංචාරක ආකර්ශනය සඳහා යොදා නොගැනීම
- යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය මෙම නගර දෙකට අතරමැදිව පනාවන්න ප්‍රදේශය දක්වා යෝජිත වීම
- යෝජිත කැළණිවැලි දුම්රිය මාර්ගය කහවත්ත නගරය හරහා ක්‍රියාත්මක වීම

පරිච්ඡේදය 04

සංවර්ධන සැලසුම් රාමුව

04 වන පරිච්ඡේදය

සංවර්ධන සැලසුම් රාමුව

4.1 දැක්ම

දැක්ම

සැඟවුණු සෞභාග්‍යයේ ද්වාරය (The Portal of Hidden Prosperity)

රූපය අංක 4.1 : නගර සංවර්ධන දැක්ම

මූලාශ්‍රය : අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

දැක්මේ ප්‍රකාශනය

4.2 දැක්මේ ප්‍රකාශනය

නගර සංවර්ධන දැක්මෙහි විස්තරාත්මක ප්‍රකාශණය තුළින් ප්‍රකාශිත වන්නේ කහවත්ත හා පැල්මඩුල්ල නගරයන්හි පවතින මැණික් සම්පත තිරසාර ලෙස උපයෝගී කර ගනිමින්, ශ්‍රී ලංකාවේ මැණික් අනන්‍යතාවයේ ප්‍රධාන සලකුණ බවට පත් කිරීමත්, කෘෂිකාර්මික බෝගවගා ආර්ථිකය ප්‍රශස්තිකරණය කරමින් ද, සංචාරක ආකර්ශණිය ස්ථානයන්හි ප්‍රවණතාවයන් වඩාත් උචිත ලෙස භාවිතා කරමින් නගරයේ පවතින අනන්‍යතාවය සුරැකෙන ලෙස භෞතික, සමාජීය, පාරිසරික හා ආර්ථික යහපැවැත්ම තහවුරු වූ ජීවත් වීමට උචිත වටපිටාවක් සහිත සෞභාග්‍යමත් ද්විත්ව නගරයක් බිහිකිරීමයි.

"සැඟවුණු" යන්නෙන් මෙම ප්‍රදේශයට බොහෝ සෙයින් අනන්‍ය වූ ගැඹුරු හා දෝනා පතල් ආශ්‍රිත ක්‍රියාකාරකම් ගැබ් වූ අවකාශය එනම් බොහොමයක් ජනතාවගේ ජීවන මාර්ගය වූ මතුපිට පොළොවෙන් යට අඩි ගණනක් ගැඹුරින් සිදු කෙරෙන පතල් කටයුතු පිළිබඳ අදහස් කෙරෙන අතර ඒ තුළින් මෙම ප්‍රදේශයේ අනන්‍යතාවය ඉස්මතු කිරීමට එම අදහස භාවිතා කර ඇත. "සෞභාග්‍යයේ" යන්නෙන් එකී සැගවුණු අවකාශය තුළ සිටිමින් මැණික් ඉල්ලම් කණින ජනතාවගෙ මෙන්ම, සියලුම නගරවැසියන්ගේ එකී නගරය තුළ සමෘද්ධිමත් ජීවිතයක් ගතකිරීමේ

අපෙක්ෂාව පිළිබිඹු කෙරේ. නගරයේ සමෘද්ධිය උදාකර ගැනිම සඳහා එහි ජිවත්වන ජනතාව එකි අවකාශය භාවිතා කරන ආකාරය වැදගත් වන අතර සියලු ක්‍රියාදාමයන් ඒ හා බැදි පවති.

මේ අනුව සැඟවුණු සෞභාග්‍ය සොයායාම සඳහා වන ද්වාරය විවර කර ගැනීම සඳහා “සැඟවුණු සෞභාග්‍යයේ ද්වාරය” යන දැක්ම තුළින් වර්ෂ 2033 වනවිට මෙම ප්‍රදේශය පුරා සැඟව පවතින සම්පත් කරා පහසුවෙන් ළගාවීමේ හැකියාව ලබාදීම හා ඒ තුළින් මෙම නගර වැසියන්ට සෞභාග්‍යමත් තිරසාර නගරයක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය ඉඩ හසර සලසා දීම අරමුණු කර ඇත.

4.3. ඉලක්ක

ඉලක්ක

1. පැල්මඩුල්ල සහ කහවත්ත නගර ශ්‍රී ලංකාවේ මැණික් අනන්‍යතාවයේ ප්‍රධාන සලකුණ බවට පත් කිරීම.
2. තේ හා රබර් මුලික කරගත් කෘෂි ආර්ථිකය හා මැණික් ඇතුළු නාගරික සම්පත් තුළින් ස්වයංපෝෂිත නගරයක් බිහි කිරීම
3. නගරයේ පාරිසරික අනන්‍යතාවය ආරක්ෂා කරමින් සංචාරයට හා වාසයට සුවපහසු නගරයක් නිර්මාණය කිරීම

4.4. අභිමතාර්ථ

අභිමතාර්ථ

1. පැල්මඩුල්ල සහ කහවත්ත නගර ශ්‍රී ලංකාවේ මැණික් අනන්‍යතාවයේ ප්‍රධාන සලකුණ බවට පත් කිරීම.
   - 1.1. වර්ෂ 2033 වනවිට මැණික් කැණීම් කර්මාන්තය ආශ්‍රිත පහසුකම් සැපයීම තුළින් දළ දේශීය නිෂ්පාදනයට 1 % කින් දායකවීම
   - 1.2. කලාපීය ප්‍රජාවට මැණික් කර්මාන්තය ආශ්‍රිත නව අවස්ථා සඳහා පහසුකම් සැලසීම තුළින් වර්ෂ 2033 වන විට පැල්මඩුල්ල සහ කහවත්ත ප්‍රදේශයේ ඒක පුද්ගල ආදායම 10% කින් ඉහළ නැංවීම.
   - 1.3. වර්ෂ 2033 වන විට ආරක්ෂිත සහ පරිසර හිතකාමී ක්‍රමවේද හඳුන්වාදීම තුළින් මැණික් කැණීමෙ කර්මාන්තයේ දී සිදුවන පාරිසරික බලපෑම් සහ ජීවිත අවදානම අවම කිරීම

2. තේ හා රබර් මූලික කරගත් කෘෂි ආර්ථිකය හා මැණික් ඇතුළු නාගරික සම්පත් තුළින් ස්වයංපෝෂිත නගරයක් බිහි කිරීම
   2.1. දැනට පවතින තේ හා රබර් නිෂ්පාදනය 2% කින් වැඩි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
   2.2. වර්ෂ 2033 වන විට මෙම ප්‍රදේශයේ ප්‍රයෝජනයට නොගත් ස්වභාවික, සංස්කෘතික හා සංචාරක විභවයන් හරහා වසරකට සංචාරකයින් 50,000ක් ආකර්ෂණය කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
   2.3 වර්ෂ 2033 වන විට මෙම ප්‍රදේශයේ පාසල් හැර යන සිසුන් සඳහා වෘත්තීය පුහුණු අවස්ථා ලබාදීම තුළින් දැනට පවතින නිපුණතා ශ්‍රම බලකාය 20% කින් වැඩි කිරීම.

3. නගරයේ පාරිසරික අනන්‍යතාවය ආරක්ෂා කරමින් සංචාරයට හා වාසයට සුවපහසු නගරයක් නිර්මාණය කිරීම
   3.1. පැල්මඩුල්ල හා කහවත්ත නගර ආපදා අවධානම අවම ප්‍රදේශයක් බවට පත්කිරීම
   3.2. පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි වර්ෂ 2033 වනවිට අවශ්‍ය පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා වන පහසුකම් සැලසීම
   3.3. වර්ෂ 2033 වනවිට අපේක්ෂිත නේවාසික හා සංසරණ ජනගහනයට අවශ්‍ය භෞතික හා සාමාජීය යටිතල පහසුකම් 100% සැපයීම සඳහා පහසුකම් සැලසීම

පරිච්ඡේදය 05

ශ.දු.අ.ත. විශ්ලේෂණය

05 වන පරිච්ඡේදය

ශ.දු.අ.ත. විශ්ලේෂණය

සාරාංශගත ශ.දු.අ.ත. විශ්ලේෂණය

5.1 සාරාංශගත ශ.දු.අ.ත. විශ්ලේෂණය

ඉලක්ක 01

පැල්මඩුල්ල සහ කහවත්ත නගර ශ්‍රී ලංකාවේ මැණික් අනන්‍යතාවයේ ප්‍රධාන සලකුණ බවට පත් කිරීම.

වගු අංක 5.1 : ඉලක්ක 01 ට අදාළ ශ.දු.අ.ත. විශ්ලේෂණය

ශක්තීන්	දුර්වලතා	අවස්ථා	තර්ජන
සැලසුම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ මැණික් ත්‍රිකෝණය තුළ පිහිටා තිබීම මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ කර්මාන්තය ශ්‍රී ලංකා අපනයන ආදායමට 2.6% කින් දායක වීම රත්නපුර දිස්ත්‍රික්කයේ නගර අතරින් වැඩිම පතල් හා කැණීම් සංඛ්‍යාවක් පැල්මඩුල්ල ප්‍රදේශයේ පැවතීම වටිනාකමින් ඉහළ මැණික් විශේෂ කිහිපයක්ම පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රදේශයෙන් හමු වීම අධ්‍යන ප්‍රදේශයේ ශ්‍රම බලකායෙන් 48 % වැනි වැඩිම ප්‍රතිශතයක් ප්‍රාථමික රැකියා වල නිරත වීම (elementary occupations) පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි දැනට පවතින මැණික් ආශ්‍රිත වෙළඳ කටයුතු	මැණික් ගල් සැකසුම් කටයුතු ඉතා අවම මට්ටමක පැවතීම අනවසර මැණික් පතල් කැණීම් ප්‍රමාණය වැඩි වීම මැණික් කර්මාන්තය තුළ පවතින ආර්ථික විෂමතාවය මැණික් කර්මාන්තයේ පවතින අවිනිශ්චිතතාවය	වර්ෂ 2050 සඳහා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම තුළ සැලසුම් ප්‍රදේශය පතල් හා කැණීම් ආශ්‍රිත කර්මාන්ත මූලික කරගත් ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන තිබීම ලංකාවේ පවතින ප්‍රධාන මැණික් වෙළඳ නගරය හා යෝජිත ජාතික මැණික් මධ්‍යස්ථානය වන රත්නපුර නගරයට ආසන්නව පිහිටා තිබීම ලොවපුරා ශ්‍රී ලංකාවේ මැණික් සඳහා පවතින ඉල්ලුම යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය පැල්මඩුල්ල දක්වා ක්‍රියාත්මක වීම	මැණික් කැණීම් තුළින් සිදුවන පාරිසරික හානි පරිබාහිර ස්ථාන වල පිහිටා ඇති මැණික් වෙළඳ ස්ථාන හා ව්‍යාජ මැණික් ගල්

වගු අංක 5.2:ඉලක්ක 02 ට අදාළ ශ.දු.අ.ත. විශ්ලේෂණය

ශක්තීන්	දුර්වලතා	අවස්ථා	තර්ජන
සැලසුම් ප්‍රදේශයේ භූමි ප්‍රමාණයෙන් 24%ක් තේ හා රබර් වගාවන්ගෙන් සමන්විත වීම	කහවත්ත නගරයෙන් කොටසක් පැල්මඩුල්ල පරිපාලන සීමාව තුළ පිහිටා තිබීම	ශ්‍රී ලංකාවේ තේ වගා කරන දිස්ත්‍රික්ක අතරින් රත්නපුර දිස්ත්‍රික්කය දෙවන ස්ථානයේ පසුවීම	ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය හා අපනයනය අඩුවෙමින් යන ප්‍රවණතාවයක් පෙන්නුම් කිරීම
සැලසුම් ප්‍රදේශයේ තේ කර්මාන්තශාලා 18 ක් පමණ පිහිටා තිබීම	නගර මධ්‍යයේ පවතින ආර්ථික වටිනාකමින් ඉහළ ඉඩම් ප්‍රශස්ථ භාවිතයන් සඳහා යොදා නොගැනීම	ශ්‍රී ලංකාවේ රබර් වගා කරන දිස්ත්‍රික්ක අතරින් රත්නපුර දිස්ත්‍රික්කය තෙවන ස්ථානයේ පසුවීම	ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනය හා අපනයනය අඩුවෙමින් යන ප්‍රවණතාවයක් පෙන්නුම් කිරීම
සැලසුම් ප්‍රදේශයේ භූමි ප්‍රමාණයෙන් 13 % ක භූමි ප්‍රමාණයක් වී වගාවන්ගෙන් සමන්විත වීම	නගර අභ්‍යන්තරයට ගමන් ගන්නා මාර්ග හොද තත්ත්වයේ නොතිබීම	ලොව ප්‍රධාන තේ අපනයන රටවල් 10 අතරට ශ්‍රී ලංකාව ඇතුළත්ව පැවතීම	
වගා කිරීමට සුදුසු සාරවත් පසක් හා හිතකර දේශගුණික තත්ත්වයක් පැවතීම		යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ පනාවැන්න අන්තර් හුවමාරුව පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යට ඉතා ආසන්න දුරකින් පිහිටීම	
මෙම ප්‍රදේශයේ දැනට ස්ථාපිතව පවතින කර්මාන්ත දැනට ව්‍යාප්තව පවතින වාණිජ ක්‍රියාකාරකම් සංචාරක ආකර්ෂණයෙන් ගිලිහී පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන		ප්‍රදේශය අවට පිහිටා තිබෙන සංචාරක ආකර්ෂණීය ස්ථාන නැවත ක්‍රියාත්මක කිරීමට යෝජිත කැළණිවැලි පැරණි දුම්රිය මාර්ගය (අවිස්සාවේල්ලේ සිට ඕපනායක දක්වා) කහවත්ත නගර පිවිසුම ආසන්නයේ පිහිටීම	

ඉලක්ක 03: නගරයේ පාරිසරික අනන්‍යතාවය ආරක්ෂා කරමින් සංචාරයට හා වාසයට සුවපහසු නගරයක් නිර්මාණය කිරීම

වගු අංක 5.3:ඉලක්ක 03 ට අදාළ ශ.දු.අ.ත. විශ්ලේෂණය

ශක්තීන්	දුර්වලතා	අවස්ථා	තර්ජන
ජීවත්වීමට උචිත හරිත වටපිටාවක් හා දේශගුණයකින් සමන්විත වීම නගරයේ පවතින සෞඛ්‍ය සේවා පහසුකම් නගරයේ ව්‍යාප්තව පවතින අධ්‍යාපන සේවා පහසුකම් නගරයේ ව්‍යාප්තව පවතින ජල මුලාශ්‍ර පද්ධතිය 60% ක් පමණ සංවර්ධනය කළ හැකි ඉඩම් පැවතීම	නගර මධ්‍යයේ පවතින රථවාහන තදබදය නගරයෙන් පිටතට ගමන් ගන්නා මාර්ග හොඳ තත්ත්වයේ නොපැවතීම ප්‍රමාණවත් තරම් විනෝදාස්වාද කටයුතු පහසුකම් නොතිබීම ජල රක්ෂිත සීමාවන් තුළ සිදුවන අනවසර ඉදිකිරීම් පානීය ජලය සැපයීම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සේවා පහසුකම් ප්‍රමාණවත් නොවීම	යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ පනාවැන්න අන්තර්හුවමාරුව පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යට ඉතා ආසන්න දුරකින් පිහිටීම නැවත ක්‍රියාත්මක කිරීමට යෝජිත කැළණිවැලි පැරණි දුම්රිය මාර්ගය (අවිස්සාවේල්ලේ සිට ඕපනායක දක්වා) කහවත්ත නගර පිවිසුම ආසන්නයේ පිහිටීම	පතල් කැණීම මගින් සිදුවන පාරිසරික හානි හා භූමිය අස්ථාවර වීම ගංවතුර හා නායයෑම් වැනි ආපදාවන්ගේ බලපෑම

5.2 විස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය

ශක්තීන් : ඉලක්ක 01

1. සැලසුම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ මැණික් ත්‍රිකෝණය තුළ පිහිටා තිබීම

ඈත අතීතයේ සිට ලක් පොළොවෙන් මැණික් මතුවුණ නිසා ශ්‍රී ලංකාව රත්නභූමි ලෙස හඳුන්වා ඇත. ස්ථිර රසායනික සංයුතියක් හා ක්‍රමවත්ව සැකසුණු පරමාණු සැකැස්මකින් සමන්විත ස්වභාවික අකාබනික ක්‍රියාවලියකට අනුව නිර්මාණය වුණු සමජාතීය ඝනයක් ඛණිජයක් ලෙසින් හඳුන්වයි. මැණික් ද ඛණිජ පවුලට අයත් වුණත් එහි තිබෙන සුවිශේෂී ගුණාංගයන් නිසා අනිකුත් ඛණිජ වලට වඩා වැඩි වටිනාකමක් එයට ලැබී ඇත. මැණික් වලට සුවිශේෂී වටිනාකමක් ලැබී තිබෙන්නේ මැණික් වල පවතින කල්පැවැත්ම, විරලතාවය හා අලංකාරත්වය වැනි ගුණාංග නිසාය.

ශ්‍රී ලංකාවෙන් හමුවන මැණික් නිධි ප්‍රාථමික නිධි සහ ද්විතියික නිධි වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකි වේ. ප්‍රාථමික මැණික් නිධියක මවු පාෂාණය සහ මැණික් එකට පිහිටා ඇත. නමුත් ද්විතියික මැණික් නිධියක පිහිටා තිබෙන මැණික් මවු පාෂාණයෙන් වෙන්ව ජලයත් සමග සේදී ගොස් වෙන්ව පවතී. එවැනි නිධි ඉල්ලම් පස් ලෙස හඳුන්වනු ලබයි. ද්විතියික මැණික් නිධි සුලභව දක්නට ලැබුණත් ප්‍රාථමික මැණික් නිධි සුළු වශයෙන් හෝ දක්නට ලැබෙන්නේ ඔක්කම්පිටිය, ඇළහැර, බකමූණ වැනි ප්‍රදේශවලයි.

ඒ අතරින් පැල්මඩුල්ල හා කහවත්ත නගරවල පිහිටා ඇත්තේ ද්විතියික මැණික් නිධි වේ. ද්විතියික නිධිද ප්‍රධාන වශයෙන් අවශේෂ නිධි, අවළු නිධි හා දියළු නිධි ලෙස වර්ග තුනකි. මේ අතරින් මැණික් බහුලවම පිහිටා ඇත්තේ දියළු නිධි වලයි. මෙම දියළු මැණික් ඉල්ලම් කඳු වැටි අතර ඇති නිම්න පත්ලෙහි සෑදෙන අතර ඒවායේ අවසාදිත තට්ටු ඒ ඒ ස්ථානය අනුව මීටර් 30 ක් හෝ 40 ක් (අඩි 100ක් හෝ 120 ක්) දක්වා ගැඹුරු වේ. එනමුත් බොහොමයක් පතල් මීටර් 15 කට වඩා අඩු ඒවා වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් මැණික් හමුවන දිස්ත්‍රික්කය රත්නපුරයි. "රත්නපුරය" යන නම ලැබී තිබෙන්නේද බහුලව මැණික් නිධි පිහිටා තිබෙන නිසාය. ශ්‍රී ලංකාවේ උස්බිම් කලාපයේ පිහිටා ඇති පැල්මඩුල්ල හා කහවත්ත නගර ශ්‍රී ලංකා මැණික් ත්‍රිකෝණයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා මැණික් ත්‍රිකෝණය අවිස්සාවේල්ල, බලංගොඩ හා අකුරැස්ස යන නගර සීමාවන් වලින් සීමා වේ (රූප සටහන 5.1).

පාංශු ස්ථර වල පිහිටීම අනුව මැණික් ඛණිජ පිහිටීම රත්නපුර දිස්ත්‍රික්කයට අමතරව ගාල්ල, මාතර, මොණරාගල ආදී අනෙකුත් දිස්ත්‍රික්ක වල ද සුළු වශයෙන් දැකගත හැකිවේ. මේ අතරින් 70% වැනි ප්‍රමාණයක් මැණික් සම්පත රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

රූපය අංක 5.1: මැණික් ඛණිජ පිහිටීම





මූලාශ්‍රය : https://www.gia.edu/gia-news-research-sri-lanka-mining-part1?rendermode=preview%3Freportno%3D
https://www.scribd.com/document/440285082/Geology-and-Occurrence-of-Gems-in-Sri-Lanka#

The Highland Complex of Sri Lanka is the most important area for formation of gemstone deposits. Illustration by Peter Johnston, © GIA
Geology and Occurrence of Gems in Sri Lanka J. W. NERATH Oceanography Unit, National Aquatic Resources Agency, Colombo 15, Srl Lanka*

2. මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ කර්මාන්තය ශ්‍රී ලංකා අපනයන ආදායමට 2.6% කින් දායක වීම

ශ්‍රී ලංකාවේ අපනයනයන් ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික, කාර්මික හා ඛණිජ සහ වෙනත් යන වර්ගීකරණ යටතේ හඳුනාගත හැකිවේ. මේ අතරින් 78.9% ක අපනයනයක් සපයන්නේ කාර්මික අංශය තුළිනි. 2019 වර්ෂයේ දී කාර්මික අංශයට අයත් මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ කර්මාන්තය ශ්‍රී ලංකා අපනයන ආදායමට 2.6 %කින් දායක වී ඇත. වර්ෂ 2011 සිට 2016 දක්වා මෙම කර්මාන්තයේ අපනයන ආදායම අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කලද 2016 සිට 2019 දක්වා වර්ධනය වීමේ ප්‍රවනතාවයක් දැකගත හැකිවේ. මේ අනුව මැණික් කර්මාන්තය ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීමෙන් මෙම අපනයන ආදායම තවදුරටත් ප්‍රවර්ධනය කළ හැකිවේ.

රූපය අංක 5.2: මැණික් ඛණිජ පිහිටීම



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2019

3. රත්නපුර දිස්ත්‍රික්කයේ නගර අතරින් වැඩිම පතල් හා කැණීම් සංඛ්‍යාවක් පැල්මඩුල්ල ප්‍රදේශයේ පැවතීම

ද්විතියික ඉල්ලම් නිධි පිහිටා ඇති පැල්මඩුල්ල නගරය අතීතයේ සිටම මැණික් පතල් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධව ඇත. කඳු හා තැනිතලා යන භූ ලක්ෂණ වලින් සමන්විත මෙම ප්‍රදේශයේ බොහෝ ස්ථාන වලින් මැණික් හමු වී ඇත. මෙම ප්‍රදේශයේ පිහිටීම සමග තැනිතලා ප්‍රදේශ වල ඉතා ගැඹුරින් මැණික් පිහිටා ඇති බැවින් එම ප්‍රදේශවල ගැඹුරු පතල් දැකගත හැකිවේ. මිට අමතරව දෝන පතල් හා දෙනවක ගග ආශ්‍රිතවද පතල් කැණීම් කටයුතු සිදු කෙරේ. රත්නපුර දිස්ත්‍රික්කයේ නගර අතරින් පතල් හා කැණීම් ප්‍රමාණය 18 % ක් ලෙස වැඩිම ප්‍රතිශතයක් වාර්තා කර ඇත්තේ පැල්මඩුල්ල ප්‍රදේශයයි. මෙම ප්‍රදේශයේ ජනතාවගෙන් බොහෝ පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය මැණික් කර්මාන්තයයි. ප්‍රධාන ජීවනෝපායට අමතරව, අමතර ආදායම් මාර්ගයක් ලෙස බොහෝ දෙනෙක් මෙම කර්මාන්තයේ නියැලෙනු ලැබේ.

සාම්ප්‍රදායික පතල් කර්මාන්තය ක්‍රියාත්මක කරන මෙම ප්‍රදේශයේ එම කර්මාන්තය ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ජාතික අපනයන ආදායම ඉහළ නැංවීමට මෙන්ම නගරයේ සංවර්ධන කටයුතු පුළුල් කිරීමටද හැකියාව ලැබේ.

රූපය අංක 5.3: පතල් කැණීම් - රත්නපුර දිස්ත්‍රික්කය 2019



මූලාශ්‍රය : Statistical Handbook, Ratnapura District

4. වටිනාකමින් ඉහළ මැණික් විශේෂ කිහිපයක්ම පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රදේශයෙන් හමු වීම

ලොව පුරා මේවනවිට මැණික් විශේෂ 200 ක් පමණ සොයාගෙන ඇති අතර, ඒ අතරින් විශේෂ 75ක් පමණ ශ්‍රී ලංකාවෙන් හමුවී ඇත. ලොවපුරා පවතින මැණික් වලින් නිල් මැණික් සඳහා ඉමහත් ප්‍රසිද්ධියක් ශ්‍රී ලංකාවට හිමි වී ඇත. නිල්, රතු, පුෂ්පරාග, වෛරෝඩි, පසිංගල්, කනක යනාදී මැණික් පැල්මඩුල්ල ප්‍රදේශයෙන් බහුල ලෙස හමුවන අතර රබහ, තෝරමල්ලි, ජාගුන් යන මැණික් සඳහා කහවත්ත ප්‍රදේශය ප්‍රසිද්ධව පවතී. මෙවැනි වටිනාකමින් ඉහළ මැණික් විශේෂ පැවතීම මැණික් හා පතල් කර්මාන්තය වැඩිදියුණු කරමින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ඇති වැදගත් අවස්ථාවකි.

රූපය අංක 5.4 : පැල්මඩුල්ල - කහවත්ත නගර තුළින් සුලභව හමුවන මැණික් වර්ග

මූලාශ්‍රය : https://shorturl.at/lqyL2

5. අධ්‍යන ප්‍රදේශයේ ශ්‍රම බලකායෙන් 48 % ක් වැනි වැඩි ප්‍රතිශතයක් ප්‍රාථමික රැකියා වල නිරත වීම (elementary occupations)

පැල්මඩුල්ල හා කහවත්ත නගර දෙකෙහි ජීවත්වන ජනතාවගෙන් බොහෝ දෙනෙක් ප්‍රාථමික රැකියාවල නිරත වේ. ප්‍රාථමික රැකියා යටතට පතල් කර්මාන්තය, තේ හා රබර් වැනි කෘෂිකාර්මික කටයුතුවල සේවාවන්හි නිරත වන පිරිස අයත් වේ. තේ, රබර් කර්මාන්තය හා අනෙකුත් රැකියාවල නිරතවන්නන් ද අමතර ආදායම් මාර්ගයක් ලෙස මැණික් පතල් කැණීම් කටයුතු වල නියැලෙනු ලැබේ. මේ අනුව සාම්ප්‍රදායික ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක කෙරෙන පතල් කර්මාන්තය ආශ්‍රිත වැඩි සේවක පිරිසක් නියැලීම මැණික් පතල් කැණීම් කර්මාන්තය ප්‍රවර්ධනය කරමින් නගරයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට පවතින වටිනා සම්පතකි.

රූපය අංක 5.5: රැකියා වර්ගීකරණය



මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2012

6. පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි දැනට පවතින මැණික් ආශ්‍රිත වෙළඳ කටයුතු

පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යයේ මැණික් මිළදී ගැනීමේ ස්ථාන බොහොමයක් පිහිටා ඇත. එම මැණික් මිළදී ගැනීමේ ස්ථාන වලට අමතරව පැල්මඩුල්ල බස් නැවතුම්පොළ ආසන්නයේ උදෑසන කාලයේ මැණික් ගැනුම්කරුවන් එක්රැස් වෙනු ලැබේ. මැණික් ගල් ඔපදැමීම වැනි අගය එක් කිරීමේ කටයුතු අවම මට්ටමක පැවතුනත් මැණික් මිළදී ගැනීමේ ස්ථාන බොහොමයක් මෙම ප්‍රදේශයේ පිහිටා ඇත. එමෙන්ම මැණික් වෙළඳාම සඳහා ජාත්‍යන්තර සුප්‍රසිද්ධියක් හිමිව පවතින ව්‍යාපාරික ස්ථානයන්ද මෙම නගර ආශ්‍රිතව පිහිටා තිබීම නාගරික ආර්ථික සංවර්ධනයට පවතින ශක්තියකි.

රූපය අංක 5.6 : පැල්මඩුල්ල විවෘත මැණික් වෙළපොළ

මූලාශ්‍රය : https://medium.com/justin-k-prim/aigs-sri-lanka-trip-2017-1393db48b388

දුර්වලතා : ඉලක්ක 01

1. මැණික් සඳහා අගය එක් කිරීමේ කටයුතු ඉතා අවම මට්ටමක පැවතීම

මැණික් කරමාන්තය ඉතා පුළුල් ක්‍රියාවලියක් ඔස්සේ ක්‍රියාත්මක වන කර්මාන්තයකි. මෙහි ආරම්භක ස්ථානය මැණික් පතලයි. ඉල්ලම් නොහොත් මැණික් නිධි වල පිහිටීම අනුව පතල්ද විවිධ වේ. ගැඹුරු පතල්, ගොඩ පතල්, දෝනා පතල් යනාදී වශයෙන් හඳුනාගත හැකිවේ.

රූපය අංක 5.7 : මැණික් කර්මාන්තයේ සැපයුම් ජාලය

මූලාශ්‍රය : (සැපයුම් ජාලය) – Industry Capability Report, EDB සමීක්ෂණයන්

2. අනවසර මැණික් පතල් කැණීම් ප්‍රමාණය වැඩි වීම

මැණික් පතල් කර්මාන්තය ආශ්‍රිතව පවතින ප්‍රධාන ගැටළුවක් ලෙස අනවසර මැණික් පතල් කැණීම හඳුනාගත හැකිවේ. පසුගිය වසර පහක කාලය තුල පැල්මඩුල්ල හා කහවත්ත නගර තුළ අනවසර පතල් කැණීම් ප්‍රමාණය වර්ධනය වීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කර ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ පවතින අනෙකුත් නගර හා සංසන්දනය කලවිට පැල්මඩුල්ල හා කහවත්ත නගර අනවසර පතල් කැණීම තුලින් තුන්වන ස්ථානයේ පසුවන බවට වාර්තා වී ඇත. මේ ආකාරයට අනවසර මැණික් පතල් කැණීම තුළින් සිදුවන පාරිසරික හානි මෙන්ම නගරයේ ආර්ථික සංවර්ධනයට එම සම්පත් විධිමත්ව භාවිතා කිරීමට නොහැකි වීම හේතුවෙන් පැල්මඩුල්ල හා කහවත්ත නාගරික ප්‍රදේශ ආශ්‍රිතව මැණික් පතල් කැනීමේ කටයුතු ප්‍රවලිත කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීම අපහසු වේ.

3. මැණික් කර්මාන්තය තුළ පවතින ආර්ථික විෂමතාවය

මැණික් කර්මාන්තයේදී පතලක සිට අවසන් වෙළඳපොළට නිකුත්වන මැණික දක්වා විවිධ අවස්ථා සම්බන්ධ වන සැපයුම් ජාලයකින් සමන්විත වේ. එකී ජාලය තුළ ආදායම් බෙදීයාමේ විෂමතාවයන් හඳුනාගත හැකිවේ. බොහෝවිට මැණික් පතලේ හිමිකාරිත්වය මැණික් ව්‍යාපාරිකයන් සතුවන අතර ඉඩම් හිමිකරුවන්, පතල බලාගන්නා අය හා කම්කරුවන් ඊට පහළින් සිටී. මෙවැනි පතලක කෙතරම් වටිනා මැණික් හමු වුවද මහා පරිමාණ වෙළඳුන් අතට මැණික් ගල පත්වන තෙක් වන ජාලයේ පහළින්ම සිටින කම්කරුවාට ලැබෙනුයේ එහි වටිනාකමින් සොච්චමකි. ව්‍යාපාරිකයන් සතුව මැණික් පතල් කිහිපයක් පැවතිය හැකි අතර පතලේ ස්වභාවය අනුව එම පතල් වල වැඩ කරන සේවක සංඛ්‍යාව අඩු වැඩි වීමක් සිදුවේ. මෙම සැලසුම් ප්‍රදේශයේ බොහොමයක් පතල් ගැඹුරු හා දෝනා ස්වභාවයක් පෙන්නුම් කරන බැවින් එවැනි පතලක පතල්කරුවන් 20 ක් 30 ක් පමණ සේවයේ නිරත වේ.

ජීවිත අවධානමක් ගෙන පතල් කැණීම් කටයුතු වල නියැලෙන පතල්කරුවන් සඳහා ලැබෙන ආදායම ඉතාම අවම මට්ටමක පවතිනවා මෙන්ම මැණික් ගල් ලැබෙන තුරු ඔවුනට ලැබෙන දීමනා ද ප්‍රමාණවත් නොවේ. මේ අනුව පතලක කෙතරම් වටිනා මැණික් හමු වුවද මෙම ජාලයේ පහළින්ම සිටිනා පතල්කරුවන් හට ලැබෙනුයේ එම මැණික් වටිනාකමින් ඉතා අඩු අගයක් වන බැවින් මැණික් කර්මාන්තය අතරමැදියන් බොහෝ ප්‍රමාණයක් අතට වාසි ලැබෙන කර්මාන්තයක් ලෙස ද හඳුනාගැනීමට හැකිවේ .

රූපය අංක 5.8 : පතලක ආදායම බෙදීයාම



මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත

4. මැණික් කර්මාන්තයේ පවතින අවිනිශ්චිතතාවය

අනෙකුත් කර්මාන්ත හා සංසන්දනය කළවිට මැණික් කර්මාන්තය අවිනිශ්චිතතාවය මත ගොඩනැගී පවතින කර්මාන්තයකි. මැණික් ගලක මිල විවිධ සාධක මත වෙනස් වීම, මැණික් ඉල්ලම් නිධි වල පිහිටීමෙ අවිනිශ්චිතතාවය, පතල්කරුවන්ගේ ජීවිත අවධානමක පැවතීම, දෛනිකව ක්‍රියාත්මක කළ නොහැකි කර්මාන්තයක් වීම යන කරුණු මැණික් කර්මාන්තයේ පවතින අවිනිශ්චිතතාවයට නිදසුන් වේ.

මැණික් පතල් කර්මාන්තයේ මූල්‍ය ධනය උත්පාදනය කරනු ලබන ප්‍රධානතම සම්පත මැණික් වන අතර මැණිකක මිල එකිනෙකට අනුව වෙනස් වේ. එය මැණික් ගලේ පැහැය, කැපුම, ප්‍රමාණය, හැඩය හා පිහිටිම මත තීරණය වේ.

රූපය අංක 5.9 : මැණික් ගලක මිළ තීරණය කරනු ලබන සාධක



මූලාශ්‍රය : https://www.gia.edu/gia-news-research/value-factors-design-cut-quality-colored-gemstone-value-factors

මැණික් ඉල්ලම් නිධි වල පිහිටීමද අවිනිශ්චිත වන අතර මව් පාෂාණයෙන් වෙන්ව සේදී ගොස් විවිධ තැන්වල විසිරි තැන්පත්ව ඇත. ඉල්ලම් පවතින ස්ථාන හදුනාගැනීමට විද්‍යාත්මක හෝ තාක්ෂණික ක්‍රමවේද භාවිතා නොකරන හෙයින් මැණික් ඉල්ලම් සෙවීම සඳහා වැයවන වියදමද වැඩි වේ.

මෙම ප්‍රදේශයේ මැණික් ඉල්ලම් සොයන පතල් ද විවිධ වන අතර බහුල වශයෙන් පවතින්නේ ගැඹුරු හා දෝන පතල්ය. ඒ අනුව පිහිටි පොළොව මට්ටමේ සිට අඩි 40 ක් 100 ක් හෝ ඊට වඩා ගැඹුරු පතල් ද මීටර් 50 ක් 60 ක් දක්වා දුරකට ව්‍යාප්ත වන දෝනා ද දැකගත හැකිවේ. නිසියාකාරව පතල සකස් නොකිරීමෙන් සිදුවන පතල් කඩාවැටීම්, පොළොව අභ්‍යන්තරව විෂ වායු නිකුත් වීම, පතල අභ්‍යන්තරයට සපයන ඔක්සිජන් ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම යන හේතු සාධක මත මැණික් පතල් කරුවන්ගේ ජීවිත අවධානමක පවතී.

රූපය අංක 5.10 : මැණික් පතල් කැණීම් වල පවතින ජීවිත අවධානම

මූලාශ්‍රය : https://rb.gy/s7esp

වාර්ෂිකව පවතින මෝසම් වර්ෂා සහිත කාලගුණය, ගංවතුර, නායයෑම් වැනි ස්වභාවික ආපදා මෙන්ම සිංහල හින්දු අලුත් අවුරුද්ද හා නත්තල් යනාදී උත්සව පවතින අවස්ථාවන්හිදීද මැණික් පතල් ක්‍රියාත්මක කළ නොහැකි වේ. එවැනි තත්ත්වයන් මත මැණික් කර්මාන්තය අවිනිශ්චිත කර්මාන්තයක් ලෙස හඳුනාගත හැකිවේ.

අවස්ථා - අරමුණ 01

1. වර්ෂ 2050 සඳහා සකස් කරන ලද ජාතික භෞතික සැලැස්ම තුළ සැලසුම් ප්‍රදේශය පතල් හා කැණීම් ආශ්‍රිත කර්මාන්ත මුලික කරගත් ආර්ථික සංවර්ධන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන පැවතීම.

වර්ෂ 2050 සඳහා යෝජිත ජාතික භෞතික සැලැස්ම තුළින් මෙම සැලසුම් ප්‍රදේශය පතල් කැණීම් ආශ්‍රිත සංවර්ධනයන් සඳහා නම්කර පැවතීම සංවර්ධන සැලැස්මේ අරමුණු ලගාකරගැනීමට පවතින වටිනා අවස්ථාවකි. ඒ අනුව මෙම ප්‍රදේශයේ පවතින මැණික් සම්පත ඵලදායිව යොදවමින් මැණික් කර්මාන්තය නවමානයකට ගෙන යාමේ හැකියාව පවතී. මේ තුළින් නාගරික අනන්‍යතාවය ඉස්මතු වන සාම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස සංවර්ධන ඉලක්ක ලගාකර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

2. ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන මැණික් වෙළඳ නගරය හා යෝජිත ජාතික මැණික් මධ්‍යස්ථානය වන රත්නපුර නගරයට ආසන්නව පිහිටා තිබීම

මේ වනවිට ලොව පුරා මැණික් කර්මාන්තයට ප්‍රසිද්ධව පවතින රත්නපුර නගරය ලංකාවේ ජාතික මැණික් වෙළඳ මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමට යෝජිතව ඇත. රත්නපුර නගර මධ්‍යයේ සිට කිලෝ මීටර් 22 ක දුරකින් පැල්මඩුල්ල නගරය පිහිටා ඇති අතර එමගින් මැණික් ආශ්‍රිත වෙළඳ කටයුතු සිදු කිරීම සඳහා වඩා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ඇත. මෙම ප්‍රදේශයේ මැණික් සම්පත් බාහිර ප්‍රදේශ වෙත ගලා යාම අවම කරගැනීමට එමගින් අවස්තාව සැලසෙනු ඇත.

3. ලොවපුර ශ්‍රී ලංකාවේ මැණික් සඳහා පවතින ඉල්ලුම

අතීතයේ සිටම මැණික් සඳහා සුප්‍රසිද්ධව පැවතිම හේතුවෙන් ශ්‍රී ලංකාව “රත්නද්විපය” නමැති විශේෂණ නාමයෙන් හඳුන්වා ඇත. ලෝකයේ ප්‍රමුඛ පෙලේ මැණික් නිෂ්පාදන රටවල් පහ අතරට ශ්‍රී ලංකාව ඇතුළත් වීම, මැණික් අපනයනයේ වර්ධනයක් පෙන්නුම් කිරීම, ශ්‍රී ලංකාවේ විවිධ මැණික් වර්ග ලොව පුරා ප්‍රසිද්ධව පැවතිම යන කරුණු තුළින් ලොවපුරා ශ්‍රී ලංකාවේ මැණික් සඳහා පවතින ඉල්ලුම සාක්ෂාත් වේ.

මේවනවිට ලෝකය පුරා මැණික් විශේෂ 200 ක් පමණ සොයාගෙන ඇති අතර ඉන් 75ක් ම ශ්‍රී ලංකාවෙන් හමු වී ඇත. නිල් ආර නූල සඳහා ශ්‍රී ලංකාව ලොව පුරා ප්‍රසිද්ධියට පත්ව ඇත. වර්ෂ 2010 සිට වර්ෂ 2018 දක්වාම මැණික් අපනයනයේ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

ශ්‍රී ලංකාවෙන් හමුවුන දුර්ලභ හා වටිනා ගනයේ මැණික් වර්ග ලොව පුරා ප්‍රභූවරුන් විසින් පරිහරණය කරනු ලබයි. බ්‍රිතාන්‍ය රාජකීය පරම්පරාවේ ඩයනා කුමරියගේ සිට පාරම්පරිකව භාවිතා කරන ගිවිස ගැනීම් මුදුවට භාවිතා කරන්නේද ශ්‍රී ලංකාවේ නිල් මැණිකකි. වර්ෂ 2016 දී ලෝකයේ විශාලතම නිල් ආර නූල ශ්‍රී ලංකාවෙන් හමු වූ අතර එහි වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 100 කි.

මෑතකාලීනව (2021) කහවත්ත නගරයෙන් ලෝකයේ විශාලම නිල් ආර නූල මැණික් පොකුර හමු වූ අතර එහි බර කිලෝග්‍රෑම් 510 කි. එය සෙරන්ඩිප් සෆායා ලෙස නම්කර ඇත. මෙවැනි විශාල පරිමාණයේ මැණික් හමුවීම තුළින් ශ්‍රී ලංකාව තවදුරටත් මැණික් සඳහා ලොව පුරා ප්‍රචලිතවීම සිදුවේ.

4. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය පැල්මඩුල්ල දක්වා ක්‍රියාත්මක වීම

මෙම සැලසුම් ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන මැණික් පතල් කැණීම් ආකෘතික මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමේදී මැණික් කර්මාන්තය ආශ්‍රිත සැපයුම් ජාලය විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම නගර වෙත පහසුවෙන් ලගාවීමේ හැකියාව මූලික වන අතර යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය ඒ සඳහා කදිම අවස්ථාවකි. මෙමගින් මැණික් මිළදී ගැනීම් කටයුතු මෙන්ම මැණික් පතල් කැණීම් කර්මාන්තය ආශ්‍රිත සංචාරක හා පර්යේෂණ කටයුතු පුළුල් කිරීමටද අවස්තාව සැලසෙනු ඇත.

තර්ජන : ඉලක්ක 01

1. මැණික් කැණීම් තුළින් සිදුවන පාරිසරික හානි

මැණික් පතල් කැණීම් කර්මාන්තය ආර්ථික වශයෙන් විශේෂ දායකත්වයක් සලසනවා මෙන්ම ඒ තුළින් සිදුවන පාරිසරික හානියේ බලපෑමද ඉහළ මට්ටමක පවතී. විශේෂයෙන් පතල් ක්‍රියාත්මක කරනු ලබන ආකාරය අනුව සිදුවන පාරිසරික හානියේ තරම දැකගත හැකිවේ. විශේෂයෙන් බැකෝ යන්ත්‍ර යොදා කරනු ලබන මැණික් පතල් කැණීම් තුළින් අවට පරිසරයේ පවතින ශාක විශේෂ හා පරිසර පද්ධති විනාශ වීම මෙන්ම, පාංශු ස්තරය අස්ථාවර වීම, අසළ පවතින ගොඩනැගිලි දෙදරීම් හා ඉරිතැලීම් වලට භාජනය වීම වැනි හානි සිදුවේ. සාම්ප්‍රදායික පතල් ක්‍රමවේදය

බැකෝ මගින් සිදුකරනු ලබන කැණීම් කටයුතු වලට වඩා පාරිසරික හානිය අවම මට්ටමක බව හඳුනාගෙන පවතී. කෙසේ වුවද නිවාස අභ්‍යන්තරව සිදු කරන අනවසර පතල් මෙන්ම දෝන පතල් බහුල වීමෙන් සමහර ස්ථාන ඉරිතැලීම් මෙන්ම ගිලා බැසීමටද ලක්වී ඇත. විශේෂයෙන් පතල් කැණීම් නිම කිරීමෙන් පසු විධිමත්ව එම පතල් නොවැසීමෙන් ඩෙංගු, මැලේරියා වැනි වසංගත රෝග පැතිරීමේ අවධානමක් ද පවතී.

2. පරිබාහිර ප්‍රදේශ වල පිහිටා ඇති මැණික් වෙළඳ ස්ථාන හා ව්‍යාජ මැණික් ගල්

ශ්‍රී ලංකාවේ ප්‍රධාන මැණික් නගරය රත්නපුර නගරය වුවද කොළඹ, බේරුවල හා ගිංතොට යන නගරවල ද මැණික් ඔප දැමීම, කැපීම, විද්‍යාගාර මට්ටමේ පරීක්ෂණ සිදු කිරීම ආදී මැණික් සඳහා අගය එක කිරීමේ කටයුතු මෙන්ම මැණික් වෙලදාම් කටයුතු ද සිදුවේ. රතන්පුර දිස්ත්‍රික්කයේ විවධ ප්‍රදේශ වලින් මිළදී ගන්නා රළු මැණික් ගල් අගය එක්කිරීම් වලට ලක්කර වෙළඳපොළට නිකුත් කිරීම මෙම නගර වලදී සිදු කෙරේ. මැණික් වෙළදාම සඳහා පැමිණෙන විදේශිකයන් මැණික් මිළදී ගැනීමට අමතරව ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට ද කැමැත්තක් දක්වන අතර එහිදී සංචාරක ආකර්ෂණය සහිත මුහුදුබඩ ප්‍රදේශ මෙන්ම සංචාරක හෝටල් ඇතුළු අනෙකුත් ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වැඩි වශයෙන් පවතින රත්නපුරෙන් පිටත පිහිටි නගර වෙත එම ගැනුම්කරුවන් ඇදීයාම දැකගත හැකිවේ.

එමෙන්ම මැණික් වෙළඳපොළ වෙත ව්‍යාජ මැණික් වර්ග ඉදිරිපත් කිරීම මැණික් වෙළදාමට මෙන්ම එහි විශ්වාසනියත්වයටද තර්ජනයක් වී ඇත.

ශක්තීන් : ඉලක්ක 02

1. සැලසුම් ප්‍රදේශයේ භූමි ප්‍රමාණයෙන් 24%ක් තේ හා රබර් වගාවන්ගෙන් සමන්විත වීම

පැල්මඩුල්ල හා කහවත්ත නගරයේ ප්‍රධාන ආර්ථික භෝග වගාවක් ලෙස රබර් වගාව දක්නට ලැබෙන අතර එම වගාව ආරම්භ වී ඇත්තේ බ්‍රිතාන්‍ය පාලන යුගයේ සිටය. මෙම නගර ස්වයංපෝෂිත නගර ලෙස සංවර්ධනය කිරීම් සඳහා රබර් කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවා නියුක්තිය නාගරික ආර්ථිකයට ලබාදෙන දායකත්වයක් ලෙස හදුනාගත හැකිය.

එමෙන්ම රබර් වගාට අමතරව පැල්මඩුල්ල හා කහවත්ත නගරයේ ප්‍රධාන ආර්ථික භෝග වගාවක් ලෙස තේ වගාවද හදුනාගත හැකිය. මෙම ප්‍රදේශයේ තේ වගාව

ආරම්භ වී ඇත්තේ බ්‍රිතාන්‍ය පාලන යුගයේ සිටය. මෙම නගර ස්වයංපෝෂිත නගර ලෙස සංවර්ධනය කිරීමේදී තේ වගාව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, ප්‍රදේශයේ ආර්ථිකය සවර්ධනයට පවතින ශක්තියක් ලෙස හඳුනාගත හැකිය.

2. සැලසුම් ප්‍රදේශයේ තේ කර්මාන්තශාලා 18 ක් පමණ පිහිටා තිබීම

තේ වගාව සිදුකෙරෙන ප්‍රදේශයක් මෙන්ම තේ නිෂ්පාදනය සිදුකිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා ද 18 ක පමණ ප්‍රමාණයක් සැලසුම් ප්‍රදේශය තුළ පිහිටා තිබීම තුළින් තේ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනය වැඩිදියුණු කරමින් අපනයන මට්ටමේ නිෂ්පාදන පුළුල් කර ගැනීමේ හැකියාව පවතී

රූපය අංක 5.11 : පැල්මඩුල්ල හා කහවත්ත නගරයේ පිහිටි තේ කර්මාන්තශාලා



මූලාශ්‍රය : Google Map

3. සැලසුම් ප්‍රදේශයේ 13% ක භූමි ප්‍රමාණයක් වී වගාවෙන් සමන්විත වීම

ආර්ථික බෝග වගාවන්ට අමතරව වී වගාව ප්‍රදේශය පුරා ප්‍රචලිතව පැවතීම මෙම නගර ස්වයංපෝෂිත නගර ලෙස සංවර්ධනය කිරීමට පවතින ශක්තියකි. තවද මැණික් පතල් කැණීම් කටයුතු බොහොමයක් කුඹුරු ඉඩම් තුළ සිදු කළද වී වගා කටයුතුද සිදුකර යමින් පවතී. බෝග වගාවකට අමතරව මෙම ප්‍රදේශයේ ආවේනිකත්වය ඉස්මතු කරන කුඹුරු බිම් සංචාරක ආකර්ෂණයට ඉඩ හසර සලසයි.

05 වන පරිච්ඡේදය

ශ.දු.අ.ත. විශ්ලේෂණය

4. වගා කිරීමට සුදුසු සාරවත් පසක් හා හිතකර දේශගුණික තත්ත්වයක් පැවතීම

කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත නගරයක් බිහිකිරීම සඳහා ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික කටයුතු විශාල දායකත්වයක් ලබාදේ. ඒ අනුව පවතින කෘෂිකාර්මික කටයුතු පුළුල් කරමින් ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක වශයෙන් නිෂ්පාදන වැඩි කිරීම සඳහා ප්‍රදේශයේ පවතින වගාවට හිතකර රතු දුඹුරු පස මෙන්ම පහත රට තෙත් කලාපීය දේශගුණයද මහත් පිටුවහලක් වේ.

5. මෙම ප්‍රදේශයේ දැනට ස්ථාපිතව පවතින කර්මාන්ත

දැනට මෙම ප්‍රදේශයේ විවිධ පරිමාණයේ කර්මාන්තශාලා ක්‍රියාත්මක වන අතර වැඩි ප්‍රමාණයක් ස්වයං රැකියා හා කුඩා පරිමාණයේ නිෂ්පාදන කර්මාන්ත වර්ගීකරණයට අයත් වේ. දැනට ක්‍රියාත්මකව පවතින මහා පරිමාණයේ කර්මාන්ත 4ක් හඳුනාගත හැකිය. ඒ අතරට කහවත්ත බ්‍රැන්ඩික් ඇඟළුම් නිෂ්පාදන කර්මාන්ත ආයතනය හා පැල්මඩුල්ල මැලිබන් ඇඟළුම් නිෂ්පාදන කර්මාන්ත ආයතනයද අයත්වේ. මෙම කර්මාන්තශාලා නාගරික ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරගැනීම සඳහා ආර්ථිකමය වශයෙන් නගරයට පවතින ශක්තියකි.

වගු අංක 5.4 : කර්මාන්ත වර්ගීකරණයන්ට අනුව පවතින ප්‍රමාණයන්

අංකය	කර්මාන්ත වර්ගීකරණය	ප්‍රමාණය
1	ස්වයං රැකියා	501
2	කුඩා පරිමාණයේ කර්මාන්ත	403
4	මධ්‍යම පරිමාණයේ කර්මාන්ත	10
5	විශාල පරිමාණයේ කර්මාන්ත	4
6	සාම්ප්‍රදායික කර්මාන්ත	13
සම්පූර්ණ කර්මාන්ත සංඛ්‍යාව		**934**

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, ප්‍රා.ලේ.කා., පැල්මඩුල්ල හා කහවත්ත - 2019

6. දැනට ව්‍යාප්තව පවතින වාණිජ ක්‍රියාකාරකම්

ස්වයංපෝෂිත නගරයක් ලෙස නාගරික ආර්ථිකය වර්ධනය කිරීම සඳහා ශක්තිමත් මූල්‍ය පද්ධතියක් අවශ්‍ය වන අතර ඒ සඳහා නගරය පුරා දැනට ස්ථාපිතව පවතින බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන සංඛ්‍යාව 45ක් පමණ වේ. රෙදිපිළි, නිමි ඇඳුම්, තොග හා සිල්ලර වෙළඳ ආයතන, ගෘහභාණ්ඩ, ගොඩනැගිලි ද්‍රව්‍ය, මුද්‍රණාල, ආහාර ද්‍රව්‍ය හා ආහාර නිෂ්පාදන ආශ්‍රිත වෙළඳසැල් වල ව්‍යාප්තියද වැදගත් වේ.

මෙවැනි වාණිජ ක්‍රියාකාරකම්වල පවත්නා ව්‍යාප්තිය නගරයට පැමිණෙන සංසරණ ජනගහනයට අවශ්‍ය වාණිජ අවශ්‍යතා ඉටුකර දිමටද මුල්‍ය ක්ෂේත්‍රයේ ආයෝජනයටද ශක්තියක් ලෙස පෙන්වා දිය හැක.

රූපය අංක 5.12 : පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි පිහිටි බැංකු හා මූල්‍ය ආයතන



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, ප්‍රා.ලේ.කා., පැල්මඩුල්ල, කහවත්ත - 2019

7. සංචාරක ආකර්ෂණයෙන් ගිලිහි පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන

පාරිසරික සංවේදී කලාපය තුළ පිහිටා ඇති පැල්මඩුල්ල හා කහවත්ත නගර සුන්දරත්වයෙන් ඉතා ඉහළ පරිසරයක් හිමි නගර දෙකකි. මෙම නගරයන්හි පවතින හරිත පැහැය අවට පවතින කඳු පද්ධති වලින් වඩාත් තීව්‍ර කරයි. කොළඹ - මඩකලපුව මාර්ගය ඔස්සේ පැල්මඩුල්ල නගරය හරහා ගමන් ගන්නා විට දකුණු පසින් කිරිබත්ගල කඳු වැටිය දැකගත හැකිවේ. ස්වභාවික දියඇලි කිහිපයකින්ම සමන්විත මෙම කඳු වැටිය ඉතා ආකර්ෂණීය ස්ථානයකි. මුහුදු මට්ටමේ සිට උසින් අඩි 3100ක් පමණ උසකින් සමන්විත වේ. මෙහි කඳු මුදුන තැනිතලාවක් ලෙසින් දිස්වෙන අතර එහි සිට පැල්මඩුල්ල හා කහවත්ත නගර දෙකම හොදින් දර්ශනය කරගත හැකිවේ.

මෙම නගර වෙත ආකර්ෂණය ඇති කරන ස්වභාවික සුන්දරත්වය මෙන්ම නගරය හා පවතින සංස්කෘතික, ආගමික හා ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන වල පිහිටීමද සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට පවතින ශක්තියකි.

පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන කිහිපයක්ම පැල්මඩුල්ල නගරය තුළ පිහිටා ඇත. විශේෂයෙන් බෞද්ධාගමිකයන්ගේ ඉතා ගෞරවාදරයට පත්ව පවතින

වන්දනීය ස්ථානයක් වන ශ්‍රී පාදස්ථානයේ සමන්දේව ප්‍රතිමාව හා දේවාභරණ තැම්පත් කර ඇති පැල්මඩුල්ල ගල්පොත්තාවල පුරාණ රජමහා විහාරස්ථානයේය. ශ්‍රීපාද වන්දනා සමය ආරම්භ වන උඳුවප් පොහෝ දින එම දේවාභරණ පෙරහැරකින් වැඩමවීම සිදුකරන අතර ශ්‍රී පාද වන්දනාසමය අවසන්වන වෙසක් පොහෝදින නැවත පෙරහැරකින් එකී දේවාභරණ ගල්පොත්තාවල රජමහා විහාරස්ථානය වෙත නැවත වැඩමවනු ලබයි.

අරමන්පොල රජමහා විහාරස්ථානය, පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරස්ථානය, පැල්මඩුල්ල නගරයේම පිහිටා ඇති සුදර්ශන ධර්මශාලාව හා ඉද්දමල්ගොඩ වලව්ව වැනි ස්ථාන පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන වශයෙන් ගැසට් කර ඇත.

මෙවැනි ස්ථාන වලට අමතරව සාම්ප්‍රදායික පතල් කර්මාන්තය මෙම ප්‍රදේශයට අනන්‍ය වූ කර්මාන්තයක් මෙන්ම සංචාරක ආකර්ෂණය සඳහා යොදාගත හැකි සම්පතකි. කොළඹ - මඩකලපුව ප්‍රධාන මාර්ගය දෙපස කුඹුරු ඉඩම් වල පවතින මැණික් පතල් සංචාරක කටයුතු වලදී සංචාරකයින්ට දැකබලා ගැනීමට සලස්වා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට පවතින ශක්තියක් ලෙස පෙන්වාදිය හැකිවේ.

දුර්වලතා : ඉලක්ක 02

1. කහවත්ත නගරය පැල්මඩුල්ල පරිපාලන සීමාව තුළ පිහිටීම

කහවත්ත නගරයේ ක්‍රියකාරිත්වමය නගර සීමාව ආරම්භ වන්නේ පැල්මඩුල්ල පරිපාලන සිමාවෙනි. වර්තමානයේ කහවත්ත බස් නැවතුම ලෙස භාවිතා කරන පැරණි දුම්රිය නැවතුම් ස්ථාන ගොඩනැගිලි, වාණිජ ගොඩනැගිලි, පාසලක් හා නේවාසික ගොඩනැගිලි මෙම ප්‍රදේශය තුළ පිහිටා ඇති ආකාරය දැකගත හැකිවේ. මෙම ප්‍රදේශය කහවත්ත නගරයේ පිවිසුම් ස්ථානය ලෙස හා නගර මධ්‍යයෙන් වෙන් වූ කොටසක් ලෙසද හඳුනාගත හැකිවේ. ඒ අනුව මෙම ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින වාණිජ හා අනෙකුත් ගොඩනැගිලිවල වරිපනම් එක්රැස් කිරීම සිදු කරනු ලබන්නේ ද පැල්මඩුල්ල පළාත් පාලන ආයතනය විසිනි. මේ අනුව කහවත්ත නගරයේ ආදායම් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට හිමිව පැවතීම හේතුවෙන් කහවත්ත නගරයේ ආර්ථික වර්ධනයට එම තත්ත්වය ගැටලුකාරී ස්වභාවයක් ඇතිකර ඇත. විශේෂයෙන් භූගෝලීය පිහිටීම අනුව කහවත්ත නගර මධ්‍ය ප්‍රදේශය පුළුල් කිරීමට දැනට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීමද කහවත්ත නගරය ස්වයංපෝෂිත නගරයක් ලෙස සංවර්ධනය කිරීමට පවතින දුර්වලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

2. නගර මධ්‍යයේ පවතින ආර්ථික වටිනාකමින් ඉහළ ඉඩම් ප්‍රශස්ථ භාවිතයන් සඳහා යොදා නොගැනීම

කහවත්ත පැරණි දුම්රිය ස්ථාන ගොඩනැගිලි ආශ්‍රිතව හා නගර මධ්‍යයේ ආර්ථික වටිනාකමින් ඉහළ ඉඩම්වල පැවතුනද එම ඉඩම් හා ගොඩනැගිලි නිසි භාවිතයකින් තොරව අත්හැර දමා පවතී. කහවත්ත කලාප අධ්‍යාපන කාර්යාලය හා රෝහල අතර භූමියේ පිහිටි පැරණි ගොඩනැගිල්ල ද භාවිතයකින් තොරව දිරාපත්වෙමින් ඇති අතර එම ස්ථාන ආර්ථික වශයෙන් නගරයේ සංවර්ධන කාර්යයන් සඳහා යොදාගත හැකි ස්ථාන වේ.

පැල්මඩුල්ල නගරයේ පැල්මඩුල්ල ප්‍රාදේශීය රෝහලට ගමන්කරන මාර්ගය ආසන්නයේ පැල්මඩුල්ල - නෝනාගම ප්‍රධාන මාර්ගයට මුහුණලා රජය සතු ඉඩමක පිහිටි ගොඩනැගිලි කිහිපයක්ද ගරාවැටෙමින් පවතින අතර එම ගොඩනැගිලි පිහිටි ස්ථානයද විධිමත් භාවිතයන් සඳහා යොදා ගත හැකි ආර්ථිකමය වටිනාකමෙන් ඉහළ ස්ථාන වේ.

3. නගර අභ්‍යන්තරයට ගමන් ගන්නා මාර්ග දූර්වල තත්ත්වයක පැවතීම

පැල්මඩුල්ල හා කහවත්ත නාගරික ප්‍රදේශ මැණික් කර්මාන්තය මෙන්ම ආර්ථික බෝග වගාවන් මූලික කරගත් ආර්ථික රටාවක් සහිත ප්‍රදේශ වන හෙයින් එකී ක්ෂේත්‍ර ආශ්‍රිත ආර්ථික කටයුතු විධිමත් ආකාරයෙන් සිදුකිරීම හා පවත්වාගෙනයාම සඳහා නගරයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ගමනාගමනයට පහසුවන පරිදි විධිමත්ව පැවතිය යුතු වේ.

අවස්ථා : ඉලක්ක 02

1. ශ්‍රී ලංකාවේ තේ වගා කරන දිස්ත්‍රික්ක අතරින් රත්නපුර දිස්ත්‍රික්කය දෙවන ස්ථානයේ පසුවීම

යටත්විජිත පාලන සමයේ මෙරට වගාකරන ලද ජනප්‍රිය ආර්ථික බෝගයක් වන තේ වගාව මේවනවිටත් බොහෝ පිරිසක් තම ප්‍රධාන ජවනෝපාය බවට පත්කරගෙන ඇත. ශ්‍රී ලංකාවේ පවතින දේශගුණික හා පාරිසරික තත්වයන් අනුව දිස්ත්‍රික්ක 14 ක පමණ තේ වගාව සිදුකරනු ලබන අතර එම දිස්ත්‍රික්ක අතරින් රත්නපුර දිස්ත්‍රික්කය දෙවන ස්ථානයේ පසුවේ. රත්නපුර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදනයෙන් 18%ක ප්‍රතිශතයක් සඳහා මෙම ප්‍රදේශය දායකත්වය සපයනු ලබයි.

ශ්‍රී ලංකාවේ තේ සඳහා ලොවපුරා පවතින ඉහළ ඉල්ලුම ද එකී ඉල්ලුම සපුරාලීමට රත්නපුර දිස්ත්‍රික්කය ලබාදෙන ඉහළ දායකත්වය ද මෙම කලාපයේ ආර්ථික සංවර්ධනයට ඇති අවස්තාවක් ලෙස හඳුනාගත හැකිවේ.

2. ශ්‍රී ලංකාවේ රබර් වගා කරන දිස්ත්‍රික්ක අතරින් රත්නපුර දිස්ත්‍රික්කය තෙවන ස්ථානයේ පසුවීම

රබර් වගාව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 19 ක පමණ සිදුකෙරෙන අතර රත්නපුර දිස්ත්‍රික්කය එම දිස්ත්‍රික්ක අතර තෙවන ස්ථානයේ පසුවීම මෙම කලාපයේ ආර්ථික සංවර්ධනය සඳහා යොදාගත හැකි අවස්ථාවකි. විවිධ නිෂ්පාදන ගණනාවක් සිදු කිරීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යයක් ලෙස රබර් යොදාගත හැකි අතර එකී අමුද්‍රව්‍ය යොදාගනිමින් ආර්ථික වාසි ගෙනදෙන රබර් ආශ්‍රිත නිමවුම් කර්මාන්ත බිහිකිරීමේ හැකියාව පවතී.

3. ලොව ප්‍රධාන තේ අපනයන රටවල් 10 අතරට ශ්‍රී ලංකාව ඇතුළත්ව පැවතීම

ලොවපුරා තේ පරිභෝජනය කරන බොහොමයක් රටවල් අතරින් ශ්‍රී ලංකා තේ සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. ශ්‍රී ලංකාව තේ අපනයනය තුළින් තුන්වන ස්ථානයේ පැවතීම තුළ ලොවපුරා ශ්‍රී ලංකා තේ සඳහා පවතින ඉල්ලුම හඳුනාගත හැකිවේ. ලොව හොඳ ඉල්ලුමක් පවතින නිෂ්පාදනයක් ලෙස පවතින තේ කර්මාන්තය වැඩිදියුණු කිරීම තුලින් මෙරට ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කරගත හැකිවේ. එය කලාපිය මෙන්ම නාගරික ආර්ථිකයේ වර්ධනයටද ඇති අවස්තාවක් ලෙස පෙන්වාදිය හැක.

4. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ පනාවැන්න අනත්ර්හුවමාරුව පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යට ඉතා ආසන්න දුරකින් පිහිටීම

නගරයක සිදු කරන නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අමුද්‍රව්‍ය, සේවකයින් හා නිෂ්පාදන ප්‍රවාහනය සඳහා වන පහසුකම් විධිමත්ව පැවතීම තුලින් අපේක්ෂිත ආර්ථික ඉල්ලක්ක වෙත පහසුවෙන් ලගාවිය හැකිවේ. පැල්මඩුල්ල හා කහවත්ත නගර දෙකට ආසන්න දුරකින් ඉදිවීමට යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ පනාවැන්න අන්තර්හුවමාරුව පිහිටා තිබීම මෙම නගරයන්හි සිදුකෙරෙන මැණික්, තේ, රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත මෙන්ම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ද ඇති වටිනා අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

5. ප්‍රදේශය අවට පිහිටා තිබෙන සංචාරක ආකර්ෂණීය ස්ථාන

සබරගමුව පළාත සංචාරක ආකර්ෂණීය ස්ථාන බොහොමයකින් සමන්විත කලාපයක් වන අතර මෙම පළාත ප්‍රධාන සංචාරක කලාප 7 කට වෙන්කර ඇත. ඒ අතරින් මෙම සැලසුම් ප්‍රදේශය මිණිපුර සංචාරක කලාපයට අයත් වේ. දේශීය හා විදේශීය සංචාරකයින් ඉතා ප්‍රිය කරන ආකර්ෂණීය ස්ථානයක් ලෙස ස්වභාවික දියඇලි හඳුනාගත හැකි අතර ශ්‍රී ලංකාව තුළ දියඇලි වැඩිම සංඛ්‍යාවක් එනම් 100 කට වැඩි දියඇලි ප්‍රමාණයක් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මෙම දියඇලි බොහොමයක් සංචාරක ආකර්ශනයෙන් සැගවී පවතින ඒවා වන අතර පැල්මඩුල්ල නගරය ආශ්‍රිත ප්‍රදේශයෙන්ද එවැනි ආකර්ෂණීය දියඇලි දැකගත හැකිවේ. පැල්මඩුල්ල දෙනවක ගගෙන් නිර්මාණය වී ඇති කිරිඳි ඇල්ලට අමතරව මරක්කල ඇල්ල, කුඩා ඇල්ල වැනි කුඩා දියඇලි කිහිපයක්ම මෙම ප්‍රදේශය ආශ්‍රිතව නිර්මාණය වී ඇත.

කඳු නැගීම වැනි සංචාරක ක්‍රියාකාරකම් සඳහා යෝග්‍ය කිරිබත්ගල කන්ද සංචාරක ආකර්ෂණය සඳහා මනා තෝතැන්නක් කරගත හැකි අතර එම කඳු මුදුනේ සිට ඇදහැලෙන පුළුන් ඇල්ල, ලිහිණියන් කෙලින ඇල්ල, බුලන ඇල්ල, කුරහන් ඇල්ල, මී බැදී ඇල්ල, බත්වාඩියගල ඇල්ල හා දුව ඇල්ල ආකර්ෂණීය දිය ඇලිවේ. මෙවැනි ස්වභාවික සුන්දරත්වයෙන් අනූන දියඇලි වල පිහිටීම නගරයේ සුන්දරත්වය ඉහළ නැංවීමට හේතුවී ඇති අතර මෙවැනි සම්පත් සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදාගැනීමට ඇති හැකියාව නාගරික ආර්ථිකයේ වර්ධනයට ඇති වටිනා අවස්ථාවකි.

6. නැවත ක්‍රියාත්මක කිරීමට යෝජිත කැළණිවැලි පැරණි දුම්රිය මාර්ගය (අවිස්සාවේල්ලේ සිට ඕපනායක දක්වා) කහවත්ත නගර පිවිසුම ආසන්නයේ පිහිටීම

අතීතයේ සිටම තේ, රබර් ප්‍රමුඛ වැවිලි බෝග වගාව සිදුකරගෙන එන ප්‍රදේශයක් ලෙසින් ඒ ආශ්‍රිත කටයුතු සාර්ථක කරගැනීම හා සංචාරක ආකර්ෂණය ස්ථාන වල සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා සංචාරකයින් ගෙන්වාගැනීමට පහසු ක්‍රමවේදයක් ලෙස දුම්රිය මාර්ග හඳුනාගත හැකිය. මේ තුළින් දේශීය හා විදේශීය සංචාරකයින්ට පහසුවෙන් මෙම ප්‍රදේශයට ඇතුළු වීමේ පහසුවද සැලසේ.

තර්ජන : ඉලක්ක 02

1. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය හා අපනයනය අඩුවෙමින් යන ප්‍රවණතාවයක් පෙන්නුම් කිරීම

ශ්‍රී ලංකා තේ සඳහා ලොව තුළ ඉහළ ඉල්ලුමක් පැවතියද සමස්තයක් ලෙස ලංකාවේ තේ නිෂ්පාදනය කරන ප්‍රමාණය අවම වීම හා එමගින් අපනයන සඳහා යොමුකෙරෙන ප්‍රමාණයද අවම වී පැවතීම ඉදිරියේදී තේ නිෂ්පාදන කර්මාන්තය ඉදිරියට ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින අභියෝගයකි. විශේෂයෙන් තේ නිෂ්පාදන ප්‍රබේද, පොහොර වල පවතින ගැටලු මෙන්ම ශ්‍රමිකයින් හිගවීම යන ගැටලු මත මෙම තත්වය උදාවී ඇත.

රූපය අංක 5.13 : ශ්‍රී ලංකා තේ ආනයනය (2012 – 2018)



මූලාශ්‍රය : Economic and Social Statistics of Sri Lanka, Central Bank Report, 2019

රූපය අංක 5.14 : ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය (2012 - 2018)



මූලාශ්‍රය : Economic and Social Statistics of Sri Lanka, Central Bank Report, 2019

2. ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනය හා අපනයනය අඩුවෙමින් යන ප්‍රවණතාවයක් පෙන්නුම් කිරීම

රබර් නිෂ්පාදනයටද ඉහළ ඉල්ලුමක් පැවතියද මේ වන විට ලංකාවේ සමස්ත රබර් නිෂ්පාදනය හා අපනයනය අඩුවීමේ ප්‍රවණතාවයක් දැකගත හැකි අතර එමගින් රබර් නිෂ්පාදනය ද තර්ජනයකට ලක්ව පවතින බව හඳුනාගත හැකිවේ. රබර් ඉඩම් නේවාසික, වාණිජ ඇතුළු විවිධ භාවිතයන් සඳහා යොදාගැනීමත් ශ්‍රමිකයන් අඩුවීමත් යන කරුණු මත මෙවැනි තත්ත්වයකට පත්ව ඇති අතර මෙම තත්ත්වය රබර් කර්මාන්තය ආශ්‍රිත අපේක්ෂිත ආර්ථික අරමුණු වෙත ලගාවීමට පවතින තර්ජනයක් බවට පත්ව ඇත.

ශක්තීන් : ඉලක්ක 03

1. ජීවත්වීමට උචිත හරිත වටපිටාවක් හා දේශගුණයකින් සමන්විත වීම

සංවේදී පරිසර කලාපයක පිහිටා ඇති පැල්මඩුල්ල හා කහවත්ත නගර කඳු, ගංගා, කුඹුරු, තේ වතු, රබර් වතු වලින් සමන්විත ප්‍රදේශයක් වේ. මෙවැනි වටපිටාවක පිරිසිදු වාතාශ්‍රය මෙන්ම ජීවත් වීමට ප්‍රිය කරන සුන්දර වටපිටාවක් පැවතීම මෙම නගරවාසීන්ට ලැබී තිබෙන සම්පතකි. මෙම පරිසර තත්ත්වයන්ට අමතරව ජීවත්වීමට හිතකර අධික උෂ්ණ හා ශීත නොවන සෞම්‍ය දේශගුණික ලක්ෂණ සහිත ප්‍රදේශයක් වීමද නගරවාසීන්ට ජීවත්වීමට පවතින ශක්තියක් ලෙස හඳුනාගත හැකිය.

05 වන පරිච්ඡේදය
ශ.දු.අ.ත. විශ්ලේෂණය

2. නගරයේ පවතින සෞඛ්‍ය සේවා පහසුකම්

නගරයක් ජීවත්වීමට හිතකර වාසස්ථානයක් බවට පත් කිරිමේදී එම නගරයේ ජීවත්වන ජනතාවගේ නිරෝගීමත්භාවය වැදගත් වන අතර ඒ සඳහා අවශ්‍ය සෞඛ්‍ය පහසකම් ප්‍රමාණවත්ව සැපයිය යුතු වේ. එහිදී මෙම ප්‍රදේශය රජයේ රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන 6 කින් සමන්විත වන අතර කහවත්ත මූලික රෝහල දැනට පවතින ප්‍රධානතම සෞඛ්‍ය පහසුකම් සැපයිමේ රෝහල වේ.

3. නගරයේ ව්‍යාප්තව පවතින අධ්‍යාපන සේවා පහසුකම්

අධ්‍යාපන පහසුකම් නගරයේ මූලික සමාජීය යටිතල පහසුකමක් වන අතර මෙම නගරයන්හි දැනට ජාතික පාසල් 01 ක් ඇතුළු 1 ඒබී පාසල් 4 ක් 1 සි පාසල් 4 ක් හා ද්විත්යික පාසල් 11 ක් හා ප්‍රාථමික පාසල් 13 කින් සමන්විත වේ. දැනට පවතින පාසල් වල පෝෂික ප්‍රදේශ තුළින් නගරයම ආවරණය කරනු ලබන අතර එය නගරයට පවතින වටිනා සම්පතකි.

4. නගරයේ ව්‍යාප්තව පවතින ජල මූලාශ්‍ර පද්ධතිය

කළු ගගේ අතු ශාඛාවක් වන වේ ගග මෙන්මකිරිදිඇල්ලේන් ආරම්භ වී ගලා එන දෙනවක ගග මෙම ප්‍රදේශයේ පවතින මූලික ජල මූලාශ්‍ර වේ. මෙම ගංගා දෙකට අමතරව ස්වභාවික ඇළ, දොළ මාර්ග හා නගරය අවට පිහිටා තිබෙන දියඇලි මෙම ප්‍රදේශයට වටිනා සම්පත් වේ.

5. 60% ක් පමණ සංවර්ධනය කළ හැකි ඉඩම් පැවතීම

කඳු අතර පිහිටි නිම්න ප්‍රදේශයක පිහිටි මෙම නගර කුඩා කඳු හා තැනිතලා සහිත භූමි ලක්ෂණ වලින් සමන්විත පාරිසරික සංවේදී කලාපයක් තුළ පිහිටා ඇත. එකී පිහිටීමට අනුව සංවර්ධන කටයුතු සඳහා යොදා ගත නොහැකි පාරිසරික සන්වේදීතාවයෙන් ඉහළ පරිසර කලාප ද මෙම ප්‍රදේශය තුළ පිහිටා ඇත. ඒ අනුව එකී පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස කුඹුරු, වන සංරක්ෂිත ප්‍රදේශ, ජල මූලාශ්‍ර , කඳු හා අදික බෑවුම් සහිත ප්‍රදේශ මෙන්ම සංවර්ධනයට යොදා ගත නොහැකි මාර්ග ආදී සියලු භූමි භාවිතයන් ඉවත් කළ විට 60% කට ආසන්න භූමි ප්‍රමාණයක් සංවර්ධනය කළ හැකි මට්ටමේ පැවතීම මෙම නගරයන්හි සංවර්ධනයට පවතින ශක්තියකි.

1. නගර මධ්‍යයේ පවතින රථවාහන තදබදය

පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යයේ රථවාහන තදබදය දෛනිකව විවධ කාල වේලාවන් තුළ දී දැකගත හැකිවේ. කොළඹ - මඩකලපුව (A 4) මාර්ගය හා පැල්මඩුල්ල - නෝනගම (A 18) මාර්ගය මෙම නගර හරහා ගමන් කරන ප්‍රධාන මාර්ග දෙකක් වන අතර එම මාර්ග ඔස්සේ බලන්ගොඩ, බදුල්ල, ඇඹිලිපිටිය, රත්නපුර හා කොළඹ යන නගර අතර පහසුවෙන් සම්බන්ධ වීමේ හැකියාව පවති.

එකී මාර්ග භාවිතයට ගනිමින් දෛනිකව මගී ප්‍රවාහන රථවාහන, සැහැල්ලු වාහන මෙන්ම බර වාහන ද මෙම නගර හරහා ගමන් ගනී. කහවත්ත නගරයට වඩා ඉහළ රථවාහන තදබදයක් පැල්මඩුල්ල නගරයේ දැකගත හැකිවේ. ඊට ප්‍රධාන හේතුව වන්නේ ඉහත සදහන් කළ ප්‍රධාන ඒ ශ්‍රේණියේ මාර්ග දෙකම මෙම නගරයේදී එකිනෙකට සම්බන්ධ වීමයි. මෙහිදී නගරය මධ්‍යය ප්‍රදේශය මගහැර ගමන්කිරීමට විකල්ප මාර්ග නොමැති වීම රථවාහන තදබදය වැඩි වීමට හේතුවී ඇත.

ඒ අනුව නගරවාසීන්ට මෙන්ම නගරයට පැමිණෙන සංසරණ ජනගහනයට පහසුවෙන් මෙම නගරය වෙත ලගා වී අවශ්‍ය සේවා පහසුකම් ලබා ගැනීම සඳහා ගමනාගමන පහසුකම් විධිමත්ව සංවර්ධනය විය යුතු වේ.

2. නගරයෙන් පිටතට ගමන් ගන්නා මාර්ග හොද තත්ත්වයේ නොපැවතීම

රථවාහන තදබදය හේතුවෙන් පවතින ප්‍රධාන මාර්ග වල දැනට පවතින පළල ප්‍රමාණවත් නොවන අතර නගර මධ්‍යයේ සිට නගරයේ අභ්‍යන්තරයට ගමන් කිරීමට පවතින මාර්ග බොහොමයක පළල ප්‍රමාණවත් නොවීම, සංවර්ධනය වී නොතිබීම, මාර්ග සම්බන්ධතාවය බිඳවැටි පැවතීම වැනි ගැටලු හේතුවෙන් ඇතිවන ප්‍රවාහන අපහසුතා හේතුවෙන් නාගරික ජනතාවට තම එදිනෙදා අවශ්‍යතා මනාව සපුරා ගැනීමේදී දුෂ්කරතාවලට ලක්වීමට සිදුව ඇත.

3. ප්‍රමාණවත් තරම් විනෝදාස්වාද කටයුතු පහසුකම් නොතිබීම

පහසුකම් සහිත ජීවත්වීමට උචිත නගරයක් බිහි කිරීමේදී එම නගරයේ ජීවත්වන ජනතාවගේ නිරෝගිමත්භාවය ඉතා වැදගත් වේ. නාගරික ජනතාවට සෞඛ්‍යය සම්පන්න දිවියක් පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකාරිත්වමය හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් ඉතා වැදගත් වේ. ඒ අනුව ජනතාවට අවශ්‍ය ක්‍රියාරිත්වමය

විනෝදාස්වාද පහසුකම් ප්‍රමිතිගත මට්ටමට නොමැතිවීම මෙම නගර සංවර්ධනය කිරීම සඳහා පවතින දුර්වලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

4. ජල රක්ෂිත සීමාවන් තුළ සිදුවන අනවසර ඉදිකිරීම්

වේ ගග හා දෙනවක ගග මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධාන ජල මූලාශ්‍ර දෙක වන අතර වේ ගග කහවත්ත හා පැල්මඩුල්ල නගර සීමාව වෙන්කරන භෞතික සීමාවක් වන අතර එය කහවත්ත නගර මධ්‍යයෙන් ගලා බසී. ඒ අනුව නගර මධ්‍යට ආසන්න වාණිජ ගොඩනැගිලි ගග රක්ෂිතය තුළද ඉදිකර ඇත. මීට අමතරව කහවත්ත අටකලන් ඇළ, පනාවැන්න ඇළ රක්ෂිත සීමාව තුළද ඉදිකිරීම් දැකගත හැකිවේ. අනවසර ඉදිකිරීම් වලට අමතරව වාණිජ හා අනෙකුත් ගොඩනැගිලි වලින් ඉවතලන අපජලය මෙවැනි ජල මූලාශ්‍ර වලට මුදාහැරීම හඳුනාගත හැකිවේ. මෙම තත්ත්වය තුලින් නගරයේ පවතින ප්‍රධාන ජල මූලාශ්‍ර විනාශ වී යාමේ තර්ජනයට ලක්ව ඇත.

5. පානීය ජලය සැපයීම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සේවා පහසුකම් ප්‍රමාණවත් නොවීම

ආහාර තරමටම පානීය ජල සම්පත ද ඉතා අත්‍යාවශ්‍ය සාධකයකි. පානීය ජලයේ ගුණාත්මකභාවය මෙහිදී ඉතා වැදගත් වේ. පතල් කැණීම් බහුල වශයෙන් සිදුකරනු ලබන ප්‍රදේශයක් වන හෙයින් නගර අවට භූගත ජලයේ පවතින ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටළු මතුව ඇත. මේ වන විට මෙම ප්‍රදේශයේ ජනගහනයෙන් නල ජලය ලබාගනු ලබන්නේ මුළු ජනගහනයෙන් 54% ක් තරම් ප්‍රමාණයක් වන අතර බොහොමයක් ප්‍රදේශ සඳහා ප්‍රමාණවත් පරිදි පානීය ජල සැපයුම නොලැබීමද ඊට හේතුවී ඇත.

අවස්ථා : ඉලක්ක 03

1. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ පනාවැන්න අන්තර්හුවමාරුව පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යට ඉතා ආසන්න දුරකින් පිහිටීම

පැල්මඩුල්ල හා කහවත්ත නගරවාසීන්ට මෙන්ම නගරයට පැමිණෙන ජනතාවට දැනට පවතින ප්‍රවාහන හා මාර්ග පහසුකම් විධිමත් ලෙස ස්ථාපනය වී නොතිබීම ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇති අතර යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය ද එම ගැටලුව විසඳීමේදී ඇති වටිනා අවස්ථාවක් ලෙස සැලකිය හැකිවේ.

2. නැවත ක්‍රියාත්මක කිරීමට යෝජිත කැළණිවැලි දුම්රිය මාර්ගය

බ්‍රිතාන්‍ය පාලන සමයේදී ඉදිකරන ලද කැළණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ල සිට කහවත්ත නගරය හරහා ඕපනායක දක්වා ක්‍රියාත්මක වී ඇත. මේ වන විට දුම්රිය මාර්ගය හා දුම්රිය නැවතුම් ස්ථානයන් ගරාවැටී පවතින අතර, වර්ෂ 2050 සඳහා යෝජිත භෞතික සැලැස්මේ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත දුම්රිය මාර්ග සංවර්ධනය සඳහා හඳුනාගෙන ඇත. මේ අනුව, මෙකී දුම්රිය මාර්ගය හරහා කහවත්ත හා පැල්මඩුල්ල නගර වෙත පහසුවෙන් ලඟාවීමේ අවස්ථාව සැලසෙනවා මෙන්ම ඒ තුළින් නගරයේ සංචාරක, වාණිජ හා අනෙකුත් කටයුතු වලට පහසුකම් සපයාගත හැකි අවස්ථාවකි.

තර්ජන : ඉලක්ක 03

1. පතල් කැණීම මගින් සිදුවන පාරිසරික හානි හා භූමිය අස්ථාවර වීම

මැණික් සම්පත් බහුල මෙම ප්‍රදේශයේ බොහෝ පතල් කැණීම් ස්ථාන හඳුනාගැනීමට හැකිවේ. පතල් කැණීම නිසා ආර්ථික වශයෙන් ලැබෙන ප්‍රතිලාභ ඉහළ මට්ටමක පැවතුනද නිසි ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම හේතුවෙන් පතල් කැණීම් ආශ්‍රිත ප්‍රදේශවල සිදුවන පාරිසරික හානි හඳුනාගත හැකිවේ. ස්වභාවික වෘක්ෂලතාදිය විනාශ වීම, කෘෂිකාර්මික බෝග වගාවන්ට හානි සිදුවීම, පාංශු ඛාදනය, භූමිය ගිලා බැසීම, නිවාස හා අනෙකුත් ගොඩනැගිලි වලට හානි සිදුවීම, ජල පෝෂක අපවිත්‍ර වීම, ඩෙංගු මැලේරියා වැනි වසංගත රෝග බෝවීම වැනි බලපෑම් ප්‍රදේශවාසීන්ගේ ජනජීවිතයට පවතින තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇත.

2. ගංවතුර හා නායයෑම් වැනි ආපදාවන්ගේ බලපෑම

දෙනවක ගග හා වේ ගග පිටාර ගැලීමෙන් වාර්ෂිකව සුළු ගංවතුර තත්ත්වයන්ට මුහුණපෑමට සිදුවන අතර නායයෑම් අවධානම් තත්ත්වයන්ද මෙම ප්‍රදේශයෙන් වාර්තා වී ඇත. මේ අනුව නායයෑමේ අවධානම් සහිත ප්‍රදේශ ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ජීවිත වලට පවතින තර්ජනයක් ලෙස මෙම තත්ත්වය හඳුනාගෙන ඇත.

පරිච්ඡේදය 06

සැලැස්ම

06 වන පරිච්ඡේදය

සැලැස්ම

6.1. හැඳින්වීම

හැඳින්වීම

මැණික් කර්මාන්තය බහුලව සිදුකෙරෙන පැල්මඩුල්ල හා කහවත්ත නගර වර්ෂ 2033 වනවිට "සැඟවුණු සෞභාග්‍යයේ ද්වාරය" යන සංකල්පය මත පදනම්ව සෞභාග්‍යමත් ද්විත්ව නගරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන අරමුණු තුනක් හඳුනාගෙන ඇත. එම අරමුණු හා පරමාර්ථ වෙත ලගාවීමට පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය කරමින් නගරයේ සංවර්ධනය පිළිබඳ සංකල්පිත සැලැස්ම ගොඩනගා ඇත.

පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධනය කිරීම සඳහා වන සංකල්පිත සැලැස්ම මත පදනම්ව යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ඇත. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම මගින් වර්ෂ 2033 වනවිට නගරය තුළින් අපේක්ෂිත භෞතික සංවර්ධනය පිළිබිඹු කෙරේ. එකී අපේක්ෂිත භෞතික සංවර්ධනය මෙන්ම ආර්ථික හා පාරිසරික සංවර්ධනය වෙත ලගාවීම සඳහා ප්‍රධාන උපායමාර්ග හඳුනාගෙන ඇති අතර ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග යටතේ උපායමාර්ගික ව්‍යාපෘති තෙක් ප්‍රධාන උපායමාර්ග හයක් මෙම පරිච්ඡේදය තුළ අන්තර්ගත කර ඇත.

සංකල්පිත සැලැස්ම

6.2. සංකල්පිත සැලැස්ම

පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම තුළ අන්තර්ගත සංකල්පිත සැලැස්ම තුළින් අනාගතයේ දී මෙම නගර වල සංවර්ධනය සිදුවන ආකාරය පිළිබිඹු වේ. මැණික් පතල් කැණීම් සඳහා සුප්‍රසිද්ධ මෙම සැලසුම් ප්‍රදේශයේ විවිධ වර්ගයේ පතල් කැණීම් කටයතු සිදුකරනු ලබන අතර, ගැඹුරු දෝන පතල් බහුලව දැකගත හැකිවේ. ඒ අනුව මෙම ප්‍රදේශයට ආවේණික ගැඹුරු දෝන පතලක ආකෘතියක් නගර සංවර්ධන සැලැස්මේ සංකල්පිත සැලැස්ම සඳහා යොදාගෙන ඇත.

මැණික් ඉල්ලම් නිධිවල පිහිටීම අනුව පිහිටි පොළොවේ සිරස් අතට කැණීම් කරනු ලබන පතලක තිරස් අතට දෝනා ගමන් කරනු ලබන අතර පතලේ ගැඹුර හා දෝනාවේ දුර ප්‍රමාණය තීරණය වන්නේ ඉල්ලම් වල පිහිටීම අනුවය. ඉල්ලම් වලින් සොයාගන්නා රළු මැණික් ගල් ඔපදැමීම ඇතුළු ක්‍රියාවලියකින් අනතුරුව නිමවුම් මැණිකක් නිර්මාණය කරන අතර එය ආර්ථිකමය වශයෙන්ද ඉහළ වටිනාකමක් හිමිකර ගනී.

තේ, රබර් ප්‍රමුඛ කරගත් වතු වගාව, කිරිබත්ගල රක්ෂිතය, එහි පිහිටා ඇති දියඇලි හා කිරිදි ඇල්ල යනාදී සෞන්දර්යාත්මක සංචාරක ආකර්ශණිය ස්ථාන, වේ ගඟ, දෙනවක ගඟ ඇතුළු ජල මූලාශ්‍ර, පමණක් නොව පුරාවිද්‍යාත්මක වශයෙන් හා ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථාන මෙන්ම මතුපිට පොළොවෙන් යට සගවාගෙන පවතින මැණික් ඉල්ලම් මෙන්ම මෙම නගර අනෙක් නගර හා කලාප සමග සම්බන්ධ කරවන ප්‍රධාන මාර්ග පද්ධතිය, යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය හා යෝජිත නව කැළණිවැලි දුම්රිය මාර්ගය වැනි බොහෝ සම්පත් ප්‍රමාණයක් මෙම ප්‍රදේශයට පවතින අතර මෙම සම්පත් බොහොමයක් රළු මැණික් මෙන් නිසි භාවිතයකට යොදා ගෙන නොමැත.

පතලක් සකස් කර අවශ්‍ය යටිතල පහසුකම් සපයමින් අවසානයේ මැණික් සම්පත ලබාගන්නා මෙන් මෙම සැලසුම් ප්‍රදේශයේ පවතින පැල්මඩුල්ල, කහවත්ත ප්‍රධාන නගර මධ්‍යස්ථාන දෙක හා නැගී එන නගර මධ්‍යස්ථානයක් ලෙස පනාවැන්න නගර මධ්‍යස්ථානය සංවර්ධනය කිරිම තුළින් එකී නගර මධ්‍යස්ථාන හා පර්යන්ත ප්‍රදේශ අතර සම්බන්ධතාවය වැඩිදියුණු කරමින් නගරයේ පවතින සම්පත් හා යෝජිත අවස්ථා තුළින් ඵලදායි ප්‍රතිඵල ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

අනෙකුත් පතල් වර්ග වලට සාපේක්ෂව ගැඹුරු දෝන පතලක් ක්‍රියාත්මක කිරීමේදී ආරක්ෂාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු වනවාක් මෙන්ම සංවේදී පරිසර කලාපයක් තුළ පිහිටි නායයෑම් වැනි ස්වභාවික ආපදාවන්හි අවධානමක් පවතින මෙම ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සිදු කිරීමේ දී පරිසරය සුරක්ෂිත කිරීමේ උපායමාර්ග ද හඳුනාගෙන ඇත.

රූපය අංක 6.1 : සංකල්පිත සැලැස්ම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

යෝජිත භූමි පරිහරණ සැලැස්ම

6.3. යෝජිත භූමි පරිහරණ සැලැස්ම

පැල්මඩුල්ල හා කහවත්ත නගර රත්නපුර දිස්ත්‍රික් කෙන්ද්‍රස්ථානයේ පිහිටා ඇත. එනම් රත්නපුර නගරය හරහා ඇඹිලිපිටිය හෝ බලංගොඩ දෙසට ද එසේ නොමැතිනම් එකී නගරයන්හි සිට රත්නපුර දෙසට ගමන් ගන්නා ඕනෑම අයෙකුට පැල්මඩුල්ල නගරය මුණගැසේ. මෙම පිහිටීම අනුව, දිස්ත්‍රික්කයේ අභ්‍යන්තරව පිහිටි අනෙකුත් නගර හා පවතින කලාපිය සබධතාවය පවත්වාගැනීමට පහසු වී ඇත. කොළඹ -මඩකලපුව (A 4) මාර්ගය ඔස්සේ ඌව පළාත හා සම්බන්ධ වීමට පහසුවන අතරම පැල්මඩුල්ල - නෝනගම (A 18) මාර්ගය ඔස්සේ දකුණු පළාත හා පහසුවෙන් සම්බන්ධවීමේ ප්‍රවේශය සැලසී ඇත. ඒ අනුව ස්වභාවික සුන්දරත්වයෙන් අනූන ස්වභාවික දියඇලි හා වනාන්තර පිහිටා ඇති මෙම ප්‍රදේශයේ පවතින

සංවර්ධන ප්‍රවණතාවයන් ඔප්නැංවීම තුළින් අනාගත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා මැණික් කර්මාන්තයේ පවතින අනන්‍යතාවය හා සංවේදී පරිසර පද්ධතිය ආරක්ෂා කිරිමත් පවතින සම්පත් හා භූමිය ප්‍රශස්ථ මට්ටමින් භාවිතයට ගැනීමත් අරමුණු කරගනිමින් වර්ෂ 2033 සඳහා යෝජිත භූමි පරිහරණ සැලැස්ම පිළියෙළ කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම මගින් හඳුන්වාදෙනු ලබන සමස්ථ නාගරික ආකෘතිය තුළින් සිත් ඇද ගන්නා මනස්කාන්ත පරිසරයක පිහිටි තැනිතලා නිම්න ප්‍රදේශයන්, උද්‍යාන, කුඹුරු හා ඒවායේ විසිර පවතින මැණික් පතල් මෙන්ම උස් කඳු සහිත භූමියන්හි, තේ, රබර් වැවිලි බෝගයන්ගෙන් ශශ්‍රික වී පවතින අතර ප්‍රාකාරයක් ලෙස දිස්වෙන කිරිබත්ගල වන රක්ෂිතයත්, කුට්ටිගල වනරක්ෂිතයත් හරිත පැහැති පසුබිමත් මවාපාන අතරම; ගංඟා, ඇළ, දොළ ආදියෙන් පිළිබිඹු වන නීලවර්ණ පසුබිම හා එක්ව නිර්මාණය වූ නීලහරිත පරිසරයකින් සමන්විත ආකර්ශණිය නගරයක් ද දැකගත හැකිවේ. ඊට අමතරව එකී පරිසරය තුළ පවතින දර්ශනිය දෘෂ්ටි කෝණයන් (scenic points) හා ප්‍රධාන සුළං කපොළු වලට අවහිරයක් ඇති නොවන පරිදි ඒ ඒ ප්‍රදේශ සඳහා ආවේණික වූ සංවර්ධන විභාවතාවයන්ට ගැළපෙන උස මට්ටම් සහිතව ඉදිකරන ලද ගොඩනැගිලි දර්ශනය වේ.

රූපය අංක 6.2 : කිරිබත්ගල කන්ද ප්‍රදේශයේ සිට ඒ 04 මාර්ගය හමුවන තෙක්

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

එමෙන්ම නගරයට ප්‍රවේශ වන ප්‍රධාන පිවිසුම් තුන අතරින් ඕනෑම පිවිසුමකින් නගරයට පිවිසෙන පුද්ගලයෙකුට නිහඬ නිසංසල පරිසරයක් දර්ශනය වන අතර නගර මධ්‍යයට වන්නට කඩිසරව ක්‍රියාත්මක වන වටපිටාවක් සහිත ආකර්ෂණිය නගරයක පහස විඳීමේ භාග්‍ය උදාවේ.

නගරයේ උතුරු පිවිසුමෙන් නගරයට ඇතුළු වීමත් සමඟ A 4 මාර්ගය දෙපස පිහිටි කෙත්වතු හා තැනින් තැන ක්‍රියාත්මක වන මැණික් පතල් දැකගත හැකිය. ක්‍රමයෙන් නගරය දෙසට ගමන් ගනිද්දී දකුණු දෙසින් ප්‍රාකාරයක් මෙන් දිස්වන කිරිබත්ගල කඳු වැටිය හා වන රක්ෂිතය දැකගත හැකිවේ. වර්ෂා සහිත කාලයන්හිදී කිරිබත්ගල කඳුවැටියෙන් ආරම්භ වන පුළුන් ඇල්ල මනාව දර්ශනය වේ. සංචාරක ආකර්ෂණය සහිත එම ඇල්ලට යන ගමන් මග ප්‍රධාන මාර්ගයට දකුණු පසින් හමුවේ.

එමෙන්ම නගරයේ වම්පසින් කුට්ටිගල කඳුවැටිය හා වන රක්ෂිතය දිස්වන අතර නගරය දෙසට යත්ම ගනේගම පුරාණ රජමහා විහාරස්ථානය දැකබලා ගැනීමේ හැකියාව සැලසෙන අතර එම විහාරස්ථානය අසලින් මරක්කල ඇල්ලට යන ගමන් මාර්ගය ද පිහිටා ඇත. එම ස්ථානය පසුකරමින් නගරය දෙසට ගමන් කරන විට මාර්ගයට දකුණු පසින් ආරම්භ වන පැල්මඩුල්ල නගරයේ විකල්ප මාර්ගය හමුවන අතර එය මංතීරු දෙකක මාර්ගයක් ලෙස පැවතීමත් මාර්ගය දෙපස පදික මංතීරු යොදා උද්‍යාන අලංකරණය කර තිබීමත් හේතුවෙන් නගරයට අලංකාරයක් එක්කරයි.

A 4 මාර්ගයේම වම්පසින් නගර මධ්‍යයට ආසන්නව පිහිටි මහජන පොළ දැකගත හැකි අතර ඒ අසළින් ගමන්ගන්නා කුට්ටපිටිය මාර්ගය ඔස්සේ යන අයෙකුට බොහෝ සංචාරක ආකර්ෂණයක් හිමිව පවතින කිරිදි ඇල්ල දැකබලා ගැනීමේ අවස්ථාව සැලසේ. පැල්මඩුල්ල නගරයේ තේමා උද්‍යානයද කුට්ටපිටිය මාර්ග පිවිසුම අසළින් ආරම්භ වන අතර එය සංචාරක ආකර්ෂණයක් සහිත උද්‍යානයක් ලෙස ද දර්ශනය වේ. මෙම තේමා උද්‍යානය තුළ මැණික් පතල් ආකෘති ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි ආකෘති දැකගැනීමට මෙන්ම ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්හි නිරත වීමට ද අවස්ථාවද සැලසේ. එමෙන්ම එම ස්ථානයේ සිට මැණික් පතල් කැණීම් සිදුකරන ප්‍රදේශ නැරඹීම සඳහා ගමන් කිරීමේ අවස්ථාවද උදාවේ. මෙම තේමා උද්‍යානයේ ප්‍රවේශය අසළ පිහිටි හෙළ බොජුන් හළ තුළින් `ප්‍රදේශයට ආවේණික ආහාර රස විදීමේ අවස්ථාවද සැලසේ. එමෙන්ම නගරයේ ප්‍රධාන බස්නැවතුම දකුණු පසින් දිස්වන අතර ඒ හරහා ගමන්ගන්නා සාමාන්‍ය බස් හා අධිවේගී බස්රථ දැකගත හැකිවේ.

රූපය අංක 6.3 : ධර්මාලෝක විද්‍යාලය පිහිටි දිශාවේ සිට ඒ 18 හරහා ඒ 04 මාර්ගය හරහා ඒ ආශ්‍රිත පිහිටි කුඹුරු



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

එමෙන්ම නැගෙනහිර දෙසින් එනම් බලංගොඩ දෙසින් මෙම නගරයට පිවිසීමේදි A 4 මාර්ගය ඔස්සේම ගමන් කළ යුතු අතර එහිදී මාර්ගය දෙපස කෙත්බිම් වලින් සරු සාර භූමියන් දර්ශනය වේ. එමෙන්ම මාර්ගයට දකුණු දෙසින් පිහිටි කුට්ටපිටිය කන්ද හා එම කඳු වැටියෙන් ආරම්භවන මනස්කාන්ත කිරිදිඇල්ලේ දර්ශනය දැකගත හැකිවේ. මෙම මාර්ගය ඔස්සේ තවදුරටත් නගරය දෙසට ගමන් කිරීමේදී වම්පසින් ඉද්දමල්ගොඩ වල්ලව්වට යන මාර්ගය හමුවන අතර එය සංචාරක හා පුරාවිද්‍යාත්මක වටිනාකම් සපිරි ගෘහ නිර්මාණ ශිල්පිය වටිනාකම් සහිත ස්ථානයක් වන බැවින් ඒ ආශ්‍රිත උනන්දුවක් දක්වන අයෙකුට එය දැකබලා ගැනීමේ අවස්ථාවද උදාවේ.

එමෙන්ම පැල්මඩුල්ල නගරය හරහා ගමන් ගන්නා විකල්ප මාර්ගයේ පිවිසුමද වම්පසින් දර්ශනය වේ. තවද පැල්මඩුල්ල නගරයේ ආගමික හා පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරයත්, සුදර්ශනී ධර්මශාලාවත් දැකබලාගත හැකිවේ. නගර මධ්‍යයට ප්‍රවේශවත්ම A 4 මාර්ගය හා A 18 යන ප්‍රධාන මාර්ග හමුවන මංසන්ධි ප්‍රදේශය එනම් පැල්මඩුල්ල නගරයේ ඔරලෝසු කණුව හා සමග පිහිටි ආකර්ශණීය භූ දර්ශනය හා වාණිජ සංකීර්ණය හා ක්‍රියාකාරී නගර මධ්‍ය ප්‍රදේශය දැකබලා ගැනීමේ අවස්ථාව සැලසේ.

දකුණු පිවිසුමෙන් A 18 මාර්ගය ඔස්සෙ මෙම සැලසුම් ප්‍රදේශයට පිවිසීමේදී දකුණු දෙසින් රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හමුවන අතර කඳු සහිත ප්‍රදේශ වල තේ හා රබර් වගා බිම් දැකගත හැකි වේ. කහවත්ත නගරයට ආසන්න වන්නට පිහිටි කහවත්ත නව මහජන ක්‍රීඩාංගනය දකුණු දෙසින් දිස්වේ. අනතුරුව නගර මධ්‍යයේ පිහිටි කහවත්ත ප්‍රධාන බස්නැවතුම්පොළ, කහවත්ත මූලික රෝහල හා නගර මධ්‍යය

ප්‍රදේශයේ පිහිටි වාණිජ ගොඩනැගිලි හා එහි ක්‍රියාකාරකම් ද දැකගත හැකිවේ. කහවත්ත හා පැල්මඩුල්ල නගර පරිපාලන වශයෙන් ප්‍රධාන ලෙස බෙදා වෙන්කර භෞතික මායිම වන වේ ගග හමුවන අතර ඒ ආශ්‍රිත දර්ශනය ද නාගරික ආකර්ෂණය ඉහළ නංවනු ඇත. කහවත්ත නගර පිවිසුම ඉන්පසුව හමුවන අතර නවීකරණය කරන ලද පැරණි කහවත්ත දුම්රිය නැවතුම්පොළ හා ඒ ආශ්‍රිත සුපිරි අවන්හල හා මැණික් චතුරශ්‍රය දැකබලා ගත හැකිවේ. කහවත්ත නගර පිවිසුම පසුකර පැල්මඩුල්ල නගරය දෙසට නැවතත් ගමන් ගැනීමේදී රුවන්පුර අධිවේගී මාර්ග පිවිසුම හමුවේ. එයද පසුකර ඉදිරියට ගමන් කිරීමේදී රබර් හා කෙත්වතු වලින් ශෘද්ධික හරිත වර්ණිත ප්‍රදේශ දර්ශනය වේ. පැල්මඩුල්ල නගරයට ආසන්න වන්නට පැල්මඩුල්ල රෝහල් පිවිසුම් මාර්ගය හා රථවාහන නැවතුම්පොළ දර්ශනය වන අතර ඒ ආශ්‍රිත වාණිජ සංකීර්ණ හා අනෙකුත් වාණිජ භාවිතාවන් දැකබලා ගැනීමේ අවස්ථාව සැලසේ.

රූපය අංක 6.4 : කහවත්ත නගර මධ්‍යයේ සිට වේ ගඟ හරහා යෝජිත දුම්රිය නැවතුම් ස්ථානය



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

අපේක්ෂිත පැල්මඩුල්ල - කහවත්ත නාගරික ආකෘතිය ලගාකර ගැනීම සඳහා විද්‍යාත්මක විශ්ලේෂණයන් ඇතුළු බොහොමයක් විශ්ලේෂණ ක්‍රමවේද පදනම් කරගනිමින් අනාගත කලාපිකරණ සැලැස්ම නිමකර ඇත. ඒ අනුව ඉහතින් සිදුකල සියලු විස්තර කිරීම් වලින් පැවසෙනුයේ පැල්මඩුල්ල, කහවත්ත නගර සංවර්ධනය තුළින් බලාපොරොත්තු වන සැඟවුණු නගරයේ සමෘද්ධිමත් බලාපොරොත්තුව නමැති නාගරික දැක්ම විදහාපාන නාගරික ආකෘතියක් අත් විඳීමේ හැකියාව වර්ෂ 2033 වනවිට යෝජිත ඉඩම් භාවිත සැලැස්ම තුළින් උදාවන බවයි.

සිතියම් අංක 6.1 : යෝජිත භූමි භාවිත සැලැස්ම



6.4 භෞතික හා සමාජීය අපරව්‍යූහ පහසුකම් සංවර්ධන උපක්‍රම

පැල්මඩුල්ල හා කහවත්ත නගර ඒකාබද්ද කරමින් භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී හදුනාගත් ප්‍රධාන උපායමාර්ග රූප සටහන් අංක 6.1 මගින් දක්වා ඇති අංශ යටතේ වර්ගීකරණය කර ඇත.

රූපය අංක 6.5 : නාගරික යටිතල පහසුකම් සංවර්ධන උපාය මාර්ග



6.4.1 සාමාජීය අපරව්‍යූහ පහසුකම් සංවර්ධන උපක්‍රම

සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ නේවාසික, සෞඛ්‍ය හා අධ්‍යාපනය යනාදී අංශ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අදාළ උපායමාර්ග හඳුනාගෙන ඇත.

6.4.1.1 නේවාසික පහසුකම්

සියලු නගරවාසීන්ට ජීවත්වීමට පහසු නගරයක් මෙන්ම සෑම පවුලකටම නේවාසික පහසුකම් ඵලදායිව භුක්ති විදීමට අවශ්‍ය පහසුකම් සැපයීම මෙහි මූලික අරමුණ වේ.

ඒ අනුව තාවකාලික හා ගුණාත්මක භාවිතයෙන් තොර වතු ආශ්‍රිත නිවාස හා අනෙකුත් නිවාස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. නායයෑම් වැනි ස්වභාවික ආපදාවන්ගේ බලපෑම් අවම ප්‍රදේශ නේවාසික කටයුතු සඳහා ප්‍රවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත. එමෙන්ම ආපදා අවධානම් අවම කිරීම සඳහා ගැළපෙන නිවාස ඉදිකිරීමට අදාළ නියමතා හඳුනාගෙන ඇත.

මෙම සැලසුම් ප්‍රදේශයේ මේ වන විට පවුල් 11,320 ක් පමණ ජීවත් වන අතර නිවාස හිඟය ඇත්තේ පවුල් 394 ක පමණ ප්‍රමාණයකටය. දරිද්‍රතාවය හා වතු නිවාස ක්‍රමයේදී එක් නිවසක් තුළ පවුල් කිහිපයක් වාසය කිරීම යනාදී කරුණු නිවාස හිඟයට හේතු ලෙස හඳුනාගෙන ඇත. මෙම ප්‍රදේශයේ නේවාසික කටයුතු පුළුල් කිරීම සඳහා පවතින භූමි ප්‍රමාණයන්හි හිඟයක් නොමැති අතර වර්ෂ 2033 වනවිට අපේක්ෂිත නේවාසික ජනගහනයටද එම භූමි ප්‍රමාණයන් ප්‍රමාණවත්ව පවතී. නේවාසික භූමි භාවිතයන්ට අදාළ තොරතුරු වගු අංක 6.1 න් පෙන්නුම් කර ඇත.

වගු අංක 6.1 : නේවාසික භූමි භාවිතයන්

නාගරික බල ප්‍රදේශය	පවුල් සංඛ්‍යාව		දැනට පවතින නේවාසික භූමි භාවිතය (පර්චස්)	එක් පවුලකට වෙන්වන නේවාසික භූමි ප්‍රමාණය (පර්චස්)	
	2020	**2033**		**2020**	**2033**
පැල්මඩුල්ල නාගරික බල ප්‍රදේශය	8868	10275	452499.37 (1144.5 ha)	51.0	44.0
කහවත්ත නාගරික බල ප්‍රදේශය	2452	2850	182755.18 (462.24 ha)	74.5	64.0
සැලසුම් ප්‍රදේශය	11320	13125	635254.56 (1,606.74 ha)	56.1	48.4

මූලාශ්‍රය : නා.සං.අධි.

දැනට පවතින නේවාසික භූමි ප්‍රමාණයහි හිඟයක් නොමැති වුවද නායයෑම් අවධානම හා වතු ආශ්‍රිත නේවාසික පහසුකම්හි පවතින ගුණාත්මක භාවය ආශ්‍රිත ගැටළු අවම කරමින් නේවාසික පහසුකම් සංවර්ධනය සඳහා පහත සඳහන් උපායමාර්ග ක්‍රියාවට නැංවීමට හඳුනාගෙන ඇත.

06 වන පරිච්ඡේදය **උපායමාර්ග**

සැලැස්ම

- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගෙන ඇති නායයෑම් අවධානම් අධික ප්‍රදේශ තුළ නිවාස ඉදිකිරීම් කටයුතු සීමා කිරීම හා එවැනි ප්‍රදේශ තුළ ජීවත්වන ජනතාව ආරක්ෂිත ප්‍රදේශයක නැවත පදිංචි කිරීම
- කලාපිකරණය හා නියමතා තුළින් අපේක්ෂිත නේවාසික ජනගහනය සඳහා සුදුසු නේවාසික කලාප නම්කිරීම හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් විධිමත් කිරීම
- මෙම ප්‍රදේශයේ පවතින රිල්හෙන, කහවත්ත, පොරෝනුව,වැල්ලඳුර හා පැල්මඩුල්ල වතු ආශ්‍රිත පේළි නිවාස වෙනුවට ගුණාත්මක තත්ත්වයේ නව නිවාස ඉදිකිරිම

රූපය අංක 6.6 : වතු නිවාස හා යෝජිත නිවාස

මූලාශ්‍රය :Google Map, 2020

- නගර මධ්‍ය ප්‍රදේශයේ නේවාසික භාවිතයන් සඳහා පවතින ඉඩකඩ සීමිත බැවින් නේවාසික භාවිතයන්ට වඩාත් සුදුසු
- පනාවැන්න ප්‍රදේශයේ නව නිවාස ක්‍රම ක්‍රියාත්මක කිරීම

6.4.1.2 සෞඛ්‍ය පහසුකම්

නිරෝගී ජනතාවක් බිහිකිරීම උදෙසා මානසික හා කායික සෞඛ්‍යය තත්ත්වය යහපත් මට්ටමක පවත්වා ගැනීමට ජීවත්වන වටපිටාව හා සෞඛ්‍යය අංශයට අදාළ යටිතල පහසුකම් වැදගත් වේ. කහවත්ත මූලික රෝහල හා පැල්මඩුල්ල ප්‍රාදේශීය රෝහල මෙම නගර වැසියන්ට සෞඛ්‍යය පහසුකම් සපයන ප්‍රධාන වෛද්‍ය මධ්‍යස්ථාන ලෙස හඳුනාගෙන ඇත. මෙම ප්‍රදේශයේ විශාල ජනතාවක් මැණික් පතල් කර්මාන්තයේ නියැලෙන අතර මැණික් පතල් ආශ්‍රිතව ඩෙංගු මැලේරියා වැනි බෝවන රෝග වල අවධානමක් පවතී. කොවිඩ් 19 වැනි ලොවපුරා ව්‍යාප්ත වූ වසංගත රෝග වැනි සෞඛ්‍ය ගැටළු තුළදී පහසුවෙන් එවැනි අවස්ථා සමනය කර නිරෝගිමත් ජීවිතයක් ගත කිරීම සඳහා හඳුනාගත් උපායමාර්ග පහතින් සඳහන් කර ඇත.

උපායමාර්ග

- දැනට පවතින හා 2033 වනවිට අපේක්ෂිත ජනගහනය සඳහා ප්‍රමාණවත් මෙන්ම ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා කහවත්ත මූලික රෝහල හා පැල්මඩුල්ල ප්‍රාදේශීය රෝහල වැඩිදියුණු කිරීම
- එළිමහන් විනෝද කටයුතු ආශ්‍රිත පහසුකම් ප්‍රමාණවත්ව සැපයීම තුළින් ජනතාවගේ මානසික හා කායික සෞඛ්‍ය යහපත් මට්ටමක පවත්වාගැනීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම

සිතියම් අංක 6.2 : රෝහල් පෝෂිත ප්‍රදේශ හා අනෙකුත් සෞඛ්‍ය පහසුකම්



6.4.1.3 අධ්‍යාපන පහසුකම්

මූලික අධ්‍යාපන පහසුකම් සපුරාලීම සඳහා දැනට මෙම ප්‍රදේශය තුළ ව්‍යාප්තව පවතින පාසල් ප්‍රමාණවත් වන අතර නගර ආශ්‍රිත ජනප්‍රිය පාසල් සඳහා පවතින ඉල්ලුම වැඩිවීම තුළ ඉඩ පහසුකම් පිළිබඳ ගැටළු මතු වී ඇත. උසස් අධ්‍යාපන කටයුතු සඳහා රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය මෙම ප්‍රදේශයේ සිසුන්ටද සුවිශේෂී අවස්ථාවකි.

මැණික් කර්මාන්තය හා වතු වගාව ආශ්‍රිතව 40%කට වැඩි සේවක පිරිසක් නියැලෙන අතර එකී ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය කරමින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා පුහුණු ශ්‍රම බලකාය වැඩි කල යුතු වේ. ඒ අනුව අධ්‍යාපනික පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ජනතාවගේ දැනුම වර්ධනය කිරීම හා පුහුණු ශ්‍රම බලකාය වැඩි කිරීම තුළින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම අධ්‍යාපන පහසුකම් සංවර්ධනයේ අරමුණු වී ඇත. මූලික අධ්‍යාපන පහසුකම් ප්‍රමාණවත් වුවද වෘත්තීය අධ්‍යාපනය සඳහා දැනට පවතින වෘත්තීය පුහුණු ආයතන හා ඒ ආශ්‍රිත පහසුකම් ප්‍රමාණවත් නැත.

උපායමාර්ග

- අවම ඉඩ පහසුකම් යටතේ පවතින වෘත්තීය පුහුණු ආයතන පනාවැන්න ප්‍රදේශය ආශ්‍රිත අධ්‍යාපනික කටයුතු සඳහා සුදුසු පරිසරයක ස්ථාපනය කිරීම තුළින් නිපුණ ශ්‍රමිකයන් බිහිකිරීමේ අවස්ථා වැඩි කිරීම
- ප්‍රදේශයට ආවේණික ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අදාළ නිපුණ ශ්‍රමිකයන් බිහිකිරීමට අදාළ වෘත්තීය පුහුණු පාඨමාලා (උදා: මැණික් හා වතු වගා ක්ෂේත්‍රය වැනි) හඳුන්වාදීම
- අවම ඉඩ පහසුකම් සහිත සිසු ඉල්ලුම බහුල පාසල් සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ඉඩකඩ එම ස්ථාන ආශ්‍රිතවම සැපයීම හෝ ඒ ආසන්න ස්ථානයක නැවත ස්ථාපනය කිරීම තුළින් සිසුන්ගේ අධ්‍යාපනික පහසුකම් විධිමත් කිරීම

සිතියම් අංක 6.3 : පාසල් පෝෂිත ප්‍රදේශ හා අනෙකුත් අධ්‍යාපනික පහසුකම්



6.4.2 භෞතික අපරව්‍යූහ පහසුකම් සංවර්ධන උපක්‍රම

පැල්මඩුල්ල කහවත්ත නගරයන්හි භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේදී නගර මධ්‍යය ප්‍රදේශය, උප නාගරික ප්‍රදේශ හා සහසම්බන්ධ කිරීම තුළින් ජනතාවට තම සේවා අවශ්‍යතා සඳහා පහසුවෙන් ලගාවීමට ඇති හැකියාව පුළුල් කිරීම හා නාගරික තදබදය අවම කිරීම මුලික අරමුණු වී ඇත.

රූපය අංක 6.7: භෞතික අපරව්‍යූහ පහසුකම් සංවර්ධන උපක්‍රම



6.4.2.1.ප්‍රවාහන පහසුකම්

නගරයේ මුලික සේවා බොහොමයක් ක්‍රියාත්මක වන නගර මධ්‍ය ප්‍රදේශයට දෛනිකව අධික සංසරණ ජනගහනයක් පැමිණීම හා ඒ හරහා සැලකිය යුතු මට්ටමේ රථවාහන ප්‍රමාණයක් සංසරණය වීමෙන් නාගරික තදබදයක් නිර්මාණය වීමේ අවස්ථාව ඉහළය. පැල්මඩුල්ල නගරය ප්‍රධාන මාර්ග දෙකක් වන ඒ 4 හා ඒ 18 මාර්ග එකිනෙක සම්බන්ධ වන මංසන්ධිය කේන්ද්‍ර කරගනිමින් නිර්මාණය වී පවතින අතර එකී මාර්ග ඔස්සේ බලන්ගොඩ හා ඇඹිලිපිටිය දෙසින් විශාල රථවාහන ප්‍රමාණයක් මෙම නගරය හරහා සංසරණය වේ. එම මාර්ග මංතීරු දෙකකින් සමන්විත මාර්ග වන අතර නගරයට පිටතින් ගමන් කළහැකි විකල්ප මාර්ගයක් නොමැතිවීම හා ප්‍රධාන බස් නැවතුම ප්‍රධාන මාර්ගයට යාබද සීමිත ඉඩකඩක් තුළ පිහිටීම හේතුවෙන් බස්රථ ප්‍රධාන මාර්ගය අවහිර වන පරිදි නතර කිරීම ද නගරයේ රථවාහන තදබදය වැඩි වීමට හේතු වී ඇත. කහවත්ත නගර මධ්‍ය ප්‍රදේශය තුළ දැනට පවතින ප්‍රධාන මාර්ගය මංතීරු දෙකකින් සමන්විත වන අතර නගරය ආශ්‍රිත රථවාහන නතර කිරීමේ පහසුකම් නොමැතිවීම, හා භූගෝලීය පිහිටීම අනුව නගරය පුළුල් කිරීමට පවතින

ඉඩකඩ සීමාවීම හේතුවෙන් නගරය තුළ මාර්ග තදබදය වැඩි වී ඇත. උපනාගාරික ප්‍රදේශ හා සම්බන්ධ වීමට පවතින බොහොමයක් මාර්ග අබලන් තත්ත්වයේ පැවතීම වතු ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහනයට හා නේවාසික ප්‍රදේශ වෙත පහසුවෙන් ලගාවීමට බාධාවක් වී ඇත.

යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය හෝ යෝජිත කැළණිවැලි දුම්රිය මාර්ගය යන විකල්ප සංවර්ධන යෝජනා තුළින් එක් විකල්ප යෝජනාවක් හෝ ක්‍රියාත්මක වීම මෙම ප්‍රදේශයේ ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට ප්‍රමාණවත් වේ.

රූපය අංක 6.8 : පවතින මාර්ග හා සංවර්ධනය කළ යුතු මාර්ග ප්‍රමාණයන්



මූලාශ්‍රය : සම්පත් පැතිකඩ, ප්‍රා.ලේ.කා., කහවත්ත, පැල්මඩුල්ල - 2019

මෙම ප්‍රධාන නගර මධ්‍යය ප්‍රදේශ තුළ පවතින තදබදය අවම කරමින් කාර්යක්ෂයම සේවා සැපයුම් මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීම අරමුණු වී ඇත.

උපායමාර්ග

- පැල්මඩුල්ල හා කහවත්ත නාගරික ප්‍රදේශ ඒකාබද්ධ කර ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම තුළින් උපනගාරික ප්‍රදේශ සමග පවතින සම්බන්ධතාවය පුළුල් කිරීම හා නගර මධ්‍යය ප්‍රදේශයේ පවතින සංවර්ධන පීඩනය අවම කිරීම
- දැනට පවතින ඒ4 හා ඒ 18 ප්‍රධාන මාර්ගයන්හි මංතීරු පුළුල් කිරීම හා යෝජිත අධිවේගී මාර්ගයට පිවිසීමේ පහසුකම් ඇති කිරීම තුළින් පැල්මඩුල්ල හා කහවත්ත නගර ආශ්‍රිතව ඇතිවන රථවාහන තදබදය අවම කිරීම

රූපය අංක 6.9 : පවතින යෝජිත මාර්ග පුළුල් කිරීම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2020

- විකල්ප මාර්ග සංවර්ධනය කිරීම තුළින් නගර මධ්‍යය ප්‍රදේශයේ පවතින රථවාහන තදබදය අවම කිරීම
- සංසරණ ජනතාවට පහසුකම් සැලසෙන පරිදි පැල්මඩුල්ල හා කහවත්ත නගරාසන්නයෙන් පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම
- උපනගාරික ප්‍රදේශ ආවරණය වන මාර්ගයන්හි, භාවිතය හා සංවර්ධන ප්‍රවණතාවයන් අනුව ප්‍රවාහන පහසුකම් වැඩිදියුණුවන පරිදි සුදුසු මාර්ග පළලක් ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවගේ දෛනික කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

සිතියම් අංක 6.4 : යෝජිත ප්‍රවාහන සැලැස්ම



6.4.2.2. පානීය ජල සැපයුම

නේවාසික ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය නළ ජලය, ළිං හා නල ළිං තුළින් සපුරා ගන්නා අතර පානීය ජල අවශ්‍යතාවයෙන් 54% ක වැඩිම ප්‍රතිශතයක් නළ ජල සම්බන්ධතා සපයනු ලබයි. මෙම සැලසුම් ප්‍රදේශයේ නළ ජලය ලබාදීම ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය හා ප්‍රජා ජල ව්‍යාපෘති ඔස්සේ ක්‍රියාත්මක වේ. අධික ගැඹුරු පතල් කැණීම් වලදී ජලය ඉවත් කිරීම තුළින් ඒ ආශ්‍රිත ප්‍රදේශවල පවතින ළිං හා නළ ළිං වල ජල මට්ටම ඉතා අධික ලෙස අඩු වීම හා එම ජලය පානීය කටයුතු සඳහා යොදාගැනීමට සුදුසු ගුණාත්මක තත්ත්වයේ නොමැතිවීම හේතුවෙන් බොහොමයක් ප්‍රදේශ තුළ පානීය ජල ගැටළුවක් මතු වී ඇත. මේ වනවිට පානීය ජල සැපයුම සඳහා කිරිදි ඇල්ල හා වේ ගඟ ජල මූලාශ්‍ර ලෙස යොදාගෙන ඇත. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් දැනට කහවත්ත නගරයට ලබාදෙන ජල සැපයුම ප්‍රමාණවත් වුවද පැල්මඩුල්ල නගරයට ලබාදෙන ජල සැපයුම ප්‍රමාණවත් නොවන බවට වාර්තා වේ. එහිදී දෛනිකව ඝණ මීටර් 2000 ක පමණ හිඟයක් වාර්තා කරයි. මේ අනුව දැනට වාසය කරන නේවාසික ජනතාවට ද පවතින පානීය ජල සැපයුම් ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී අපේක්ෂිත නේවාසික හා සංසරණ ජනගහනයට ප්‍රමාණවත් වන පරිදි ගුණාත්මක පානීය ජල සැපයීම මෙම සැලැස්මේ මූලික අරමුණක් වී ඇත.

වගු අංක 6.2 : පානීය ජල ඉල්ලුම

ප්‍රදේශය	ජනගහනය (2020)		දැනට පවතින ජල අවශ්‍යතාවය	ජනගහනය (2033)		අපේක්ෂිත පානීය ජල ඉල්ලුම 2033
	නේවාසික	සංසරණ		නේවාසික	සංසරණ	
පැල්මඩුල්ල	33921	36500	(4070.5+1460) 5,530.5 m^3	41500	40000	(4980 + 1600) 6580 m^3
කහවත්ත	9378	28500	(1125 + 1140) 2,265m^3	11500	32000	(1,380 + 1280) 2660 m^3
සැලසුම් ප්‍රදේශය			**7,795.5 m^3**			**9,240 m^3**

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2020

උපායමාර්ග

- ප්‍රදේශයේ පවතින කිරිදි ඇල්ල වැනි ප්‍රධාන ජල මූලාශ්‍ර යොදාගනිමින් පිරිපහදු ක්‍රමවේද ඔස්සේ පානීය ජල හිඟය සපුරාලීමට කටයුතු කිරීම
- පිරිපහදු කළ පානීය ජලය ආරක්ෂිත නළ මාර්ග මගින් විධිමත් ක්‍රමවේදයකට අනුව බෙදාහැරීම තුළින් අනාරක්ෂිත ජල පරිභෝජනය වැළක්වීම

සිතියම් අංක 6.5 : යෝජිත පානීය ජල සැපයුම් සැලැස්ම



6.4.2.3. විදුලිය හා දත්ත රැහැන් සැපයුම

වර්තමානය වන විට පැල්මඩුල්ල හා කහවත්ත සමස්ථ සැලසුම් ප්‍රදේශයම ආවරණය කරමින් විදුලි බල සැපයුම සිදු කර ඇති අතර බලංගොඩ කොටුමා උපපොළ මගින් විදුලිය අවශ්‍යතාවය සපුරාගනු ලබයි. සැලසුම් ප්‍රදේශයම ආවරණය වන පරිදි විදුලි රැහැන් ආවරණය කර ඇති අතර දෛනික විදුලි ඉල්ලුමට පවතින සැපයුම ප්‍රමාණවත් වේ.

වර්ෂ 2050 සඳහා යෝජිත ජාතික භෞතික සැලැස්මේ විදුලි ප්‍රවේශකත්ව සැලැස්ම තුළ පෙන්වාදී ඇති කිලෝවොට් 200ක විදුලි රැහැන් පද්ධතිය මගින්ද කහවත්ත, පැල්මඩුල්ල නගර ආවරණය කර ඇත. ඒ අනුව 2033 වනවිට අපේක්ෂිත විදුලි අවශ්‍යතාවය සපයාගැනීමේ පහසුකම් සලසාගත හැක. එමෙන්ම ජාතික භෞතික සැලැස්ම තුළ දත්ත රැහැන් ව්‍යාප්ති සැලැස්ම තුළ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් යෝජිත ෆයිබර් ඔප්ටික් ජාලය මෙම නගර හරහා ව්‍යාප්ත කිරීමට හඳුනාගෙන ඇත.

උපායමාර්ග

- මෙම සැලසුම් ප්‍රදේශය තුළ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත උද්‍යාන හා විදි අලංකරණ ව්‍යාපෘති වල ආලෝකකරණයන් සඳහා සූර්යකෝෂ පුනර්ජනනීය බලශක්තිය භාවිතයට ගැනීම තුළින් නඩත්තු වියදම් හා නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම

  රූපය අංක 6.10 : සූර්යකෝෂ භාවිතාවන වීදි ලාම්පු

- සංචාරක ආකර්ශණීය ස්ථාන පිහිටා ඇති උපනාගාරික හා ග්‍රාමීය ප්‍රදේශ සඳහා අධිවේගී අන්තර්ජාල පහසුකම් සපුරාලීම තුළින් සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම

සිතියම් අංක 6.6 : විදුලි සැපයුම් සැලැස්ම



6.4.2.4. අපජලය හා මළාප්‍රවාහන කළමනාකරණය

පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි මළාප්‍රවාහය හා අප ජලය බැහැර කිරීම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් නොමැති අතර නිවාස, වාණිජ ගොඩනැගිලි හා ආයතනික ගොඩනැගිලි ආදී සියලු ස්ථාන වල මළාප්‍රවාහන හා අප ජලය බැහැර කිරීම සඳහා පූතික ටැංකි හා උරාගැනීමේ වලවල් භාවිතයට ගැනේ. නමුත් මෙම ක්‍රම භාවිතා කිරීම නගර මධ්‍යය ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති අධි ඝණත්ව වාණිජ භාවිතය හේතුවෙන් ගැටළුවක් බවට පත්ව ඇත. එමෙන්ම භූමියේ පිහිටීම හා භූගෝලීය තත්ත්වයන් මත භූගත ජල මට්ටම ඉහළින් පිහිටා තිබීම හේතුවෙන් පූතික ටැංකි ඉක්මණින් උතුරා යන තත්ත්වයක් මතු වේ. උරා ගැනීමේ වලවල් වලින් ජලය නිසි පරිදි උරා නොගැනීමේ ගැටළු මෙහිදී හඳුනාගෙන ඇත.

නාගරික පර්යන්ත ප්‍රදේශ තුළ පවතින බොහොමයක් කාණු පද්ධති කොන්ක්‍රීට් ආවරණයෙන් තොරව පැවතීම හේතුවන් ජලය උරාගැනීමේ හැකියාව වැඩි මට්ටමක පවති. ඒ අනුව කාණු තුළ වැසි ජලය රැඳී ඇතිවන මැසි, මදුරු වුවදුරු අවම වුවද කාණු පද්ධති අවහිරවීම හේතුවෙන් හදිසි ගංවතුර වැනි ආපදා තත්ත්වයන් ඇතිවීමේ හැකියාවක් පැවතිය හැක. මෙම ප්‍රදේශයේ පවතින භූගෝලීය හා දේශගුණික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අපජල හා මළාප්‍රවාහන සැලැස්මක් ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

මෙහිදී වර්ෂ 2033 වනවිට එකී ගැටළු අවම කරමින් සුපිරිසිදු නගරයක් නිර්මාණය කිරීම සඳහා පහත සඳහන් උපායමාර්ග හඳුනාගෙන ඇත.

උපායමාර්ග

- නාගරික ප්‍රදේශයේ යෝජිත වාණිජ කලාප ආවරණය වන පරිදි අප ජලය එක්රැස් කිරීම සඳහා නළ පද්ධතියක් ස්ථාපිත කර ඒ සඳහා ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථානයක් වෙත බැහැර කරන අප ජලය පිරිපහදු කිරීමෙන් අනතුරුව ජල මූලාශ්‍ර වලට මුදා හැරීම තුළින් එම ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම වැලැක්වීම
- නගර මධ්‍ය ප්‍රදේශයෙන් බැහැරව පවතින පර්යන්ත ප්‍රදේශ තුළ පවතින කාණු පද්ධති නඩත්තු කර පවත්වාගෙන යෑම.
- නගරයේ මළාප්‍රවාහනය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පූතික ටැංකි හා උරාගැනීමේ වලවල් භාවිතයට ගැනීම සඳහා වැඩි වශයෙන් යොමු කරවීම

රූපය අංක 6.11 : පිරිපහදු ක්‍රම මගින් කාණු හරහා ජල මූලාශ්‍ර වලට ජලය බැහැර කිරීම



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2020

6.4.2.5 . ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ජීවත්වීමට හිතකර වටපිටාවක් සහිත නගරයක් නිර්මාණය කිරීමේදී කසළ කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු අතර ඒ තුළින් පිරිසිදු නගරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ. මේවන විට සැලසුම් ප්‍රදේශයේ කසළ එක්රැස් කිරීම පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රාදේශීය සභා විසින් සිදු කරනු ලබන අතර දෛනිකව කසළ ටොන් 10 ක් පමණ එක්රැස් කරයි. නේවාසික ප්‍රදේශ වලින් ඔබ්බට වන්නට පිහිටි රබර් වතු ආශ්‍රිත ප්‍රදේශ කසළ එක්රැස් කිරීම සඳහා භාවිතා කරනු ලබන අතර සනීපාරක්ෂක බිම් පිරවුම තුළින් කසළ බැහැර කිරීම සිදු කෙරේ. දැනට ක්‍රියාත්මක කෙරෙන කසළ එක්රැස් කිරීම නගර මධ්‍යය හා ප්‍රධාන මාර්ග ආශ්‍රිත නේවාසික, වාණිජ හා ආයතනික අංශ ආශ්‍රිතව සිදු කෙරෙන අතර උප නාගරික ප්‍රදේශ වල කසළ කළමනාකරණය නේවාසික භූමිය තුළම සිදු කරනු දක්නට ලැබේ.

මෙම සැලසුම් ප්‍රදේශය තුළ දැනට උත්පාදනය වන හා 2033 වන විට අපේක්ෂිත ඝණ අපද්‍රව්‍ය උත්පාදනය වේයැයි ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු වගු අංක 6.3 තුළ සඳහන් කර ඇත. නාගරික බල ප්‍රදේශය තුළ විධිමත් ක්‍රමවේදයක් තුළින් කසළ කළමනාකරණය සිදු කිරීම සඳහා පහත සඳහන් උපායමාර්ග හඳුනාගෙන ඇත.

වගු අංක 6.3 : ඝණ අපද්‍රව්‍ය උත්පාදනය

ප්‍රදේශය	ජනගහනය (2020)		පවතින ඝණ අපද්‍රව්‍ය උත්පාදනය (T/D)	ජනගහනය (2033) (පුරෝකථන)		අපේක්ෂිත ඝණ අපද්‍රව්‍ය උත්පාදනය (T/D)
	නේවාසික	සංසරණ		නේවාසික	සංසරණ	
පැල්මඩුල්ල නාගරික බල ප්‍රදේශය	33921	43000	30.7	40557	86000	50.6
කහවත්ත නාගරික බල ප්‍රදේශය	9378	25000	13.7	11343	50000	24.5
සම්පූර්ණ ඝණ අපද්‍රව්‍ය උත්පාදනය			**44.4**			**75.1**

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය

උපායමාර්ග

නගර මධ්‍යය ප්‍රදේශය තුළින් බැහැර කෙරෙන සියලු කසළ හා පර්යන්ත ප්‍රදේශ තුළ එක්රැස් කෙරෙන නොදිරන කසළ විධිමත් ක්‍රමවේදයකට අනුව ප්‍රාදේශීය කසළ කළමනාකරණ මධ්‍යස්ථානය තුළට එක්රැස් කර එලදායි ක්‍රමවේදයකට අනුව කසළ බැහැර කිරීම සඳහා පහත උපායමාර්ගයන් හඳුනාගෙන ඇත.

- **ක්‍රමවත් ක්‍රමවේදයකට අනුකූලව කසළ එක්රැස් කිරීම හා බැහැර කිරීම**

  (අ) වෙන් කරන ලද කසළ එක්රැස් කිරීම

  පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රධාන නගර මධ්‍යය ප්‍රදේශ හා A4 හා A 18 ප්‍රධාන මාර්ගය ආශ්‍රිත ප්‍රදේශය ආවරණය වන පරිදි ක්‍රමවත් ක්‍රමවේදයකට අනුව දිරන, නොදිරන, ඉලෙක්ට්‍රෝනික (E-waste) හා ආදී වර්ගීකරණයන් කිහිපයක් යටතේ වෙන් කිරීමක් සහිතව පවතින කසළ නේවාසික, වාණිජ, ආයතනික හා සියලු ස්ථාන තුළින් එක්රැස් කිරීම

  දිනපතා බැහැර කරනු ලබන කසළ බැහැර කිරීම අඩුකිරීම(Reduce), නැවත නැවත භාවිතය (Reuse) හා ප්‍රතිචක්‍රීකරණ (Recycle) ආදී කසළ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ) GPS තාක්ෂණය භාවිතය

පැල්මඩුල්ල හා කහවත්ත නාගරික සැලසුම් ප්‍රදේශය තුළ කසළ එක්රැස් කිරීම සඳහා GPS තාක්ෂණය භාවිතා කරමින් කසළ එක්රැස් කිරීම් කාර්යයන් කාර්යක්ෂම කිරීම

(ඇ) වෙන්කරන ලද කසළ එක්රැස් කිරීම් මධ්‍යස්ථාන හරහා බෙදාහැරීම

දෛනිකව එක්රැස් කරනු ලබන කසළ දැනට කසළ එක්රැස් කරන පැල්මඩුල්ල හා කහවත්ත ප්‍රාදේශීය කසළ මධ්‍යස්ථානය වෙතට ප්‍රවාහනය හා එහි එක්රැස් කරන ලද කසළ විධිමත් ක්‍රමවේදයකට අනුව බැහැර කිරීම

රූපය අංක 6.12 : කසළ කළමනාකරණය



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2020

ආර්ථික සංවර්ධන උපායමාර්ග

6.5 ආර්ථික සංවර්ධන උපායමාර්ග

මැණික් පතල් කැණීම්, තේ හා රබර් වගාව ප්‍රධාන කරගත් ආර්ථික පදනමක් පවතින මෙම ප්‍රදේශය සංචාරක ආකර්ෂණීය මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන බොහොමයක් පවතින ප්‍රදේශයකි. එමෙන්ම 50% කට වැඩි තරුණ ජනගහනයක් වාර්තාවන මෙම නගර ස්වයන්පෝෂිත නගර ලෙස සංවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ආර්ථික සංවර්ධන උපායමාර්ග පිළියෙළ කර ඇත.

රූපය අංක 6.13 : ආර්ථික සංවර්ධන උපාය මාර්ග



6.5.1. මැණික් කර්මාන්තය සංවර්ධනය කිරීමේ උපායමාර්ග

රුවන්පුර යන අනුවර්ථ නාමයෙන් හැඳින්වෙන රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩිම පතල් සංඛ්‍යාවක් එනම් 1/5 ක් පමණ මෙම ප්‍රදේශයේ පවතී. සැලසුම් ප්‍රදේශය ආශ්‍රිත පමණක් පතල් කැණීම් කටයුතු ප්‍රධාන ජීවනෝපාය කරගත් පිරිස 20% ක් පමණ වන අතර අධ්‍යයන ප්‍රදේශය තුළ 50% ක් දක්වා ඉහළ ප්‍රතිශතයක් වාර්තා වේ. විවිධ රැකියා ක්ෂේත්‍රයන්හි නිරතවන්නන් ද අමතර ජීවනෝපාය මාර්ගයක් ලෙස මැණික් කර්මාන්තයේ නියැලී සිටිම මෙයට හේතු වේ. මතුපිට භූ ස්ථරයෙන් අඩි 20 ක් 30 ක් හෝ ඊටත් වඩා ගැඹුරට ඉල්ලම් සොයා මැණික් පතල් කැණීම් කරනු ලැබේ. දිවා කාලයේ පවා පොළොව යට බොහෝ වෙලාවක් කාලය ගතකරන පතල් කරුවන් රටේ දළ ජාතික නිෂ්පාදනයට සෘජු දායකත්වයක් ලබාදේ. ඒ අනුව මැණික් කර්මාන්තය සංවර්ධනය කරමින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට මෙන්ම නාගරික ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙහිදී අරමුණු කෙරේ.

මැණික් කර්මාන්තය තුළ පවතින සැපයුම් ජාලය අධ්‍යානයේදී ප්‍රධාන අධියරයන් 3ක් හඳුනාගත හැකිවේ. මැණික් පතල් කැණීම් සිදුකිරීම, එහිදී හමුවන රළු මැණික් ගල් සඳහා අගය එක්කිරීම හා එසේ අගය එක්කරන මැණික් ගල් වෙළඳාම් කිරීම එම ප්‍රධාන අධියරයන් වේ. මෙම ක්‍රියාදාමය තුළ පැල්මඩුල්ල හා කහවත්ත නගර විශේෂ වන්නේ මැණික් පතල් කැණීම් කටයුතු සඳහාය. ඒ අනුව මැණික් කර්මාන්තයේ අනන්‍යතාවය ඉස්මතු කරවන සලකුණුගත නගරයක් ඉදිකිරීමේ අපේක්ෂාව සාක්ෂාත් කරගැනීම උදෙසා ඉහත හඳුනාගත් ප්‍රධාන අධියරයන් යටතේ උපායමාර්ග හඳුනාගෙන ඇත.

රූපය අංක 6.14 : මැණික් කර්මාන්තය සංවර්ධන උපාය මාර්ග සඳහා අදාළ වන ප්‍රධාන අවස්ථා



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2020

උපායමාර්ග

මැණික් පතල් කැණීම

- නාගරික සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති ඉඩම් තුළ පවතින මැණික් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට පෙර විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ලබාගැනීම තුළින් නගර මධ්‍ය ප්‍රදේශ වල සිදු කෙරෙන අනවසර මැණික් පතල් කැණීම් කටයුතු අවම කිරීම
- මෙම ප්‍රදේශයේ පවතින මැණික් පතල් කැණීමේ කර්මාන්තය සංචාරක කර්මාන්තය හා සම්බන්ධ කිරීම තුළින් ප්‍රදේශවාසීන්ට අමතර ආදායම් මාර්ග අවස්ථා ඇති කිරීම
- මැණික් පතල් කැණීම් කර්මාන්තයට අවශ්‍ය උපකරණ නිෂ්පාදනය හා අලෙවිය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ප්‍රදේශවාසීට අමතර ආදායම් උත්පාදන අවස්ථා ඇතිකිරීම

රූපය අංක 6.15 : මැණික් පතල් කැණීම් සඳහා අවශ්‍ය වන උපකරණ නිෂ්පාදනය

මූලාශ්‍රය : ඡායාරූප අන්තර්ජාලයෙනි, 2020

අගය එක්කිරීම

- මැණික් සඳහා වැඩි වටිනාකමක් ලබා ගැනීම සඳහා මැණික් කර්මාන්තය ආශ්‍රිත අගය එක්කිරීම් කාර්යයන් පුළුල් කිරීම
- මැණික් කර්මාන්තය ආශ්‍රිත පුහුණු ශ්‍රමිකයන් වැඩි කිරීම සඳහා වෘත්තීය පාඨමාලා ප්‍රමාණය වැඩි කිරීම හා ඒ ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම

රූපය අංක 6.16 : මැණික් සඳහා අගය එක් කිරීම්

මූලාශ්‍රය : ඡායාරූප අන්තර්ජාලයෙනි, 2021

මැණික් වෙළඳාම

- පැල්මඩුල්ල බස් නැවතුම ආශ්‍රිතව හා කහවත්ත නගරය ආශ්‍රිතව විවෘත මැණික් වෙළඳාම් කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සැපයීම තුළින් මැණික් වෙලදාම් කටයුතු විධිමත් කිරීම

රූපය අංක 6.17 : එළිමහන් මැණික් වෙලදාම් ස්ථාන හා යෝජිත සංවර්ධනය

මූලාශ්‍රය : නා.සං.අධි. හා අන්තර්ජාලය

6.5.2. කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමේ උපායමාර්ග

බ්‍රිතාන්‍ය පාලන සමයේ සිට මෙම ප්‍රදේශයේ සිදුකෙරෙන තේ හා රබර් වගාවන් කලාපීය ආර්ථිකය සංවර්ධනය සඳහා සැලකියයුතු දායකත්වයක් ලබාදේ. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය කරන දිස්ත්‍රික්ක අතර දෙවන ස්ථානයේ සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ තේ නිෂ්පාදනයට 18% ක දායකත්වයක් සැලසුම් ප්‍රදේශයෙන් ලබාදෙන අතර රබර් නිෂ්පාදනයෙන් තුන්වන ස්ථානයේ සිටින රත්නපුර දිස්ත්‍රික්කයේ රබර් නිෂ්පාදනයට 12% ක දායකත්වයක් ලබාදේ. මේ අනුව දැනට පවතින දායකත්වයට වඩා වැඩි දායකත්වයක් ලබාදෙමින් වතු වගාව ප්‍රවර්ධනය කිරීම හා ඒ තුළින් නාගරික ආර්ථිකය ස්වයංපෝෂිත කිරීමත් මෙහිදී අරමුණු කෙරේ.

- දැනට පවතින තේ හා රබර් ඉඩම් සුරක්ෂිත කරමින් වතු ආර්ථිකය නගාසිටුවීම සඳහා සංවර්ධන සැලැස්මේ කලපිකරණය තුළින් එම වගා භූමි වැවිලි බෝග ප්‍රවර්ධන කලාපය ලෙස නම් කිරීම හා වගාකටයුතු ප්‍රවර්ධනයට අදාළ මාර්ගෝපදේශ ඇතුළත් කිරීම

රූපය අංක 6.18 : වැවිලි ප්‍රවර්ධන කලාපය සඳහා යෝජිත භාවිතයන් (තේ හා රබර් වතු)

මූලාශ්‍රය : ඡායාරූප අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

- ගුණාත්මක තත්ත්වයේ තේ හා රබර් නිෂ්පාදන වැඩි කිරීම සඳහා නව බෝග විශේෂ පැළෑටි වගාකරන හා බෙදාහැරීම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම

රූපය අංක 6.19 : නව බෝග විශේෂ සහිත පැළ තවාන් හා බෙදාහැරීමේ මධ්‍යස්ථාන

මූලාශ්‍රය : ඡායාරූප අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

- ගුණාත්මකභාවයෙන් ඉහළ අපනයන මට්ටමේ අගය එක්කළ තේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා දැනට පවතින තේ කර්මාන්ත ශාලා ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම

රූපය අංක 6.20 : අගය එක්කළ තේ නිෂ්පාදනය

මූලාශ්‍රය : ඡායාරූප අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

- වතු ආශ්‍රිත ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඒ ආශ්‍රිත නිවාස, පාසල්, වෛද්‍ය මධ්‍යස්ථාන හා අනෙකුත් මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

6.5.3. සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ උපායමාර්ග

මිණිපුර සංචාරක කලාපයට අයත්වන මෙම ප්‍රදේශය, සංචාරක ආකර්ෂණයෙන් සැඟව පවතින සංචාරක ආකර්ශණීය ස්ථාන බොහොමයකින් සමන්විත වේ. කිරිබත්ගල හා කුට්ටිගල කඳු වැටි ආශ්‍රිතව පවතින රක්ෂිත ප්‍රදේශ වල ඇති සංචාරක ආකර්ශණීය ස්ථාන මෙන්ම ප්‍රදේශයට ආවේණික මැණික් පතල් කර්මාන්තය, හා සංස්කෘතික වටිනාකමක් පවතින සංචාරක ආකාර්ශණීය ස්ථාන බොහොමයක් හදුනාගෙන ඇත. ඒ අනුව නගරයේ පවතින සම්පත් තුළින්ම නාගරික ආර්ථිකය ස්වයංපෝෂිත කිරීම සඳහා මෙම සංචාරක ආකර්ශණීය ස්ථාන යොදාගැනීම හා ඒ තුළින් ප්‍රදේශවාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙහිදී අරමුණු කර ඇත.

- ප්‍රදේශයේ පවතින මැණික් පතල් කර්මාන්තය සංචාරක කර්මාන්තය සමග මුසුකර නව සංචාරක අත්දැකීම් ලබාදීම හා ඒ තුළින් සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කිරීම.

රූපය අංක 6.21 : මැණික් පතල් කැණීම් ආශ්‍රිත සංචාරක කටයුතු

මූලාශ්‍රය : Google Map, අනෙකුත් ඡායාරූප අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

- කිරිබත්ගල හා කුට්ටිගල කඳු ආශ්‍රිතව පවතින දියඇලි හා ආකර්ශණීය ස්ථාන මුනැරඹීම මූලික කරගනිමින් සංචාරක ගමන්පථ නිර්මාණය කිරීම හා ඒවා සංචාරකයන් අතර ප්‍රචලිත කිරීම තුළින් සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කිරීම

රූපය අංක 6.22 : යෝජිත ස්වභාවික දියඇලි නැරඹුම් ගමන් පථය

මූලාශ්‍රය : නා.සං.අධි., 2021

- හඳුනාගත් සංචාරක ආකර්ශණීය ගමන්පථ ආශ්‍රිත කඳු නැගීම, කුඩාරම් ගැසීම් ආදී ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා මාර්ගෝපදේශ සැපයීම මෙන්ම හා සංචාරකයින්ට අවශ්‍ය ආහාරපාන සැපයීම නවාතැන් සැපයීම යනාදී අංශ තුළින් ප්‍රදේශවාසීන්ට නව ආදායම් ඉපයීමේ මාර්ග සඳහා අවස්ථාව සැලසීම.

රූපය අංක 6.23 : සංචාරක සේවා ආශිත ක්‍රියාකාරකම් හා ආදායම් මාර්ග

මූලාශ්‍රය : ඡායාරූප අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී, 2020

- කලපිකරණය හා අනුමත භාවිතයන් තුළින් සංචාරක ආකර්ශණීය ස්ථාන ආශ්‍රිත ස්ථාන ආශ්‍රිතව ගෘහ ආශ්‍රිත සංචාරක තොරතුරු මධ්‍යස්ථාන යනාදී සංචාරක සේවා පහසුකම් ඇතිකිරීමට අවශ්‍ය අවස්ථා සැලසීම.

සිතියම් අංක 6.7 : යෝජිත සංචාරක සැලැස්ම



6.5.4. වෙළඳ හා වාණිජ සංවර්ධන උපායමාර්ග

මැණික් කර්මාන්තය හා වැවිලි බෝග ආර්ථික කටයුතු වලට අමතරව පැල්මඩුල්ල හා කහවත්ත නගර තුළ දැනට ව්‍යාප්තව පවතින වෙළඳ හා වාණිජ සේවා පහසුකම් තුළින් මෙම නගර දෙකේ හා ඒ අවට කුඩා නගර බොහොමයක ජනතාව තම වාණිජ හා සේවා පහසුකම් සපුරාගැනීම සිදුකරනු ලබයි. තොග හා සිල්ලර වෙලදාම්, අවන්හල්, ආපනශාලා පහසුකම් මෙම ප්‍රදේශය රත්නපුර දිස්ත්‍රික්කයේ සිව්වන ස්ථානයේ පවතින අතර සංචාරක හා අනෙකුත් නවාතැන් ආශ්‍රිත පහසුකම් අවම මට්ටමක පැවතීම හඳුනාගෙන ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ ``මැණික් පතල් අතරින් වැඩිම මැණික් පතල් ප්‍රමාණයක් මෙම ප්‍රදේශයේ පිහිටීම තුළින් මැණික් බහුල ප්‍රදේශයක් බව තහවුරු වේ. මෙම නගර ආවරණය කරමින් බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන 45ක් පමණ දැනට ස්ථාපනය වී පවතින අතර එමගින් මෙම නගරයන්හි පවතින මූල්‍ය ශක්තිය පිළිබඳ අවබෝධ කරගත හැකිවේ.

පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යය ප්‍රදේශ ආශ්‍රිතව දැනට පවතින ප්‍රධාන වාණිජ සේවාවන් ඒකරාශී වී පවතින අතර වර්ෂ 2033 වනවිට අපේක්ෂිත ජනගහනයට අවශ්‍ය වෙළඳ හා බාහිර සේවාවන් විධිමත්ව සැපයීමට පහසුවන පරිදි සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් උපායමාර්ග හඳුනාගෙන ඇත.

උපායමාර්ග

- පැල්මඩුල්ල නගර මධ්‍යයේ ඔරලෝසු කණුව ආශ්‍රිත ප්‍රදේශයේ පිහිටි ආර්ථික වටිනාකමින් ඉහළ රාජ්‍ය ආයතන සඳහා භාවිතා කරන ඉඩම් වාණිජ භාවිතයන් සඳහා යොදාගනිමින් දැනට පවතින ආයතන නගරාසන්න සුදුසු ස්ථානයක නැවත පිහිටුවීම

රූපය අංක 6.24 : පැල්මඩුල්ල ඔරලෝසු කණුව ආශ්‍රිත දැනට පවතින භාවිතයන්

මූලාශ්‍රය : Google Map, 2020

06 වන පරිච්ඡේදය

සැලැස්ම

- දැනට පවතින පැල්මඩුල්ල ප්‍රධාන බස් නැවතුම්පොළ ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන අතර එම ස්ථානය සුදුසු වාණිජ භාවිතයක් සඳහා යොදාගනිමින් බස්නැවතුම්පොළ ඉඩකඩ සහිත නගරාසන්න ප්‍රදේශයක නැවත ස්ථාපනය කිරීම
- කහවත්ත හා පැල්මඩුල්ල නගර මධ්‍යයේ පිහිටි ආර්ථිකමය වටිනාකම ඉහළ රජයසතු හිස් ඉඩම් හා ගරාවැටුණු හා භාවිතයට නොගන්නා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කර සුදුසු වාණිජ භාවිතයන් සඳහා යොදාගැනීම

රූපය අංක 6.25 : කහවත්ත මූලික රෝහලට හා අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට ආසන්නව ගරාවැටුණු ගොඩනැගිල්ල සඳහා යෝජිත සංවර්ධනය

මූලාශ්‍රය : නා.සං.අධිකාරිය, අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

- පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍යය ප්‍රදේශය වාණිජ කලාපයට ඇතුළත් කරමින් වාණිජ භාවිතයන් ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම

තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග

6.6 තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග

සංවේදී පරිසර කලාපයක පිහිටා ඇති මෙම ප්‍රදේශය කුඹුරු, වනාන්තර රක්ෂිත, ගංගා, දිය ඇළි වැනි ස්වභාවික සම්පත් වලින් අනූන ප්‍රදේශයක් වන අතර එම සම්පත් සුරක්ෂිත කිරීම මෙහි මූලික අරමුණකි. එමෙන්ම මෙම ප්‍රදේශය සංවේදී පරිසර කලාපයක් මෙන්ම ස්වභාවික හා අනෙකුත් ආපදා බලපෑම් පවතින ප්‍රදේශයක් වන හෙයින් ආපදා අවම කරමින් ජීවත් වීමට යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම ද අරමුණු වේ. තවද පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීම තුළින් නිරෝගිමත් ජනතාවක් බිහි කිරීම අරමුණු කෙරේ.

තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග යටතේ ප්‍රධාන සැලසුම් හතරක් ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇත.

රූපය අංක 6.26 : තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග



6.6.1. පරිසර සංරක්ෂණ සැලැස්ම

පැල්මඩුල්ල - කහවත්ත සැලසුම් ප්‍රදේශයෙන් 20% කට ආසන්න භූමි ප්‍රමාණයක් පාරිසරික සංවේදී ප්‍රදේශ ලෙස හදුනාගෙන ඇත. කුඹුරු, වගුරු බිම්, වන රක්ෂිත ප්‍රදේශ සහ ජල මාර්ග මෙයට අයත් වේ. ජෛව විවිධත්වය ආරක්ෂා කරගනිමින් පාරිසරික, සංචාරක අවස්ථා වැඩිකිරීම මෙන්ම පාරිසරික සංවේදී ප්‍රදේශ තිරසාර භාවිතයට යොදා ගැනීමද එමගින් ප්‍රදේශයේ ආර්ථිකය ශක්තිමත් කිරීමද අරමුණු කර ඇත.

ඒ අනුව මෙම සංවේදී පරිසර පද්ධතිය හා නාගරික අනන්‍යතාවය ආරක්ෂා කරගැනීම සඳහා හදුනාගෙන ඇති උපායමාර්ග පහතින් දක්වා ඇත.

උපායමාර්ග

- පවතින ස්වභාවික ලක්ෂණ සහ ඒවායේ සංවේදීතා මට්ටම මත පදනම්ව කිරිබත්ගල වනාන්තර ප්‍රදේශය, කුඹුරු හා වගුරු බිම් ප්‍රදේශ පාරිසරික සංවේදී ප්‍රදේශ කලාපිකරය තුළ ඇතුළත් කිරීම හා නියමතා පැනවීම තුළින් ආරක්ෂා කිරීම
- ජල මූලාශ්‍ර ආශ්‍රිතව රක්ෂිත ප්‍රදේශ පවත්වාගෙන යාම හා ඒ ආශ්‍රිත අනවසර ඉදිකිරීම් පාලනය සඳහා මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම හා එම රක්ෂිත ප්‍රදේශ එළිමහන් විනොදාස්මක කටයතු සඳහා භාවිතයට ගැනීම.

රූපය අංක 6.27 : ගඟ හා ඇළ රක්ෂිත සඳහා යෝජිත භාවිතයන්



මූලාශ්‍රය : Google Map - අන්තර්ජාලය

- කිරිබත්ගල, කිරිදි ඇල්ල යනාදී සංචාරක ආකර්ෂණය සහිත පාරිසරික සංවේදී ප්‍රදේශ තුළ පාරිසරික සංවේදීතාවයට හානියක් නොවන අයුරින් පරිසර හිතකාමී සංචාරක කටයුතු ක්‍රියාත්මක කිරීම මගින් සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කිරීම
- වේ ගඟ, දෙනවක ගඟ, අටකලන් ඇළ, කෝලන් ඇළ, පනාවැන්න ඇළ යනාදී ප්‍රධාන ජල මූලාශ්‍ර හා අනෙකුත් ජල මූලාශ්‍ර සුරක්ෂිත කරමින් පිරිසිදු වටපිටාවක් සහිත නාගරික පරිසරයක් බිහිකිරීම සඳහා සුදුසු රක්ෂිත සීමාවන් පැනවීම

6.6.2. ආපදා අවධානම අවම කිරීමේ සැලැස්ම

පැල්මඩුල්ල හා කහවත්ත නාගරික ප්‍රදේශ නායයෑම් අවධානම් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති අතර ගංවතුර, තද සුළං හා අකුණු වැනි ආපදා තත්ත්වයන්ද දැකිය හැකිවේ. ස්වභාවික හේතූන්ට අමතරව ගැඹුරු පතල් කැණීම් යනාදී මිනිස් ක්‍රියාකාරකම්ද ආපදා අවධානම් ඇතිවීමට හේතු ලෙස හඳුනාගෙන ඇත. මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් ලෙස මැණික් පතල් කර්මාන්තය හඳුනාගත හැකිය. පතල් කැණීම් මගින් සිදුවන ආපදාවන්ගේ බලපෑම පිළිබඳව දැනුවත් වුවද එකී කර්මාන්තයම හේතුවෙන් ඔවුන් වෙනත් ප්‍රදේශයක පදිංචි වීමටද කැමැත්තක් නොදක්වයි.

වාර්ෂිකව බලපෑම් ඇති නොවුවද නායයෑම් වැනි ආපදා සිදුවිය හැකි බවට සිදුකරන ලද පරීක්ෂණ තුළින් අනාවරණය කරගත් පූර්ව ලක්ෂණ අනුව අවධානමේ බලපෑම් මට්ටම් හදුනාගෙන ඇත. ඒ අනුව අන්තරායක නායයෑම් සම්බන්ධයෙන් හදුනාගත් නිර්ණායක වන්නේ බෑවුම් පරාසය සහ කාණ්ඩයන්, භූමියේ පවතින මව් පාෂාණයේ ස්වභාවය, භූමිය සැකසී ඇති ආකාරය, වර්තමාන ඉඩම් පරිහරණ රටාව, එම භූමියට අදාලව පවත්නා නාය යෑම් ඉතිහාසය, ජලවහන රටාව සහ කාණු පද්ධතියයි.

මේ අනුව ආපදා ආවධානමේ ස්වභාවය අනුව ආපදා අවම කරගැනීම හා ප්‍රදේශවාසීන්ගේ ජීවනෝපාය මාර්ගයන්ද සිදු කර ගැනීමට හැකිවන පරිද්දෙන් ආපදාවලට ඔරොත්තු දෙන නගරයක් නිර්මාණය කිරීම සඳහා අදාළ උපායමාර්ග හදුනාගෙන ඇත.

උපායමාර්ග 1: ආපදා අවධානමේ ස්වභාවය අනුව ඒ ඒ ප්‍රදේශ සඳහා අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම තුළින් ආපදා අවධානම අවම කිරීම හා ආපදාවලට ඔරොත්තු දෙන නගරයක් නිර්මාණය කිරීම.

අධි අවධානම් සහිත ප්‍රදේශ

- කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සඳහා භාවිතයට නොගැනීම
- දැනට අධි අවධානම් සහිත ප්‍රදේශ වල ජීවත්වන ජනතාව සුදුසු ආරක්ෂිත ප්‍රදේශයක නැවත පදිංචි කරවීම
- අදාළ ආපදා කළමනාකරණ හා පර්යේෂණ ආයතන වල උපදෙස් හා මාර්ගොපදේශයන්ට අනුකූලව ක්‍රියා කිරීම.

මැදි අවධානම් සහිත ප්‍රදේශ

- දැනට පවතින ජනාවාස වැඩිදියුණු කිරීමේදී අදාළ මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කිරීම.
- කිසියම් කැණීම් කටයුත්තක් හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකමක් සිදුකරන්නේ නම් අදාළ මාර්ගොපදේශයන්ට අනුකූලව ක්‍රියා කිරීම

අඩු අවධානම් සහිත ප්‍රදේශ

- මෙම ප්‍රදේශ වල සියලු ඉදිකිරීම් කටයුතු මාර්ගොපදේශයන්ට අනුකූලව සිදු කිරීම

උපායමාර්ග 2 : හදිසි ආපදා පූර්ව අනතුරු ඇගවීම් අවස්ථාවකදී ජනතාවට පහසුවෙන් ලගාවියහැකි ආරක්ෂිත ස්ථාන ආපදා සහන සේවා මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක කිරීම

උපායමාර්ග 3 : මැණික් පතල් කැණීම් හේතුවෙන් ඇතිවිය හැකි ආපදා වැලැක්වීම සඳහා අදාළ මාර්ගෝපදේශ වලට අනුව මැණික් පතල් කැණීම් කටයුතු සිදු කිරීම

උපායමාර්ග 4 : වැසි ජල බැස යන කාණු පද්ධතිය ජලය බැසයාමට පහසු වන පරිදි නඩත්තු කර පවත්වාගෙන යාම

උපායමාර්ග : වේ ගග හා දෙනවක ගග ආශ්‍රිත ගංවතුරු අවධානම් සහිත ප්‍රදේශ වල සංවර්ධන කාර්යයක් සිදුකිරීමේදී සංවර්ධනයේ ස්වභාවය අනුව ගංවතුර පාලනය සඳහා අදාළ උපක්‍රම ක්‍රියාත්මක කිරීම තුළින් ආපදා අවධානම් අවම කරගැනීම

6.6.3. පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම

පැල්මඩුල්ල - කහවත්ත නාගරික ප්‍රදේශයේ වර්තමාන ජනගහනය 50,814 ක් පමණ වන අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වාදෙන ලද ප්‍රමිතියට අනුව එම ජනගහනය සඳහා පොදු එළිමහන් විවෘත භූමි හෙක්ටයාර් 71 ක් පමණ පැවතිය යුතුය. එම අවශ්‍යතාවයට අනුව හෙක්ටයාර් 6.04 ක් පමණක් දැනට පවතින අතර වසර 2033 ජනගහන පුරෝකථනයට අනුව එම අවශ්‍යතාවය හෙක්ටයාර් 80 ක් අවශ්‍ය වේ.

මෙම සැලසුම් ප්‍රදේශය සතු දර්ශනීය ස්ථාන ආරක්ෂා කරගනිමින් එවැනි ස්ථාන ජනතාවගේ භාවිතය සඳහා තිරසාරව යොදා ගැනීමත්, 2033 වර්ෂය වනවිට අපේක්ෂිත ජනගහනයට සාපේක්ෂව ඔවුනට විනෝදාස්වාදය සඳහා අවශ්‍ය වන විවෘත ඉඩ පහසුකම් නිසි පරිදි සැලසුම් කිරීමත් මෙහිදී අරමුණු කර ඇත. ඒ අනුව නිදහසේ ප්‍රවේශ විය හැකි පොදු උද්‍යාන, ක්‍රීඩාංගණ වැනි පොදු විවෘත අවකාශයන් කෙරෙහි අවධානය යොමු කෙරේ.

වගු අංක 04,05 හා 06 මඟින් ප්‍රදේශයේ පවතින ක්‍රීඩාංගන පිළිබඳ ප්‍රමාණාත්මක විස්තර හා සිතියම් අංක 03 මඟින් පවතින උද්‍යාන සහ ක්‍රීඩා පිටි වලට අදාළ අවකාශීය ව්‍යාප්තිය දක්වා ඇත.

01. කොළඹ - මඩකලපුව පාරට සමාන්තරව පිහිටා ඇති කුඹුරු ඉඩම් සහ අවට ස්වභාවික පරිසරයේ දර්ශනීය දසුන් සඳහා පවතින දෘශ්‍ය බාධක පාලනය කරමින් නිෂ්ක්‍රීය එළිමහන් විනෝදාස්වාද කටයුතු සඳහා භාවිතයට යොදාගැනීම

St-02 මෙම සැලසුම් ප්‍රදේශය තුළ හඳුනාගෙන පවතින දර්ශනීය දසුන් සහිත ස්ථාන ආරක්ෂා කරමින් ප්‍රදේශයේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා අදාළ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම

St-03 පවතින ක්‍රීඩා පිටි නැවත සංවර්ධනය කිරීමෙන් ක්‍රියාකාරී විනෝදාත්මක ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම

St-04 පැල්මඩුල්ල සහ කහවත්ත නගර මධ්‍ය ප්‍රදේශයේ විනෝදාත්මක පහසුකම් හරහා සංචාරක ආකර්ෂණය වැඩි කිරීම

වගු අංක 6.4 : පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය තුළ ව්‍යාප්තව පවතින උද්‍යාන සහ ක්‍රීඩාංගන

අනු අංකය	උද්‍යාන වර්ගය	සංඛ්‍යාව	ප්‍රමාණය(හෙක්:)
01.	EPP (පවතින ඉතා කුඩා උද්‍යාන)	01	0.14
02.	EMP (පවතින කුඩා උද්‍යාන)	08	3.45
03	ELP (පවතින අසල උද්‍යාන)	1	2.45
එකතුව - 6 .04 (හෙක්:)			

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019, නා.සං.අධි.

වගු අංක 6.5 : පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය තුළ ව්‍යාප්තව පවතින ඉතා කුඩා උද්‍යාන හා ක්‍රීඩා පිටි

අනු අංකය	වර්ගය	වර්තමාන භාවිතය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය	ප්‍රමාණය (හෙක්ටයාර්)
01.	EPP 01	පනාවැන්න ක්‍රීඩාපිටිය	පනාවැන්න	0.14
එකතුව - 0.14 (හෙක්:)				

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019, නා.සං.අධි.

වගු අංක 6.6 : පැල්මඩුල්ල - කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාප්තව පවතින කුඩා උද්‍යාන

අනු අංකය	වර්ගය	වර්තමාන භාවිතය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය	ප්‍රමාණය (හෙක්ටයාර්)
01.	EMP 01	රිල්හේන ක්‍රීඩාපිටිය	රිල්හේන	0.30
02.	EMP 02	ඉහළ බෝපිටිය ක්‍රීඩාපිටිය	ඉහළ බෝපිටිය	0.36
03.	EMP 03	පැල්මඩුළුගම ක්‍රීඩාපිටිය	පැල්මඩුළුගම	0.33
04.	EMP 04	බොරළු ක්‍රීඩාපිටිය	බොරළු	0.60
05.	EMP 05	බණ්ඩාර වත්ත ක්‍රීඩාපිටිය	පනාවැන්න	0.22
06.	EMP 06	කහවත්ත ක්‍රීඩාපිටිය	නුගවෙල නැගෙනහිර	0.84
07.	EMP 07	සුසිරිගම ක්‍රීඩාපිටිය	වෙල්ලේදූර	0.39
08.	EMP 08	වෙල්ලේදූර ක්‍රීඩාපිටිය	වෙල්ලේදූර	0.41
				එකතුව – 3.45 (හෙක්:)

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019, නා.සං.අධි.

වගු අංක 6.7 : පැල්මඩුල්ල - කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාප්තව පවතින අසල උද්‍යාන

අනු අංකය	වර්ගය	වර්තමාන භාවිතය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය	ප්‍රමාණය (හෙක්ටයාර්)
01.	ELP 1	මහපොළ පොදු ක්‍රීඩාපිටිය	ගනේගම	2.45
				එකතුව - 2.45 (හෙක්:)

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත - 2019, නා.සං.අධි.

පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය තුල පවතින වක්‍ර විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන කිහිපයක්ද හඳුනා ගැනීමට හැකි අතර ඒ පිළිබඳ විස්තර වගු අංක 07 මඟින් දැක්වේ.

වගු අංක 6.8 : පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශය තුල පවතින වක්‍ර විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන

අනු අංකය	**පහසුකම්**	**සංඛ්‍යාව**
01.	ප්‍රජා ශාලා	66
02.	පුස්තකාල	13

සිතියම් අංක 6.8 : පොදු එළිමහන් කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම



6.6.4 භූ දර්ශන කළමනාකරණ සැලැස්ම

කිරිබත්බල හා කුට්ටපිටිය කඳු අතර නිම්න ප්‍රදේශයේ පිහිටි පැල්මඩුල්ල නගරයත් ඊට යාබදව පිහිටි කහවත්ත නගරයත් කඳු සහිත උස්බිම් හා තැනිතලා ප්‍රදේශ මෙන්ම කුඹුරු, තේ, රබර් වගාවන්ගෙන් සමන්විත නීල හරිත වටපිටාවකින් සමන්විත වේ. විශේෂයෙන් පැල්මඩුල්ල නගරය හරහා ගමන් ගන්නා විට ප්‍රධාන මාර්ගය දෙපස පවතින හරිත වර්ණිත කුඹුරු තුළ තැනින් තැන මැණික් පතල් ඇසට සුලභ දර්ශනයක් වන අතර ඒ තුළින් නගරයේ අනන්‍යතාවය ඉස්මතු වේ. ශ්‍රී ලංකාවේ මැණික් පතල් සණත්වය වැඩිම ප්‍රදේශය ලෙස හඳුනාගෙන ඇති මෙම සැලසුම් ප්‍රදේශය, ශ්‍රී ලංකාවේ මැණික් අනන්‍යතාවයේ ප්‍රධාන සලකුණ ලෙස සංවර්ධනය කිරීම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණකි. එමෙන්ම, මෙම සැලැස්ම මගින් ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූ දර්ශනය ආරක්ෂා කිරීම ප්‍රධානම අරමුණ වේ. එමගින් නගරයට පවතින අනන්‍යතාවය ආරක්ෂා කරගැනීම ද අපේක්ෂා කෙරේ.

පාරිසරික වශයෙන් සංරක්ෂණය පෙරදැරි කරගත් ක්‍රමවත් සැලසුම් මගින් විවිධ පරිසර පද්ධති, මං මාවත් ආදිය තිරසාර ලෙස භූ දර්ශන සංවර්ධනය කිරීමට මෙම සැලැස්ම මගින් අපේක්ෂා කෙරේ. ගෝලීය කාලගුණ විපර්යාස සඳහා අනාගතයේ මුහුණ දීමට, භූ දර්ශන සැලැස්ම පහත සඳහන් අරමුණුමත පදනම්ව පිළියෙළ කර ඇත.

- ගෝලීය දේශගුණික විපර්යාස හේතුවෙන් නගරයේ ඇතිවිය හැකි නාගරික උෂ්ණත්වය ඉහළ යාම, කාබන් අංශු වැඩිවීම, වායු දූෂණය වැඩිවීම, ජල ගැලීම් වැඩිවීම වැනි ආපදා තත්ත්වයන් අවම කිරීම
- නාගරික ජෛව විවිධත්වය වර්ධනය සඳහා පරිසරයට ආවේණික වූ දේශීය ශාක විශේෂ ආරක්ෂා කිරීම
- නාගරික ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය ආරක්ෂා කරමින්, ජීවත්වීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම

ඉහත සඳහන් අරමුණු වෙත ළගාවෙමින් පැල්මඩුල්ල - කහවත්ත නගරයන්හි භූ දර්ශන කළමනාකරණ සැලැස්ම තුළින් පහත සඳහන් උපායමාර්ග හඳුනාගෙන ඇත.

උපායමාර්ග 01:

ප්‍රධාන නගර මධ්‍යස්ථාන සංවර්ධනය

- මෙම සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගෙන ඇති ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන තුන ආශ්‍රිත භූ දර්ශනය සිදු කිරීමේදී ප්‍රදේශයට ආවේණික මැණික් කර්මාන්තය හා සංචාරක ආකර්ශණීය සහිත ස්ථාන පිළිබිඹු කිරීම
  - පැල්මඩුල්ල ඔරලෝසු කණුව හා ඒ ආශ්‍රිත ප්‍රධාන A ශ්‍රේණියේ මාර්ග දෙකක් හමුවන මං සංධිය
  - කහවත්ත ඔරලෝසු කණුව පිහිටි ප්‍රධාන මං සංධිය හා වේ ගග දෙපස ප්‍රදේශය
  - යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයේ අවසන් පිවිසුම වන පනාවැන්න ප්‍රදේශය

උපායමාර්ග 02:

උද්‍යාන අලංකරණය

- සංවේදී පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සහ ඥාණාන්විත භාවිතයන් (Wise use) හඳුන්වා දීම මඟින් තිරසර ලෙස පරිසර හිතකාමී විනෝද කටයුතු සඳහා තිරසාර ලෙස යොදා ගැනීම.
- නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි අපරව්‍යුහ පහසුකම් සහිත මනාව සැලසුම් කල විවෘත භූමි ප්‍රදේශ පොදු ජනතාව වෙනුවෙන් නිර්මාණය.

උපායමාර්ග 03:

මංතීරු සංවර්ධනය

- මං තීරු සංවර්ධනයේදී සුදුසු දැන්වීම් පුවරු, විදුලි ආලෝකය එක් කිරීම මගින් නගරයට අලංකාරයක්, අනන්‍යතාවයක් මෙන්ම, ආර්ථිකමය සංවර්ධනයක්ද ලබාදීම.

උපායමාර්ග 04:

දර්ශණීය ස්ථානවල භූ දර්ශනය

- දර්ශනීය ස්ථාන අවහිර වන ලෙස ඉදිකිරීම් වැලැක්වීම හා එකී දර්ශනීය ස්ථාන නැරඹීම සඳහා සුදුසු නැරඹුම් පහසුකම් සැලසීම

නේවාසික හා අනෙකුත් භෞතික සංවර්ධනයන්

- අපේක්ෂිත භෞතික ආකෘතිය වෙත ළගාවෙමින් භූ දර්ශන කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට අදාළ නියමතා යෙදවීම.

6.7 සංස්කෘතික සහ ඓතිහාසික උරුමයන් පිළිබඳ උපායමාර්ග

සංස්කෘතික හා ඓතිහාසිකමය වශයෙන් වැදගත් සහ පුරාවිද්‍යාත්මක ස්ථාන වශයෙන් ප්‍රකාශිත ස්ථාන කිහිපයක්ම මෙම සැලසුම් ප්‍රදේශය තුළ පිහිටා ඇත. එවැනි ස්ථාන වලින් බොහොමයක් බෞද්ධ විහාරස්ථාන වන අතර ඊට අමතරව ඉද්දමල්ගොඩ වලව්ව, කහවත්ත පැරණි දුම්රිය නැවතුම්පොළ යනාදී ස්ථාන ද හඳුනාගත හැකිය. භෞතික වශයෙන් හඳුනාගත් උරුමයන්ට අමතරව සාම්ප්‍රදායික මැණික් පතල් කර්මාන්තය, සබරගමු නර්තන සම්ප්‍රදාය වැනි දෑ මෙම ප්‍රදේශයට ආවේනික වන අතර එවැනි කලාවන් හා සම්ප්‍රදායන් ආරක්ෂාකරමින් ජනතාවට ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම මෙහිදී අරමුණු කර ඇත.

6.7.1. පුරා විද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන

රත්නපුර දිස්ත්‍රික්කයේ බෞද්ධාගමික සිද්ධස්ථාන වැඩිම ප්‍රමාණයක් පිහිටි පැල්මඩුල්ල නගරයේ පුරාවිද්‍යාත්මක වශයෙන් නම් කරන ලද විහාරස්ථාන 9ක් පිහිටා ඇත.

ගනේගම අරමුණුපොල විහාරය

ඓතිහාසික වශයෙන් අධ්‍යනය කිරීමේදී මෙම විහාරස්ථානයේ ඉතිහාසය අනුරාධපුර යුගයේ දේවානම්පියතිස්ස රජු සමය දක්වා අතීතයට විහිද යයි. අනුරාධපුරයේ ජයශ්‍රීමහා බෝධියෙන් හටගත් දෙතිස්ඵල බෝධියක් අදටත් ගනේගම රජමහා විහාරයේ පවතී. මෙම විහාරය වටා ගල් කණු 27 ක් කැටයමින් යුතුව නිමවා ඇත. බැලූ බැල්මට විහාරය දෙමහල් ලෙස පෙනුනද එය තනිමහල් ගොඩනැගිල්ලකි. තනි බිත්තියෙන් ඉහලට නැගුන මේ විහාරගෙයි උඩු මහල යැයි සිතිය හැකි ප්‍රදේශයේ පිටතට පෙනෙන පරිදි විහාර ගෙය වටා කලාත්මක කැටයම් දැකිය හැකිය. මෙම විහාරස්ථානය 1951/03/02 වන දින ගැසට් අංක 10217 යටතේ ආරක්ෂිත පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

විශේෂයෙන්ම මේ විහාරගෙයි වහලයේ රන්කොත් දෙකක් දැකිය හැකි අතර එම නිසාම "රන්කොත් වෙහෙර" යැයි පසු කාලීනව මෙම ඉපැරණි වෙහෙර හඳුන්වන ලදී. මෙහි ඇති පැරණි ගල් උළුවස්ස, මකර තොරණ, නාරිලතා සිතුවම්, යනාදිය දකුණු ඉන්දීය ආභාෂය අනුව නිර්මාණය කර තිබීමද විශේෂත්වයකි.

රූපය අංක 6.28 : පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරය

මූලාශ්‍රය : අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරය

අනුරාධපුර යුගයේ මුල් අවධියේ ශ්‍රී මහා බෝධීන්වහන්සේ ගේ ශාඛාවක් රුහුණට වැඩමවීමේදී මෙම ස්ථානයේදී මුල් ඇදීම හේතුවෙන් මෙහි විහාරස්ථානයක් ඉදි කළ බවටද ජනප්‍රවාදයේ පවතී. මෙහි ඇති ටැම්පිට විහාරය කෝට්ටේ යුගයේදී නිර්මාණය කර ඇත.

මෙහි ඇති ටැම්පිට විහාරය ගල් කණු 16 ක් මත ඉදිකර ඇති අතර එය වසර 400 කටත් වඩා පැරණි යැයි සැලකේ. ප්‍රධාන විහාරය බ්‍රිතාන්‍ය යුගයේ 1819 ඉදිකරන ලද්දකි. 1828 දී දොලොස්වල අධිකාරී විසින් පුළුල් රූප මන්දිරයක් මෙහි ඉදිකර ඇත. ප්‍රතිමා ගෘහයට ඇතුළුවන දොරටුව මකර තොරන් වලින් සහ ගජසිංහ තොරණකින් හා අසාමාන්‍ය මල් මෝස්තර වලින් සරසා ඇත. මකර තොරණ මධ්‍යයේ කාන්තාවකගේ කුඩා මූර්තියක් ඇති අතර එය ආශිර්වාද ලත් කන්‍යා මරියතුමියගේ යැයි බොහෝ දෙනා විශ්වාස කරති. ගජසිංහ තොරණ මධ්‍යයේ දේවදූතයන් දෙදෙනෙකුගේ රුව දක්නට ඇත. විහාර මන්දිරය තුල උඩරට යුගයට අයත් සිතුවම් බොහොමයක් ඒ අටවිසි බුදුවරුන්ගේ රූපද නැකත් වලට අදාල රූපද දක්නට ඇත. එමෙන්ම 1867 දී ත්‍රිපිටකයෙහි ශාසනික කෘතීන් ගායනා කළ ස්ථානය ලෙසද පැල්මඩුල්ල රජමහා විහාරය හැඳින්වේ.

රූපය අංක 6.29 : ටැම්පිටගෙය පැල්මඩුල්ල පුරාණ රජමහා විහාරය

මූලාශ්‍රය : අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

ඉද්දමල්ගොඩ වලව්ව

සබරගමුවේ සිටි ප්‍රතාපවත් පරපුරක් වූ ඉද්දමල්ගොඩ පරපුරේ ඉද්දමල්ගොඩ නිලමේ විසින් ඉදිකරන ලද මෙම නිවස කබොක් ගල් හා මැටියෙන් තනා ගෙබිම කළු ගල් අතුරා ඔප දමා ඇත. සිංහල හා ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පය අනුව හා සාම්ප්‍රදායික ක්‍රම අනුසාරයෙන් ඉදිකිරීම් කර තිබේ. වලව්ව වටා කබොක්ගලින් කළ මිටි තාප්පයක් දැකිය හැකිය. එහි සමාන දුරින් තනා තිබූ කුළුණු කිහිපයක් වර්තමානයේද දැකිය හැකිය.

සම්ප්‍රදායික වලව්වක ලක්ෂණ ඒ අයුරින්ම දක්නට ඇති ඉදිදමල්ගොඩ වලව්වේ ඉදිරියෙන්ම විශාල ප්‍රමාණයේ කුළුණු 15කට වැඩි සංඛ්‍යාවකින් යුක්ත දිගු විවෘත ආලින්දයක් දැකිය හැකිය. ඊට පිටුපසින් එම කුළුණු වලට වඩා උසින් යුක්ත කුළුණු කිහිපයකින් දරා සිටින තවත් විවෘත ආලින්දයක් දැකගත හැකිවීමද විශේෂත්වයකි. නිවසට ඇතුළුවන ප්‍රධාන උළුවස්ස හා අනිකුත් සියළුම දොර සහ ජනෙල් උළුවහු ඉතා විශාල ප්‍රමාණයේ ඒවා වන අතර ඒවා උසින්ද වැඩිය වර්තමානය වනවිට ඒවා තරමක් දිරාපත්ව ඇත. වලව්වට ජලය ලබාගත් ළිඳ වර්තමානයේද නිවසට පිටුපසින් දක්නට තිබේ.

රූපය අංක 6.30 : ඉද්දමල්ගොඩ වලව්ව

මූලාශ්‍රය : නා.සං. අධිකාරිය

පැල්මඩුල්ල සුදර්ශන ධර්ම ශාලාව

පැල්මඩුල්ල නගරයට ඉතා සමීපව පිහිටා ඇති සුදර්ශන ධර්ම ශාලාව වර්ෂ 125 ක් පමණ පැරණි ගොඩනැගිල්ලකි. මෙම නිර්මාණය මහනුවර යුගයේ දේශීය ගෘහනිර්මාණ සම්ප්‍රදාය හා යුරෝපීය ගෘහ නිර්මාණ ශිල්පයේ සංකලනයක් ලෙස දැක්විය හැකි වේ. ජනෙල් කවුලු හා දොරටු ආරුක්කු ක්‍රමයට තනා ඇත. මෙහි බිත්තිවල විවිධ චිත්‍ර සිතුවම් කර ඇත. ඇතුල් පැත්තේ බිත්ති මැදින් ශාලාව වටා පහන් දැල්වීම සඳහා යකඩ සිදුරු සාදා තිබේ. ශාලාව මැද විශාල ප්‍රමාණයේ වටකුරු කුළුණු අටකි. වහලය එල දෙකට තනා සිංහල උළු සෙවිලි කර ඇත.

පැල්මඩුල්ල සුදර්ශන ධර්මශාලාවෙහි පවත්වනු ලැබූ ධර්ම සංඝායනා නිසාද මෙම ස්ථානය විශේෂත්වයක් ගනී. මෙහිදී ග්‍රන්ථාරූඪ කල ත්‍රිපිටක පොත් දැනටද මෙහි ඇති පුස්තකාලයේ සුරක්ෂිතව ඇත.

රූපය අංක 6.31 : සුදර්ශන ධර්මශාලාව

මූලාශ්‍රය : අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකමකින් යුක්ත ගොඩනැගිලි කිහිපයක් මෙම සැලසුම් ප්‍රදේශය තුළින් හඳුනා ගෙන ඇති අතර එම ස්ථාන වගු අංක 6.10 මගින් දක්වා ඇත.

වගු අංක 6.9 : පුරාවිද්‍යාත්මක ස්ථාන වශයෙන් ප්‍රකාශිත ස්ථාන

අංකය	පුරාවිද්‍යාත්මක ස්ථානය	ස්මාරකය	ග්‍රාම නිලධාරි වසම
1.	අරමන්පොළ රජමහා විහාරය	පැරණි බෝධිය, රන්කොත් වෙහෙර	රිල්හෙන
2.	පැල්මඩුල්ල රජමහා විහාරය	ටැම්පිට විහාරය, මකර තොරණ	පැල්මඩුල්ලගම
3.	ගල්පොත්තාවල පුරාණ රජමහා විහාරය	පැරණි චිත්‍ර සහිත විහාරගෙය	ගනේගම
4.	ශ්‍රී සුධර්මාරාමය රජමහා විහාරය හා පිරිවෙණ	ආවාස ගෙය, දාන ශාලාව සහ ධර්ම ශාලාව	පැල්මඩුල්ල නගරය
5.	මීගහගොඩ පුරාණ විහාරය	පැරණි චිත්‍ර සහ මූර්ති සහිත පැරණි විහාරය	දෙනවක උඩකඩ
6.	අභයතිලකාරාමය	පැරණි චිත්‍ර මූර්ති සහිත ප්‍රතිමා ගෘහය සහ ප්‍රාකාරය	රිල්හේන
7.	කිරිවැල්දෙණිය පුරාණ විහාරය	ප්‍රතිමා ගෘහයේ මකර තොරණ සහිත ඉදිරිපස බිත්තිය	සන්නස්ගම
8.	දිද්දෙණිය පුරාණ විහාරය		දෙනවක
9.	ගොඩගම රජමහා විහාරය		පනාවැන්න
10	ඉද්දමල්ගොඩ වලව්ව	වලව්ව	පැල්මඩුල්ල නගරය
11	ගිරාවත්ත ඉඩම	ඉද්දමල්ගොඩ බස්නායක නිලමේගේ සොහොන සහ පැරණි බෝධිය	පැල්මඩුල්ල නගරය
12	බුංගිරිය ගල්ලෙනේ පත්තිනි දේවාලය	ආඩියාගල ගලෙහි ඇති පර්වත ලිපිය සහ කටාරම් සහිත ලෙන් විහාරය	බුංගිරිය

6.7.2. සංස්කෘතික උත්සව හා අනන්‍යතාවයන්

ගල්පොත්තාවල රජමහා විහාරයේ වාර්ෂික පෙරහැර

ගල්පොත්තාවල රජමහා විහාරස්ථානයේ සිට ශ්‍රී පාදස්ථානය දක්වා ශ්‍රී සර්වඥ ධාතූන් තැන්පත් කර ඇති සධාතුක කරඬුව හා සමන්දේව ප්‍රතිමා වහන්සේ පෙරහැරින් වැඩම කරවීම සෑම වර්ෂයකම චාරිත්‍රානුකූලව කරනු ලබයි. පෙරහැර තුනකින් වැඩම කරවන සධාතුක කරඬුව හා සමන් දේව ප්‍රතිමාව ආගමික වතාවත් සිදු කර ශ්‍රී පාද මළුවේ තැන්පත් කිරීමෙන් අනතුරුව ශ්‍රී පාද වන්දනාවේ ආරම්භය සනිටුහන් කරනු ලබයි.

රූපය අංක 6.32 : ශ්‍රී පාද දේවාභරණ වැඩම්මවීමේ වාර්ෂික පෙරහැර

මූලාශ්‍රය : අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

ප්‍රදේශයට ආවේණික කලාවන්

මෙම ප්‍රදේශයට ආවේණික කලාවන් අතර සබරගමු නර්තන සම්ප්‍රදාය විශේෂිත වේ. ජාතික සංස්කෘතියට අයත් ඉතාමත් පැරණි දුටුවන් ප්‍රිය උපදවන ආකාරයේ නැටුම් කලාවක් වන මෙය ප්‍රදේශයටම ආවේණික වූවකි. සබරගමු පලාතේ රත්නපුර, කලවාන, පැල්මඩුල්ල බලංගොඩ ආදී ප්‍රදේශවල මෙම නර්තනය සම්ප්‍රදාය ප්‍රචලිතය. මෙම නර්තන අතරින් දෙවොල් මඩු, ශාන්තිකර්ම, පහන්මඩු යාග, ආදිය වැදගත් වේ.

රූපය අංක 6.33 : සබරගමු නර්තන සම්ප්‍රදායන්

මූලාශ්‍රය : අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

සාම්ප්‍රදායික පතල් කර්මාන්තය

ශ්‍රී ලංකාවේ පවතින සම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස මැණික් පතල් කැණීම පුරාණ රජවරුන්ගේ යුගය දක්වා දිව යයි. දැනට ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික, පරිසර හිතකාමී සහ සදාචාරාත්මක කැණීම් ක්‍රම ජාත්‍යන්තර මැණික් කැණීම් ක්ෂේත්‍රය තුළ බොහෝ මං සලකුණු පිහිටුවා ඇත. තවද, ශතවර්ෂ ගණනාවක් පුරා පැවත එන සාම්ප්‍රදායික කැණීම් ක්‍රම ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ අවම පතල් අනතුරු සඳහා මූලික හේතුව වී ඇත. ශ්‍රී ලංකාව තුළ මැණික් පතල් කැණීම් ක්‍රම කිහිපයක් පවතින ඒවා අනුව මැණික් පතල් තට්ටු පතල්, ගොඩ පතල් (පතහ), දෝනා පතල් සහ යාන්ත්‍රික පතල් ලෙස වර්ගකර දැක්විය හැකිය.

මෙහි ඇති විශේෂත්වය නම් සාම්ප්‍රදායික මැණික් පතල් කර්මාන්තය සමග අදටත් ඒ සඳහාම ආවේණික භාෂා ව්‍යවහාරයන්, ඇදහිලි හා විශ්වාසයන් පැවතීමයි. පතල්නඩය යන්නෙන් පතලක වැඩ කරන සේවක පිරිස හඳුන්වනු ලබන අතර පතල් බාස්, කුමතේරුකරු, හවුල්කරුවෝ විශේෂ තනතුරු වේ. සාමාන්‍ය සිරිත අනුව කාන්තාවන් පතලය අසලට ගෙන්නා ගන්නේ නැත. මෙයට අමතරව, පතලයට හෝ පතලය සහිත කලාපයට කබරයින් වැනි සතුන් පැමිණෙනවා නම් එයත් අසුභ ලකුණක් බවට සමහර පතල් හිමිකරුවන්ගේ විශ්වාසය වේ. උරුවම් බැම, පාවහන් පැළඳීම සිදු නොකරන අතර පතල ආරම්භ කිරීමට පෙර දෙවියන්ට බාර හාර වීම සිදු කෙරේ පතලයේ වැඩ ආරම්භ කරන්නට කලින් මල්පහන් පූජා කර බුදුන් දෙවියන් ඇදහීම අතීතයේ සිට පැවත එන සම්ප්‍රදායකි.

පතලය ආරම්භ කරන්නට කලින් මරු සිටින දිශාව, සුභ වෙලාව, සුභ දිශාව ආදී ජෝතිෂ්‍ය ශාස්ත්‍රයට අනුකූල ක්‍රමවේද නිසි පරිදි ඉටුකරන බව කිවයුතු වේ. පළමු පස් පිඩැල්ල වෙනම තැබීමත් රාහු කාලය තුල දී ඉල්ලම් කැඩීම, ගැරීම සහ පතලයකට වැඩ තැබීම ආදිය සිදු නොකරයි. පළමු ඉල්ලම් කූඩයට සිරිතට අනුව වැඳ නමස්කාර කර දෝතින්ම ගෙන ඉල්ලම් කමතින් තැබීම වැනි ක්‍රියාවන් සෑම පතලයකම වාගේ සිදු කෙරේ.

පැල්මඩුල්ල හා කහවත්ත නගර සංවර්ධනය කිරීමේදී නාගරික අනන්‍යතාවය ඉස්මතුකරන හා එහි ජීවත්වන ජනතාවගේ ඇදහිලි විශ්වාස, මෙන්ම සංස්කෘතික උරුමයන් වැනි වටිනා අවස්තාවන් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් එකී සංස්කෘතිය සුරක්ෂිත කිරීම හා අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් ඵලදායි ලෙස භාවිතා කිරීම සඳහා පහත උපායමාර්ග හඳුනාගෙන ඇත.

මෙවැනි උරුමයන් සංරක්ෂණය කිරීම හා එකි උරුමයන්හි වටිනාකමවලට හානියක් නොවන පරිදි උචිත භාවිතයන් සඳහා යොදාගනිමින් එවැනි ස්ථාන නඩත්තුව හා නාගරික ආර්ථිකය ශක්තිමත් කරන සංචාරක කටයුතු සඳහා භාවිතා කිරීමට හඳුනාගෙන ඇත.

උපායමාර්ග

මෙම ප්‍රදේශයේ දැනට අතහැර දමා ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමෙන් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහ පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කිරීම

රූපය අංක 6.34 : කහවත්ත පැරණි දුම්රිය නැවතුම් ස්ථානය

මූලාශ්‍රය : නා.සං. අධිකාරිය, අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදී

- මෙම ප්‍රදේශයේ පවතින සංස්කෘතික උරුමයන් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා සංස්කෘතික මංපෙතක් නිර්මාණය කිරීම
- මෙම ප්‍රදේශයට ආවේණික සංස්කෘතික සිදුවීම් ජනතාව අතරට ගෙනයාම සහ ආරක්ෂා කිරීම සඳහා ප්‍රදේශයේ කලා ආයතන සහ අනෙකුත් සංස්කෘතික ආයතනවලට පහසුකම් සැලසීම

සිතියම් අංක 6.9 : සංස්කෘතික හා උරුමයන් සංවර්ධන සැලැස්ම



6.8. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

6.8.1. හැඳින්වීම

නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගන්නා ලද සංවර්ධන උපායමාර්ග ලගාකර ගැනීම සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා කර ඇත. විශේෂයෙන් නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී හඳුනාගත් ප්‍රධාන ගැටළු සඳහා විකල්ප අවස්ථා සැලසීම මෙන්ම නගර සංවර්ධන දැක්ම හා අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම අරමුණු කරගනිමින් භෞතික සංවර්ධන ව්‍යාපෘති හඳුනාගෙන ඇත. මේ අනුව විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරමින් ව්‍යාපෘති පිළිබඳව පවතින භෞතික, සාමාජීය, පාරිසරික හා ආර්ථික වටිනාකම් පිළිබඳ අවධානය යොමු කරමින් ව්‍යාපෘති හඳුනාගැනීම සිදුකර ඇත.

මෙහිදී නගරයේ පවතින අවශ්‍යතා, ගැටළු හා ප්‍රවණතාවයන් අනුව සංවර්ධන ව්‍යාපෘති ප්‍රමුඛතාගතකර ඇත.

6.8.2. ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම

වර්ෂ 2033 සඳහා යෝජිත පැල්මඩුල්ල - කහවත්ත නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගත් ව්‍යාපෘති, සමාජීය, ආර්ථික හා පාරිසරික බලපෑම, ව්‍යාපෘති කාලසීමාව, ව්‍යාපෘති පිරිවැය, අපේක්ෂිත නගර සංවර්ධන සංකල්පයට අනුකූල වීමේ ප්‍රමාණාත්මකතාවය යනාදී අංශ වලට පවතින අනුකූලත්වය මත සිදුකරන ලද දත්ත විශ්ලේෂණය තුළින් මෙම ව්‍යාපෘති පෙළගැස්ම සිදුකර ඇත (ඇමුණුම 4)

06 වන පරිච්ඡේදය

සැලැස්ම

ව්‍යාපෘති පෙළගැස්ම පැල්මඩුල්ල නගරය

ව්‍යාපෘති පෙළගැස්ම	ව්‍යාපෘතිය
1	1. පැල්මඩුල්ල මහජන පොළ ආශ්‍රිත නාගරික චතුරශ්‍රය හා රථවාහන නැවතුම් ස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2. පැල්මඩුල්ල ප්‍රධාන බස්නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 3. ප්‍රධාන මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 4. පැල්මඩුල්ල විකල්ප මාර්ගය ඉදි කිරීමේ ව්‍යාපෘතිය 5. පැල්මඩුල්ල මැණික් චතුරශ්‍ර ඉදිකිරීමේ ව්‍යාපෘතිය (පැල්මඩුල්ල දැනට පවතින බස්නැවතුම්පොළ අසළ)
2	1. පැල්මඩුල්ල ප්‍රාදේශීය රෝහල් පිවිසුම, රථගාල හා වාණිජ සංකීර්ණය සංවර්ධන ව්‍යාපෘතිය 2. පැල්මඩුල්ල දැනට පවතින ප්‍රධාන බස්නැවතුම්පොළ ස්ථානයේ මැණික් ආශ්‍රිත වෙළඳසැල් හා සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 3. පනාවැන්න මධ්‍යම ප්‍රාන්තික නිවාස සංවර්ධන ව්‍යාපෘතිය 4. මැණික් කර්මාන්තය පාදක කරගත් තේමා උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය (මහජන පොළ ඉදිරිපස හිස් ඉඩම) 5. කිරිබත්ගලට හා කිරිදි ඇල්ල ආශ්‍රිත සංචාරක ගමන් මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
3	1. කිරිදි ඇල්ල පානීය ජල ව්‍යාපෘතිය 2. තේමා උද්‍යානය අසළ හෙළ බොජුන්හල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 3. ගනේගම පුරාණ රජමහා විහාරය ඉදිරිපස රථගාල හා අලංකරණ ව්‍යාපෘතිය 4. පැල්මඩුල්ල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පනාවැන්න ප්‍රදේශයේ නැවත ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 5. පැල්මඩුල්ල ආශ්‍රිත සංචාරක ආකර්ශණීය ස්ථාන ආශ්‍රිත නැරඹුම් මැදිරි ඉදිකිරීමේ ව්‍යාපෘතිය 6. අප ජල පිරිපහදු කිරීමේ ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

4	1. පැල්මඩුල්ල ඔරලෝසු කණුව ආශ්‍රිතව පවතින ආයතන යෝජිත බස්රථ අංගනය ආශ්‍රිත නැවත පිහිටුවීමේ ව්‍යාපෘතිය 2. පැල්මඩුල්ල ඔරලෝසු කණුව අසළ මංසන්ධිය වැඩිදියුණු කිරීම හා අලංකරණය කිරීමේ ව්‍යාපෘතිය 3. ගන්කන්ද මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 4. විකල්ප මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 5. පැල්මඩුල්ල ඔරලෝසු කණුව ආශ්‍රිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘති පෙළගැස්ම කහවත්ත නගරය

ව්‍යාපෘති පෙළගැස්ම	ව්‍යාපෘතිය
1	1. කහවත්ත ප්‍රධාන බස්නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (කහවත්ත ක්‍රීඩා පිට්ටනිය පවතින ස්ථානය) 2. කහවත්ත කලාප කාර්යාලයට යාබද හිස් ඉඩම තුළ වාණිජ ගොඩනැගිල්ල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 3. කහවත්ත පැරණි දුම්රිය ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය 4. කහවත්ත ප්‍රධාන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 5. වේ ගඟ ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය
2	1. දැනට පවතින නාගරික ක්‍රීඩාංගණය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (විමලරත්න මැණික් වෙළඳසැල පිටුපස කුඹුරු ඉඩම) 2. සංචාරක තොරතුරු මධ්‍යස්ථානය හා මැණික් චතුරශ්‍රය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 3. අතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය 4. කහවත්ත නාගරික උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය (කහවත්ත ඔරලෝසු කණුව අසළ ඇති ඉන්ධන පිරවුම්හල පිටුපස්පුරන් කුඹුරු ඉඩම) 5. කහවත්ත ළමා උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය (යෝජිත ක්‍රීඩාංගණය ආශ්‍රිත)

06 වන පරිච්ඡේදය

සැලැස්ම

3	1. කහවත්ත මූලික රෝහල රථගාල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2. කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (යෝජිත බස්නැවතුම අසළ) 3. කහවත්ත යෝජිත විකල්ප මාර්ග සංවර්ධනය 4. කහවත්ත ඔරලෝසු මංසන්ධි අලංකරණ ව්‍යාපෘතිය 5. අප ජල පිරිපහදු කිරීමේ ප්‍රාථමික ප්‍රතිකාර මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය (වේ ගඟ ආශ්‍රිත)

6.8.3 ව්‍යාපෘති පිළිබඳ විස්තර

පැල්මඩුල්ල ප්‍රධාන බස්නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය				
ව්‍යාපෘති යෝජනාව	නගරයේ ප්‍රධාන ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම			
පිහිටීම	**පළාත**	සබරගමුව	**දිස්ත්‍රික්කය**	රත්නපුර
	ප්‍රා .ලේ.කො.	පැල්මඩුල්ලප්‍රා.ලේ.කො.	**පළාත් පාලන ආයතනය**	පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (කොළඹ - මඩකලපුව මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	පුරන් කුඹුරු ඉඩම්			
ඉඩමේ අයිතිය	පෞද්ගලික			
භූමි ප්‍රමාණය	අක්.3			

ව්‍යාපෘතියේ අදාළත්වය

දැනට පැල්මඩුල්ල නගරයේ පවතින ප්‍රධාන බස්නැවතුම්පොළ තුළ පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන අතර භෞතික යටිතල පහසුකම් ද ප්‍රමාණවත්ව සපුරා නොමැත.

06 වන පරිච්ඡේදය
සැලැස්ම

රත්නපුර දිස්ත්‍රික්කයේ කේන්ද්‍රස්ථානයේ පිහිටි පැල්මඩුල්ල නගරයට කොළඹ - මඩකලපුව (A 4) මාර්ගය හා පැල්මඩුල්ල - නෝනගම (A 18) මාර්ගය සම්බන්ධ වේ. මේ අනුව රත්නපුර, ඇඹිලිපිටිය , කොළඹ , බදුල්ල , බලංගොඩ , මොණරාගල නගර වෙත ගමන් ගන්නා බස් රථ මේ හරහා ගමන් ගන්නා අතර දැනට පවතින ඉඩකඩ බස් රථ නතර කිරීමට තරම් ප්‍රමාණවත් නැත. එමෙන්ම යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමත් සමඟ ක්‍රියාත්මක වීමට නියමිත අධිවේගී මාර්ග බස් රථ ගමනාගමනයට ද නිශ්චිත ස්ථාන පහසුකම් හඳුනාගෙන නොමැති බැවින් මෙම සියලු කරුණු සැලකිල්ලට ගෙන, වර්ෂ 2033 සඳහා අපේක්ෂිත සංසරණ ජනගහනයට ප්‍රමාණවත් පහසුකම් ලබාදෙමින් නාගරික ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම සඳහා පැල්මඩුල්ල ප්‍රධාන බස් නැවතුම්පොළ ප්‍රමාණවත් ඉඩකඩ සහිත ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

පැල්මඩුල්ල නගරයේ ප්‍රධාන බස්නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය කිරීම තුළින් මූලික ප්‍රවාහන සේවා ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම හා ඒ තුළින් නාගරික ජනතාවට හා සංසරණ ජනගහනයට අවශ්‍ය පොදු ප්‍රවාහන පහසුකම් විධිමත් අයුරින් සපුරා දීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නගර මධ්‍යයේ ඇතිවන රථවාහන තදබදය අවම වීම .
- බස්රථ හැසිරවීම සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් ලැබීම.
- මඟී ජනතාවට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ඇතුළු පොදු පහසුකම් සැපයීම.
- පැල්මඩුල්ල නගරය ආශ්‍රිත හා දුර ගුවන් සේවා බස් රථ සේවා පහසුකම් සැලසීම.

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	දළ ඇස්තමේන්තුව රු.මිලියන
පැල්මඩුල්ල ප්‍රධාන බස්නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත්කර ගැනීම හා සංවර්ධනය කිරීම	350
බස්නැවතුම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය	350

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

<table>
<tr><td colspan="5">කහවත්ත ප්‍රධාන බස්නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">නගරයේ ප්‍රධාන ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>සබරගමුව</td><td>දිස්ත්‍රික්කය</td><td>රත්නපුර</td></tr>
<tr><td>ප්‍රා .ලේ.කො.</td><td>කහවත්ත ප්‍රා.ලේ.කො.</td><td>පළාත් පාලන ආයතනය</td><td>කහවත්ත ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (පැල්මඩුල්ල - නෝනගම මාර්ගය)</td></tr>
<tr><td>පිහිටීම් සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td>දැනට පවතින භාවිතය</td><td colspan="4">කහවත්ත මහජන ක්‍රීඩාංගණය</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="4">කහවත්ත ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td>භූමි ප්‍රමාණය</td><td colspan="4">අක්.1</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

දැනට කහවත්ත නගරයේ බස් නැවතුම් සඳහා පැල්මඩුල්ල පරිපාලන සීමාව තුළ පිහිටා ඇති කහවත්ත පැරණි දුම්රිය ස්ථානය භාවිතයට ගෙන ඇත. රත්නපුර

දිස්ත්‍රික්කයේ කේන්ද්‍රස්ථානයේ පැල්මඩුල්ල නගරයට යාබදව පිහිටි කහවත්ත නගරය හරහා පැල්මඩුල්ල - නෝනගම (A 18) ප්‍රධාන මාර්ගය ගමන් ගන්නා අතර ඒ හරහා රත්නපුර, ඇඹිලිපිටිය , කොළඹ, මොණරාගල නගර වෙත ගමන් ගන්නා බස් රථ සේවා ක්‍රියාත්මක වේ. දැනට පවතින බස්නැවතුම්පොළ තාවකාලිකව භාවිතයට ගැනීමේ අරමුණින් ස්ථාපනය කර ඇත. මේ අනුව කෙටි දුර හා නගරය හරහා ගමන්ගන්නා දුර සේවා බස් නතර කිරීමට තරම් පවතින පහසුකම් ප්‍රමාණවත් නොවේ. මේ අනුව වර්ෂ 2033 වනවිට අපේක්ෂිත සංසරණ ජනගහනයට ප්‍රමාණවත් වන පරිදි යටිතල පහසුකම් වලින් සමන්විත විධිමත් බස්රථ නැවතුම් ස්ථාපනයක් නගරයට ආසන්න ඉඩකඩ සහිත ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

කහවත්ත නගරයේ ප්‍රධාන බස්නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය කිරීම තුළින් මූලික ප්‍රවාහන සේවා ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම හා ඒ තුළින් නාගරික ජනතාවට හා සංසරණ ජනගහනයට අවශ්‍ය පොදු ප්‍රවාහන පහසුකම් විධිමත් අයුරින් සපුරා දීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නගර මධ්‍යයේ ඇතිවන රථවාහන තදබදය අවම වීම .
- බස්රථ හැසිරවීම සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් ලැබීම.
- මඟී ජනතාවට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ඇතුළු පොදු පහසුකම් සැපයීම.
- කහවත්ත නගරය ආශ්‍රිත හා දුර ගමන් සේවා බස් රථ පහුකම් සැලසීම.
- දැනට පැල්මඩුල්ල පරිපාලන සීමාව තුළ ස්ථාපිතව ඇති බස්නැවතුම්පොළ කහවත්ත පරිපාලන සීමාව තුළ ස්ථාපනය කිරීම තුළින් එහි ප්‍රතිලාභ කහවත්ත ප්‍රාදේශීය සභාවට හිමිවීම.

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	රු.මිලියන
කහවත්ත ප්‍රධාන බස්නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	**300**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

<table>
<tr><td colspan="5">ව්‍යාපෘතිය හැඳින්වීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">පැල්මඩුල්ල කහවත්ත නගරයන්හි ප්‍රධාන මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">නගරයේ ප්‍රධාන මාර්ග සංවර්ධනය තුළින් මාර්ග තදබදය අවම කිරීම හා ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>සබරගමුව</td><td>දිස්ත්‍රික්කය</td><td>රත්නපුර</td></tr>
<tr><td>ප්‍රා .ලේ.කො.</td><td>පැල්මඩුල්ල ප්‍රා. ලේ. කොට්ඨාශය</td><td>පළාත් පාලන ආයතනය</td><td>පැල්මඩුල්ල සභාව / කහවත්ත ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td>පිහිටීම සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td rowspan="2">මාර්ගයේ දිග</td><td>කොළඹ - මඩකලපුව මාර්ගය (A 4)</td><td colspan="2">ශ්‍රී අභයාරාම විහාරස්ථානය ආසන්නයේ සිට යෝජිත විකල්ප මාර්ගය හමුවන තෙක් (පැල්මඩුල්ල ඔරලෝසු කණුව හන්දියේ සිට මී.700 ක් පමණ දක්වා)</td><td>කි.මී.1.8</td></tr>
<tr><td>පැල්මඩුල්ල - නෝනගම මාර්ගය (A 18)</td><td colspan="2">පැල්මඩුල්ල ඔරලෝසු කණුව මංසන්දියේ සිට- කහවත්ත යායින්න හන්දිය දක්වා</td><td>කි.මී. 7.5</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

පැල්මඩුල්ල හා කහවත්ත නගරයට ප්‍රවේශ වීම සඳහා පවතින ප්‍රධාන මාර්ග ලෙස කොළඹ - මඩකලපුව මාර්ගය හා පැල්මඩුල්ල - නෝනගම මාර්ගය හැඳින්විය හැකිය. මෙම මාර්ග දෛනිකව විශාල වාහන ප්‍රමාණයක් ඇතුළු වීම හා පිටවීම

සිදුවේ. ඒ අනුව වර්ෂ 2033 වනවිට අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සාර්ථක කරගැනීම සඳහා මෙම මාර්ග සංවර්ධනය හඳුනාගෙන ඇත.

මෙම ප්‍රධාන මාර්ග, කලාපීය හා ප්‍රාදේශීය අන්තර් සබධතා පවත්වා ගැනීමට වැදගත්වන අතර නගරයේ අපේක්ෂිත අනාගත සංවර්ධනයත් සමඟ මාර්ග තදබදය අවමකරමින් වැඩිවන රථ වාහන සංඛ්‍යාවට ප්‍රමාණවත් වන පරිදි මාර්ග පුළුල් කර ප්‍රධාන නගර දෙක අතර සම්බන්ධතාවය ඇති කිරීම සඳහා මෙන්ම නගර මධ්‍ය ප්‍රදේශයන්හි සංවර්ධනය විධිමත් කිරීම සඳහා මෙම ප්‍රධාන මාර්ග සංවර්ධනය අත්‍යඅවශ්‍ය වී ඇත.

ව්‍යාපෘති අරමුණු

පැල්මඩුල්ල සහ කහවත්ත නගරයන්ට පිවිසීම සඳහා වැඩි වශයෙන් භාවිතා වන ප්‍රධාන මාර්ග සංවර්ධනය තුළින් රථවාහන ගමනාගමනය පහසු කරමින් ප්‍රවාහන කටයුතු සඳහා වන `යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- රථවාහන ගමනා ගමනය පහසුවීම
- රථවාහන තදබය අවම වීම
- නාගරික ආකර්ෂණය වැඩිදියුණු වීම
- නව ආයෝජන අවස්ථා ලැබීම
- ඉඩම් වටිනාකම ඉහළ නැඟීම
- නගරයේ ඉදිරි අපේක්ෂිත සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීම පහසු වීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකෙරේ.

<table>
<tr><td colspan="5">ව්‍යාපෘතිය හැඳින්වීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">මැණික් චතුරශ්‍රය හා සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">දැනට පවතින විවෘත මැණික් වෙළඳපොළ විධිමත්ව පවත්වාගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම හා නාගරික ජනතාවට අවශ්‍ය වාණිජ සේවා පහසුකම් සැලසීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>සබරගමුව</td><td>දිස්ත්‍රික්කය</td><td>රත්නපුර</td></tr>
<tr><td>ප්‍රා .ලේ.කො.</td><td>පැල්මඩුල්ල ප්‍රා .ලේ.කො.</td><td>පළාත් පාලන ආයතනය</td><td>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (කොළඹ - මඩකලපුව මාර්ගය)</td></tr>
<tr><td>පිහිටීම් සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td>දැනට පවතින භාවිතය</td><td colspan="4">පැල්මඩුල්ල බස්නැවතුම්පොළ, සමුපකාර ගොඩනැගිල්ල, රාජ්‍ය නිළ නිවාස</td></tr>
<tr><td>අයිතිය</td><td colspan="4">රජය</td></tr>
<tr><td>භූමි ප්‍රමාණය</td><td colspan="4">අක්.1</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

මැණික් කර්මාන්තයේ සලකුණික නගරය වශයෙන් සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සාක්ෂාත් කරගැනීමත්, මැණික් කර්මාන්තය ආශ්‍රිත වෙළඳපොළ කටයුතු හා අනෙකුත් ඒ ආශ්‍රිත මැණික් වෙළදාම් සාප්පු සංකීර්ණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීම සඳහා මෙම ව්‍යාපෘතිය කියාත්මක කිරීමේ අවශ්‍යතාවය හදුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- විවෘත මැණික් වෙළඳපොළ පහසුකම් විධිමත්ව සපුරාලීම
- මැණික් වෙළඳ සැල් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් ලබාදීම
- ප්‍රධාන වාණිජ සේවා පහසුකම් නගර මධ්‍ය ප්‍රදේශයෙන් සපුරාලීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නගරයේ මැණික් වෙලදාම් නාගරික මැණික් වෙළඳාම සඳහා පවතින ඉල්ලුම වැඩිවීම
- නාගරික ආකර්ෂණය ඉහළ යාම
- නාගරික වාණිජ සේවා පහසුකම් කඩිනමින් සපුරා ගැනීමේ හැකියාව පැවතීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	දළ ඇස්තමේන්තුව මිලියන (රු.)
මැණික් චතුරස්‍රය හා සුපිරි වෙළඳ සාප්පු සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	750

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

<table>
<tr><td colspan="5">පැල්මඩුල්ල ප්‍රාදේශීය රෝහල් පිවිසුම්රථගාල හා වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">සෞඛ්‍ය සේවා පහසුකම් පුළුල් කිරීම හා වාණිජ සේවාවන් ප්‍රවර්ධනය කිරීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>සබරගමුව</td><td>දිස්ත්‍රික්කය</td><td>රත්නපුර</td></tr>
<tr><td>ප්‍රා.ලේ.කො.</td><td>පැල්මඩුල්ල ප්‍රා.ලේ.කො.</td><td>පළාත් පාලන ආයතනය</td><td>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (පැල්මඩුල්ල - නෝනගම මාර්ගය)</td></tr>
<tr><td>පිහිටීම සිතියම</td><td colspan="4"> </td></tr>
<tr><td>දැනට පවතින භාවිතය</td><td colspan="4">1.විධායක ඉංජිනේරු නිළ නිවාස
2.වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
3.සමෘද්ධි බැංකුව
4.අනවසර ඉදිකිරීම්
5.හිස් ඉඩම</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="4">රජය</td></tr>
<tr><td>භූමි ප්‍රමාණය</td><td colspan="4">අක්.3</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

පැල්මඩුල්ල නගරයට පවතින මූලික රෝහල වශයෙන් රෝහලට ඇතුල්වීමේ පිවිසුම හා වාහන නැවතුම් ස්ථානයක් නොමැතිවීම ගැටළුවක් ලෙස හඳුනාගන්නා ලද අතර ඒ සඳහා විසඳුමක් ලබාදීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇත. ඒ අනුව එකී අවශ්‍යතාවය ඉටුකරන අතරතුර භූමියේ වටිනාකම

උපරිමයෙන් භාවිතයට ගැනීමට හැකිවන පරිදි සුදුසු වාණිජ කටයුතු සඳහා භාවිතා කරමින් නගරයේ පහසුකම් වැඩිදියුණු කිරීම.

ව්‍යාපෘති අරමුණු

නගරවාසීන්ට තම සෞඛ්‍ය අවශ්‍යතා විධිමත්ව සපුරා ගැනීමට අවශ්‍ය පහසුකම් සපුරාලීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- රෝහල ආශ්‍රිත වාහන නතර කිරීමේ ඉඩ පහසුකම් සපුරාලීම
- රෝහල ආශ්‍රිත ප්‍රධාන මාර්ගයේ රථවාහන තදබදය අවම වීම
- රෝහල් පිවිසුම් මාර්ගය අවහිරයකින් තොරව භාවිතා කළ හැකිවීම
- ප්‍රදේශයේ වාණිජ සේවාවන් පුළුල් වීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	දළ ඇස්තමේන්තුව රු.මිලියන
රෝහල් පිවිසුම, රථගාල හා වාණිජ ගොඩනැගිල්ල ඉදිකිරිම	450

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

පැල්මඩුල්ල ඔරලෝසු කණුව ආශ්‍රිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය				
ව්‍යාපෘති යෝජනාව	පැල්මඩුල්ල නගරයේ වාණිජ කේන්ද්‍රස්ථානයේ පිහිටි මෙම ඉඩම සුදුසු වාණිජ භාවිතයන් සඳහා යොදාගැනීම හා නාගරික අනන්‍යතාවය ඉස්මතුවන පරිදි භූමි අලංකරණය කිරීම			
පිහිටීම	**පළාත**	සබරගමුව	**දිස්ත්‍රික්කය**	රත්නපුර
	ප්‍රා .ලේ.කො.	පැල්මඩුල්ල ප්‍රා.ලේ.කො.	**පළාත් පාලන ආයතනය**	පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (කොළඹ - මඩකලපුව මාර්ගය)/(පැල්මඩුල්ල - නෝනගම මාර්ගය)			
පිහිටීම සිතියම				
දැනට පවතින භාවිතය	1.තැපැල් කාර්යාලය 2.මහේස්ත්‍රාත් අධිකරණය 3.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය			
ඉඩමේ අයිතිය	රජය			
භූමි ප්‍රමාණය	අක්.3			

ව්‍යාපෘතියේ අදාළත්වය

පැල්මඩුල්ල නගර මධ්‍යයේ පිහිටි වාණිජ වටිනාකමින් ඉහළ ඉඩම් ප්‍රශස්ථ මට්ටමේ වාණිජ භාවිතයන් සඳහා ප්‍රවර්ධනය කිරීම තුළින් ආයෝජනයන් සඳහා පවතින අවස්ථා පුළුල් කිරීමෙන් නගර මධ්‍යයේ වාණිජ කටයුතු විධිමත් කිරීමෙන් අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- නගරවාසීන්ට හා සංසරණ ජනතාවට අවශ්‍ය වාණිජ සේවාවන් පුළුල් කරමින් නාගරික ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- වාණිජ කලාපය තුලින්ම සියලු වාණිජ සේවා ලබාගැනීමේ අවස්ථාව සැලසීම
- නව ආයෝජනයන් සිදුකිරීම සඳහා අවස්ථාව සැලසීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	දළ ඇස්තමේන්තුව රු.මිලියන
යෝජිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	950

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

<table>
<tr><td colspan="5">පැල්මඩුල්ල රාජ්‍ය ආයතන ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">පැල්මඩුල්ල නගරයේ වාණිජ කේන්ද්‍රස්ථානයේ පිහිටි මෙම ඉඩම් සුදුසු වාණිජ භාවිතයන් සඳහා යොදාගැනීම හා නාගරික අනන්‍යතාවය ඉස්මතුවන පරිදි භූමි අලංකරණය කිරීම</td></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>සබරගමුව</td><td>දිස්ත්‍රික්කය</td><td>රත්නපුර</td></tr>
<tr><td>ප්‍රා .ලේ.කො.</td><td>පැල්මඩුල්ල ප්‍රා.ලේ.කො.</td><td>පළාත් පාලන ආයතනය</td><td>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (කොළඹ - මඩකලපුව මාර්ගය)</td></tr>
<tr><td>පිහිටීම සිතියම</td><td colspan="4">
</td></tr>
<tr><td>දැනට පවතින භාවිතය</td><td colspan="4">අත්හරින ලද කුඹුරු ඉඩම්</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය</td><td colspan="4">පෞද්ගලික</td></tr>
<tr><td>භූමි ප්‍රමාණය</td><td colspan="4">අක්.6</td></tr>
</table>

ව්‍යාපෘතියේ අදාළත්වය

නගරය ආශ්‍රිතවම ප්‍රමාණවත් පහසුකම් සහිතව පරිපාලන ආයතන ස්ථාපනය කිරීම තුළින් සේවා ලබාගැනීමට පැමිණෙන ජනතාවට පහසුවෙන් එකම කලාපයක් තුළින් පරිපාලන කටයුතු බොහොමයක් එකවර ඉටුකර `ගැනීමට පහසු වන පරිදි පරිපාලන සංකීර්ණ ස්ථාපනය කිරීමට හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- පරිපාලන ආයතනික සේවා ලබාගැනීම පහසු කිරීම
- පවතින භූමි භාවිතයන් විධිමත් කිරීම
- වාණිජ භාවිතයන් සඳහා යෝග්‍ය ප්‍රදේශ පරිපාලන කටයුතු වලින් බැහැර කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ජනතාවට තම පරිපාලන සේවා ලබා ගැනීම පහසු වීම
- අනවශ්‍ය රථවාහන තදබදයක් ඇති නොවීම
- ආයතන සඳහා ප්‍රමාණවත් පරිදි ඉඩකඩ සැලසීම
- රාජ්‍ය සේවකයන්ට පහසුකම් සහිත පරිසරයක සිට සේවාවන් ඉටුකිරීමේ පහසුව

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	දළ ඇස්තමේන්තුව රු.මිලියන
තැපැල් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා උසාවි සංකීර්ණය ප්‍රතිස්ථාපනය කිරීම	1500

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඒ ඒ රාජ්‍ය ආයතන විසින් සිදුකෙරේ.

කහවත්ත මූලික රෝහල රථගාල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය				
ව්‍යාපෘති යෝජනාව	කහවත්ත නගරයේ මූලික සෞඛ්‍ය සේවා පහසුකම් පුළුල් කිරීම තුළින් ජනතාවට විධිමත් සෞඛ්‍ය සේවාවක් සැපයීම			
පිහිටීම	**පළාත**	සබරගමුව	**දිස්ත්‍රික්කය**	රත්නපුර
	ප්‍රා.ලේ .කො	කහවත්ත ප්‍රා.ලේ.කො.	**පළාත් පාලන ආයතනය**	කහවත්ත ප්‍රාදේශීය සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (පැල්මඩුල්ල - නෝනගම මාර්ගය)			
පිහිටීම සිතියම				
දැනට පවතින භාවිතය	කහවත්ත මූලික රෝහල			
ඉඩමේ අයිතිය	රජය			
භූමි ප්‍රමාණය	1. පර්චස් 80 2. පර්චස් 40			

ව්‍යාපෘතියේ අදාළත්වය

කහවත්ත නගරය හා ඒ අවට කුඩා නගර බොහොමයක මූලික සෞඛ්‍ය අවශ්‍යතාවයන් සපුරාලනු ලබන්නේ කහවත්ත මූලික රෝහලින් වන අතර මෙම රෝහල පරිශීලනය කරනු ලබන ජනතාවට රථවාහන නැවත්වීමට ප්‍රමාණවත් ඉඩකඩක් ලබාදෙමින් සෞඛ්‍ය සේවා පහසුකම් ප්‍රවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

06 වන පරිච්ඡේදය

සැලැස්ම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ජනතාවට තම මූලික සෞඛ්‍ය සේවා ලබා ගැනීම පහසු වීම
- අනවශ්‍ය රථවාහන තදබදයක් ඇති නොවීම
- ප්‍රමාණවත් රථවාහන නැවතුම් පහසුකම් ලැබීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	දළ ඇස්තමේන්තුව රු.මිලියන
රථගාල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - කහවත්ත මූලික රෝහල	75

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම කහවත්ත මූලික රෝහල විසින් සිදුකෙරේ.

කහවත්ත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය				
ව්‍යාපෘති යෝජනාව	කහවත්ත නගරයේ වාණිජ සේවාවන් ප්‍රවර්ධනය කිරීම			
පිහිටීම	පළාත	සබරගමුව	දිස්ත්‍රික්කය	රත්නපුර
	ප්‍රා .ලේ.කො.	කහවත්ත ප්‍රා.ලේ.කො.	පළාත් පාලන ආයතනය	කහවත්ත ප්‍රාදේශීය සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (පැල්මඩුල්ල - නෝනගම මාර්ගය)-A18			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	1.අධ්‍යාපන කලාප කාර්යාලය 2.ගරාවැටුණු ගොඩනැගිල්ල			
ඉඩමේ අයිතිය	රජය			
භූමි ප්‍රමාණය	පර්චස් 80			

ව්‍යාපෘතියේ අදාළත්වය

කහවත්ත නගර මධ්‍යයේ කහවත්ත මුලික රෝහලට යාබදව පිහිටා ඇති මෙම භූමිය, සෞඛ්‍ය ක්ෂේත්‍රය හා ආශ්‍රිත වාණිජ භාවිතයන් සඳහා යොදාගැනීමට හදුනාගෙන ඇත. නගරයට පැමිණෙන ජනතාවගේ සේවා අවශ්‍යතා හා පහසුකම් සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හදුනාගෙන ඇත.

ඒ අනුව එකී අවශ්‍යතාවය ඉටුකරන අතරතුර භූමියේ වටිනාකම උපරිමයෙන් භාවිතයට ගැනීමට හැකිවන පරිදි සුදුසු වාණිජ කටයුතු සඳහා භාවිතා කරමින් නගරයේ පහසුකම් වැඩිදියුණු කිරීමට හදුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

නගරවාසීන්ට තම වාණිජ සේවා අවශ්‍යතා විධිමත්ව සපුරා ගැනීමට අවශ්‍ය පහසුකම් සපුරාලීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ප්‍රදේශයේ වාණිජ සේවාවන් පුළුල් වීම
- නගර මධ්‍යයේ භාවිතයකින් තොරව පවතින ඉඩම් ප්‍රශස්ථ භාවිතයන් සඳහා යොදා ගැනීමට අවස්තාව ලැබීම
- ජනතාවට අවශ්‍ය සේවා පහසුකම් ලබාගැනීමේ පහසුව උදාවීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	දළ ඇස්තමේන්තුව රු.මිලියන
මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය	450

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම කහවත්ත ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

දෙවන කොටස

භෞතික සංවර්ධන උපාය මාර්ග සහ නියමතා

හත්වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

7.1. හැඳින්වීම

හැඳින්වීම

සංවර්ධන සැලැස්ම තුළ හඳුනාගත් ඉලක්කගත දැක්මේ, අරමුණු වෙත ලගාවීම සඳහා අවකාශීය සංවර්ධන උපායමාර්ගය යටතේ කලාපීකරණය සිදුකර ඇත. මෙම සැලසුම් ප්‍රදේශය සඳහා සිදුකරන ලද සංවර්ධන ප්‍රවණතා අධ්‍යනය, සංවේදී ප්‍රදේශ විශ්ලේෂණය, යෝග්‍යතා අධ්‍යනය, මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය යන ප්‍රධාන විශ්ලේෂණයන් මෙහිදී සැලකිල්ලට ගෙන ඇත. එමෙන්ම අපේක්ෂිත ජනගහනය හා යෝජිත සංවර්ධන ව්‍යාපෘති වල බලපෑමද සැලකිල්ලට ගනිමින් ඝණත්වය හා ක්‍රියාකාරකම් රටාවන් මත පදනම්ව කලාප බෙදා වෙන්කර ඇත.

කලාපීකරණය තුළින් ඒ ඒ කලාපය ආශ්‍රිතව පවතින විභවතාවයන් ප්‍රවර්ධනය වන පරිදි සංවර්ධන කලාප සඳහා අදාළ භාවිතයන් හඳුන්වා දී ඇත. එමෙන්ම සංවර්ධන කලාප ආශ්‍රිත භාවිතයන් ප්‍රවර්ධනය හා කලාපීය ලක්ෂණ හා කලාපීය අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සියලු කලාප හා ඒ ඒ කලාප සඳහා පොදු නියමතා හඳුන්වාදී ඇත. ඒ අනුව කලාපීකරණය තුළින් අපේක්ෂිත නාගරික ආකෘතිය නිර්මාණය කර ජනතාවට ජීවත්වීමට උචිත වටපිටාවක් නිර්මාණය කරන අතරම පාරිසරික සම්පත් සුරක්ෂිත වූ තිරසාර නගරයක් නිර්මාණය කිරීම මෙහිදී අරමුණු කර ඇත.

7.2 කලාපීකරණ සැලැස්ම (2023 – 2033)

සිතියම් අංක 7.1: පැල්මඩුල්ල - කහවත්ත නාගරික බල ප්‍රදේශයේ කලාපීකරණ සැලැස්ම 2023 – 2033



මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2022

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

7.3 සංවර්ධන කලාප සහ කලාප සංගුණකය

සංවර්ධන කලාප සහ කලාප සංගුණකය

පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම මගින් පැල්මඩුල්ල හා කහවත්ත නාගරික බල ප්‍රදේශය ප්‍රධාන සංවර්ධන කලාප 5 කට බෙදා ඇති අතර එම ප්‍රධාන සංවර්ධන කලාප අපේක්ෂිත සංවර්ධන ඝනත්වය මත පදනම්ව නැවත උප කලාප වලට බෙදා දක්වා ඇත. ඒ අනුව, එම සංවර්ධන කලාපය සඳහා අපේක්ෂිත සංවර්ධන ඝනත්වය හා සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය මත පදනම්ව කලාප සංගුණකය නිර්ණය කරන ලදී. (වගු අංක 7.1)

වගු අංක 7.1: සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන්

සංවර්ධන කලාපය	උප සංවර්ධන කලාපය	කලාප කේතය	කලාප සංගුණකය
නේවාසික කලාපය	අඩු ඝනත්ව නේවාසික කලාපය	R3	0.6
වාණිජ කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය	C1	2.0
මිශ්‍ර සංවර්ධන කලාපය	අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	MD1	1.5
	මධ්‍යම ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	MD2	1.0
සංරක්ෂණ කලාපය	සංරක්ෂණ කලාපය (වනාන්තර)	Cn	0
කෘෂිකාර්මික කලාපය	කෘෂිකාර්මික කලාපය I (කුඹුරු හා තෙත්බිම්)	A –I	0
	කෘෂිකාර්මික කලාපය II (වැවිලි බෝග)	A –II	0.5

සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

7.4 සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

i. වර්ෂ **1978** අංක **41** දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ **3** වන වගන්තිය යටතේ අංක **1535/14** හා **2008 .02.08** දිනැති සහ අංක **1809/13** හා **2013.05.09** දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයන් මගින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත්කර ඇති පැල්මඩුල්ල, කහවත්ත හා ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගේ කොටස් ඇතුළත්

පරිපාලන සීමාවන් තුළ පිහිටි සියලුම ප්‍රදේශයන් සඳහා මෙම නියමතා බල පැවැත්වේ.

ii. පැල්මඩුල්ල, කහවත්ත හා ගොඩකවෙල ප්‍රාදේශීය සභා ප්‍රදේශයන්ගේ කොටස් ඇතුළත් පැල්මඩුල්ල - කහවත්ත සැලසුම් ප්‍රදේශය තුළ කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී කලාපීකරණ සැලැස්මේ නියමතාවන්ට අමතරව 2021 ජූලි මස 08 දිනැති හා අංක 2235/54 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇති සැලසුම් හා සංවර්ධන රෙගුලාසි ද බලාත්මක වේ.

iii. **1986.03.10** දිනට පෙර නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ සඳහා **1986.03.10** දිනට පෙර අනුබෙදුම් කර ඇති අවම බිම් ප්‍රමාණය ව.මී. **150**ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකන අතර **1986.03.10** දිනට පසු නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ සඳහා නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති දිනට පෙර අනුබෙදුම් කර ඇති අවම බිම් ප්‍රමාණය ව.මී. **150** ට අඩු බිම් කොටස්, පවත්නා බිම් කට්ටියක් ලෙස සලකනු ලබයි.

iv. සංවර්ධන නියාමන ප්‍රදේශ සඳහා සංවර්ධන නියාමන සැලසුම් මගින් **(Development Guide Plan)** හඳුන්වා දෙනු ලබන රෙගුලාසි අදාළ වන අතර එම රෙගුලාසි හඳුන්වාදෙන තෙක් මෙම සැලැස්මේ සඳහන් කලාපීකරන රෙගුලාසි එම ප්‍රදේශ සඳහාද බල පැවැත්වේ. එමෙන්ම ඉහත සංවර්ධන නියාමන ප්‍රදේශයන්හි සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබාගත යුතු අතරම, අධිකාරිය විසින් සකස් කර ඇති කෙටුම්පත් සංවර්ධන නියාමන සැලැස්ම ප්‍රකාරව සංවර්ධනයන් තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

v. යම් ඉඩමක අයිතිකරුවකු විසින්, වීථි රේඛාවට/යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස මාර්ගය සඳහා වන්දියකින් තොරව ප්‍රදානය කරන්නේ නම්, යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා වන අවසරලත් ගෙබිම් අනුපාතය සඳහා සම්පූර්ණ ඉඩමේ ප්‍රමාණය සලකා බලනු ලබයි. නමුත් බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී වීථි රේඛාවට/ යෝජිත මාර්ග පළලට අයත් වන කොටස හැර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය සැලකිය යුතු වේ.

vi. එකිනෙකට ස්වායක්තව ප්‍රධාන මාර්ගයන් හා සම්බන්ධ වන, අවම පළල මීටර් 6ට හෝ ඊට වැඩි සහ නිත්‍යානුකූල ප්‍රවේශ අයිතිය හිමි මාර්ග එකකට වඩා වැඩි ප්‍රමාණයක් සංවර්ධන පරිශයට මුහුණලා ඇති අවස්ථාවන්හිදී, ප්‍රවේශ මාර්ගයේ පළල ලෙස එකී සියලු මාර්ගවල පළල එකතුව සලකා අවසරලත් සංවර්ධනය ගණනය කිරීම අවස්ථානුකූලව සලකා බැලිය හැකිය.

vii. කිසියම් ඉඩමක් කලාප දෙකකට හෝ වැඩි ගණනකට වැටන සේ පෙන්වා දී ඇති අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රදේශයට හසුවන කලාපය තීරණය කරනු ලබන්නේ, එම බිම් කොටසට ප්‍රවේශය ලබන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය මගිනි.
එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් කලාපය අදාළ කරගත යුතුය.
*සංරක්ෂණ කලාප සඳහා මෙම නියමතාවය අදාළ නොවේ.

viii. කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් අතරට හසු වන සේ පිහිටා ඇති විටකදී, එම බිම් කොටසට ප්‍රධාන ප්‍රවේශය ලබන කලාපයේ භාවිතයන් සඳහා යොදාගැනීම අදාළ පළාත් පාලන ආයතනවල එකගතාවය මත අධිකාරිය විසින් තීරණය කරනු ලැබේ.

එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් පළාත් පාලන බල ප්‍රදේශය අදාළ කරගත යුතුය.

ix. යම් ප්‍රවේශ මාර්ගයක පළමු බිම් කොටස හරහා කලාප මායිම් වැටී ඇති විටක, එකී බිම් කොටසේ ප්‍රවේශ මාර්ගයට සමාන්තරව ඈතින්ම පිහිටි අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතු වේ.
යම්හෙයකින්, පිටුපස බිම් කොටස් පළමු බිම් කොටසට ඒකාබද්ධ කර තනි ඉඩමක් ලෙස අනුමත කර ඇතිවිටක, එකී තනි ඉඩමේ අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතුය.

x. කලාපීකරණ සැලැස්මේ පෙන්වා දී ඇති මායිම්, භෞතික මායිම් හා භූගෝලීය ඛණ්ඩාංක යන දෙකෙන්ම නිර්වචනය කර ඇති අවස්ථාවකදී මායිම් වෙනසක් සිදු වුවහොත් ඒ පිලිබඳ අවසාන තීරණය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතු වේ.

xi. කලාපීකරණ සැලැස්මේ අවසරලත් භාවිත කාණ්ඩයේ සඳහන් නොවන නමුත් එකී කලාපයේ අවසරලත් භාවිතයන් හා සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබාදීම පිලිබඳ තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

xii. යෝජිත කලාපීකරන සැලැස්ම තුල අනුමත භාවිතයන් නොවන නමුත් දැනට පවත්වාගෙන යන භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සඳහා පමණක් අවසර ලබාදීම සලකා බලනු ලැබේ. නමුත් පවත්නා භාවිතයන් තවදුරටත් පුළුල් කිරීම සඳහා අනුමැතිය ලබා දීම පිලිබදව සලකා නොබලන අතර භාවිතය දිගින් දිගටම පවත්වාගෙන යාම අහිතකර යැයි හැඟී යන්නේ නම් එකී භාවිතය නතර කරන ලෙස නියම කරනු ලැබිය හැක.

xiii. ගොඩනැගිලි සීමාව තුල මායිම් තාප්ප ඉදිකිරිම සඳහා මාර්ගය අයත් ආයතනය සමග නිර්වන්දි ගිවිසුමක් අත්සන් කිරීමට යටත්ව අනුමැතිය සඳහා සලකා බැලිය හැක.

xiv. ප්‍රදේශයේ මංසන්ධි, මාර්ග දෙපස ගොඩනැගිලි සීමා, මාර්ග පළල් කිරීමේ සීමා හා රක්ෂිත තුල විවිධ ආගමික ප්‍රතිමා, ආගමික සංකේත, සලකුණු හෝ ඒ සමාන ඉදිකිරීම් සඳහා අවසර නොදෙන අතර, එවැනි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒ සඳහා වන්දි ගෙවීමක් ද සිදු නොකරනු ලබයි.

xv. සුසාන භූමියක්/ආදාහනාගාරයක් සඳහා යම්කිසි ඉඩමක් වෙන් කරනු ලබන්නේ නම් ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනයේ හා නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශ ලබාගත යුතුය.

xvi. සංවර්ධන සැලැස්ම තුල හඳුනාගෙන නොමැති නමුත් පහත් බිම්, වගුරු බිම්, කුඹුරු, පුරන් කුඹුර, දෙණිය හෝ ඊට ආනුසාංගික ඉඩම් සඳහා අවසර දීමේදී නාගරික සංවර්ධන අධිකාරියෙහි නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

xvii. යම් සංවර්ධනයක් සඳහා කුළුණු දොඹකර භාවිතා කරනු ලබන්නේ නම් ඒ සඳහා සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකුගේ නිර්දේශ සහ රක්ෂණාවරණයක් සහිතව අවසර පත්‍රයක් අදාළ සංවර්ධනය සඳහා අනුමැතිය ලබාදීමේදී ඉදිරිපත් කළ යුතුය.

xviii. පාසල් හා ළමා නිවාස සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී විවෘත ඉඩකඩ වශයෙන් භූමියෙන් 50%ක ප්‍රමාණයක් විවෘතව තැබීය යුතු වේ.

xix. රථවාහන නැවතුම් ඉඩකඩ සංවර්ධන භූමිය තුළින්ම සැපයීමට අපොහොසත් වන්නේනම්, උපරිමය මීටර 500ක දුරකින් පවතින භූමියක් ඒ සඳහා යොදා ගැනීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදුකළ හැකිය.

xx. අධිකාරිය විසින් හඳුනා ගනු ලබන ප්‍රදේශවල අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ගෘහ නිර්මාණ/ සැලසුම්කරණ නියමතා පැනවිය හැකිය.

xxi. මෙම සැලසුම් ප්‍රදේශය තුල පවතින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනාදී රාජ්‍ය ආයතන දෙපාර්තමේන්තු හෝ සංස්ථාවන්ට අයත් ඉඩම් හෝ රක්ෂිත කලාපයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් එකී අදාළ ආයතනයන්ගේ නිර්දේශයන් හා සංවර්ධන යෝජනා ලබා ගත යුතු වේ.

xxii. සියලු කැණීම් කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු අදාළ ආයතනයන්හි නිර්දේශයන්ට අනුව සිදු කල යුතු අතර, එම කටයුත්ත නිම වීමෙන් පසුව එකී ආයතනයේ නිර්දේශයට අනුකුලව කැණීම් කරන ලද ස්ථාන යථා තත්වයට පත් කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ.

xxiii. යම්කිසි නීතිගත සැලසුම්, සංවර්ධන හෝ ගොඩනැගිලි රෙගුලාසියක් සම්බන්ධයෙන් හෝ එහි අර්ථකථනය සම්බන්ධයෙන් හෝ ප්‍රයෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගෙන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතුවේ.

xxiv. සංවර්ධන අනුමැතිය ලබා දීමේදී යම් හේතුවක් නිසා භූමිය සම්බන්ධ රෙගුලාසියක් ලිහිල් කරන්නේ නම් හෝ ඉවත් කරන්නේ නම් මුළු ඉඩමෙන් එම රෙගුලාසියට යටත්වන ප්‍රමාණය ගණනය කර, එහි තක්සේරු වටිනාකමින් 30% කට නොවැඩි මුදලක් අවස්ථානුකූලව අධිකාරිය වෙත අය කර ගත යුතු වේ.

xxv. මෙම නාගරික බල ප්‍රදේශය තුළ සෑම ඉදිකිරීමක් සඳහාම භූමි යෝග්‍යතාව හා ඉදිකිරීම සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (**NBRO**) නිර්දේශය ලබා ගත යුතු අතර, මීටර් 1.5 ට වැඩි උස ඉවුරු කැපීම් වලදී හා ආනතියක් සහිත භූමියක ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේදී පහත රෙගුලාසි බලපැවැත්වේ.

- මීටර් 1.5 ට වැඩි උස ඉවුරු කැපීමකදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ අනුව කටයුතු කිරීම අනිවාර්යය වේ. එසේ වුවද කැපුම් කරනු ලබන ඉවුරේ උස මීටර් 1.5 ට වඩා අඩුවන හා එම කැපුම් තලයට රැදවුම් බැම් ඉදි නොකරනු ලබන අවස්ථා වල යාබද මායිමේ සිට කැපුම් තලයේ ආරම්භක ස්ථානයට අවම වශයෙන් මීටර් 1 ක දුරක් වෙන්කර තැබීමට කටයුතු කල යුතුය.
- ආනතියක් සහිත භූමියක බිම් කට්ටියක අවම විශාලත්වය සැලකීමේදී කලාපීකරණ රෙගුලාසි වල නියම කර ඇති බිම් කට්ටියක අවම විශාලත්වය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නියම කරනු ලබන බිම් කට්ටියක අවම විශාලත්වය යන දෙකෙන් වඩා වැඩි අගය බලපැවැත්වේ.
- ආනතියක් සහිත භූමියක භූමි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී අංක **2235/54**-2021 ජුලි මස 03 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් සැලසුම් හා සංවර්ධන නියෝගයන්හි හා කලාපීකරන රෙගුලාසි මගින් නියම කර ඇති භූමි ආවරණ ප්‍රතිශතයකන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නියම කරනු ලබන භූමි ආවරණ ප්‍රතිශතයකන් යන අගයන්ගෙන් වඩා අඩු අගය බල පැවැත්වේ.

xxvi. ප්‍රාදේශීය සභා සීමාව තුළ පවත්නා අඩි පාරවල් , පඩිපෙළ හා සියලුම මාර්ග වලට අදාළවන ගොඩනැගිලි සීමා හා යෝජිත අවම මාර්ග පළල ද ගංගා සහ ඇළ මාර්ගවලට අදාළ රක්ෂිත හෝ ගොඩනැගිලි සීමා ප්‍රදේශයන් ද 09 වන පරිච්ඡේදයට අනුකූල විය යුතුය. එමෙන්ම, ගංගා සහ ඇළ මාර්ගවලට අදාළ

රක්ෂිත හෝ ගොඩනැගිලි සීමා සුදුසු ශාක වගාවන් සහිතව පවත්වා ගත යුතුය.

xxvii. බෑවුම් ආනතියක් සහිත භූමි භාගයක සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේ දී සංවර්ධන ස්ථානයේ භූ විෂමතාව සලකා බලා මීටර් 1.5 කපළලකින් යුතු පියගැටපෙලකින් ප්‍රවේශකත්වය ලබා ගැනීම සලකා බලනු ලැබේ.

xxviii. කිසියම් පුද්ගලයෙකු විසින් මැණික් හා අනෙකුත් සියලු ඛණිජ ද්‍රව්‍ය සඳහා කරනු ලබන කැණීම් කටයුතු වෙනුවෙන් වන රක්ෂිත අවශ්‍යතා අවසර ලබාදෙනු ලබන කලාපවලදී පරිච්ඡේදය 09 හි සඳහන්වන රක්ෂිත අවශ්‍යතාවන්ට අනුකූල විය යුතුය.

xxix. වාණිජ කලාපය තුළ සිදු කෙරෙන මැණික් පතල් කැණීම් කටයුතු හා සියලුම කලාප වල සිදුකෙරෙන අනෙකුත් ඛණිජ කැණීම් කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතු වේ.

xxx. යෝජිත කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන, සනීපාරක්ෂක කසළ මධ්‍යස්ථාන හෝ වෙනත් ඒ ආශ්‍රිත කාර්යයක් සඳහා යොදාගනු ලබන භූමියක මායිමේ සිට මීටර් 100ක් දක්වා ප්‍රදේශය හරිත වැටියක් ලෙස පවත්වාගත යුතු අතර එම හරිත වැටිය තුළ කිසිදු නේවාසික භාවිතයක් සඳහා අවසර ලබා නොදිය යුතුය.

xxxi. කිසියම් සංවර්ධන කටයුත්තකට අදාළව අනුමැතිය ලබාදීමේදී කලාපීකරන රෙගුලාසි තුල අවම බිම් ප්‍රමාණය සඳහන් කර නොමැති අවස්ථාවලදී බිම් කොටසක අවම විශාලත්වය පර්චස් 6 ක් විය යුතු වේ. එසේ වුවද , පොදු ජල සැපයුමක් නොමැති ප්‍රදේශවල, අනුමැතිය සලකා බැලීම සඳහා අවම බිම් ප්‍රමාණය පර්චස් 10 ක් තිබිය යුතුය.

xxxii. ජලාභිමුඛව සිදු කෙරෙන සියලු නේවාසික නොවන ඉදිකිරීම් කටයුතු සඳහා අවසර ලබාගැනීමේදී අපජල කළමනාකරණ සැලැස්මක් ඉදිරිපත් කළ යුතු අතර වේ ගඟ හා දෙනවක ගඟ ආශ්‍රිතව සිදු කරන සංවර්ධන කටයුතු වලදී ගඟ ඉවුරේ සිට රක්ෂිත හෝ ගොඩනැගිලි සීමාව වශයෙන් පවත්වාගතයුතු භූමිය සඳහා වන භූ දර්ශන සැලැස්මක් අදාළ ගොඩනැගිලි සැලසුම් සමඟ ඉදිරිපත් කළ යුතුය.

xxxiii. ගංගාවක් හෝ ප්‍රධාන ඇළ මාර්ගයක් නොවන අවස්ථාවකදී අදාළ ආයතනයන්ගේ නිර්දේශයන්ට යටත්ව ඉවුරු බැම් ඉදිකිරිම සඳහා අවසර ලබාදෙනු ලබන අතර එකී බැම් මත මායිම් තාප්ප හෝ වෙනත් එවැනි නිර්මිත ඉදිකරන්නේ නම් ඉවුරු බැම්මේ කෙළවර සිට මීටර් 0.75 ක සීමාවක් පිටුපසට ගෙන ඉදිකිරීම් කළ යුතුය

xxxiv. කලාපිකරණය තුළින් අවසර ලබාදිය හැකි භාවිතයන් වුවද නේවාසික කලාපයන්හි සිදුකරනු ලබන නේවාසික නොවන සංවර්ධනයක් හේතුවෙන් ශබ්ද දූෂණය/ වායු දූෂණය/ භූගත හෝ මතුපිට ජලය දූෂණයට තුඩු දෙන්නා වූ සංවර්ධන කටයුතු වලදී මෙන්ම සමාජීය තත්ත්වයන්ට නොගැලපේ යැයි සමාජය තුලින්ම විරෝධතාවයක් මතුවේයැයි හැඟී යනු ලබන සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සලකා බලනු ලබන අතර එවැනි සංවර්ධන කටයුතු නියාමනය සඳහා කොන්දේසි පැනවීමේ බලය හා අවසර නොදීමේ බලය අධිකාරිය සතුවේ.

xxxv. නාගරික බල ප්‍රදේශය තුළ හදුනාගෙන ඇති ආකර්ෂණීය ස්ථානනයන් නැරඹීම සඳහා නම්කර ඇති (සිතියම් අංක 6.8) දර්ශනීය ස්ථාන දර්ශනපථය අවහිරවන ආකාරයේ කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර ලබානොදෙන අතර දර්ශනපථයට බාධාවක් නොවන ඉදිකිරීම් සඳහා මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව අවසර ලබාදීම සලකා බලනු ලැබේ.

ඉහත කරුණු වලට අමතරව ගැසට් පත්‍ර අංක **2235/54** යටතේ **2021.07.08** දින ප්‍රකාශයට පත්කරන ලද සැලසුම් හා ගොඩනැගිලි නියෝගයන්හි රෙගුලාසි අංක **55 (3)**, **73** රෙගුලාසිය සහ 10 වන උපලේඛනය සංවර්ධන සැලැස්මේ බල ප්‍රදේශයට අදාළ කර ගැනීමේදී පහත පරිදි අදාළ කරගත යුතුයි.

xxxvi. **10** වන උපලේඛනයේ අංක **2** යටතේ වන පළමු, දෙවන භාවිතයන් සඳහා සම්මත වාහන අවශ්‍යතාවය වර්ග මීටර් **100** ක් සඳහා එක් ඉඩකඩක් බැගින් විය යුතුය.

xxxvii. 10 වන උපලේඛනයේ අංක 2 යටතේ 8 වන වාණිජ භාවිතය (සැලූන් /රූපලවන්‍යාගාර/පාරිභෝගික සේවා ස්ථාන/ බාබර් සාප්පු) සඳහා සම්මත වාහන අවශ්‍යතාව වර්ග මීටර් 50 ට එක් ඉඩකඩක් බැගින් විය යුතුය.

07 වන පරිච්ඡේදය

සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

xxxviii. වාහන නතර කිරීමේ පහසුකම් යටතේ වන අංක 73 හි අනු අංක 8 හි (ආ) සහ (ඇ) හි සඳහන් ප්‍රවේශ මාර්ගයන්හි ඇලකරණය තැබීමේදී අදාළ දුර ප්‍රමාණයන් යෝජිත මාර්ග පළල හෝ මාර්ග පුළුල් කිරීමේ යෝජනාවෙහි ඇතුළත් මාර්ග පළලෙහි කෙළවර සිට තැබිම සලකා බලනු ලැබේ.

xxxix. වාහන නතර කිරීමේ පහසුකම් යටතේ වන අංක 73 හි අනු අංක 16 (අ) යටතේ වන රථවාහන ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීම, ජාතික මාර්ග පද්ධතියෙන් ප්‍රවේශය ගනු ලබන හෝ එම මාර්ගයන්හි රථවාහන ගමනාගමනයට බලපෑමක් සිදුවිය හැකි යැයි නිරීක්ෂණය වන අවස්ථාවකදී 16 (අ) යටතේ වන සංවර්ධනයන් සඳහා සිදු කල යුතුය.

xl. 10 වන උපලේඛනයේ පරිදි කිසියම් සංවර්ධන කටයුත්තක් සඳහා සැපයිය යුතු වාහන නැවතුම් අවශ්‍යතාවය ගණනය කිරීමේදී ගොඩනැගිල්ලේ ගෙබිම් ප්‍රමාණය හෝ වාහන අවශ්‍යතා ගණනය කිරීමේදී ඉතිරිවන ගෙබිම් ප්‍රමාණය එක් වාහන අවශ්‍යතාවක් සඳහා වන ගෙබිම් ප්‍රමාණයෙන් 50% ක් හෝ ඊට අඩු වන අවස්ථාවක එම රථගාල් අවශ්‍යතාව සඳහා යෝජිත මාර්ග පළල හෝ මාර්ග පුළුල් කිරීමේ යෝජනාව ඇතුලත් මාර්ග රේඛාව සහ ගොඩනැගිලි සීමාව අතර පවත්නා ඉඩකඩද ඇතුලත්ව එක් වාහන ඉඩකඩක් සැලසුම් කිරීම සලකා බලනු ලැබේ.

xli. විවෘත ඉඩකඩ සහ ගොඩනැගිලි දුරස්ථ කිරීම යටතේ වන රෙගුලාසි අංක 55 හි අනු අංක 03 හි සඳහන් ගොඩනැගිලි දුරස්ථ කිරීම් පහත සඳහන් අවස්ථාවල හැර යම් ගොඩනැගිලි සීමාවක් හෝ වීථි රේඛාවක් හෝ වෙන යම් මාර්ග රක්ෂිතයක් නියම කර නොමැති අවස්ථාවක, මීටර් 1 ක ගොඩනැගිලි දුරස්ථ කිරීමක් එම මාර්ගයට / මාර්ග මායිමේ සිට තැබිය යුතුය. යම් මාර්ගයක් මීටර් 50 කට අඩු දුරකින් අවසන් වන ආවෘත මාර්ගයක් නම් හෝ එක් බිම් කට්ටියකට පමණක් ප්‍රවේශය ලබා ගනු ලබන අවස්ථාවක සහ අදාල ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ප්‍රවේශ මාර්ගයට අවහිරයක් නොවන ලෙස සහ වැසි ජලය සෘජුව මාර්ගයට නොවැටෙන ලෙස සැලසුම් කරන ගොඩනැගිලි වලදී.

අටවන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

8.1. කලාපීකරණ නියමතා

කලාපීකරණ නියමතා

පැල්මඩුල්ල - කහවත්ත සංවර්ධන සැලැස්ම මගින් එකී නාගරික බල ප්‍රදේශ සඳහා හඳුන්වාදෙන ලද ප්‍රධාන සංවර්ධන කලාප 5 සඳහා බලපැවැත්වෙන කලාපීකරණ නියමතා පහත පරිදි වේ.

වගු අංකය 8.1 : නේවාසික කලාපය

i. ප්‍රධාන කලාපය	නේවාසික කලාපය
ii. කලාප ලක්ෂණ	ඒ 04 සහ ඒ 18 ප්‍රධාන මාර්ගයන්ගෙන් ඈතට වන්නට පිහිටා ඇති නේවාසික ප්‍රදේශ නේවාසික කලාපයට ඇතුළත් කර ඇත. මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ එම කලාපයේ ඉඩම් පරිහරණ ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කලාපය තුළ ජීවත්වීමේ හැකියාව ශක්තිමත් කිරීමයි.
iii. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා **Google Earth** හි **Decimal Degree X** (නැගෙනහිර දේශාංශ) සහ **Y**(උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (**GPS-WGS-**1984)ඇමුණුම් අංක 05 හි සඳහන් කර ඇත.
iv. උප කලාපය	අඩු ඝනත්ව නේවාසික කලාපය
v. කලාප අංකය	**R3**
vi. කලාප සංගුණකය	0.6
vii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	**8.2 හි උපලේඛණය I** සහ **II** හි සඳහන් "අ" සහ "ආ" ආකෘති අනුව වියයුතුය
viii. අවසරලත් උපරිම බිම් කවරේජ් ආවරණය	**8.2 හි උපලේඛණය II** සහ **III** හි සඳහන් "ආ" සහ "ඉ" ආකෘති අනුව වියයුතුය
ix. විවෘත අවකාශයන් සහ උපරිම උස	**8.2 හි උපලේඛණය III** හි සඳහන් "ඉ" ආකෘතිය අනුව වියයුතුය

x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	ව.මීටර් 250 (පර්චස් 10)
xi. අවසරලත් භාවිතාවන්	8.2හි උපලේඛණය IV හි සඳහන් "ඊ" ආකෘතිය අනුව වියයුතුය
xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	i.කිසියම් ඉඩමක් කෘෂිකාර්මික කලාපය II හෝ සංරක්ෂණ කලාපයට මායිම්ව පිහිටා ඇතිවිට සත්ත්ව ගොවිපොළවල් පවත්වාගෙන යාම සඳහා පහත කොන්ද්සියට හා නා. සං. අධිකාරියේ මූ. සැ. නිරාකරණයක් ලබාගැනීමට යටත්ව සලකා බලනු ලැබේ. • ඉහත සදහන් කලාප මායිම් හැර අනෙකුත් මායිම් සඳහා මීටර් 10ක හරිත වගා බිම් තීරුවක් පවත්වාගෙන යා යුතුය.

වගු අංකය **8.2:** වාණිජ කලාපය

i. ප්‍රධාන කලාපය	වාණිජ කලාපය
ii. කලාප ලක්ෂණ	පැල්මඩුල්ල හා කහවත්ත නගරයන්හි පවතින වාණිජ හා අනෙකුත් මූලික සේවාවන් ආශ්‍රිත කටයුතු ඒ ඒ නගර මධ්‍ය ප්‍රදේශය තුළ සංකේන්ද්‍රණය වී ඇත. කලාප සැලැස්ම තුළ මෙම කේන්ද්‍රස්ථාන දෙක වාණිජ කලාපයට ඇතුළත් කර ඇත. • මෙම වාණිජ කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ, නගරයට පැමිණෙන හා නගරය හරහා ගමන් ගන්නා ජනතාවට අවශ්‍ය වාණිජ හා අනෙකුත් සේවා පහසුකම් සපුරාලීමයි.
iii. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා **Google Earth** හි **Decimal Degree X** (නැගෙනහිර දේශාංශ) සහ **Y**(උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ**,** දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (**GPS-WGS-**1984)ඇමුණුම් අංක 05 හි සඳහන් කර ඇත.

08 වන පරිච්ඡේදය

කලාපීකරණ නියමතා

iv. උප කලාපය	අධි ඝනත්ව වාණිජ කලාපය
v. කලාප අංකය	**C1**
vi. කලාප සංගුණකය	2.00
vii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	**8.2 හි උපලේඛණය I** සහ **II** හි සදහන් **"අ"** සහ **"ආ"** ආකෘති අනුව වියයුතුය
viii. අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය	**8.2 හි උපලේඛණය II** සහ **III** හි සදහන් **"ආ"** සහ **"ඉ"** ආකෘති අනුව වියයුතුය
ix. විවෘත අවකාශයන් සහ උපරිම උස	**8.2හි උපලේඛණය III** හි සදහන් **"ඉ"** ආකෘතිය අනුව වියයුතුය
x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	ව.මීටර් **150 (පර්චස් 6)**
xi. අවසරලත් භාවිතාවන්	8.2 හි උපලේඛණය IV හි සදහන් "ඊ" ආකෘතිය අනුව වියයුතුය
xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	**i.** මෙම කලාපය තුළ මැණික් පතල් කැණීම් කටයුත්තක් හැර වෙනත් කිසිදු කැණීම් කටයුත්තක් සදහා අවසර ලබා නොදෙන අතර මැණික් පතල් කැණීම් කටයුතු සදහා නා.සං.අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව අවසර ලබාදෙනු ලැබේ

වගු අංකය 8.3: මිශ්‍ර සංවර්ධන කලාපය

i. ප්‍රධාන කලාපයේ නම	මිශ්‍ර සංවර්ධන කලාපය	
ii. කලාප ලක්ෂණ	අධි සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	මධ්‍යම සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය
	පැල්මඩුල්ල හා කහවත්ත නගර මධ්‍ය ප්‍රදේශය ඇතුළත් වාණිජ කලාපයට යාබදව හා **A 4** මාර්ගය හා **A 18** ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශය මෙන්ම යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සමග නැගී එන කලාපයක් ලෙස පනාවැන්න ප්‍රදේශය ද අධි සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය යටතට ඇතුළත් කර ඇත. මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ වැඩි ඝණත්වයකින් යුතුව වෙනත් භාවිතයන් සමඟ වාණිජ සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම හා වාණිජ කලාපයේ පවතින පීඩනය මෙම කලාපය දෙසට මුදාහැරීමයි.	අධි සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය ට යාබදව හා **A 4** මාර්ගය හා **A 18** ප්‍රධාන මාර්ගයන් ආශ්‍රිත ප්‍රදේශය මිශ්‍ර සංවර්ධන කලාප **II** යටතට ඇතුළත් කර ඇත. මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ මෙම නගරයන්හි පර්යන්ත ප්‍රදේශ වල ජීවත්වන නේවාසික ජනතාවගේ හා නගරය හරහා ගමන් ගන්නා ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අඩු සනත්වයකින් යුතුව වෙනත් භාවිතයන් සමඟ වාණිජ සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සපුරාලීමයි.

iii. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා **Google Earth** හි **Decimal Degree X** (නැගෙනහිර දේශාංශ) සහ **Y**(උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (**GPS-WGS**-1984)ඇමුණුම් අංක 05 හි සඳහන් කර ඇත.	
iv. උප කලාපයේ නම	අධි ඝණත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	මධ්‍ය ඝණත්ව මිශ්‍ර සංවර්ධන කලාපය
v. කලාප අංකය	**MD1**	**MD2**
vi. කලාප සංගුණකය	**1.5**	**1.0**
vii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	**8.2** හි උපලේඛණය **I** සහ **II** හි සදහන් "අ" සහ "ආ" ආකෘති අනුව වියයුතුය	
viii. අවසරලත් උපරිම බිම් කවරේජ ආවරණය	**8.2** හි උපලේඛණය **II** සහ **III** හි සදහන් "ආ" සහ "ඉ" ආකෘති අනුව වියයුතුය	
ix. විවෘත අවකාශයන් සහ උපරිම උස	**8.2** හි උපලේඛණය **III** හි සදහන් "ඉ" ආකෘතිය අනුව වියයුතුය	
x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	MD1	MD2
	වර්ග මීටර් **150** (පර්චස් **6**)	වර්ග මීටර් **250** (පර්චස් **10**)
xi. අවසරලත් භාවිතාවන්	8.2 හි උපලේඛණය IV හි සදහන් "ඊ" ආකෘති අනුව වියයුතුය	

	MD1	MD2
xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	-	i. මෙම කලාපය තුළ පිහිටි, **A** ශ්‍රේණියේ මාර්ග තුළින් ඍජු ප්‍රවේශකත්වය ලබාගන්නා සියලු සංවර්ධන කටයුතු සඳහා රථවාහන නැවතුම් පහසුකම් අදාළ භූමිය තුළින්ම සැපයිය යුතු .වේ **ii.** මෙම කලාපය තුළ අවසර ලබාදෙනු ලබන ඉන්ධන පිරවුම්හල්, ආංශික වෙළඳසැල් , ප්‍රදර්ශනාගාර, වාහන සේවා ස්ථාන, ගබඩා සංකීර්ණ හා මහල් 3 ට වැඩි වාණිජ ගොඩනැගිලි ආශ්‍රිත සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී අදාළ ඉඩමේ මුහුණත පළල මීටර් 12කට නොඅඩු විය යුතුය.

වගු අංකය 8.4: සංරක්ෂණ කලාපය

i. ප්‍රධාන කලාපය	සංරක්ෂණ කලාපය
ii. කලාප ලක්ෂණ	කිරිබත්ගල වනාන්තර රක්ෂිතයෙන් පැල්මඩුල්ල කහවත්ත සැලසුම් ප්‍රදේශයට අයත්වන රක්ෂිත ප්‍රදේශය මෙම කලාපයට ඇතුළත් කර ඇත. මෙම කලාපය ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ අධි සංවේදී මධ්‍යම පාරිසරික කලාපයේ පවතින ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා වන සේ අධි පාරිසරික සංවේදිතාවයෙන් යුතු ප්‍රදේශ ආරක්ෂා කිරීමයි.
iii. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා **Google Earth** හි **Decimal Degree X** (නැගෙනහිර දේශාංශ) සහ **Y**(උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (**GPS-WGS-**1984)ඇමුණුම් අංක 05 හි සඳහන් කර ඇත.
iv. උප කලාපය	වනාන්තර සංරක්ෂණ කලාපය
v. කලාප අංකය	**Cn**
vi. කලාප සංගුණකය	-
vii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	-
viii. අවසරලත් උපරිම බිම් කවරේජ ආවරණය	-
ix. විවෘත අවකාශයන් සහ උපරිම උස	-
x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	-
xi. අවසරලත් භාවිතාවන්	**8.2** හි උපලේඛණය IV හි සඳහන් "ඊ" ආකෘතිය අනුව වියයුතුය
xii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	8.1.1 හි සඳහන් භාවිතයන් සඳහා පමනක් අවසර ලබාදෙනු ලැබේ.

වගු අංකය 8.5: කෘෂිකාර්මික කලාපය

i. ප්‍රධාන කලාපය	කෘෂිකාර්මික කලාපය	
ii.	කෘෂිකාර්මික කලාපය I	කෘෂිකාර්මික කලාපය I I
iii. කලාප ලක්ෂණ	පවතින වගා කුඹුරු, පුරන් වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙණිය, ඕවිට යනාදී ආනුශාංගික ප්‍රදේශයන් මෙම කලාපයට ඇතුළත් කර ඇත. මෙම කලාපය ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ කුඹුරු වගාවට ප්‍රමුඛතාවය ලබාදෙමින් ජල රැඳවුම් ප්‍රදේශ සංරක්ෂණය කිරීම මෙන්ම පාරිසරික සංවේදිතාවයට හානියක් නොවන අයුරින් පරිසර හිතකාමී ක්‍රියාකාරකම් පමණක් සිදුවන ඉතා අඩු ඝණත්ව කලාපයක් ලෙස පවත්වා ගනිමින් පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කිරීමය.	පැල්මඩුල්ල හා කහවත්ත නාගරික බල ප්‍රදේශයේ පිහිටා ඇති තේ හා රබර් වතු ආශ්‍රිත ප්‍රදේශ මෙම කෘෂිකාර්මික කලාපයට ඇතුළත් කර ඇත. මෙම කලාපය පිහිටුවීමේ අරමුණ වන්නේ වතු ආශ්‍රිත ආර්ථික කටයුතු සංවර්ධනය හා ඒ ආශ්‍රිත ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවෙන පරිදි සංවර්ධන කටයුතු සිදුකරමින් වතු වගාවන් ප්‍රවර්ධනය කිරීමේ කලාපයක් බවට පත් කිරීමයි.
iv. කලාප මායිම්	මෙම කලාපයේ මායිම් සඳහා **Google Earth** හි **Decimal Degree X** (නැගෙනහිර දේශාංශ) සහ **Y**(උතුරු අක්ෂාංශ) එනම් අක්ෂාංශ, දේශාංශ සහිතව ඛණ්ඩාංක තලයන් (**GPS-WGS**-1984)ඇමුණුම් අංක 05 හි සඳහන් කර ඇත.	
v. උප කලාපය	කෘෂිකාර්මික කලාපය I	කෘෂිකාර්මික කලාපය I I

vi. කලාප අංකය	A-I	A-II
vii. කලාප සංගුණකය	0	0.5
viii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය	**8.2** හි උපලේඛණය **I** සහ **II** හි සදහන් "අ" සහ "ආ" ආකෘති අනුව වියයුතුය	
ix. අවසරලත් උපරිම බිම් කවරි ආවරණය	**8.2** හි උපලේඛණය **II** සහ **III** හි සදහන් "ආ" සහ "ඉ" ආකෘති අනුව වියයුතුය	
x. විවෘත අවකාශයන් සහ උපරිම උස	**8.2** හි උපලේඛණය **III** හි සදහන් "ඉ" ආකෘතිය අනුව වියයුතුය	
xi. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය	-	
xii. අවසරලත් භාවිතාවන්	**8.2** හි උපලේඛණය IV හි සදහන් "ඊ" ආකෘතිය අනුව වියයුතුය	
	කෘෂිකාර්මික කලාපය I	කෘෂිකාර්මික කලාපය I I
xiii. කලාපය සඳහා වන පොදු රෙගුලාසි	**i.** මෙම කලාපයේ පවතින ගොඩ ඉඩම් තුළ සිදුකරන ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදු කළ යුතුය **ii.** මෙම කලාපයේ සියලු භාවිතයන් සඳහා 8.1.2. හි සදහන් මාර්ගෝපදේශ හා කොන්දේසි බල පැවැත්වේ.	-

8.1.1. සංරක්ෂණ කලාපය සඳහා අනුමත භාවිතයන්

- පානීය ජල සම්පාදන ව්‍යාපෘති
- ආරක්ෂක කුටි, අවසරපත් නිකුත් කරන කවුළු (ගෙබිම් ප්‍රමාණය ව.මී. 25 ට නොවැඩි), සනීපාරක්ෂක පහසුකම්
- පාරිසරික සංචාරක කටයුතු, ත්‍රාසයජනක සංචාරක කටයුතු
- නැරඹුම් ස්ථාන, සංචාරක කඳවුරු බිම්
- පාරිසරික අධ්‍යාන කටයුතු

8.1.2. කෘෂිකාර්මික කලාපය I සඳහා අනුමත භාවිතයන්

අනුමත භාවිතයන්	
පහත් බිම් / කුඹුරු ඉඩම්	ගොඩ ඉඩම්
• කුඹුරු වගා බිම් • තෙත්බිම් සම්බන්ධ අනෙකුත් කෘෂි වගා බිම් • අවිධිමත් භූමිය යථා තත්වයට පත් කිරීමේ කටයුතු වලට යටත්ව භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරියේ හා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ කොන්දේසි වලට යටත්ව සිදුකරනු ලබන කැණීම් කටයුතු (මැණික්,මැටි, වැලි, පස් හා වෙනත් ඛණිජ කැණීම්) • බලපෑම අවම පරිසර හිතකාමී සංචාරක කටයුතු (උදා:- පතල් කර්මාන්තය ආශ්‍රිත) • පාරිසරික අධ්‍යාපන කටයුතු • පර්යේෂණ කටයුතු • පරිසර හිතකාමී ජලජ ජීවී වගා පොකුණු • තෙත්බිම් ස්වභාවික උද්‍යාන	මෙම කලාපය තුළ කිසියම් ගොඩ ඉඩමක් පවතින්නේ නම් පහත සඳහන් භාවිතයන්ට පමණක් බිම් ආවරණය 50 % කට යටත්ව අවසර දෙනු ලැබේ. • උද්‍යාන/ විවෘත ක්‍රීඩා පිටි (ව්‍යුහාත්මක ස්ථිර ඉදිකිරීම් නොමැති) • නේවාසික ගොඩනැගිලි - අවම භූමි ප්‍රමාණය ව.මී. 500 (පර්චස් 20) • පරිසර හිතකාමී අවන්හල්, ලැගුම් හල්, උත්සව ශාලා - අවම භූමි ප්‍රමාණය ව.මී. 1000 (පර්චස් 40) • කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ ශාලා - අවම භූමි ප්‍රමාණය ව.මී. 1000 (පර්චස් 40) • පරිසර හිතකාමී සංචාරක කටයුතු - අවම භූමි ප්‍රමාණය ව.මී. 1000 (පර්චස් 40)

• එළිමහන් ශරීර සුවතා ප්‍රදේශ / ශාරීරිකව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන - (අවම භූමි ප්‍රමාණය ව.මී.1000) • ජාතික වැදගත් කමක් සහිත රජයේ අනුමත පොදු අපරව්‍යුහ ව්‍යාපෘති • නව වාරිමාර්ග ඉදිකිරීම /ගංවතුර පාලනය සඳහා වන ආරක්‍ෂණ ඉදිකිරීම	

8.1.3. කෘෂිකාර්මික කලාපය I සඳහා අනුමත මාර්ගෝපදේශ

1. පුරන් වූ කුඹුරු සහ වගා කුඹුරු වෙනත් භාවිතයන් සඳහා සංවර්ධනය කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ සහ උප ලේඛණයේ සඳහන් අංක 02,14,04,05,06 සහ 09 දරණ අදාළ ආයතන වල නිර්දේශ සහ අනුමැතින් ලබාගත යුතුය.
2. මෙම කලාපයේ අනුමත කාර්යයන් වලදී නිත්‍යානුකූල වූ පොදු අඩි පාරවල්, පොදු නාන ස්ථාන සංරක්ෂණය කිරීම හෝ ඒවා සුදුසු ළඟම ස්ථානයක ස්ථාන ගත කල යුතුය.
3. කුඹුරු ඉඩම් වලට අප ජලය බැහැර නොකළ යුතු අතර එසේ බැහැර කරන්නේ නම් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව පිරිපහදු කල අප ජලය පමණක් මුදා හැරීම සිදු කළ හැකිය.
4. ජලය බැස යාම හා ගංවතුර රැඳවුම් ධාරිතාවන්ට බාධා වන කිසිදු ඉදිකිරීමක් සඳහා කුඹුරු ඉඩම් තුළ අවසර දෙනු නොලැබේ. එසේවුවද මහා සැලසුමකට (Master Plan) හෝ නිර්මාන උපදේශක මාර්ගෝපදේශ සැලසුමකට අනුව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අනුමත කරන ලද විශේෂ ව්‍යාපෘතීන්ට හෝ ජල ගැලීම් පාලනය සඳහා වන ව්‍යාපෘති උප ලේඛණයේ සඳහන් අංක 01 සිට 15 දක්වා ඇති අදාළ ආයතනයන් වල නිර්දේශයන්ට යටත්ව අවසර දෙනු ලැබේ.
5. ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන කුඹුරු වගා සම්බන්ධ භූමියක සිදු කරන අනුමත සංවර්ධනයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට හිලව් වන සේ විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා උපලේඛණයේ සඳහන් අදාළ ආයතනවල අනුමැතිය ලබාගත යුතුය.

6. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා මෙම කලාපය තුළ සිදු කර ඇති ගොඩ කිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්‍රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු උපලේඛනයේ සඳහන් ආයතන වල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය.
7. පාරිසරික සංවේදී වටිනාකම සහිත මෙම කලාපය තුළ ඇති ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් ශාක හා සතුන් ඉවත් නොකළ යුතුය.
8. මෙම කලාපය තුළ අවසරලත් සෑම ඉදිකිරීමක්ම නියම කරන ලද ශිල්පීය ප්‍රමිතීන් සහිත හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිර්මාණය විය යුතුය.
9. මෙම කලාපය තුළ අවසර දෙනු ලබන සංවර්ධන කටයුත්තකදී පැහැදිලිව හඳුනාගත හැකි භූ දර්ශන / සංස්කෘතික / පුරා විද්‍යාත්මක / ජෛව විවිධත්වය ඉහල අගයන් ඇති ප්‍රදේශ සංරක්‍ෂණය කල යුතුය.
10. සංවර්ධනකරුවන් විසින් සැලසුම් සකස් කිරීම හා නිර්මාණ සහ අධීක්‍ෂණ කටයුතු කිරීම සඳහා වෘත්තීය සුදුසුකම්ලත් වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගත යුතුය.

08 වන පරිච්ඡේදය උපලේඛණය

කලාපීකරණ නියමතා

1. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
2. මධ්‍යම පරිසර අධිකාරිය
3. නාගරික සංවර්ධන අධිකාරිය
4. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
5. කහවත්ත ප්‍රාදේශීය සභාව
6. ගොඩකවෙල ප්‍රාදේශීය සභාව
7. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
8. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,
9. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
10. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
11. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය
12. ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය
13. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය
14. ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
15. මාර්ග සංවර්ධන අධිකාරිය

8.2 උපලේඛණ

උපලේඛණය I - "අ" ආකෘතිය: නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් ගෙබිම් අනුපාතයන්

ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)	කලාපිය සංගුණකය = 0.50 - 0.74				කලාපිය සංගුණකය = 1.00-1.24				කලාපිය සංගුණකය = 1.50 - 1.74				කලාපිය සංගුණකය = 2.00-2.24			
	මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල				මාර්ගයේ අවම පළල			
	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි	**මීටර් 6	මීටර් 9	මීටර් 12	මීටර් 15 සහ වැඩි
150 - 250ට අඩු	0.8	0.9	0.9	0.9	1.6	1.7	1.8	1.9	2.4	2.6	2.7	2.8	3.0	3.4	3.6	3.8
250 - 375 ට අඩු	0.9	1.0	1.2	1.3	1.8	2.2	2.4	2.7	2.6	3.2	3.6	4.0	3.2	3.6	4.5	4.5
375 - 500 ට අඩු	0.9	1.0	1.2	1.4	1.9	2.2	2.5	2.8	2.7	3.3	3.8	4.2	3.4	3.7	4.8	5.2
500 - 750 ට අඩු	1.0	1.1	1.3	1.5	2.0	2.3	2.7	3.0	2.8	3.4	4.0	4.5	3.5	4.0	5.0	6.0
750 - 1000 ට අඩු	1.0	1.2	1.4	1.7	2.1	2.4	2.9	3.3	3.1	3.6	4.3	5.0	3.6	4.5	5.7	6.5
1000 - 1500 ට අඩු	1.1	1.3	1.5	1.8	2.2	2.5	3.0	3.6	3.2	3.8	4.6	5.5	3.7	5.0	6.1	8.0
1500 - 2000 ට අඩු	1.1	1.4	1.7	2.0	2.3	2.7	3.4	4.0	3.4	4.0	5.0	6.0	3.8	5.1	6.7	9.0
2000 - 2500 ට අඩු	1.2	1.5	1.8	2.1	2.4	2.8	3.5	4.2	3.5	4.2	5.2	6.5	3.9	5.2	7.1	*10
2500 - 3000 ට අඩු	1.2	1.6	2.0	2.4	2.5	3.2	4.0	4.7	3.6	4.4	5.5	7.0	4.0	5.3	7.4	*10.5
3000 - 3500 ට අඩු	1.3	1.7	2.1	2.5	2.6	3.4	4.2	5.0	3.7	4.6	6.0	7.5	4.0	5.4	7.6	*11
3500 - 4000 ට අඩු	1.4	1.8	2.2	2.6	2.8	3.6	4.3	5.3	3.8	4.8	6.3	7.7	4.0	5.5	7.8	*11.5
4000ට වැඩි	1.5	1.9	2.3	2.8	3.0	3.8	4.5	5.5	4.0	5.0	6.5	8.0	4.0	5.6	8.0	*12

UL - අසීමිත

නීත්‍යානුකූලව වාහන නැවතුම් සඳහා වෙන්කර ඇති ගෙබිම් ප්‍රමාණයන් ගෙබිම් අනුපාතය සඳහා ගණනය නොකරයි

කලාපීය රෙගුලාසි යටතේ මහල් ප්‍රමාණය හෝ ගෙබිම් අනුපාතය දක්වා ඇති විටකදී ඉහත ගෙබිම් අනුපාතයන් අදාළ නොවේ.

සංවර්ධන සැලැස්ම යටතේ ඉඩමේ ආනතියට අනුව ඉහත ගෙබිම් අනුපාතයන් වෙනස් විය හැක.

ඉඩමේ ආනතිය අංශක 11 ට වඩා වැඩිවනවිට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය ලබාගත යුතුය.

* ගෙබිම් අනුපාතය 10.0 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සඳහා අවසර ලැබෙනුයේ අවම වශයෙන් මීටර් 12 ක (මාර්ගයේ මැද සිට) ගොඩනැගිලි සීමාවක් පනවා ඇති ප්‍රවේශ මාර්ගය සඳහා පමණි. එසේ නොවන අවස්ථාවක උපරිම ගෙබිම් අනුපාතය 9.0 ට සීමා විය යුතුය.

** සංවර්ධන සැලැස්මේ මීටර් 7 ක් පළල මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති මාර්ග සඳහා අවම මාර්ග පළල මීටර් 7 ක් ලෙස සලකනු ලැබේ.

උපලේඛණය II - "ආ" ආකෘතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් මහල් ප්‍රමාණයන්

මීටර් 3 සහ 4.5 මාර්ග සඳහා මහල් ප්‍රමාණයන්						
මාර්ගයේ අවම පළල	**ඉඩමේ මුහුණතෙහි අවම පළල**	**ගෙබිම් ආවරණ ප්‍රතිශතය***	**උපරිම මහල් ප්‍රමාණය**			
			කලාපිය සංගුණකය 0.5 - 0.74	**කලාපිය සංගුණකය 0.75 - 1.24**	**කලාපිය සංගුණකය 1.25 - 3.49**	**කලාපිය සංගුණකය 3.50 - 4.00**
මීටර් 3.0	**මීටර් 6**	**65%**	**1 (G)**	**2 (G+1)**	**3 (G+2)**	**3 (G+2)**
මීටර් 4.5	**මීටර් 6**	**65%**	**1 (G)**	**2 (G+1)**	**3 (G+2)**	**4 (G+3)**
වාහන නැවතුම් ඉඩකඩද ඇතුලත්ව ඉහත මහල් ප්‍රමාණයන් දක්වා ඇත එක් එක් මාර්ග සඳහා නියමිත නිවාස ඒකක ප්‍රමාණයන් වෙනස් නොවේ * කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී						

උපලේඛණය III - "ඉ" ආකෘතිය: නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති විවෘත අවකාශයන්

"ඉ" පෝරමය - විවුර්ත අවකාශයන්									
ගොඩනැගිල්ලේ උස (මීටර්)	ඉඩමේ මුහුණතෙහි අවම පළල (මීටර්)	ගෙබිම් ආවරණ ප්‍රතිශතය*		පසුපස අවකාශය (මීටර්)		පැති අවකාශය (මීටර්)		ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබාගන්නා වාලිං සඳහා	
		නේවාසික නොවන	නේවාසික	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා නොගන්නාවිට	මෙම අන්තයෙන් ස්භාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නාවිට	අවම පළල	අවම ගෙබිම් ප්‍රමාණය
7ට අඩු	**6**	80%**	65%	2.3 මීටර්	2.3 මීටර්	-	2.3 මීටර්	2.3 මීටර්	5 ව. මීටර්
7 - 15ට අඩු	**6**	65%	65%	3.0 මීටර්	3.0 මීටර්	-	3.0 මීටර්	3.0 මීටර්	9 ව. මීටර්
15 - 30ට අඩු	**12**	65%	65%	4.0 මීටර්	4.0 මීටර්	1.0 මීටර් සහ 3.0 මීටර්	4.0 මීටර්	4.0 මීටර්	16 ව. මීටර්
30 - 50ට අඩු	**20**	65%	65%	4.0 මීටර්	5.0 මීටර්	3.0 මීටර් දෙපසින්	5.0 මීටර්	5.0 මීටර්	25 ව. මීටර්
50 - 75ට අඩු	**30**	50%***	50%***	5.0 මීටර්	6.0 මීටර්	4.0 මීටර් දෙපසින්	6.0 මීටර්	6.0 මීටර්	36 ව. මීටර්
75 සහ ඊට වැඩි	**40ට වැඩි**	50%***	50%***	5.0 මීටර්	6.0 මීටර්	5.0 මීටර් දෙපසින්	6.0 මීටර්	6.0 මීටර්	****

ගොඩනැගිල්ලේ උස - ප්‍රවේශ මාර්ගය මට්ටමේ සිට ඉහල සඳලු තලය හෝ වහලය මට්ටම දක්වා උස (වාහන නැවතුම් මහල්ද ඇතුලත්ව)

* කලාපීය රෙගුලාසි යටතේ ගෙබිම් ආවරණ ප්‍රතිශතයන් දක්වා නොමැති විටකදී

** සම්පූර්ණයෙන්ම නේවාසික නොවන සංවර්ධන කටයුතු සඳහා

*** ගොඩනැගිලි උසේන් 20% හෝ මහල් 12 යන දෙකෙන් අවම උසක් සහිත පොඩියම් (Podium) මහල් සඳහා 65% ගෙබිම් ආවරණ ප්‍රතිශතයක් ලබා දියහැක

**** අමතර සෑම උස මී 3ක් සඳහාම අවම ගෙබිම් ප්‍රමාණය ව. මීටර් 1 කින් වැඩිවිය යුතුය

උපලේඛණය IV - "ඊ " ආකෘතිය : සංවර්ධන කලාප සඳහා අවසරලත් භාවිතාවන් සහ අනුමත භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණයන්

“ ඊ ” පෝරමය - සංවර්ධන කලාප සඳහා අවසරලත් භාවිතාවන් සහ අනුමත භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණයන්				අධි ඝණත්ව වාණිජ කලාපය	අධි ඝණත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	මධ්‍ය ඝණත්ව මිශ්‍ර සංවර්ධන කලාපය	අඩු ඝණත්ව නේවාසික කලාපය	කෘෂිකාර්මික කලාපය - II (වැවිලි බෝග ප්‍රවර්ධන කලාපය)
ප්‍රධාන භාවිතය	අනු අංකය	අනු භාවිතය	අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)					
නේවාසික)Residential)	1	නිවාස	150	150	150	250	250	අ.බි.ප්‍ර. අදාළ නොවේ
	2	සහාධිපත්‍ය නිවාස සංකීර්ණ	150	150	150	250	250	
	3	නිවාස සංකීර්ණ	500					
	4	නිවාස ව්‍යාපෘති	1000					අ.බි.ප්‍ර. අදාළ නොවේ
	5	නිල නිවාස/සේවක නිවාස	250					අ.බි.ප්‍ර. අදාළ නොවේ
	6	සේවා නිවාස (Service apartments)	500					
	7	ස්ටුඩියෝ නිවාස	500					
	8	ඩෝමෙට්‍රි	500					
	9	නේවාසිකාගාර	150	150	150	250	250	

	10	දිවා සුරැකුම් මධ්‍යස්ථාන	500					
	11	ගිලන් සේවා මධ්‍යස්ථාන	500					
	12	වැඩිහිටි නිවාස	500					
	13	ළමා නිවාස	500					
	14	ආබාධිත පුනරුත්ථාපන නිවාස	500					
	15	පුනරුත්ථාපන නිවාස පරිවාස /	1000					
	16	ප්‍රජා ශාලා	150	150	150	250	250	අ.බි.ප්‍ර. අදාළ නොවේ
	17	නිවාඩු නිකේතන/සංචාරක බංගලා	500					
	18	ආගන්තුක නිවාස	250	250	250	**500**	**1000**	
	19	ලැගුම් හල්	250	250	500	500		
	20	තානායම්	1000					
	21	විශ්‍රාම ශාලා	250					
	22	වතු නිවාස						අ.බි.ප්‍ර. අදාළ නොවේ
		ගෘහාශ්‍රිත සංචාරක කටයුතු (Home Stay)	150	150	150	250	250	

සෞඛ්‍ය)Health)	1	රෝහල්	1000					
	2	වෛද්‍ය මධ්‍යස්ථාන (එක් වෛද්‍යවරයෙකු පමණක් සිටින)	150	150	150	250	250	150
	3	වෛද්‍ය මධ්‍යස්ථාන (වෛද්‍යවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකු සිටින)	500					
	4	සාම්පල් එකතු කිරීමේ මධ්‍යස්ථාන	150	150	150	250	250	
	5	රසායනාගාර	150	150	150	250		
	6	ඖසුසල්	150	150	150	250		
	7	පශු වෛද්‍ය සායන	150	150	150	250	250	150
	8	පශු වෛද්‍ය රෝහල්	500					
	9	නිරෝධායන මධ්‍යස්ථාන	500					
	10	ළමා හා මාතෘ /පවුල් සායන මධ්‍යස්ථාන	250					
	11	අනෙකුත් වෛද්‍ය ආයතන	250					
	12	වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන	500					
	13	සත්ත්ව සුරුකුම් මධ්‍යස්ථානය	500					

	14	ආයුර්වේද රෝහල්	1000					
	15	වතු රෝහල්	1000					
කාර්යාල සහ ආයතනික)Office & Institution)	1	කාර්යාල	150	150	150	250		
	2	වෘත්තිය කාර්යාල	150	150	150	250	250*	
	3	කාර්යාල සංකීර්ණ (වර්ග මීටර් 5000 වැඩි)	1000					
	4	බැංකු/රක්ෂණ මූල්‍ය ආයතන	150	150	150	250	250*	
	5	වෙනත්	150	150	150	250 *	250*	අ.බි.ප්‍ර. අදාළ නොවේ
වාණිජ)Commercial and services)	1	සාප්පු සංකීර්ණ	500					
	2	සිල්ලර වෙළඳසැල්	150	150	150	250	250 *	150 *
	3	තොග වෙළඳසැල්	250					
	4	ආංශික වෙළඳසැල් /සුපිරි වෙළඳ සැල්	500				**	
	5	විවෘත වෙළඳ සැල්	150	150	150	250	250	
	6	ප්‍රදර්ශනාගාර	500					
	7	අවන්හල්/ ආපනශාලා (Take Away only)	150	150	150	250	250 *	
	8	අවන්හල්/ ආපනශාලා	250					

	9	උත්සව ශාලා	1000					
	10	තරු පන්ති හෝටල්	2000					
	11	හෝටල්	500	500	500	500	1000	
	12	නාගරික හෝටල් city hotel	500					
	13	සමාජ ශාලා	500					
	14	මොටෙල්	250	250	250	250	1000	
	15	කබානා හෝටල්	500		500	500	1000	
	16	විකාශනාගාර Broadcasting Studios	500					
	17	ශබ්දාගාර) විකාශනාගාර නොවන(	150	150	150	250		
	18	රූපලාවන්‍ය මධ්‍යස්ථාන / බාබර් සාප්පු	150	150	150	250	250	
	19	පාරිභෝගික සේවා මධ්‍යස්ථාන	150	150	150	250	250*	
	20	සම්භාහන මධ්‍යස්ථාන	150	150	150	250		
	21	ටේලර් සාප්පු	150	150	150	250	250*	
	22	අවමංගල්‍ය ශාලා)Funeral Parlor)	500					

	23	මල් ශාලා	150	150	150	250		
	24	ලොන්ඩ්‍රි ඇඳුම් පිරිසිදු කිරීමේ / මධ්‍යස්ථාන	150	150	150	250	250	
	25	හාඩ්වෙයාර්/ ගොඩනැගිලි ද්‍රව්‍ය විකුණුම් වෙළඳසැල්	250	250	250	500	500 **	
	26	මත්පැන් අලෙවිසැල්	150	150	150	250		
	27	වාහන අමතර කොටස් වෙළඳසැල්	150	150	150	250		
	28	කුලී රථ සේවා මධ්‍යස්ථාන	250					
	29	වාහන සේවා මධ්‍යස්ථාන බයිසිකල් / ත්‍රීවිල්	375					
		වාහන සේවා මධ්‍යස්ථාන සැහැල්ලු වාහන	500					
		වාහන සේවා මධ්‍යස්ථාන බර වාහන	1000					
	30	වාහන අලුත්වැඩියා මධ්‍යස්ථාන බයිසිකල් / ත්‍රීවිල්	375					

		වාහන අලුත්වැඩියා මධ්‍යස්ථාන සැහැල්ලු වාහන	500					
		වාහන අලුත්වැඩියා මධ්‍යස්ථාන බර වාහන	1000					
	31	වාහන ඉන්ධන පිරවුම්හල	1000					
	32	දුම්පරීක්ෂණ මධ්‍යස්ථාන	500					
	33	ඔට්ටු ඇල්ලීමේ මධ්‍යස්ථාන	150	150	150	250		
	34	බස් පර්යන්ත	1000					
	35	මුද්‍රණාල	150	150	150	250		
	36	වාහන ටයර් අලෙවිය හා සේවා කටයුතු මධ්‍යස්ථාන	1000					
අධ්‍යාපනික)Educational)	1	පෙර පාසල් / පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන	500					
	2	ප්‍රාථමික පාසල්	4000					
	3	ද්විතික පාසල්	8000					
	4	තෘතික පාසල්	8000					

	5	පෞද්ගලික පාසල් / ජාත්‍යන්තර පාසල්	4000					
	6	උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන	2000					
	7	රාජ්‍ය / පෞද්ගලික විශ්ව විද්‍යාල	4000					
	8	කාර්මික විද්‍යාල / වෘතියය පුහුණු මධ්‍යස්ථාන / පුහුණු මධ්‍යස්ථාන	1000					
	9	පෞද්ගලික උපකාරක පන්ති- වර්ග මීටර 50ට අඩු	150	150	150	250	250	
	10	පෞද්ගලික උපකාරක පන්ති- වර්ග මීටර 50 හා වර්ග මීටර 500 අතර	500					
	11	පෞද්ගලික උපකාරක පන්ති වර්ග මීටර 500ට වැඩි	1000					
	12	කලායතන / රංගායතන	1000					
	13	අනෙකුත් අධ්‍යාපන ආයතන	250				**	
	14	පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන	250				**	

සමාජ හා ආගමික)Social & Religious)	1	ආගමික ස්ථාන	500					
	2	ආගමික අධ්‍යාපන මධ්‍යස්ථාන	500					
	3	කෞතුකාගාර	250					
	4	සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන	500					
	5	සුසාන භූමි ආදාහනාගාර /	2000					
	6	ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන	150	150	150	250	250	අ.බි.ප්‍ර. අදාල නොවේ
	7	ශ්‍රවනාගාර (Auditorium)	500					
	8	සමන්ත්‍රණ ශාලා	1000					
	9	සංචාරක තොරතුරු මධ්‍යස්ථාන	150	150	150	250	250	
කාර්මාන්ත සහ ගබඩා)Industrial)	1	වාහන එකලස්/ උපාංග ගබඩා කිරීමේ මධ්‍යස්ථාන	500					
	2	බෙදා හැරීමේ කටයුතු සඳහා වන ගබඩා	500					
	3	ගබඩා/ ගුදම්	1000					
	4	**සේවා කර්මාන්ත**	1000					
	5	ගෘහස්ත කර්මාන්ත	150	150 *	150 *	250 *	250 *	
	6	ඇසුරුම් කර්මාන්ත	500				**	

	7	**ප්‍රතිචක්‍රීකරන කර්මාන්ත**	1000					
	8	අගය එකතු කිරීමේ කර්මාන්ත	500				**	
	9	**අබලි දෑ එකතු කිරීමේ මධ්‍යස්ථාන**	1000					
	10	බේකරි නිෂ්පාදන දර පෝරණු	500					
	11	බේකරි නිෂ්පාදන විදුලි	250					
	12	කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත	500					
	13	**උළු සහ ගඩොල් කර්මාන්ත**	1000					
	14	ලී බඩු නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත	500	500	500	500	1000 *	
	15	අඹරුම්හල්	150	150	150	250	250 *	
	16	ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපොලවල්	500					
	17	**දූෂ්‍ය කාරක නොවන අනෙකුත් කර්මාන්ත** (මධ්‍යම පරිසර අධිකාරියේ නිර්නායක අනුව)	500	500	500	500	1000 **	

	18	දූෂ්‍ය කාරක අනෙකුත් කර්මාන්ත (මධ්‍යම පරිසර අධිකාරියේ නිර්ණායක අනුව)	1000					
	19	තේ හා රබර් කර්මාන්තශාලා	2000					
	20	වී මෝල්	500					
විනෝදාත්මක)Leisure)	1	ගෘහස්ත ක්‍රීඩාගාර	1000					
	2	විවෘත රංග භූමි	1000					
	3	පුස්තකාල	250					
	4	කාය වර්ධන මධ්‍යස්ථාන	150	150	150	250	250	
	5	ළමා උද්‍යාන	500					
	6	විවෘත පිට්ටනි	1000					
	7	සිනමා ශාලා	500					
	8	පිහිනුම් තටාක	1000					
	9	උද්‍යාන	-					
	10	**විනෝදාත්මක උද්‍යාන**	-					
	11	**ශරීර සුවතා ප්‍රදේශ / ව්‍යායාම් පහසුකම් ස්ථාන**	250					
		සංචාරක කඳවුරු බිම්						

කෘෂිකාර්මික හා ධීවර කර්මාන්තය	1	**බෝට්ටු ජැටි පාරු නවාතැන් /**						
	2	නැංගුරම් තොටුපළවල්						
	3	ධීවර තොටුපළවල්						
	4	ඉදිකිරීම් සහිත මාදැල් පාඩු						
	5	ලෙල්ලම						
	6	සත්ත්ව හා වගා ගොවිපලවල්	2000					
